# KURUKULA CHARITHA

BY


**A. S. F. Weerasuriya, Kurukula Venthar**

(Member, Urban Council)

HAPUTALE.


# කුරුකුල චරිතය


හපුතලේ

(පළාත් ආණ්ඩු සභාවේ සාමාජික)

ඒ. ඇස්. ඇෆ්. වීරසූරිය, කුරුකුල වේණ්දර්


විසින් ලියන ලදී.


ප්‍රකාශක

කෞරව ආදිත්‍ය, පී. පියදාස ජයරත්න

කුරුණෑගල.


රු. 5/-

# සංඥාපනය

ජාතියකගේ ජීවය ඒ පිළිබඳ ඉතිහාසයයි. මෙය රටක් වර්ගයක් කුලයක් පවුලක් හෝ පුද්ගලයෙක් සම්බන්ධයෙන් වුවද සාධාරණයි.

දෙමාපියන් නොහැඳිනීම ශිලාචාරත්වයට කැළලකැයි නිගමනය කරතොත්, සිය පරපුර ගැන නොදැනීමද ඒ ගණයෙහිම ලා ගිණීම නිවරදය.

"ජනනී ජන්ම භූමිශ්ච ස්වර්ගාද පිගරී යසී."

වැදූ මවත් උපන් බිමත් ස්වර්ගයටද වඩා ශ්‍රේෂ්ඨයි. එමෙන්ම ඒ ඒ පුද්ගලාදීන් පිළිබඳවූ පරපු?ද ඔවුනට ස්වර්ගයෙකි. ඒ පිළිබඳ සත්‍ය තොරතුරු උද්ග්‍රහණ ධාරණ පාඨනාදිය අවශ්‍ය වනුයේ මෙරමා හුවා දැක්වීමට නොව අතීතයෙහි ඒ ඒ පරපුරෙහි වූවන් ගිය සදෙස්මග හරිමින් නිදෙස්මග දරමින් ඔවුන් ගැන සමරමින් මතු පරපුරට යහමග දැක්වීමටය.

තවද;

"පහතින් පනත් සිය ගණනක් ඇවුලුව ද
එපහන් සිලෙහි අලු අඩු නොව දිලෙතලෙ ද"

යි, වියුසේ යම් නිවැරදි වංශ කථාවක් වේනොත් එය සෙසු ලෝකයාටද ආලෝකයක්වනු ඇත. ඉතිහාස ග්‍රන්ථයක් හෝ වංශ කථාවක් උපයෝගි වනුයේ මේ ආදි හේතූන් සඳහාය.

ඒ ඒ ජාත්‍යාදීන්ගේ සම්භවයත් සමගම ආරම්භවන යටගියාවක් (ඉතිහාසයක්) ඇති වතුදු කරුණු එක්තැන්වූ ඉතිහාස ග්‍රන්ථයකගේ හිමිකම එතෙකින් ඇති නොවේ. එබඳු හිමිකමක් ඇති වෙතොත් එය ශත වර්ෂ ගණනාවක් ගෙවීයාමෙන් පසුවයි. ඒද තැනින් තැන විසිරී සිටිනා ලිපි ලේඛන තුඩපත් සන්හස් පුරාවෘත නෂ්ටාවශේෂ හා ජන කථාදිය එක්තැන් කිරීමෙන් කාලාන්තර පරිශ්‍රමයකිනි. යමක් යම්තරමට ව්‍යාප්තද ඒ පිළිබඳ ඉතිහාසයද එපමණටම පළල්ය.

කාලය නැමැති මහා සයුරෙන් ගසා ගෙන ගොස් තැනින් තැන විසිරී සිටි මුතු රැසක් එක් තැන් කරන්නාක්මෙන්, අටළොස් වසක් මුලුල්ලේ අපගත් දෘඪ පරිශ්‍රමයෙහි ප්‍රතිඵලයකි මේ.

පෙර අපර දිග්හි අතීත වර්තමාන හා නා උගතුන්ගේ ලිපි ලේඛනාදියත්, තුඩපත් සන්හස් ශිලා ලේඛන හා ජන කථාදියත් මේ ග්‍රන්ථ කරණයෙහි ලා උපයෝගි කර ගතිමු.

කෞරව වංශ මහා මුතු වැලෙහි පලින්පල දිළුණු මහගු මිණිරුවන්වන් ඇතැම් සංක්ෂිප්ත චරිත කථා කිපයකුදු මෙහි දැක්වූයේ, දීඝ මාර්ගයක වැඩුණු ශාඛා ප්‍රශාඛා ඇතිව හැඹී ගැඹෙතක් නැගී සිටි වනස්පතියක් දෙකක් දෙස මග සලකුණු පිණිස අත දිගුකර පෙන්වන ලෙසිනි.

මහ මුහුණුට දකවල ප්‍රිය නොවනුයේ සූර්යයාගේ වරද කිත් නොවේ.

සමහර විට ඇතැම් රාත්‍රී ගවේෂිතට අප ගත් මේ උත්සාහයද දෙබරයකට ගල් ගැසීමක් සේ නොවිය හැක්කේද නොවෙයි. එවිට;

"මැ පෙල පමණ සිඹි - කිවිමන් දනන් පසසන
ගරහන යළිදු කම්කිම් - පඹුවෝම මෙහි පමණෝ"

යන්නය එහිලා මෙහිදී සැලකිය යුත්තේ. භින්න රුචික ලෝකයෙහි සියල්ලන් තුටුකළ හැක්කෙක් ශාස්තෘන් අතරද නොවීය.

වැරදීම පුහුදුන් ගතියෙකි. එබැවින් මෙහිදු අපගේ ප්‍රමාදදීන් නිසාවූ සදොස් තැන් නොවිය හැක්කේ නොවෙයි. එහිලා අපක්ෂපාත විචාරකයන්ගේ සහිදගීත සඳගීණයක් වේනොත් අවස්ථානුකූලව පිළිගන්නටද අප පසුබට වනුයේ නොවෙයි.



## අපගේ සතුතිය

අපගේ මේ දෘඪතර පරිශ්‍රමයෙහිදී නොයෙක් ලෙසින් සහායවූ, කෘතඥ කෘතවේදිත්වයෙන් සදානුසමරණීය සාධූන් අතර දුර්ලභ පොත්පත් රැසක් සපයාදුන් කුරුණෑගල කෞරව 'ආදිත්‍ය පියදස ජයරත්න, ගාල්ලේ උපාලි ගුණරත්න හාමු, මොරටුවේ ජයවර්ධන වලව්වේ ගස්ටේව් ජයවර්ධන හාමු, ශාස්ත්‍රාචාර්ය ඒ. පී. ගෝමස්, කුරුණෑගල සැම්සන් ද සිල්වා ගාර්දියේ පුංචි හේවා, හතර කෝරළේ දෙඹේමඩ එච්. ඇම්. හේතුහාමි ගම්සභා මැම්බර්, හතර කෝරළේ තල්ගමුවේ වීරසූරිය මුදියන්සේලාගේ ඉලංගසූරිය, තමන්කඩුව සිවලාකුලමේ ආර්. ඇම්. මුදියන්සේ, තමන්කඩුව මන්නම්පිටියේ වණිසූරිය කන්දප්පු, දකුණු දඹදිව මකප්පාඩි නුවර භාරත වංශික ජෝන් බුකානන් පාඕවා, හපුතලේ ඒ. පී. පී. ෂන්මුගම් පුල්ලේ කෞර වඩුගර්, යන මහත්මෝ අගතැන් ගනිති.

තවද මුඛ පරම්පරාගත වෘතාන්ත කිපයක් ලියා කියා දුන් කාලයාත්‍රා කල ජේ. සි. ලංකාතිලක උඩුකිඳ රටේ මැතිතුමා, කදුරුගමුවේ කොස්කණුවේ වලව්වේ, ඒ.ඩබ්ලිව්. ඇම්. රත්නායක බණ්ඩාර, වියලුවේ සමුද්දර ජයගත් පොරෝහිත බ්‍රාහ්මණලාගේ මුතුබණ්ඩාර යන මහතුන් තිදෙනද, මේ ග්‍රන්ථය නිසිලෙස පිටපත් කර දුන් හෙලකදුරුගමුවේ ඇස්. පී. බී. රණසිංහ මහතාද අපගේ අචංකාදර සතුතියට හිමිවෙක් මැයි.

මෙයට දෙස්දෙන මහා භාරතීය පුරු, කුරු ඈ රාජ වලියෙහිද, යෞරෝපීය භාෂාවන්ගේ පරිවර්තනයන්හිද යම් යම් අඩු පාඩු මෙහි ඇතිවිය හැක.

එසේම කලක සිට රෝ සතුරෙකු හා දරුණු සටනෙක යෙදී සිටි අපට මෙය සිතැගිලෙස නිම කිරීමට හෝ මේ පිළිබඳ අවබෝධයක් ඇති කෘතහස්ත බහුශ්‍රැත වැඩිහිටියෙකු ලවා සුඩකරවා ගැන්මට හෝ නුපුළුවන් විය. ඒ එසේ වතුදු මෙයි සඳහන් ඓතිහාසික සත්‍යයන් වෙන් කොට ගැන්මට බාධා නොවෙතැයි සිතමු.

මෙම පොත මුද්‍රණය කරවීමේ බලය කුරුණෑගල, පී. පියදාස ජයරත්න මහතාට සහ හපුතලේ ඒ. ඇස්. ඇෆ්. වීරසූරිය යන අප දෙපලට පමණක් සීමාවී තිබෙන බවද මෙහි ඇතුළත් නොවූ කෞරවයින් සම්බන්ධව වැදගත් සත්‍ය ඉතිහාසික කරුණු දන්නා භවතුන් කාරුණාකර අප වෙත විස්තර සහිතව ලියා එව්වහොත් එය මතු මුද්‍රණයට යොදවන බවද දන්වා සිටිමු.

තවද කුරුකුල, වරුණකුල, මුතුවාදී, මුතුමාල, මුතු පංත්‍රි, අඩප්පනාර්, වෙඩි අරශන්, යනාදි කෞරවයින් අතරෙන් ඇතැම්හු අන්‍යකුල ස්ත්‍රීන් පාවාගැනීම හේතුකොට ගෙන ඔවුන්ගේ දරු මුණුපුරු පරම්පරාවෝ ද කෞරව නාමයෙන් බැහැරව සිටිති.

මේ වගට,

දෙඩම්පහල වැල්ලේලියන මහ ගාර්දිය
වසම්, ජයසූරිය මුහන්දිරමගේ

ජ්. ඇස්. ඇෆ්. වීරසූරිය
(හපුතලේ පළාත් ආණ්ඩු සභා සමාජික)

1948 දෙසැම්බර් 1
හපුතලේ.

## ශුද්ධ පත්‍රය

| පිට | පෙල | වැරදි | නිවැරදි |
|---|---|---|---|
| 2 | 2 | කුරු | කුරු |
| 2 | 30 | බ්‍රිතත්වරුන් | බ්‍රිතන්වරුන් |
| 3 | 12 | චක්‍රමාන් | චසුමාන් |
| 3 | 26 | සරසවත්‍ය | සරසවත්‍යා |
| ,, | 26 | දාෂත් | දාෂත් |
| 4 | 10 | මිතස්මිං | තස්මිං |
| ,, | 11 | සාං | — |
| ,, | ,, | සඳුවර | සඳවාර |
| ,, | 12 | කුරුක්ෂෙත්‍රව | කුරුක්ෂෙත්‍රව |
| ,, | 15 | සච්ජී | සජී |
| ,, | 32 | එහත් | එතත් |
| 5 | 6 | පංචාරුම | පංචරු |
| ,, | 7 | මාදශ | වාදශ |
| ,, | 15 | ෂුසනාථ | ෂසනාථා |
| ,, | 17 | රක්ෂණාලායාං | රක්ෂණායාලං |
| 13 | 3 | ශාසත්‍රධාරියෙක්ව | සමකාලිකයෙක්වූ |
| .14 | 35 | hough | though |
| 17 | 8 | කිරුකුල | කුරුකුල |
| 17 | 35 | හවද්‍රජා කෞරවණාං | භවද්‍රාජා කෞරවාණාං |
| 20 | 15 | පුත්‍ර | පුත්‍රො |
| ,, | 16 | වද්වසාන් කාරුණං | යද්වසාත් කුරුණං |
| ,, | 23 | නාකාලෙ ප්‍රියතෙ | නාකාලෙ ම්‍රියතෙ |
| ,, | ,, | කශ්චින් විධඃ | කශ්චිත් විධඃ |

| පිට | පෙල | වැරදි | නිවැරදි |
|---|---|---|---|
| 20 | 23 | ශෛතෙරපි | ශෛතෙරපි |
| " | 31 | ජනාදීදතඃ | ජනාදීනඃ |
| 21 | 27 | ...... ..... | මහභාරතයෙහි පෙනී යන පරිදි |
| 21 | 30 | අනවරතයෙන්ම | නොයෙක් විට |
| 22 | 33 | වෘක්ෂණීයගේ | වෘෂ්ණීයගේ |
| 23 | 17 | පුඩාභිලාෂීන් | සතුරු ජාතියක් |
| 27 | 17 | ක්‍රිෂ්ණගේ සහෝදරයා | කෘෂ්ණාගේ සහෝදර බලදේවයා |
| 28 | 24 | දෘඨ | දෘඪ |
| " | 25 | සමහරෙත් | සමහරෙක් |
| 29 | 21 | ඊසාන දිගින් | අග්නි දිගින් |
| 35 | 12 | මංජරුබදී | මංජරුබද් |
| 35 | 28 | (කාවේරි පුරය) | කාංචි පුරය |
| 37 | 22 | කරුවේ - කරුවේ | ...... |
| 39 | 3 | ශමිෂ්ටාං | ශර්මිෂ්ටාං |
| 39 | 19 | සුරවීර | සුවීර |
| 49 | 10 | නාගනත්‍යාය | නාගකන්‍යාය |
| 52 | 18 | කොනතාරු දෙවර්ගයාගේම | කොංතවරුන්ගේ |
| 56 | 5 | කුන්දිරුවේ | කුංදිරුවේ |
| 77 | 15 | අච | අඩි |
| 86 | 2/3 | තේනුවරජ | තේනුවර |
| 87 | 16 | වරන් | වරුන් |
| 92 | 17 | මහවංශය | ...... |

| පිට | පෙල | වැරදි | නිවැරදි |
|---|---|---|---|
| 98 | 16 | නාමයෙන් මෙත්සි | නාමයන් මෙසේයි |
| 109 | 16 | වික්මැනී | වික්මැතී |
| 114 | 3 | බවක් | බවත් |
| " | 29 | දමුලිකම් | මුදලිකම් |
| 117 | 3 | දියෙය් | දියෙස් |
| 120 | 6 | සරෙස් වී | සරුස් වී |
| " | 7 | ඇටිටිලි | ඇවිටිලි |
| 121 | 12 | කත්‍රඃ | කතීඃ |
| 123 | 30 | අසු වි | අසු වී |
| 124 | 4 | නාඩගම | නාඩගම |
| 136 | 16 | ෂටකල | ස්වකල |
| 161 | 33 | මූලක්නම | මූලක්කම |
| 163 | 19 | කෙලඹට | කොළඹට |
| 165 | 22 | වඩබැද්ද | මඩබැද්ද |
| 170 | 28 | දේනුසර | දේනුපුර |
| 178 | 18 | දලයත්තෙනෝ | දලයත්තෙතේ |
| 194 | 2 | සේනාධිප | සේනාධිපති |
| 200 | 2 | පව්වාර් | පච්චාර් |
| 220 | 2 | සීමොන් නමෙල් | දොන් සීමොන් නමෙල් |
| 239 | 30 | නිඹේ | තිඹේ |
| 242 | 11 | කාරඑන්ත | කාරවත්ත |
| 244 | 19 | අළුත් කෝරලය | අළුත්කුරු කෝරලය |
| 245 | 28 | බෝස් බදුගර් | බෝස් මදුගෙ |
| 247 | 2 | කරුමේ | කරුවේ |

# අතීත ඉන්දියාව



හිමාලය
කෝසලරට
ශ්‍රාවස්ති නුවර
මිථිලා නුවර
විදේහ රට
පාටලිපුත්‍ර නුවර
කාසිරට
මගධ රට
අංග රට
රජගහ නුවර
කාමරූප
ගංගා නදිය
යමුනා නදිය
සුරසේන
කුරුරට
ඉන්ද්‍රප්‍රස්ථ නුවර
මාලව
වින්ධ්‍යා
නර්මදා
සුරාෂ්ට්‍ර
කාච්ච
සින්ධු
විදර්භ
දක්ෂිණාපථ
අපරාන්ත
මහාරාෂ්ට්‍ර
ප්‍රතිෂ්ඨාන
ගෝදාවරී ගඟ
මහා නදිය
කාලිංග
ක්‍රිෂ්ණා නදිය
වෛජයන්තිපුර
කොංගු දේශ
ආන්ධ්‍ර
පල්ලව
චෝල
කාවේරී ගඟ
කාංචිපුර
කේරල
පාණ්ඩ්‍ය
ලංකා

මේ පොතේ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 30 | පිටුවේ | 22 | පෙළේ | සිට | 32 | පෙළ | දක්වාද, |
| 18 | „ | 2 | „ | „ | 4 | „ | „ |
| 32 | „ | 3 | „ | „ | 19 | „ | „ |
| 34 | „ | 2 | „ | „ | 16 | „ | „ |
| 36 | „ | 3 | „ | „ | 4 | „ | „ |
| 153 | „ | 9 | „ | „ | 29 | „ | „ |
| 154 | „ | 3 | „ | „ | 5 | „ | „ |
| 259 | „ | 2 | „ | „ | 7 | „ | „ |
| 280 | „ | 2 | „ | „ | 5 | „ | „ |

අනාගත කොටස් වශයෙන් ලියා එවන ලද මුඛ පරම්පරා කථා බව සැලකිය යුතුයි.

කොළඹ "ග්‍රෑන්ඩ්පාස්හි" අක්කර 58 ක නොහොත් අමුනු 65 ක ප්‍රමාණ "මහවත්ත" නැමැති ගම්වරය ලද්දේද, පරතෝල්ඩස් දියෙස් අන්ද්‍රරාදි කියාද, ලුවිස් දියෙස් අන්දරාදි කියාද, මානුවෙල් දියෙස් අන්දරාදි කියාද තුන් ප්‍රකාරයට මෙහි ලියන ලද්දේ, එකී කරුණු උපුටා ගත් ඒ ඒ පොත්වල තිබුණු අන්දමට බව සැලකිය යුතුයි.

තවද පුස්කොළ පොත් සහ පැරණි මුද්‍රිත පොත් පත් වලින් උපුටාගත් කරුණු සියල්ලම ඒ ඒ පොත්වල ලියා තිබුණු පිළිවෙලට ම මෙහි යෙදුවෙමු.



මේ පො
80
18
82
84
86
153
154
259
280

අභ
මු

කො

අමුනු 65
මරතෝ
අන්දරාදි
ප්‍රකාරයට
ඒ ඒ පො

තවද
වලින් උප
තිබුණු පි

## නමඃ ශ්‍රී සඞ්ඝාය

### කුරු රට

කුරු රට වනාහි දඹදිව උතුරු දිග්භාගයෙහි පිහිටි දැනට ඉංදු දෙශයේ අග නුවරවූ "දිල්ලි" නගරය වන්නේය.

දඹදිව මධ්‍ය මණ්ඩලයෙන් උතුරු දිගට පිහිටි ශුබදායක රම්‍ය ජනපදය වූකලී "කුරුක්ෂෙත්‍රය" නම් වන්නේය. ගංගා හා යමුනා යන දෙනදිය අතර ඉහළ ප්‍රදෙශයෙහි පිහිටි රාජ්‍යය කුරුරට යයි ව්‍යවහාර කරනු ලැබේ. මේ කුරුරට බඳ කුරුක්ෂෙත්‍රය වනාහි කෞරව හෙවත් කරුවෙ "කුරු" සහ පාණ්ඩව යන සහෝදර රජ දරුවන්ගේ යුධ භූමියවේ.

හස්තිනා පුරයෙහි පටන් පංචාල දෙශය දක්වා ඇති රාජධානිය කුරු රටට අයිති වන්නේය. පුරාණ කාලයේ විසූ සංවරණ රජුගේ "කුරු" නමින් සිටි පුත් කුමර තෙමේ ගංගා සහ යමුනා යන නදී සන්ධිස්ථානය වන ප්‍රයාග තීර්‍ථ නම් තොටුපල සමීපයෙහි තම රාජධානිය පිහිටු වූයේය. ඒ නිසා එයට "කුරු රට" යයි නම් වීය.

1. "ගංගාද යමුනාඃ න ර
   මැදිවූ බිම සකි මනහ ර
   මසෙකුරුව සම ව ර
   එබිම විය පෙර මත්ස පුරව ර

2. මිරිදිය වලල්ල කි
   අතර තුර රට මබුල්ල කි
   ..................ජනපදය කි
   පසුව කුරු රට පසිඳු නාමෙ කි"

("මුක්කර හටන" පුස්කොළ පොතේ පිටපතකින් උපුටාගන්නා ලදී.)

"මත්ස්‍ය" යනු රිග් වේදයේ සඳහන්වී තිබෙන මනුෂ්‍ය වර්ගයකි. මහා භාරත ආණ්ඩු කාලයේ මෙම මත්ස්‍ය නැමැති

මිනිසුන් කුරු රටට දකුණු දෙසින් හා සූරසේනයට බටහිරින් පිහිටි ප්‍රදෙශයක වාසය කළෝය. මේ මත්ස්‍ය වර්ගයාගේ ජන්ම භූමිය වනාහි වත්මන් රාජපුටානාවේ (රාජපුත්‍ර) පිහිටි අල්වාර් රාජධානිය වේ."

වර්තමාන අල්වාර්වරු ඉහත සඳහන් මත්ස්‍ය වර්ගයාගෙන් පැවත එන්නන් බැව් මෙයින් පෙනේ.

(අද සිටින මත්ස්‍ය රජු වනාහි, ශ්‍රීමත් සර් තේජ් සිංහජී බහදූර් තුමාය.)

ඈත අතීතයේ සත්ව නාමයන්ගෙන් පෙනී සිටි මිනිස්සු දඹදිව සහ අන්‍ය රටවලද සිටි බව ඉතිහාසගත නොයෙක් කරුණුවලින් පැහැදිලිවේ. මෙයින් "රාජපුත්‍ර අල්වාර්වරු" මත්ස්‍ය නමින් හැඳින්වේ.

"MATSYA" The name of a people mentioned in the RIG-VEDA.

In the period of The MAHA BARATA they lived to the south of the KURUS and to the west of the SURASENAS. Their Country is the modern STATE of ALWAR in RAJAPUTANA and some adjacent DISTRICTS"

*(ANCIENT INDIA, BY E. T. RAPSON, M. A. Professor of sanskrit. University of Cambridge 1916)*

එමෙන්ම කුරුරට වාසිහු "හස්ති" නමින්ද මණිපුර වාසිහු "නාග" නමින්ද දකුණු ඉන්දියාණුන් "වානර" නමින්ද ලංකාවාසින් "රාක්ෂ" සහ "යක්ෂ" නමින්ද වංග දෙශින් "සිංහ" නමින්ද ව්‍යවහාරව වූසු බව නොයෙක් පොත පතින් පැහැදිලිවේ.

හලාවත පළාතේ සිංහල මිනිසුන් කොටසක් "වග" (ව්‍යාඝ්‍ර) නමින් අද දක්වා පෙනී සිටින්නාහුය.

එංගලන්ත වාසී පුරාණ බ්‍රිතන්වරුන් අතරද සත්ව නාමයන් ව්‍යවහාර කරණ පරපුරයන් මේ දක්වා වෙති.



එනම්:

| | | | | | |
|---|---|---|---|---|---|
| SWAN | ස්වාන් | හංසයා | PEACOCK | පීකොක් | මොණරා |
| CROW | ක්‍රෝ | කපුටා | COCK | කොක් | කුකුළා |
| ROBIN | රොබින් | සුවිත්තා | DUCK | ඩක් | තාරාවා |
| DRAKE | ඩ්‍රේක් | තාරාබෙනුම | BIRD | බර්ඩ් | පක්ෂියා |
| LARKS | ලාක්ස් | කෝකිල | CAMEL | කැමල් | ඔටුවා |
| WOLF | වුල්ෆ් | වෘකයා | FOX | ෆොක්ස් | හිවලා |
| LEO | ලියෝ | සිංහයා | FISHS | ෆිෂ් | මත්ස්‍ය |
| APES | ඒප්ස් | වානර | LEECH | ලීච් | කූඩැල්ලා |

යනාදී වශයෙනි.

උත්තරතඃ කෛලාසො හිමවාන් වසුමාන් ගිරිශ්‍රෘඞ්ගමාංශච:
ක්‍රෞඤ්චශ්චා මෙරුඃ කුරුවස්ත පෞනතරඃ ක්ෂුද්‍ර මීනාශච;
(වරාහ සංහිතාව)

කුරු දෙශය මධ්‍ය මණ්ඩලයෙහි උතුරු දිග පිහිටි බව මෙයින් දක්වන ලදී.

හස්තිනාපුර මාරභ්‍ය කුරු ක්ෂෙත්‍රාච්ච දක්ෂිණේ.
පඤ්චාල පූර්වභාගේතු කුරු දෙශඃ ප්‍රකීර්තිතඃ;
(මහා භාරතය.)

කුරුක්ෂෙත්‍රය කෙරෙන් දකුණු දිග පංචාල දෙශය කෙරෙන් නැගෙනහිර දිශාවෙහි හස්තිනාපුරය පටන් කුරු දෙශයයි කියන ලදී.

කුරු රටෙහි වටප්‍රමාණය සැතපුම් (1167) එක්දහස් එකසිය හැට හතකි.

(හුයං සැං චීන වන්දනාකරු)

දක්ෂිණෙන සරස්වත්‍යා දෘෂද්වත්‍යුත්තරෙණච,
යෙ වසන්ති කුරුක්ෂෙත්‍රෙ තෙ වසන්ති ත්‍රිවිෂ්ට පෙ;

(මහා භාරතය)

සරස්වතී නදිය කෙරෙන් දකුණෙහි ද දෘෂද්වතී නදිය කෙරෙන් උතුරෙහිද පිහිටියාවූ කුරුක්ෂෙත්‍රයෙහි යම් කෙනෙක් වසත් නම් ඔහු දිව්‍ය ලෝකයෙහි වසත් කියා මෙහි භාවය වේ.

ශිව ආගම් කාරයින්ගේ විශ්වාසයේ හැටියට කෘෂ්ණ රජහුගේ අවතාරය ගත් විෂ්ණු මේ කුරුක්ෂෙත්‍රයෙහිදී යුධිෂ්ඨිර යන නම් ඇති කෞරව හෙවත් කරාවේ කුමාරයාගේ පක්ෂයට බැඳී යුධකොට ජය ලැබූ භූමිය නිසා එම භූමි භාගය මිනිසුන්ගේ පව් සුඩ කටයුතු භූමියක් යයි කියත්.

“සරස්වතී දෘෂත්වත්‍යෝ දේවනද්‍යෝඃ දන්තරම්
තං දෙව නිර්මිතං දෙශං බ්‍රහ්මා වතීං ප්‍රවක්ෂතෙ;
මිතස්මිං දෙශෙය ආචාරඃ පාරම්පර්‍යඃ ක්‍රමා ගතඃ,
වර්ණානාං සාං සාන්තරාලාං ස සද්‍රචර උච්‍යතෙ,
කුරුක්ෂෙත්‍රව මත්ස්‍යාශ්ච පඤ්චාලඃ ශූර සෙනකාඃ,
එෂ බ්‍රහ්මර්ෂී දෙශො වෛ බ්‍රහ්මා වර්තා දනන්තරඃ,
එතද්දෙශ ප්‍රසූතස්‍ය සකාසාදග්‍ර ජන්මනඃ,
ස්වං ස්වං චරිත්‍රං ශික්ෂෙරං පෘථිව්‍යාං සර්ව්ව මානවඃ

(මහාභාරත)

සරස්වතී-දෘෂත්වතී - යන නම් ඇති උතුම් නදී දෙක මධ්‍යයෙහි දෙවියන් විසින් මවන ලද්දාවූ යම් දෙශයක් වේද ඒ දෙශය බ්‍රහ්මාවතී යයි. ඒ දෙශයෙහි ක්ෂත්‍රිය, බ්‍රහ්මණාදීන් මිශ්‍රවූ ජාතීන් තෙළවර කොට ඇත්තාවූ බ්‍රහ්මණ ජාතීන්ගේ යම් හැසිරීමක් පිළිවෙලින් පරම්පරා වශයෙන් ආයේද ඒ තෙම මනා හැසිරීම් යයි කියනු ලැබේ.

කුරුක්ෂෙත්‍රය, මත්ස්‍ය දෙශය, කාන්‍යකුබ්ජ දෙශය, මථුරා දෙශය යන මේ ජනපදයන් බ්‍රහ්මාවතීය කොරෙන් මඳක් අඩුවූ බ්‍රහ්ම ඍෂිදෙශය නම්. මේ දෙශයේ උපන්නාවූ බ්‍රහ්මණයාගේ සමීපයෙන් පොළෝ-තලයෙහි සියලු මනුෂ්‍යයෝ තමතමන්ට අයිතිවූ චාරිත්‍ර පිළි පැදීම් ඉගන ගතිත්වා යනුයි.

තද්‍රන්ත කාරත්න කයොර්‍ය දන්තරං
රාමාහ්‍ර දන්‍යාඤ්ච භචක්ත කස්‍යච,
එතත් කුරුක්ෂෙත්‍ර සමන්ත පංචකං
පිතා මහස්‍යොත්තර වෙදි රුච්‍ය තෙ,

(හරිවංශය)



කුරුක්ෂෙත්‍රය සහිත බිම් පහක් වටකොට ඇත්තාවූ භූමි ප්‍රදෙශය බ්‍රහ්මයාගේ උත්තර වේද යයි කියනු ලැබේ යනුයි. මේ භූමිය දොළොස් යොදුනක් බවද කියන ලදී.

බ්‍රහ්ම වෙදිඃ කුරුක්ෂෙත්‍රං පංචාරාම හ්‍රද්‍යන්තරම්,
ධර්ම ක්ෂෙත්‍රං කුරුක්ෂෙත්‍රං මාදශ යොජනාවධි,

පංචාලය නම් මහත් දෙශයකි. වාහ්‍යශ්ව රජුගේ මුද්ගල සෘඤ්ජය වෘහදිෂු - යවීනර කෘම් ලාශ්ව - යයි පුත්‍රයෝ පස්දෙනෙක් වූවෝ ය. මාගේ මේ පුත්‍රයෝ පස්දෙන මාගේ මේ ප්‍රදෙශය රක්ෂා කිරීමට පොහොසත්හුයි. පියරජු විසින් කියන ලද වචනය නිසා ඔවුන්ගේ දෙශය එතැන් පටන් පංචාලය යන නම් විය.

වාහ්‍යාශ්වන නයාඃ පඤ්ච බභූවුර මරොපමාඃ,
මුද්ගලඃ සෘඤ්ජය ශෛවච රාජා වෘහදි ෂූසතථ,
යවී නරශ්ච වික්‍රාන්තඃ කෘම්ලාශ්චශ්ච පඤ්චමඃ
පශ්‍යෙච්චතෙ රක්ෂණාලායාං දෙශානාම්තිනඃ ශ්‍රැතම්,
පඤ්චානාං විභි පඤ්චාලාං ස්ඵිතෙජිත පදෛජෘතම්,
අලංසං රක්ෂණේ තෙෂාං පඤ්චාලා ඉති විශ්‍රතාඃ,

(හරිවංශය)

හස්තිනාපුරය නම්, සුහොත්‍ර රජහට හස්තින් යන නම ඇති පුත්‍රයෙක් වූයේ ය. ඒ හස්තින් කුමාරයා විසින් කරණ ලද නුවර ඔහුගේ නාමයෙන් හස්තිනාපුරය නම් වියයි කියන ලදී.

සුහොත්‍රාඩස්තිය ඉදං හස්තිනාපුර
මාරොපයා මාස,

(විෂ්ණු පුරාණය)

මේ හස්තිනාපුරය පටන්ම කුරු රජවරුන්ට අයිති දෙශයයි කියන ලදී.

සවිතිශ්විත්‍ය මනසා පඤ්චාල්‍යාං ප්‍රති බුඩිමාන්,
ජගාම කුරු මුඛ්‍යානාං නගරං නාගසාහ්වයං,

(මහාභාරතය)

නුවණැත්තාවූ ඒ ද්‍රෝණ ඍෂිතෙම ද්‍රුපද රජුගේ ද්‍රව තොරෙහි සිතින් විනිශ්චය කොට කුරුරජවරුන්ගේ හස්තිනා පුර නම් නුවරට ගියේය යනුයි.

හස්තිනාපුරය කුරු රජවරුන්ගේ රටක් බව මෙයින් ප්‍රකාශවේ.

“බෝධිමණ්ඩලයට දකුණු දිග්භාගයෙහි අරිට්ට නුවරය, කුලසවුග නුවරය, අයෝශ්‍රියා නුවරය, කුරුරටය, බරණැස් නුවරය. කිඹුල්වත් පුර නුවරය යන මේ නුවරවල් හත පිහිටියේයි.

(වන්නි රාජවලිය සහ බණ්ඩාරවලිය පුස්කොළ පොත්)

## පඤ්චාල දේශය

“පඤ්චාලය කුරු රට හා සම්බන්ධයෙන් ගෙන කුරු පඤ්චාල යනුවෙන්ද නොයෙක් කාලයන්හි ප්‍රසිද්ධ විය පඤ්චාලයද කුරුක්ෂේත්‍රය වැනිවූම නොහොත් ඊටද විශාලවූ භූමි ප්‍රදේශයකි. මහාභාරතයෙහි පෙනෙන හැටියට පඤ්චාලයට මායිම්, උතුරෙන් සහ ඊසානයෙන් හිමාලය සහ කොශලයද නැගෙන හිරින් ශූරසේනය හා කන්‍යා කුබ්ජයද, දකුණෙන් වීරාටය, ශූරසේනය හා කුරුක්ෂේත්‍රයද බස්නාහිරින් සිංධු නදියද විය. මේ විශාල ප්‍රදේශය උත්තර පඤ්චාලය දක්ෂිණ පඤ්චාලය කියා දෙකොටසකින් යුක්තවිය. උත්තර පඤ්චාලයෙහි අහිච්ඡත්‍රය අගනුවර විය. දක්ෂිණ පඤ්චාලයෙහි කාම්පිල්‍යය අග නුවර විය. මෙකල අහිච්ඡත්‍රය අහිචාතර් නමින් ප්‍රසිද්ධය. කාම්පිල්‍යය කම්පිල් නමින් ප්‍රසිද්ධය.

අහිච්ඡත්‍රයෙහි ඉතිහාසය ක්‍රි: ව: 1430 කට පෙර සිට පටන් ගනු ලැබේ. කුරු පාණ්ඩව යුද්ධය කෙරෙන්නට ඇතැයි සිතෙන්නේ යථෝක්ත කාලයේදී ය. කුරු පාණ්ඩව යුධයටද පෙර පඤ්චාලයෙහි ද්‍රැපද නම් රජකු රජකළ බැව් පෙනේ.

අහිච්ඡත්‍රයට “අහික්ෂේත්‍රය” කියාද ව්‍යවහාර විය නාගයන්ට ක්ෂේත්‍රවූ හෙයින් අහික්ෂේත්‍රය වියයි ඇතැමෙක් කියයි. මෙහි රාජධි නම්වූ නරපතියෙකුට නාගයෙකු විසින් සවකීය භෝගාවලියෙන් සෙවන දුන් හෙයින් අහිච්ඡත්‍රය වියයි තවත් කෙනෙක් කියති.



පාණ්ඩවයන්ට යුද්ධ ශිල්පය ප්‍රගුණ කැරවූ ද්‍රෝණාචාර්යයන් විසින් දෘපද රජුගෙන් පඤ්චාලය ජයගත් බවත් එසේ ජයගෙන, නැවත දෘපද රජුට දක්ෂිණ පඤ්චාලයදී තමන් උත්තර පඤ්චාලය පාලනය කළ බවත් දක්නා ලැබේ

හියුං සියැංගේ වාර්තාවේ හැටියට මෙතැන නගරයෙන් පිට “නාග හෘදය” නම් විලක් තුබුණු බවත්, එහි නාරජුගේ ආරාධනයෙන් තථාගතයන් වහන්සේ සත් දිනක් ධර්මදේශනා කළ බවත්, එය සිහිවීම පිණිස අශෝක අධිරාජයන් විසින් චෛත්‍යයක් කළ බවත් පෙනේ. දැනට මෙහි “ඡත්‍ර” නම් චෛත්‍යයක සුන් බුන් දක්නා ලැබේ.

## මත්ස්‍යය

මෙහි අගනුවර වීරාට නම් විය. මේ අගනුවර නමින්ම මත්ස්‍ය දේශයට ද වෛරාටයයි කියන ලදී. වර්තමානයෙහි මත්ස්‍යය, බෛරාට් (Bairat) නමින් ප්‍රසිද්ධය. දිල්ලියට වයඹ දිගින් හැතැප්ම 105 ක් ගිය තැන නොහොත් ජයපුරට උතුරෙන් හැතැප්ම 41 ක් ගියතැන මේ පිහිටා ඇත්තේය. ඉන්ද්‍ර ප්‍රස්ථයෙන් විප්‍රවාසයට පැමිණි පඤ්ච පාණ්ඩවයෝ මේ විරාට පුරයෙහි දොළොස් අවුරුද්දක් වාසය කළහ.

මත්ස්‍ය දෙශ වාසින්ද රණ කාමි වර්ගයක් බවත් යුද්ධයෙහි අති දක්ෂ බවත් කියනු ලැබේ. යුද්ධ සේනාවක් බල සම්පන්න වෙන්නට නම් එහි පෙරමුණ කුරුක්ෂේත්‍රයෙහි හෝ මත්ස්‍යයෙහි හෝ පඤ්චාලයෙහි හෝ කන්‍යා කුබ්ජයෙහි හෝ ශූරසේනයෙහි හෝ උපන් යොධයන්ගෙන් යුක්ත විය යුතු බව මනුනීතියෙන්ද ප්‍රකාශවේ

## සූරසේන

ශූර සේනයෙහි අගනුවර මධුරා නම් වීය. වර්තමානයෙහි මේ "මුද්‍රා" නමින් ප්‍රසිද්ධය මෙය දිල්ලියට දකුණෙනුත් බෙරාවියට නැගෙන හිරිනුත් පිහිටා තිබේ එහෙත් පැරැණි මධුරා පුරය පිහිටියේ මෙතනම නොවේ. ජල-ප්‍රවාහයෙන් එතැන යටවී තිබෙනහෙයින් පැරැණි නුවර සුත් බුත් දූන් බැලිය නොහැක. මේ අතීතයෙහි දෛත්‍ය-යන්ගේ හෙවත් අසුරයන්ගේ රාජධානියක් විය මෙහි මධු නම් අසුර රජෙකු රජ කළ හෙයින් මධුරා නම් විය. ඒ මධුරාජයාගේ පුත්‍ර තෙමේ ලවණ නම් වීය.

ඔහු මධුරා පුරයෙහි රජ කරණ කල දශ රථ පුත්‍ර රාම කුමාරයන්ගේ සහෝදරවූ ශත්‍රැඝ්න කුමාරයන් විසින් මරණු ලැබීය. ශත්‍රැඝ්නයන්ගේ පුත්‍ර ශූර සෙන නම් කුමාරයන් නිසා මධුරයට අයිති රට ශූර සෙන නම්වූ බව වායු පුරාණයෙහි දක්නා ලැබේ. තවද කෘෂ්ණයන් පිළිබඳ ඉතිහාසයෙහි, කෘෂ්ණ තෙමේ ශූරසෙන රජුගේ මුණු-බුරු බවත් ඔහු මධුරයෙහි වුසු රාජකාංශ නම් සතුරු රජෙකු නසා එය යටත් කළ බවත් ඊට ශූර සෙන පරම්පරාවෙන් ලැබුණු පිහිට නිසා ඔවුන්ට රට අයිති කරදී ඔවුන් නමින් රටට ශූර සෙන යයි නම් කළබවත් දක්නා ලැබේ.

මීටම මථුරායයිද කියති. හේ පෙශාවි ව්‍යවහාරයකි දකුණු ඉන්දියාවේ පඬිරටේද මදුරා පුරයක් ඇත්තේ ය. ඒ මේ මදුරා පුරය නොවන බැව් සැලකිය යුතුයි. දක්ෂිණා පතයෙහි පඬිත් සතු ඒ මදුරා පුරය මෑත ඇති-වූවකි. පඤ්චාලයට යාබද උතුරෙන් මදුරට නමින් ප්‍රසිද්ධවූ ප්‍රදෙශයක් වීය. හෙද මේ මධුරා පුරය නොවන බැව් සැලකිය යුතුයි. ඒ "මද්‍ර" දෙශය අනෙකකි ශාකල නගරය එහි රාජධානිය වීය. මදුරට සාගල නුවර ගැන කුසජාතකයෙහි සඳහන් වේ. තවද මිලින්දප්‍රශ්ණයෙහි පැනෙන මිළිඳු රජ රජකොළේද මේ සාගල නුවරය. මේ



මද්‍ර දෙශය සහ ශාගල නගරයත්, එහි වුසු වාහීක නම් ජනතාවක් ගැන කියයුතු බොහෝ විස්තර ඇත්තේ ය. අපගේ පෞද්ගලික හැඟීම් නම් දූන් මේ, මොහන්ජදාරෝ සුත් බුත් දක්නා ලැබෙන්නේ ඒ සාගල පුරය පිහිටි තැන බවයි.

මේ සොළොස් මහ ජන පදයට ඒ ඇතුලත් නැති බැවින් විස්තර නොදක්වමු"

(ලංකා සමය පත්‍රය 16. 1. 37)

## කුරුකුල උපත

සෘක්ෂාත් සංවරණෙ ජඥෙ - කුරුඃ සංවරණත්තථා,
යඃ ප්‍රයාගාදති ක්‍රම්‍ය - කුරුක්ෂෙත්‍රං චකාරහ;
පුණ්‍යඤ්ච රමණීයඤ්ච - පුණ්‍ය කෘද්භිනිර් ෂෙවිතං,
තස්‍යාන්වවායඃ සුමහාන් - යස්‍ය නාම්නා සත්කෞරවඃ;
(මහාභාරත)

සෘක්ෂ රජුතෙරෙන් සංවරණ කුමාරයා උපන්නේය'

සංවරණ තෙරෙන් කුරු කුමාර තෙම උපන්නේ ය. ප්‍රයාගතීර්ථය ඉක්මවා සුචරිතයෙහි යෙදෙන්නාවුන් විසින් ආශ්‍රය කරණ ලද්දවූ සිත් කළුවූ පුණ්‍ය භූමියක්වූ කුරු-ක්ෂෙත්‍රය මේ රජතෙමේ කොළේ ය. කෞරව හෙවත් ^කරුව නම් ඇති සමූහයා යමෙකුගේ නාමයෙන් වූවෝද

---

^ භරත වංශය

"MAHABHARATA means" the great narrative of the battle of the *Bharatas*. The *Bharatas* are already mentioned in the Rig Veda as a warlike tribe, and in the *Brahmanas* we come across *Bharata*, the son of *Duhsanta* and *sakuntala*, who are regarded as the ancestors of the royal race of the *Bharatas*. The home of these *Bharatas* or *Bharatas* was in the country of

the upper *Ganges* and the *Jumna*. Among t
descendants of *Bharata*, a Ruler named *Kuru* w
speacilly prominent, and his descendants, t
*Kauravas (Kuruides)* were so long the ruling ra
of the *Bharatas*. that the name *Kuru* or *Kaura*
in the course of time assumed the character
a name for the tribe of the *Bharatas*, and the
land is that *Kuruksetra* or "*Kuru-Land*"

(A History of Indian Literature. VOL 1 Page 317)

මෙහි කෙටි විස්තරය:-

"මහ භාරත" යනු භාරතවරුන්ගේ (කුරු සහ පාණ්ඩ
වර) මහා සංග්‍රාමය විස්තර වන කථාවයි. භරත වර්ගයා එක
හෙලාම යුධකාමී ගොත්‍රයක් බව ඍග්වේදයේ දක්වා ඇත්තේ
ය. භරත යනු දුෂ්මාන්ත සහ ශකුන්තලාගේත් පුත්‍රයා බව
'බ්‍රහ්මණයෙහි' සඳහන් වී තිබෙන බව අපට පෙනීයයි
මේ භරත තෙම භාරත රජවංශිකයන්ගේ ආදි පීතෘම
රයාය. ගංගානම් නදියෙහි සහ යමුණා නදියෙහි උ
කොටසට ඇතුලත් ප්‍රදේශයෙහි මේ භරත නොහො
භාරත වර්ගයාගේ ජන්ම භූමිය වන්නේ ය. භරත ගෙ
පැවත ආ පරපුරෙන් කුරු නම් රාජ්‍ය පාලක තෙ
විශෙෂ ස්ථානයක් ගෙන තිබේ. මොහුගෙන් පැවත එ
දරු මුණු-පුරු ආදි කොට ඇති පරම්පරාවටම කෞරව
යෝයි (කුරුයිද) කියති.

මොවුන් වනාහි දීර්ඝ කාලයක් භාරතය ආණ්ඩුක
වංශයයි. කාලාතික්‍රමණයෙන් මේ භරත වංශය වූ ක
කුරු හෙවත් කෞරව වංශයයි ප්‍රසිද්ධවිය. කුරු-ක්‍ෂෙත්‍ර
හෙවත් කුරුරට වනාහි ඔවුන්ගේ රාජධානිය වන්නේය
යනුයි.



ජ්‍යවූ කෞරව යන ගොත්‍රය තෙම ඒ කුරු රජුගේ
ංශය වෙයි කියාවේ. කුරු රජගෙන් ඉපිද පැවැත
ගේනාවූ දරු මුණුපුරු පරම්පරාවේ සමූහයා කෞරව යනා
ම ඇතිවූවෝයි යනු ශ්ලොකයේ අර්ථයි.

කෞරව යන ශබ්දය කුරු රාජ පරම්පරාව යන්නෙ-
ද කෞරව යන්න කුරුරාජ වංශය යනු ශබ්දස්තෝම
යා නිඝණ්ඩුයෙහි ප්‍රකාශිතයි. ශබ්දාම්බුධියෙහිද එය එලෙසම
ශිතයි. කෞරව යන්නම සමහර තැනක කෞරව්‍ය
යාද දක්නා ලැබේ. කෞරව ශබ්දය බිදී සිංහල ශබ්දය
කාරවයයි පෙරළී ඇති බැව් පෙනී යන්නේ "කෞ"
න අක්ෂරය සිංහල භාෂාවේ නැති බැවිනැයි සිතමු.

අන්‍ය භාෂාවකින් තවත් භාෂාවකට බිදී එන ශබ්ද-
න්ගේ එබඳු වෙනස්කම් ඇතිවීම ස්වභාවිකයි "කෞරව"
න ශබ්දය පාළිභාෂාවෙන් දක්නාවිට "කොරව්‍ය" කියාද
මහර ප්‍රාකෘති භාෂාවලින් ...උරව-කාඋරම කියාද වෙනස්
වනස් ආකාරයන් ගෙන් ව්‍යවහාරව පැවතෙන බැව්
රරුචි ආචාරි තෙම කියේයි.

"කුරෝරපත්‍යං කෞරවඃ" යනු කුරුගේ පුත්‍ර තෙම
කෞරව" නම් වෙයි යන මේ අර්ථයෙහි කෞරව යන්න
කුරු" යන්නෙන් උපන් බැවින් දූන් "කුරු" කාවරෙක්
යි නැවතත් විස්තර කර බැලීය යුතුයි.

'කුරු" යනු චන්ද්‍රවංශයෙහිවූ රජකෙනෙක් යයි ශබ්ද-
නාම මහා නිඝණ්ඩුයෙහි කියන ලදී. සංවරණ රජුගේ
ත්‍රයා කුරු යයි මුලින් සඳහන් වී ඇත. මේ චන්ද්‍රවංශික
කුරු රජගෙන් පැවැත එන පරම්පරාවට කුරුකුලය
යාද "කුරු" වංශය කියාද කෞරව වංශය කියාද සාමා-
න්‍යයෙන් කාරාව කියාද ව්‍යවහාර කරණු ලැබේ.

(වැලිගම ශ්‍රී සුමංගල ඉතිහාසය)

---

A කෞරව-කාරාවේ අය. හෙවත් කුරු රජුගේ වංශයෙහි
ක්‍ෂත්‍රියයා.

අමරශබ්දාවලී-නම්වූ සංස්කෘත සිංහල අකාරාදිය පිටු 66.)

" The Venerable Rsi *Dvaipayana*, also called *Vyasa*. This same Rsi is also said to be the compiler of the four Vedas and the author of the Puranas. According to the legend, he was not only a contemporary, but also a close relative of the heroes of the Mahabharata.

He is the son of a famous ascetic, the Rsi *Parasara*. The great saint one day catches sight of *Satyawati*, who came to the world in a fish and was brought by fisherfolk, and is so charmed with her beauty that he desires her love. But she will yield to him only on the condition that, after she has borne him a son, she may regain her maidenhood. The great saint grants her this wish, and also the wish that she may lose her fish-odour and may diffuse a wonderful perfume. Immediately' after he has co-habited with her, she gives birth to a son, on an island in the *Jumna*, who is named *Dvaipayana*, " the island - born"

The boy grows up and soon gives himself up to ascepticism. When taking leave of his mother he tells her that he will appear immediately at any time she needing him, thinks of him. *Satyawati*, however once more a virgin, later on became the wife of the *Kuru* King, *Santanu*"

(A History of Indian Literature, by Maurice Winternitz. Ph. D Vol 1 Page 322)

මෙහි සංක්ෂේප විස්තරය නම්:-

A "කෘෂ්ණ ද්වෛපායන නොහොත් ව්‍යාස මුණිවරයා චතුර්වේදයෙහි' සහ 'පුරාණ' නැමැ

---

A කෘෂ්ණද්වෛපායන නොහොත් ව්‍යාස මහ ඍෂිවරයා නමින් පෙනී සිටින කුරුකුල පරම්පරාවල් වර්තමාන කාලයේ ද ඉන්දියාවේ සහ ලංකාවේ ද සිටිති. ඔවුන්ට ද්‍රවිඩ භාෂාවෙන් "තීවාන්" නොහොත් "දීවාන්" යයි කියති එහි අර්ථය ද්වෛපායන වේ.



ග්‍රන්ථාදියෙහි කර්තෘවශයෙන් ද සලකනු ලැබේ. පැරණි භාරතවස්තුන්හි පෙනියන අන්දමට ඔහු ශාස්ත්‍රධාරියෙක්ම පමණක් නොව මහා භාරතයෙහි විස්තරයවන රණසූරයන්ටද ලේ සබඳ නම් ඇති ඥාතිවරයෙකි.

සුප්‍රසිද්ධ පරාශර මහා මුණිවරයා මෙතුමාගේ පියාණෝය. මත්ස්‍යයෙකුගේ ගර්භයෙන් මෙලොව එළිය ලැබ මසුන් මරන්නන් විසින් හදා වඩාගත් රූප සම්පන්න සත්‍යවතී නැමැති කුමරිය පරාශර මුණිවරයා විසින් එක්තරා පොරොන්දුවක් පිට පාවාගන්නා ලද්දේ ය. එනම්:- පරාශර මුණිවරයාට දූව සත්‍යවතී තොමෝ පුත්‍රයෙකු වදා දුන් පසු නැවතත් ඇගේ කන්‍යාභාවයට පත් කර දීමේ පොරොන්දුව පිටය.

නොබෝ දිනකින් සත්‍යවතිය පුත්‍රයෙකු ලදින් එවෙලෙහිම ඇ පරාශරගේ ආනුභාවයෙන් නැවැතත් කන්‍යාභාවයට පත් කරණ ලදී. යමුණා නදියෙහි පිහිටි ද්වීපතනෙමම උත්පත්තිය සිදුවූ බැවින් ඔවුන්ගේ පුත්‍රයාට ද්වෛපායන නම් විය. කල් යත් යත් ද්වෛපායන වැඩි වයසට පත්වී මුණිවරයෙක් විය. පියාණන්වූ පරාශර මුණිවරයා හා යන්ට පිටත්වූ ද්වෛපායන, සත්‍යවතී නැමැති සිය මවගෙන් සමුගෙන මෙසේ කීයේ ය. "මෑණියනි! ඔබට මාව දැක්මට කැමැති වේලාවක මගේ නම පමණක් මතක් කළ පමණින් ඔබ සමීපයෙහි පෙණී සිටිමි" යනුයි.

නැවතත් කන්‍යාභාවය ලැබ සිය ශරීරයෙන් සුගන්ධය වහනය වන අතිරූපී සත්‍යවතී කුමරිය දෙවැනිවරට සුප්‍රසිද්ධ ශාන්තනු නැමැති කුරුරජයා හා විවාහවිය" යනුයි.

## THE DESCENT OF THE KAURAVAS AND THE PANDAVAS

In the land of the *Bharatas* there once ruled a king of the house of the *Kurus*, *Santanu* by name. By the goddess **Ganga* who had become a mortal woman,

---

* ගංගා මහනදියෙහි ආරූඪවූ දෙව්දුව

this king had a son called *Bhisma*, whom he had appointed as his successor to the throne. One day, when the later had already grown up into a superb hero endowed with all warlike virtues, *Santanu* met the beautiful fisher girl *Satyawati*, fell in love with her and desired her as a wife. Her father, the king of the fisherfolk, would however, only give her to him on condition that the son born by his daughter should inherit the throne.

But *Santanu* would not consent to this, though he found it difficult to give up his beloved. Now *Bhisma* soon noticed how depressed his father was, and when he had learned the cause of this depression, he himself went to the king of the fishermen to woo Satyawati on his father's behalf: He not only announces his intention to renounce his right to the throne, but takes a vow of chastity, so as to make it impossible for any son of his to claim the throne, whereupon the fishermen gladly gives him his daughter. So *Santanu* marries *Satyawati* and has two sons by her, *Citrangada* and *Vicitravirya* Soon after this *Santanu* died and young *Citrangada* was killed in battle by a *Gandharva:* then *Bhisma*, as the senior of the family, annointed *Vicitravirya* as king. The later however died young and without issue, though he had two wives. In order that the race may not die out, *Satyawati* begs *Bhisma*, to beget descendants by the surviving widows of *Vicitravirya*, in accordance with the ancient usage of the *Levirate*. But *Bhisma*, mindful of his vow of chastity, declares that hough the sun may give up its brilliancy, the



fire its heat, the moon may give up the coolness of its rays, the god Indra his bravery, and the god Dharma his justice, he could never brake his promise

Then *Satyawati* remembers her illegitimate son *Vyasa*, and with *Bhisma's* consent invites him to see to the propagation of the race. And as we have already seen the saint *Vyasa* begets *Dhrtarastra*, *Pandu* and *Vidura*.

As *Dhrtarastra* was born blind, the younger brother *Pandu* became king. *Dhrtarastra* married *Gandari*, daughter of the king of Gandhara, and she bore him a hundred sons, the eldest of whom was named *Duryodana*. *Pandu* had two wives, *Prtha* or *Kunti*, daughter of a king of the *Yadavas* and *Madri*, sister of *Salya* king of the Madras. *Kunti* bore him three sons: *Yudhistira*, the eldest *Arjuna* and *Bhima*, who was born on the same day as *Duryodhana*, whilst *Madri* gave birth to the twins *Nakula* and *Sahadeva*".........

*Pandu* killed a pair of antelopes at time of copulation. In reality, however, it was a *Risi* who had assumed the form of an antelope order to enjoy love.

This *Risi* now pronounces a curse that *Pandu* shall die during the enjoyment of love. *Pandu* therefore ditermines to lead the life of an ascestic, and to renounce sexual pleasures. In order to provide descendants, however, *Kunti* invokes the gods to beget children with her.

*Dharma* * the god of justice, beget *Yudhistira* with her, *Vayu* the god of the wind, begets strong *Bhima* and *Indra*, the king of the gods begets *Arjuna*. At *Kuntis* request the two *Asvins* cohabit with *Madri*, and begets the twins *Nakula* and *Sahadeva*, with her

(A History of Indian Literature Vol I Page 328 & 329)

* Dharma, the god of death & the god of justice

මේ සත්‍යවතී කුමරිය මච්ච කොන්ත යන අතුරු නාමයකින්ද පෙනී සිටි බව සැලකිය යුතුයි. ද්‍රවිඩ භාෂා වලින් ලියන ලද මහා භාරත පොත් වල සත්‍යවතී කුමරිය අඳුන්වා දී තිබෙන්නේ මච්ච කොඬි නොහොත් මච්ච කොංති කියව නමිනි.

මෙය "මත්ස්‍ය කෞංතිය" යන සංස්කෘත ශබ්දය ද්‍රවිඩ ශබ්දයට පෙරලා තිබෙන ආකාරයයි සිතිය හැක. මේ පිළිබඳ "මහපදරංග ජාතකය" නැමැති පුස්කොළ පොතෙහි පැනෙන කවි කීපයකින්ද "මච්ච කොන්තිය" යන නාමය මේ කුමරියට ව්‍යාවහාර කළ බව පෙනේ.

ඒ මෙසේ යි.

1 "එනැවි තොට තිනි යෙ ත
සවි සත එගොඩ කර ව ත
මච්ච කොන්තිය ය ත
රජ දුවක් නැවි පදින සැම දි ත

2 ඒ මුනිවර සතු ට
පවසන තෙපුල් තිසි තො ට
මච්ච කොන්තිය හ ට
බැතිව මන් සැප විඳින විලස ට"

(කොළඹ කෞතුකාගාර පුස්තකාල අංක AN 15. මෙම පොත දෙවන රාජසිංහ රජු දවස සිටි කොබ්බෑ-කඩුවේ මහා සවාමී විසින් සිංහල කාව්‍යයට නගන ලදි)

මච්ච කොන්තිය නොහොත් සත්‍යවතී නැමැති මේ කුමරිය මත්ස්‍යයෙකුගේ කුසින් උපන්නියක් බව අපි ඉඟත සඳහන් කෙලෙමු. එහෙත් මෙය ඇදහිය නොහැකි තරම්ය. මහා භාරතයේ මසුන් මරන්නන්ගේ රජුයයි දක්වෙන්නේ මැගේ පියාටය. මහා භාරතයේ මසුන් මර-න්නන්ගේ රජු වශයෙන් ව්‍යාවහාර වන මොහු වනාහි කුරුරටට දකුණු දෙසින් පිහිටි යා බද රාජධානිය වන මත්ස්‍යදෙශයේ එවකට සිටි මත්ස්‍ය රජු විය හැක. එකල "කුරු" "මත්ස්‍ය" දෙරටක් සේ පෙනෙතත් ඇත අතීතයේ



දනට කුරුරටට අයත් පෙදෙස් සම්පූර්ණයෙන්ම වාගේ මත්ස්‍යපුරය නමින් පැවැති බව "මුක්කර හටණ" නැමැති ග්‍රන්තයෙන්ද පැහැදිළි වෙයි.

මෙම මත්ස්‍ය දෙශයේ රජුට මත්ස්‍ය රජ කියාද ඔහුගේ දුහිතෘවට මත්ස්‍යා කෞන්තිය කියාද ව්‍යවහාර කරන්ට ඇත. පුරාණ ඉන්දියා දෙශයේ "මහභාරතය කාව්‍යයෙන්" එවකට තිරුකුල දෙශය (කුරු-මත්ස්‍ය, සුරසේනය ආදි) සම්බන්ධ රාජධානීන් පිළිබඳ අනාවරණය කරණ විස්තරයන්හි එහි පැවතෙන්නන් චන්ද්‍රවංශිකයන් බව හඳුන්වයි.

ඒ නිසා මත්ස්‍ය පරපුරද චන්ද්‍රවංශිකයෝ විය යුතු. මහභාරත කාලයේ සහ ඊට පසු කාල වල සිටි රජවරු-න්ගේ නාමයන්ම සිය දියණිවරුන්ටද ව්‍යවහාර කර තිබෙන බව මහාභාරතයෙන් සහ රාමායණයෙන්ද පෙනී යයි. එනම්:-
පංචාලයෙහි දෘපද රජුගේ දියණිය දෘපදී, නමින්ද ගාන්ධාර රජුගේ දියණිය ගාන්ධාරි නමින්ද ජනක රජුගේ දියණිය ජානකී නමින්ද පෙනී සිටියෝ ය. එමෙන්ම මත්ස්‍ය රජුගේ දියණියද මත්ස්‍ය කෞන්ති නමින් පෙනී සිටි බව වටහාගත හැක.

සත්‍යවතී හෙවත් මත්ස්‍ය කොන්ති (මච්ච කෞන්ති) කුමරිය දෙවන වරට ශාන්තනු නැමැති රජු හා අවාහ පත්වූ බව මෙහි මුලින් දක්වීන ශාන්තනු රජ වනාහි මෙහි මුලින් විස්තර කළ "කුරු" රාජයාගේ පරම්පරාවෙන් පැවැත එන්නෙකි. එය මෙසේ දතයුතුයි.

කුරු රජුගේ පුත් ජන්හුද, ජන්හුගේ පුත් සුරථද, සුරථගේ පුත් විදූරථද විදූරථගේ පුත් සාර්වභෞමද, සාර්-වභෞමගේ, පුත් ජයසේනද ජයසේනගේ පුත් ආරාවින්ද, ආරාවින්ගේ පුත් ආයුතායුස්ද, ආයුතායුස්ගේ පුත් අක්‍රොධනද, අක්‍රොධනගේ පුත් දේවාතිතිද දේවාතිතිගේ පුත් ඍක්ෂද, ඍක්ෂගේ පුත් භීමසේනද, භීමසේනගේ පුත් දිලීපද, දිලීපගේ පුත් ප්‍රතීපද, ප්‍රතීපගේ පුත් ශාන්තනු කියාද' යනුයි.

"සාන්තනුස්ච භව ද්‍රජ කෞරවණාං ධුරන්ධරඃ"
(මහාභාරත)

"සාන්තනු රජුගෙන් පැමැත ආවෝ ලෝකයෙහි අති-ශයින් ප්‍රසිද්ධවූ, බලසම්පන්නවූ, කෞරවයෝ වූවෝය" යනු මෙහි භාවාර්ථයි.

මේ ශාන්තනු නම් කුරුකුල රජතෙම කඩු දුනු තෙප් යනාදියෙන් සන්නද්ධව වනගත මුව හුරු ඇත්, වග වලස් ආදී සතුන් දඩයම් කිරීමෙහි ලොල් පාපයට භය රහිත යුද්ධයෙහි අතිසූරයෙක් බැව් මහාභාරතයෙහි කියා තිබේ.

පරාශර මුණිවරයාට දාව මත්ස්‍ය කෞන්ත හෙවත් සත්‍යවතී නැමැති කුමරිය කුසින් ව්‍යාස නම් මහා ඍෂි තෙම උපන්නේ ය. ඔහුට සංස්කෘත භාෂාවෙන් කෘෂ්ණ-විපායන කියාද ද්‍රවිඩ භාෂාවෙන් වේද ව්‍යාසර් කියාද ව්‍යාවහාර කරණු ලැබේ. මේ කථාව මීට ඉහතින්ද කියා ඇත.

පරාශර මුණිවරයාගෙන් පසු මච්ච කොන්ත හෙවත් සත්‍යවතී තොමෝ ශාන්තනු නැමැති කෞරව තොහොත් භාරතවේ සුප්‍රසිද්ධ රාජයා හා ද්‍රවත වරට විවාහ විය. මච්ච කොන්ත බිසව මේ රජුට දාව චිත්‍රාංගදය විචිත්‍ර වීරිය, ය යන කුමාරයින් දෙදෙනෙකු ප්‍රසූත කොළේ ය. කල්යාමෙන් විචිත්‍ර වීර්‍ය කුමරු කාශි රජුගේ දියණිවරුන්වූ අම්බිකා සහ අම්බාලිකා යන කුමරියන් දෙදෙන සරණ කර ගත්තේ ය. එහෙත් මෙකුමරු තරුණ වියෙහිදීම මරු මුවට පත්විය මොහුගේ සහෝදර චිත්‍රාංගද කුමර තෙම ගාන්ධර්ව හා කරණ ලද සටහණකින් මරුමුවට පත්ව සිටි හෙයින්ද විචිත්‍ර වීර්‍ය, කුමරුට පුත්‍ර දුහිතෘ ඈ කිසිවෙක් නොසිටි බැවින්ද කෞරව පරපුර, දියුණුව ගෙනයාමට මහත් බාධාවක් ඇතිවිය.

එහෙත් ශාන්තනු රජුට දාව ගංගාදේවී විසින් උපදනු ලැබූ භීෂ්ම නම් තවත් පුත්‍රයෙක් සියේ ය. ශාන්තනු රජුගේ මරණින් පසු කුරුරට සිංහාසනයට උරුම නොකීමට භීෂ්ම කුමරු ඛිවිසුම්කාට බැඳී සිටි සෙයින් පුත්‍ර ලාභයක් ගැන ඔහුද නොසැලකුවේ ය.

කරුණු මෙසේ හෙයින් මච්ච කොන්ති තොහොත් සත්‍යවතී බිසවට ඇගේ වැඩිමහල් පුත්‍ර ව්‍යාස ඍෂිහු සිහිවී ඔහුගේ සරණ ලබාගන්ට සිදුවිය.

"සවකීය මැණියන්වූ මච්ච කොංත හෙවත් සත්‍යවතී බිසවගේ නියෝග ප්‍රකාර ව්‍යාස ඍෂිතෙම තම සොහොයුරු විචිත්‍ර වීරියගෙ අම්බිකා නම් බිසව කෙරෙන් ධ්‍රතරාෂ්ට්‍ර කුමාරයාද අම්බාලිකා බිසව කෙරෙන් පාණ්ඩු නම් කුමාරයාද මැණියන් විසින් නිදහස් කර එවන ලද දාසිය කෙරෙන් විධුර කුමාරයාද ඉපද වූයේ ය."



ධ්‍රතරාෂ්ට්‍ර කුමාර අන්ධවද පාණ්ඩු කුමර සුදුමැලිවද A විධුර කුමර ඥාණවන්තවද උපත ලැබූවන් බව මහාභාරතයෙහි සඳහන් වී ඇත.

ධ්‍රතරාෂ්ට්‍ර කුමර ගාන්ධාර දෙශි රාජ දුහිතෘව සරණ පවා නත්තේ ඔහුට දාව සියක් පුතුන් හා දියණියක් ද ඇට ලැබුනාය ඉන් වැඩිමහල් පුත් දුර්යෝධන නම් ශ්‍රේෂ්ඨ කුමරවිය.

පාණ්ඩු කුමර තෙම කෞන්තය හෙවත් කුංතී නම් කුමරියක් සරණ පාවා ගත්තෝ ඈ කෙරෙන් යුධිෂ්ඨිර, භිමසේන, හා අර්ජුණ, නම් පුත්‍රයෝ තිදෙනෙක්ද මාද්‍රිය නම් දෙවන බිසවක් කෙරෙන් නකුල සහ සහදේව යන පුත්‍රයෝ දෙදෙනෙක්ද ලද්දාහු ය.

කෞංතය හෙවත් කුංතිය බිසව කන්‍යා අවදියේ දෙවාශිර්වාදයෙන් 'කර්ණ' නම් පුත්‍රයෙක් ලත්හි එම කුමරු ගඟට පිසිකරණ ලද්දේ වෙයි ධ්‍රතරාෂ්ට්‍ර රජු විසින් මේ ලේ කැටි කුමර දැක අවුලා සූතපෙම්න් ඇති දැඩි කොළේයි.

ධ්‍රතරාෂ්ට්‍ර රජුගේ පුත්‍රයින් වන දුර්යෝධන දුක්ශාසන යන දෙදෙන ප්‍රධානවූ සියක් කුමරුවන් ඔවුන්ගේ දහහත් වැනි මුත්තනුවූ 'කුරු' නොහොත් කෞරව රජුගේ නාමයෙන් කුරු කුලයෝය. කුරු වංශිකයෝය කෞරව වංශිකයෝය කියා ප්‍රසිද්ධ විය.

පාණ්ඩු රජුගේ පුත්‍රයින්වූ යුධිෂ්ඨිර, භිමසේන, අර්ජුණ නකුල, සහ සහදේව යන කුමාරවරු පස්දෙන සිය පියාණන්ගේ පාණ්ඩු නාමයෙන් පාණ්ඩවරු යයි ප්‍රසිද්ධවිය.

එහෙත් ධ්‍රතරාෂ්ට්‍ර, පාණ්ඩු යන දෙරජුන්ගේ සියළුම රජ දරුවන් සහ ඔවුන්ගෙන් පැවතෙන දරු මුණුපුරු පරම්පරාවට ඔවුන්ගේ හිස්තවවෙනි පමණ මුත්තනුවන්වූ පුරු රජු හෙවත් පෞරව රජුගේ නාමයෙන් "පුරු" හෙවත් "පෞරව" වංශය කියාද, සත්විසි රජ පත් මහා භාරත රජුගේ නාමයෙන් "භරත" වංශය කියාද, ඔවුනගේ දහහත් වැනි මුත්තනුවන්ගේ "කුරු" හෙවත් කෞරව රජුගේ නාමයෙන් "කුරු" කුලය හෙවත් "කෞරව" වංශය කියාද

---

A விஞ்ஞான் = LEARNEDMAN

විදුරන් සංස්කෘතනාමය

(යාපනේ දෙමළ-ඉංග්‍රීසි අකාරාදිය 380 පිටුව)

කෞන්ති හෙවත් "කුන්ති" බිසවගේ නාමයෙන් කෞන්ත වරුය කියාද පොදු වශයෙන් ආමන්ත්‍රණය කර තිබෙන බවද "මහාභාරත කාව්‍ය" යෙන් පෙනී යන්නේ ය.

"සත්‍යවතී නොහොත් මච්ච කොන්ත බිසවගේ නාමය කරණ කොටගෙණ කෞරව, පෞරව, භරත, සහ කෞන්තය යන වංශ චතුන්ට "මච්ච කොන්ත කාර වන්ත කුල" යයි ව්‍යවහාර කර තිබෙන බව තමන් සාධුවේ, කොඩිකාර ගම් පංසලේ තිබෙන ජලනන්දනය නැමැති පුස්කොල පොතේ සඳහන් වී ඇත."

කුන්ති බිසවගේ නාමයෙන් "කුන්දිරාවෝ" යයි පෙනී සිටි කෞරවයෝ ඔවුන් ජයගත් දූපත් සමූහයකට ද කුංදිරුවයයි, නම් කරගත් බව මුඛ පරම්පරා කථාවන්ගෙන් දැනගන්ට තිබේ.

පුරු......යයා තෙර්තෘපස්‍ය කාතීෂ්ඨ පුත්‍ර
වද්වසාන් කාරුණං පෞරවේති සංඥ.

"පුරු" යනු යයාති රජුගේ සතරවෙනි පුත්‍රයා කොරෙයි මේ "කුරු" රජුවරුන්ගේ පෞරව යන නාමය මේ කරණ කොටගෙන වූයේ යයි කියා මෙහි අභිප්‍රාය දතයුතුයි.

"කුරු" "පෞරව" පරම්පරා දෙකම එකක් බව මෙයින් පැහැදිලි කරයි.

නාකාලෙ ප්‍රියතෙ කශ්චින් විධඃ ශර ශතෛරපි.
කාල ප්‍රප්තස්‍ය කෞන්තෙය වජ්‍රායන්තෙ තෘණ්‍යාපි,
(පංචතන්ත්‍රය)

ඊ දඹු සියයකි තුදු විඳිනා ලද්දෙ අකාලයෙහි කිසි කැනෙක්හි නොමියේ කුංති පුත්‍රවූ මහරජ දවස පැමිණි තැනැත්තාහට තණ පත්‍ර පවා වජ්‍රායුධ මෙන් වෙත් යනු මෙහි භාවයයි.

මෙහි "කෞන්තය" යනු කුරුවංශ ඇත්තෙකි.

ජයොස්තු පාණ්ඩු පුත්‍රාණං යෙෂාං පක්ෂෙ ජනාර්දනඃ,
යතඃ කෘෂ්ණ සතතො ධර්මො යතො ධර්මිස්ත තොජයඃ
(නීතිසාරය)

යම් කෙනෙකුගේ පක්ෂයෙහි විෂ්ණුද පාණ්ඩු පුත්‍රවූ යුධිෂ්ඨාරාදීන්ට ජයවේව! යම්හෙයකින් කෘෂ්ණ රජතෙම වූයේද ඒ කාරණයෙන් ධර්මය තෙම වූයේ ය. යම් කාරණයකින් ධර්මය තෙම වූයේද ඒ කාරණයෙන් ජයවූයේ යයි කියායි,



මෙහි පාණ්ඩු පුත්‍ර යනු "කෞරව වංශයෙහි" රජුයි

" After a year had elapsed Dhartarastra appointed as heir to the throne, Yudhisthira the first-born son of Kuru family ''

[*A History of Indian Literature By Maurice Winternitz P.H.D.*]
*Page 331*

භාවය:-

"අවුරුද්දක් අතික්‍රාන්තවූ පසු ධෘතරාෂ්ට්‍ර රජු, කුරු කුල පවුලේ පලමුවෙනියාව උපන් යුධිෂ්ඨිර කුමරුව සිංහාසනයට (කුරුරට) උරුමඃකාරයා වශයෙන් පත් කොලේ ය."

(වැඩිමහල් පාණ්ඩු කුමරු කුරුකුල පවුලේ හෙවත් කෞරව පවුලේ මූලික උත්පත්තිය ලැබූ සෙයින් ඔහු කුරුවංශිකයෙක් බැව් එයින් තේරේ.)

" Panchala. a people who appear to be identical with the KRIVIS mentioned in the RIGVEDA........The Capital of South PANCHALA..........was KAMPILYA, It appears in the Mahabharath as the Capital of King DRUPADA, the father of KRISHNA or DRUPADI, who became the wife of the five sons of PANDU.............. The Panchalas are often accociated with the KURUS: V, KURU''

[*Ancien. India Page 167*]

පංචාල වගීයා වනාහි රිග් වේදයේ සඳහන් "කිරිවි" වගීයා බවට අදුනා ගත හැක.........දකුණු පංචාලයේ අගනුවර වූ කලී කම්පිල්ලය වන්නේ ය. ........පාණ්ඩු රජුගේ පුත්‍රයින් පස් දෙනාගේ භාර්‍යාවූ ක්‍රිෂ්ණා හෙවත් ද්‍රෞපදී දෙවියගේ පියාණන්වූ ද්‍රුපද රජුගේ අගනුවර කම්පිල්ලය නුවර විය.........පංචාල වගීයා අනවරතයෙන්ම කුරු කුල වගීයා හා සබඳ කම් පවත්වන ලද්දේ ය."

## කෞරවයින්ගේ දූ කෙළිය

දුර්යෝධන රජු සහ මයිලනු සකුණීත් අතරවූ කුමන්ත්‍රණයකින් කුරුරට සම්පූර්ණයෙන්ම අත්පත් කර ගැනීමට විශාල දූ කෙළියක් කෙළීමට සකස් කොට ගෙන, ඒ ක්‍රීඩාව සඳහා අවසර ගැනීමට ඔව්හු මහළු ධෘතරාෂ්ට්‍ර රජු කරා ගොස් ඒ බව දැන්වී ය.

ධෘතරාෂ්ට්‍ර රජ තම ඥානවන්ත බාල සහෝදරයාවන විදුර කුමාරයාගෙන් එයට අවසර ලබාගත යුතු බව දන්වන එවිට ධූර්යෝධන කථා කරමින්, අපේ සුළු පියාණෝ වන විදුර කුමරු පාණ්ඩව වරුන්ගේ පක්ෂයට හිතැති බැවින් දූ කෙළිය සම්බන්ධව ඔහුගේ අවසරයක් නුවමනා බැව් ඇඟවිය. එහෙත් පසුව විදුර කුමරගේද සතුට ඇතිව විශාල දූ කෙළි උත්සවයක් පැවැත් වීම පිණිස සූදානම් විය. නැණවත් විදුර කුමරු ලවා යුධිෂ්ඨිර රජුට දූ කෙළිය සඳහා ආරාධනයක් කෙළේ ය.

මේ. දූ කෙළියෙන් යුධිෂ්ඨිර රජ, කුරුරටද තම සහෝදර භීමසේන, අර්ජුණ - නකුල - සහදේවද අන්තිම වරට ස්වකීය රූපත් ද්‍රෞපදී දේවියද කෞරවයින් හට පරාජය විය.

(මහභාරතය)

" BALADEVA KRSNA'S brother gets drunk with his wife REVATI, UGGRASENA, king of he VARSNIS comes with his 1000 wives, and many other princes with their wives. On this occasion ARJUNA sees SUBHADRA, KRISNAS beautiful sister, and becomes enamoured of her. He asks KRISNA how he can obtain her, and the later advices him to carry her off by force after the fashion of warriors, as a self-choice is always an uncertain affair. Then ARJUNA sends a messenger to YODHISTIRA to ask his permission for re abduction of SUBHADRA. YODHISTIRA gives his consent........... ARJUNA seizes her, places her on his chariot and drives off with her in the direction of INDRAPRASTHA."

*( Mahabharala )*

කෘෂ්ණාගේ සොහොයුරු බල් දේවයෝ රේවතී නැමැති සිය අම්බිකාවත් සමග සුරාවෙන් මත්ව පැමිණියේ ය. වෘෂ්ණියේ රජවූ උග්‍රසේනද භාර්යාවන් දහස (1000) නමක් බොහෝ කුමාරවරුන් සහ ඔවුන්ගේ ඇඹේනියන්ද කැටිව පැමිණ සිටියහ. මේ අවස්ථාවේ කෘෂ්ණගේ රූපත් නැගනියන් වූ සුභද්‍රාවෝ අර්ජුණා විසින් දක්නා ලදී.

ඈ කෙරෙහි පිළිබඳ සිත් ඇතිවූ අර්ජුණයින් විසින් ඈ ලබාගන්නේ කෙසේදැයි කෘෂ්ණාගෙන් පිළිවිසී ය.



රණකාමීන්ගේ චාරිත්‍රානු කූලව බලහත් කාරයෙන් ඈව ගෙනයවසි, ක්‍රිෂ්ණා තෙම පිළිවදන් දුන.

එවිට අර්ජුණ තෙම සුභද්‍රාව පැහැර ගෙන යාම පිණිස යුධිෂ්ඨිරගෙන් අවසර ඉල්වා පණිවිඩ කාරයෙකු යැවී ය. යුධිෂ්ඨර ගෙන් ලත් අවසර පරිදි අර්ජුණ තෙමේ බලහත්කාරයෙන් සුභද්‍රා කුමරිය අල්වා සිය රථයෙහි හිඳුවා ගෙන ඉඳිපත් නුවර දෙසට පලා ගියේ ය.

(මහා භාරත)

" As Matsyas are a hostile Nation.........Now the TRIGARTAS arrange with the KAURAUAS to organise a joint raid on the land of the Matsyas...... while VIRATA is fighting against the TRIGARTAS, The Kaurava invade the land of the Matsya at another point, and steal much cattle."

*(Indian Literaiure Page 354 & 355)*

" මත්ස්‍යවරු යුධාභිලාෂීන් සෙයින් ත්‍රිගර්තවරු සහ කෞරවයින් එක්පසක් වී මත්ස්‍ය දෙශය යටත් කිරීමට යත්න දැරුවෝ ය. විරාතවරු ත්‍රිගර්තයින් හා සටන් කරණ අතර කෞරවයෝ අන්‍යමගකින් මත්ස්‍ය දෙශයට තුල්ව ගවයින් රැශියක් සොරාගත්හ."

" පාණ්ඩව වරු අප්‍රසිද්ධව විසීම පිණිස ව්‍යාජ නාමයන් ගෙන් පෙනීසිට විරාත රජ (මත්ස්‍යරජ) ගේ මාලිගයට ගියෝ ය. ඉක්බිති යුධිෂ්ඨිර රජ මත්ස්‍ය රජුගේ මන්ත්‍රී-වශයෙන් ද භීමසේන අරක්කැමි වශයෙන් ද අර්ජුන මත්ස්‍ය රජ දූ උත්‍රාගේ නාටකා චාරිය වශයෙන් ද නකුල අශ්ගොව්වා වශයෙන් ද සහදේව ගව පට්ටියේ ප්‍රධානියෙකු වශයෙන් ද ද්‍රෞපදී දේවිය මත්ස්‍ය දේවියගේ යහන් ගබඩාව භාර දැසිය මෙන් ද කලක් විසූවෝ ය."

(ඉන්දියානු සාහිත්‍ය ඉතිහාසය පිටු 353, 354)
මොරිස් වින්ටර්නිට්ස්, පී. එච්. ඩී

" තථාගතයන් වහන්සේ විසින් කුරුක්ෂෙත්‍රයේ කම්මාස දම්ම නැමැති කුරු කුලයින්ගේ නියම් ගම්හිදී දෙශනා කරණ ලද සතිපට්ඨාන සූත්‍රයේ අනන්ත ප්‍රාණීන්ට ලැබුන ශාන්තිය නිසා ඒ අභය භූමිය සිහිකිරීම වස් අශොක නරපතීන් විසින් පිහිටුවන ලද මෙම ශිලස්තම්භය ලිපිකොට එවකට කුරුරට පැවැති සිරිත් විරිත් නිසා අපමණ ප්‍රාණීන් වධයට පත්වනු දිටි අශොක රජු ප්‍රාණීන් කෙරේ දයා-

වෙන් ප්‍රජාරක්‍ෂණය සඳහා මේ දයා දාන ශිලා ලිපිය ලියවූ බව පෙනේ. දැනට මේ ශිලාස්ථම්භ ලිපිය කුරුරට මීරුට් නගරයේ තිබෙන බව දැනගන්ට තිබේ.

දෙවානං පියෙ පියදසි ලාජ හෙවං ආහ-සඩ්වීසති
    වසාභි සිතෙන මෙ ඉමා නිපි
ජතානි අවධ්‍යානි කටානි සෙයථා සුකෙ-සාලිකා-අළුනෙ
    චකවාකෙ හංසෙ නන්‍දීමුඛෙ
ගෙලාටෙ ජතුකා අංබා කිපිලිකා දුලි අනඨික-මචෙඡ
    වෙදවෙයකෙ ගංගා පුපුටකෙ සං
කුජ මචෙඡ කඵට සේයකෙ පංනසසෙ-සිමලෙ සංඩකෙ
    ඔකපිංඩෙ පලසතෙ-
සෙත කපොතෙ ගාම කපොතෙ සබේ චතු පදෙයෙ
    පටිභොගං නොඑති නචඛාදි.
යානි අජකානනානි එලකාච සූකලීච ගභිනීවා...
    පායමානාව අවධිය පොත
කෙච කානි ආසංමාසිකෙ වධි කුකුටෙ-නොකට වීය
    තුසෙ සජීවෙ නොඣා පයාථ
වියෙ...දවෙ අනඨායෙවා විහිංසායෙවා නොඣාපයිතවියෙ
    ජීවෙන ජීවෙනො පුසිත
වියෙ තිසු චාතුං මාසෙසු තිසියං පුනන මාසියං තිනි
    දිවසානි චාවුදසං පන්නදසං
පටිපදං ධුවායෙච අනුපොසථං මචෙඡ අවධෙයෙ නොපි
    විකිතවියෙ එතානියෙව (ච)
දිවසානි නාගවනසි කෙවට භොගසි යානි-අන්නානිපි
    ජීවනිකායානිනො
හනං වියානි අඨමී පකඛායෙ චාතුදසයෙ-පංනදසයෙ
    තියායෙ පුනාවසුනෙ තීසු.
චාතුං මාසෙසු සුදිවසායෙ ගොනෙනො - නීලඛිතවියෙ
    අජකෙ එලකෙ සූකලෙ ........
එවාපි අංනානි ලඛියති නොනි ලඛිතවියෙ - තිසායෙ පුන්න
    වසුනෙ චාතුම්මාසියෙ
චතුමාසි පකඛායෙ අසවසා ගොනස - ලඛනෙ නො
    කටවියෙ යාව සඩවීසති.
වසාභිසිතෙන මෙ එතායෙ අංතලිකායෙ - පංනිවීසති
    බංධනෙ මොඛානි කටානි



භාවය:- දෙවියන්ට ප්‍රියවූ පියදසී රජ මෙසේ කියයි. මාගේ අභිෂෙක වර්‍ෂයෙන් සත් විසි වෙනි වසේදී මෙකී සඳහන් සතුන්ගේ ප්‍රාණවධ නොකට යුතුසේ නොහොත් ප්‍රාණ ඝාතනය නොකරණසේ නියම කෙළෙමි.

කුමන ප්‍රාණීදයත්:- ගිරා, සැළලිහිණි, අළුණ, චක්‍රවාක, හංස, නන්දිමුඛ, ගෙලාට, ජතුකා, අංබා, (ජලචර) කිපිලිකා අෂ්ටි රහිත මත්ස්‍ය නම් කැස්බෑ වෙදවෙයක, සහ ගංගා ඇසුරු කොට වසන පුපුටකාදීන් හා සංකුජ මත්ස්‍ය නම්, කැස්බෑ, ඉබි ආදීහුද, හාවුන් හා සෙමරුද, සණ්ඩ නම් මාගයෝද (වානර විශෙෂයක්) සුදු පරවියාද, ගම් ඇසුරු කොට වසන සාමූව පරවියෝද, ඕකපිංඩ නම් වානරයෝද, ආහාර පිණිස නොගන්නා සියලු ප්‍රාණීහුද, චතුස්පාදී සත්වයෝද මෙසේසින් නොමැරිය යුත්තෝය. ගැබ්ණිවූ එළු බැටළු දෙනුන් හා ඌරියන්ද, පැටවුන් ඇති කිරි එරුණාවූ මෙකී දෙනුන්ද, විශෙෂයෙන් නොමැරිය යුත්තෝය. වධ නොකට යුත්තෝය. හමාසයකට අඩු වයස්වූ පැටවුද වධයට නොපැමිණිය යුත්තෝය. කිසිවෙකු විසින් කුකුළෝද නොමැරිය යුත්තාහ. සජීව සත්වයෝ හෝම පිණිස නොදැවිය යුත්තාහ. වන ලැහැබ් ගිනි තබා නොදැවිය යුත්තාහ. එක් ප්‍රාණියෙකු තවත් ප්‍රාණියෙකු පෝෂ්‍ය කිරීම නොමැනවි. ගිම්හාන සෘතුවේ මාස හතරේ පුණු පොහො දිනවල සහ තුදුස්වක අමාවක සහ පැලවිය දක්වා උපොසථ අනුපොසථ දිනයන්හිද සියලුම පොහො දිනයන්හිද මත්ස්‍යයන් මැරීම හා විකිණීම (සර්වප්‍රකාරයෙන්ම) නොකළ යුත්තාහ මෙකී දවස්වල නාග වනයෙහි සහ කෙවට්ට භොගයේ වසන් නාවූ යම් ප්‍රාණීහු වෙද්ද ඔව්හුද නොමැරිය යුත්තාහ. අටවක තුදුස්වක පසළොස්වක සහ පුවපුටුප පුස යන නකත් යෝග දිනයන්හිද උපොසථ දිනයන්හිද උත්සව නිමිති කොට එළු බැටළු ගව යන සතුන්ට ශරීරික වධ නොකට යුතුයි. තවද පුසේ නකත හා පුවපුටුප නකත් දිනයන්හිද ගිම්හාන සිව්මස සුක්ල පක්‍ෂයෙහිද අමාවක් පසළොස්වක් දිනයන්හිද කිනියම් කරණ ලද අගුරු කොකු නම්වූ දෙයින් ගවයන් හංවඩු ගැසීම නොකට යුත්තේය. මාගේ රාජාභිෂෙකයෙන් සත් විසිවෙනි වර්ෂයෙහිදී මේ අනන්තා පරිමාන ලෝකයේ සැරිසරනවුන්ට පස්විසි මහා බන්ධනයෙන් මිදෙන පිණිස මේ කරවන ලදී. යනුයි.

(අශොක ශිලාලෙඛන සංග්‍රහය 18, 19, පටු)

## අශෝක ලිපිය.

"සත්ව ඝාතනය කිරීම මීට පෙර තහනම් කර නොතිබුණේය. මාගේ මුළුතැන්ගෙයි මෙහෙකරුවන් විසින් ආහාර පිණිස දහස් ගණන් සතුන් මැරූ නමුත් මවිසින් ප්‍රාණ ඝාතනය නොකරන ලෙස ආඥාවක් නිකුත් කරන ලද්දීය. ඒ ආඥාව පැනවූ දිනයේ මාගේ ආහාරය පිණිස මොණරු දෙන්නෙකද මුවෙක්ද මරණ ලද්දාහුය. නමුත් ඉන්පසු එකම සත්වයෙක්වත් නොමරණ ලෙස රටවාසීන් වද නියම කෙළෙමි." .......... "රජවරු ක්‍රීඩා වශයෙන් දඩයම් කිරීම හා දේශ සංචාරය කරණ නමුත්............"

(දෙවියන්ට ප්‍රියවූ පියදසි ධර්මාශෝක)

(ශිලාලේඛන සංග්‍රහය 43 පිටුව)

"ධර්මාශෝක රජහට අටලොස් වන්නෙහි දෙවන පෑතිස් රජහට පළමුවන්නෙහි එම මිහිඳු මහ තෙරුන් වහන්සේ ...............තුමූ (දෙවන පෑතිස් රජ) සතලිස් දහසක් පුරුෂයන් පිරිවරා මිහින්තලාවට මුවදඩ ගියහ....... ......රජ්ජුරුවෝ මුවා දක තණ කන මුවා විදීම යුක්ත නොවෙයි සිතා දුනුදිය අත පොළාපීහ."

(සද්ධර්මාලංකාරය පිටු 340, 341)

## කුරුකුල මහා සංග්‍රාමය

කුරු ක්ෂේත්‍රයෙහි සිදුවූ මේ සටණ දහ අට දවසක් පැවතින. පාණ්ඩවයන් පක්ෂයට නෙවත් යුධිෂ්ඨිර කුමරුට සම්පූර්ණයෙන් කුරුරට සිංහාසනය උරුම්වීම කාරණ කොට ගෙන ඔවුන්ගේ එකම ලේ දරාවේ සොහොයුරන් වන දුර්යෝධන ප්‍රධාන අතිකුත් කුරු කුලයින් වෛරවී මෙන් මේ මහා සටන ඇතිවීමට හේතුවිය.

හස්තිනාපුරයේ රජකම සඳහා ආරම්භවූ මේ සටනෙහි ද්වාරක නම් රටේ ක්‍රිෂ්ණ පාණ්ඩවරු පතනාවත් මනධරට රජ බලසම්පන්න හස්තීන් (10000 ක්) දසදහසක් සමග කෞරවයින්ගේ පක්ෂයටත් එක්වූහ. පාණ්ඩවරු සහ කෞරවයින් අතර සිදුවූ මේ සටණින් ලක්ෂ සඞ්ඛ්‍යාත හේවා සමූහයක් විනාශ මුඛයට පත්වූ බව මහා භාරතයේ කියා තිබේ



එකල දඹදිව වැසි රජවරුන් සියලු දෙනාම පාහේ ඉහත සඳහන් දෙපක්ෂයට එක්වී සටන් කළහ.

ධෘතරාෂ්ට්‍ර රජුගේ පුත්‍රයින් සියලු දෙනාම මේ සංග්‍රාමයේදී විනාශවිය. ඔවුන්ගේ මෑණියන්වූ ගාන්ධාරි බිසව ශෝකයෙන් පෙලී ක්‍රිෂ්ණාහට ශාප කලාය. ද්‍රෞපතීගේ පුත්‍රයින් පස් දෙනාද මේ සටණින් මැරුම් කෑවෝය. ඔවුන්ගේ භාර්යාවෝ නම පුරුෂයින්ගේ ලෙයින් තෙත්වූ කේශකලාපයන් ගැට ගසා හිස් හෙඩි තම උකුල මත තබා විලාප කියමින් හැඬූවෝය. භීමසේන සහ දුර්යෝධන සටන් කරන අතර දුර්යෝධනව පරාජය කළ නොහැකි බව හැඟුන අර්ජුනයෝ යුධ නීතියට විරුඬව දුර්යෝධනගේ කලවයට පහර දෙනලෙස භීමසේන හට ඉඟි කළේය. භීමසේනද යුධ නීතියට පිටුපා දුර්යෝධනයන්ගේ කලවයට පහරදී බිම හෙළීය.

මධ්‍යස්ථ භාවයෙන් මේ සටන දෙස බලා සිටි ක්‍රිෂ්ණගේ සහෝදරයා, "පාණ්ඩවරු අවනීති ප්‍රකාර සටන් කරණ ප්‍රයෝග කාරයෝයි. කෞරවයෝ වූකලි නීතිප්‍රකාර සටන් කරණ මහා වීරයෝයි" යනුවෙන් පාණ්ඩවරුන්ට නිග්‍රහ කරමින් යුධ බිමෙන් ඉවත්ව ගියේය.

මේ අතර කෞරවයින් දෙදෙනෙක් රාත්‍රී යුධ බිමෙන් පලාගොස් ගස් සෙවනක ලැගුම් ගෙන සිටින්නාහු, එනස අතුපතර නිශා කාලය ගත කරණ කවුඩන් අතරට බස්සෙක් සෙමින් සෙමින් පැමිණ කවුඩු හිස් කඩ කඩා ලන බව දුටුවෝය.

එවිට ඒ දිටි කෞරවයින් ගෙන් එකෙක් අනිකා අමතා "සබඳ! මේ බස්සා නිදා සිටින කවුඩන් අතරට පැමිණ උන්ව පහසුවෙන් මරාදමන්නේ යම්සේද, එමෙන්ම අපිද හොරෙන් යුධ බිමට තුල්ව නිදාසිටින පාණ්ඩවරයින් සමූහයක් පහසුවෙන්ම මරා දමමුදැයි" යෝජනා කෙළේය.

ඒ ඇසූ අතිකා පිළිතුරු දෙමින්, "එය කෞරව රණකාමී වීරයින්ගේ යුධ චාරිත්‍රානුකූල නොවන්නේය. එසේ නිදා සිටින්නන් රහසේ ගොස් මරා දැමීම හිංසුල්ලන්ගේ දුශ්ශීල ක්‍රියාවකැයි" කියමින් අතිකාගේ යෝජනාව හෙලා දැකීය.

නුමුත් යෝජනාකාර කෞරවයා එවෙල්ම හොරා යුධ බිම කරා පත්ව සතුරු උවදුරු බලාපොරොත්තු රහිතව නිදාසිටි පාණ්ඩවරයින් බොහෝ දෙනෙක් කඩු මුණෙන් ඇන මරා දමා පලා ගියේය.

අටලොස් දිනක් පමණ පැවැති මේ බිහිසුණු සටනින් කෙළවර පාණ්ඩවරයෝ ජය ගත්හ.

රණ බිම හාත්පස විසිරී තිබුන කෞරවයින්ගේ මෘත ශරීරද ඇත්, අශ්, ඇ මල් කුණුද කුඩ කොඩි රථ වාහනාදියද දිටි කෘෂ්ණා තෙම තම නෑයා වන අර්ජුනයන් අමතා, "බලව ! අර්ජුනයනි; කෞරවයින්ගේ තාරකා චන්ද්‍ර සූර්ය යන සලකුණුවලින් හා සුදු, කළු, කහ, රතු, ඈ නොයෙක් වර්ණයන්ගෙන් හෙබි කොඩිද කුඩ සමූහයාදියද යුධ භූමියෙහි විසිරී තිබෙන ආකාරයයි" කීයේය.

## කෞරවයන්ගේ විසිර යාම

කුරුක්ෂෙත්‍රයෙහි ඇතිවූ මහා සංග්‍රාමයෙන් ශෙෂවූ කෞරවයන්ගෙන් සමහරෙක් තම සහෝදර යුධිෂ්ඨිර රජුගේ අභිනව ආණ්ඩුව යටතේ විසුවෝය. පරාජය නොඉවසූ දෘඪ සිත් ඇති කෞරවයින් සමහරෙන් කුරු රට අත් හැර පලා ගිය බව නොයෙක් කරුණු* වලින් අනාවරණය කරයි.

* කුරුරට යුධයෙන් පරාජයට පත් ඇතැම් කෞරවයෝ ජාවා, සුමාත්‍රා, දකුණු ඉන්දියාව හා ලංකාව ආදී නොයෙක් රටවලට විසිර ගිය බව ඉතිහාසාදි නොයෙක් ලේඛනයන්ගෙන් පෙනේ.

කුරුකුල ඉර හඳ කොඩිය



'බලව අර්ජුණයිනි;"

"කෞරවයින්ගේ තාරකා, චන්ද්‍ර, සූර්ය, යන සටහන් ඇති, කළු, සුදු, කහ, මදටිය ැහැති කොඩිද, කුඩ සමූහාදියද යුධ භූමියේ විසිරී තිබෙන හැටි!"

(ක්‍රිෂ්ණා, මහාභාරත, කර්ණ පර්ව)

යුධිෂ්ඨිර රජ පලා ගියාවූ හා සංග්‍රාමයෙන් ජීවිතක්ෂය පත්වූවාවූ සවකීය ඥාති කෞරවයන් ගැන සෝකිවූ බැව් මහ භාරතයේ සඳහන් වෙයි.

"Of the surviving Kauravas, a few seem to have settled down peaceably under their cousins; while others, the more prominent ones presumably, became exiles. (Maha-bharata Stree 22 and another place) where Yudisthira laments the loss of his cousins, killed or expelled."

" We next hear of the Kauravas in Central India (Dalton, Ethnology of Bengal).

In the South-east of thePeninsula, there were king-doms founded by princes of their (Chandra) race, before and after the great war, as at Mahabalipur South of Madras and Madura the capital of the Pandiyan Kingdom, which was long governed by viceroys from Hastinapura.

(Taylor, 1. 12o & 195)

මෙහි කෙටි අදහස:-

" මධ්‍යම ඉන්දියා දේශයේ කෞරවසින් වාසය කරණ බව නැවත අපට අසන්ට ලැබී තිබේ." (ඩෝල්ටන්)

දඹදිව ඊසාන දිගින් ඔවුන්ගේ වංශයට (චන්‍ද්‍ර) අයත් කුමාරවරුන් විසින් ගොඩ නැගූ ජනපද ඇත්තේය. මහා සංග්‍රාමයට ඉහතින් හා පසු කාලවල දී මහ බලිපුරය හා මද්‍රාසියට දකුණු දෙසින්ද, පාණ්ඩිය රජුන්ගේ අගනුවර වූ මධුරයද, හස්ථිනාපුර (කුරුරට අගනුවර) ඈපාවරුන් විසින් ආණ්ඩු කරණ ලද්දේය. (ටේලර්)

## අගස්ත්‍ය මුණි

"අගස්ත්‍ය ඍෂිවරයා පිළිබඳ දේව කථා බොහෝ වෙත්. කලගෙඩියකින් මෙතුමන්ගේ උත්පත්තිය සිඩවීයයි කියති. මේ වනාගි වේද පාඨ හැදෑරීමේ ලෙහෙසිය සඳහා කල්පිත දේව කථාවකි. "මිත්‍රා හා වරුණ" මේ සෘෂිහුගේ මව්පියන් වශයෙන් දක්වා තිබේ, මෙතුමන්ගේ කාලයේ උත්තර ජම්බුවීපයේ චන්ද්‍ර සූර්‍ය වංශිකයන් අතර නොයෙක් යුධ කෝලාහල ඇතිවිය.

බොහෝ කාලයක් නොකඩවා පැවැති ඒ සටන් සංසිඳවනු රිසිවූ මේ ඍෂිවරයාණෝ චන්ද්‍ර වංශිකයින් සමග දක්ෂිණ ජම්බුද්වීපයට ගියහ. එහි පාණ්ඩ්‍ය-චෝලය-කේරල යයි ද්‍රවිඩ රාජ්‍යත්‍රයක්ද පිහිටුවා ගත්හ.

තාම්‍රපර්ණී නදිය සමීපයෙහි පිහිටුවාගත් පාණ්ඩ්‍ය රාජ්‍යයෙහි ප්‍රධාන නගරයවූ "කපාටපුරය" කලකදී මුහුදුබත් වූයෙන් "මධුරා පුරය" පාණ්ඩ්‍ය රජදරුවන්ගේ රාජධානිය විය. අගස්ත්‍ය ඍෂිවරයාණෝ රජ කුමරුවන් ලවා රාජ්‍ය විචාරවමින් පුරෝහිතයා වශයෙන් එහිම වාසය කළේය.

මේ අගස්ත්‍ය ඍෂි තෙමේ ද්‍රවිඩ භාෂා විෂයෙහි ප්‍රවීණයෙක් විය. 'පොදිය' නම් පර්වතයෙහි බොහෝ කලක් තපස් රැක සොක්කලිං හෙවත් සරස්වතී දේවිය ගෙන් වරප්‍රසාදයක්ද ලැබුවේය. සංස්කෘත භාෂාවෙහිවූ ඌෂ්මාක්ෂර හා ධනිතාක්ෂර හැර, අක්ෂර සංහිතකින් සමන්විත ද්‍රවිඩ ග්‍රන්ථ සෝඩියද නිෂ්පාදනය කළේය.

(භාරත මණීෂි මඤ්ජරි)

මෙහි සඳහන් අගස්ති මුනිවරයා විසින් උතුරු දඹදිවෙන් රැගෙන පැමිණි චන්ද්‍ර ගෝත්‍රිකයන් වනාහි රණකාමී කෞරවයන් (පාණ්ඩව) විය හැකි බව සිතිය හැක.

මේ චන්ද්‍ර වංශිකයෝ දකුණු ඉන්දියාවේ රාජධානි ඇති කර ගැන්මෙන් පසු ඔව්හු ද්‍රවිඩ භාෂාව පුහුණුවීමෙන් එයම ඔවුන්ගේ ජන්ම භාෂාව කරගත්හ. එපමණක් නොව මොවුන් ද්‍රවිඩ නාමවලින්ම පෙණී සිටීමටද පුරුදු විය: එහෙත් මොවුහු උතුරු ඉන්දියානික චන්ද්‍ර වංශිකයෝම වන්නාහ.

මහ ඇලෙක්සැන්ඩර්ගෙන් පසු ක්‍රි: ව: යට 302 වෙනි වරුෂයේදී සෙලෙවුකස් නිකේටර් රජු විසින් මෙගෙස්තෙනස් නමැත්තෙක් පාටලි පුත්‍ර නුවර චන්ද්‍ර ගුප්ත රජු වෙත නානාපතියෙකු වශයෙන් යවන ලදුව, පාණ්ඩ්‍යය නමැති



රජස් ක්‍රිෂ්ණගේ එකම දියණිය වන පාණ්ඩ්‍යය කුමරියගේ නමින් තිබෙන බවත්. ඉංදියාවේ දක්ෂිණ භාගයෙහි සමුද්‍රය දක්වා දිඝිව පිහිටි මෙම ප්‍රදේශය ක්‍රිෂ්ණා විසින් නම දීඅ නියට දූයාද වශයෙන් දුන් බවත් ග්‍රීක් සහ රෝම ඉතිහාස වල සඳහන්වී ඇත්තේය.

ක්‍රිෂ්ණා වූකලී කුරු සහ පාණ්ඩව රජ දරුවන්ගේ මස්සිනාය. ඔහුගේ දියණියගේ නාමය හේතුකොට පාණ්ඩ්‍යය රාජධානිය ඇතිවූ බව මෙයින් ප්‍රකාශවේ.

Native tradition represents the eponymous ancestors of the Pandyas, Cheras and Cholas as three brothers living together at Korkai, a town which tradition and historical research alike have identified with place of that name, now an obscure village, four miles from the mouth of the river Tambaparni, in the modern Srivaikuntam Taluk. Eventually a separation took place. Pandyan remaining at home, while Cholan and Cheran went forth to seek their fortunes. Choalan founded a kingdom in the north, while Cheran founded one in the west. The Choalan seem to have ruled in the Tan-jore and Trichinapoly districts and perhaps at the highest point of their greatness extended their influence as far as Kurnool District. The Cheras established themselves in Trivancore, Malabar and Coimbatore and the Pandyas in Madure and Tinnavelly.

(Caldwell's History of Tinnevelly, Madras 1881. Page 12)

මෙහි සංක්ෂේපය:-

සෝළි පාණ්ඩි කේරල වශීයාගේ ආදි පරම්පරාවල්. සම්බන්ධව ස්වදේශ ග්‍රන්ථවල සටහන් ප්‍රකාර මෙසේය.

" සොලියාය පාණ්ඩියාය කේරළයාය යන නමින් යුතු සහෝදරයන් තිදෙනෙක් කෝර්කෙයි නුවර වසූහ. තාම්‍ර-පර්ණී නදියෙහි මෝයට සැතැපුම් හතරකට පමණ නුදුරින් ශ්‍රී වෛකුන්ඨම් තාලූක් නමැති පෙදෙසෙහි පිහිටි දැනට සටබුන්වී ගිය නගරයක නෂ්ටාවශේෂයන් මේ කෝර්කෙයි නුවර බවට ඉතිහාසික පරීක්ෂකයින්ගේ කල්පනාවට භාජනවී තිබේ.

පාණ්ඩියා කෝර්කෙයි නුවර සිටියදී චෝලියා සහ කේරලයා යන දෙදෙන ඔවුන්ගේ අභිවෘද්ධිය තකා යම්කිසි බලාපොරොත්තුවකින් එනුවරින් පිටව ගියෝය. සෝලියා උතුරු දිසා භාගයේ ජනපදයක් පිහිටුවා ගත්තා අතර කේරලයා බටහිර දිසා භාගයේ ජනපදයක් පිහිටුවා ගත්හ. චෝලියා තංජෝර් සහ ත්‍රිචිනෝපලිය යන පලාත් පාලනය කරමින් ඔහුගේ පරාක්‍රමයන් අනුව කුර්නූල් ප්‍රදේශය දක්වා තම රාජ්‍යය දීඝී කරගත්හ.

කේරලයා ත්‍රැවන්කෝරය - මලබාරය සහ කොයිම්බටෝරය යන ප්‍රදේශද පාණ්ඩියා මධුරය සහ තින්න වැලි ජනපදයද පාලනය කිරීමට ආරම්භ කර ගත්හ."

උත්තර ඉන්දියා දේශයේ සිටි චන්ද්‍ර වංශිකයන්ගේ යුද්ධ කෝලාහල මැඩ පැවැත්වීම පිණිස අගස්ත්‍ය මුණි චන්ද්‍ර වංශිකයින් සමූහයක් එදෙසින් වෙන්කරවාගෙන දක්ෂිණ ඉන්දියාවේ තාම්‍රපර්ණී නදිය අසල කපාටාපුරයට කැඳවා ආ බවත් එම නගරය පසුව මුහුදු බත්වූ බවත් ඉතිහාසයේ සඳහන් වී ඇත.

දක්ෂිණ ඉන්දියාතික භූමි පරීක්ෂකයින් විසින් දැනට තාම්‍රපර්ණී නදිය අසල තටබුන්වූ නගරයක් වශයෙන් පෙනීයාගෙන තිබෙන්නේ, "කෝර්කෙයි" නගරය විය යුතුයයි කියති. යට දක්වන ලද "කපාටා පුරය"ද මෙහි සඳහන් "කෝර්කෙයි" නගරයද කලින් කල වෙනස් නාමයන්ගෙන් හඳුන්වා ඇතත් 'කෝර්කෙයි' නගරය 'කාපාටා පුරයම' විය යුතුයයි පරීක්ෂකයන්ගේ ප්‍රකාශකයන්ගෙන් පැහැදිලිවේ.

ඉතිහාසයේ සඳහන් පරිදි මෙහි දක්වෙන කපාටාපුරයත්, කෝර්කෙයි නගරයත් තාම්‍රපර්ණී නදිය අසල පිහිටි බව හැදින් වෙන නිසත් පාණ්ඩව වරුන්ගේ අග නුවර වශයෙන් පැවතුන බව පැහැදිලි වන නිසත් ඉතිහාස කතුවරයෝ එසේ කියති.



කපාටාපුර උත්තර ඉන්දියාතික චන්ද්‍ර වංශිකයන්ගේ අගනුවර වශයෙන් කොට ගෙන ඔව්හු පඬිය, සෝලිය කේරල යයි රාජ්‍යත්‍රයක් පිහිටුවා ගත්තාහු යයි "භාරත මණිෂි මඤ්ජරි" යේ පුවත කියනාතර කෝර්කෙයි නුවර විසූ පඬි, සෝලි, කේරල තුන් බෑයෝ වෙන් වෙන්ව දක්වෙන රාජ්‍යත්‍රයක් පිහිටුවා ගත් බව අනාවරණය කරණ පුවතක් "කෝල්ඩ්වැල්ගේ තින්නවැලි" ග්‍රන්ථයෙන් හෙළි වෙයි.

යට සඳහන් දෙපුවත දෙයාකාරව ඒ ඒ ග්‍රන්ථයන්හි සඳහන්ව තිබෙන්නේ එකම පුවතක්යයි සැලකීමට ඉඩ තිබේ.

අගස්ත්‍ය මුණි හා පැමිණි චන්ද්‍ර වංශිකයෝ ද්‍රවිඩ භාෂා වම ජන්ම භාෂාව කොට ගෙන යටකී පාණ්ඩය, කේරල හා සොලීය ආණ්ඩු කළාහු කල්යාමේදී ඔවුන් පරපුර ද්‍රවිඩ නාමයන්ද පාවිච්චි කිරීමට වන. "කෝල්ඩ්වැල්ගේ තින්නවැලි" ග්‍රන්ථයෙහි සඳහන් කෝර්කෙයි නගරයේ විසූ පාණ්ඩියා ය, කේරලයා ය, සොළියා ය, යන තිදෙන ද්‍රවිඩයෝ බව හැගෙතත් ඔව්හු කවර වංශිකයෝද යනු එහි විස්තර කර නැත.

එහෙත් "මදුරෙයි-කාංචි" නමැති බොහෝ පුරාණ ද්‍රවිඩ කාව්‍යයෙහි, සඳහන් මෙහි පහත පලවන ප්‍රකාශනයෙන් කෝර්කෙයි දේශි කවරහුද යනු දත හැක.

"පරවර නොහොත් පරදවර් මිනිසුන්ගේ ප්‍රධාන නගරය "කෝර්කෙයි" නුවර වන්නේය. මෙම නගරය චූකලි මුතු වගී සම්බන්ධව බොහෝ ප්‍රසිඩය. මෙහි ස්වදේශීන් වන පරවරු අන්‍යයන්ට වඩා ඉතා උසස් බලසම්පන්න ජාතියක්යෝය" යනුයි:

"According to their own account they are discendents of King Bharatha (Parawa is said to be a corruption of this name) of the Lunar race who ruled in Oudh)"

(Tinnavelly Gazetteer P. 122)

(By H. R. Pate, I. C. S. Government Press, Madras. 1917)

මෙහි සංක්ෂේපය:-

"පරවර මිනිසුන්ගේ ඉතිහාසය ප්‍රකාර ඔවුන් චතාගි අයෝධ්‍යය ආණ්ඩු කල චන්ද්‍ර වංශික* භරත රජුගෙන් පැවතෙන පරම්පරාව වන්නේය. (පරවර යනු භරත යන්නෙන් බිඳුන නාමයකි.")

(තින්නවලි ගැසටියර් පි: 122)

කෝර්කෙයි නුවර හිමි කාරයෝව සිටි පරවර මිනිසුන් චන්ද්‍ර වංශිකයින් බවට මේනයින් පිළිගත යුතුව තිබේ. තවද ඤෑලි, පාඩි, කේරලයින්ද චන්ද්‍ර වංශිකයන් වශයෙන් වටහා ගත හැක.

භරත දේශය

| | |
|---|---|
| பரத கண்டம் - | India Hindustan |
| පරත කන්ඩම් (බරත කන්ඩම්) | ඉන්දියාව හින්දුස්ථානය |
| பரதர் | Merchants, Paravars |
| පරතර් (බරතර්) | වාණිජ = පරවරු |
| பரத்தி | Parava Woman |
| පරත්ති (බරත්ති) | පරවර ස්ත්‍රී |

(Dictionery of Jaffna. P. 264)
Tamil & English

ද්‍රවිඩ අකාරාදියෙන් පරවර යන්න පරත, පරතර්, පරදර්, බරත - බාරතර් සහ බාරතර් යනාදි වශයෙන් බිඳී ව්‍යවහාරව එන්නකි. මේ භරත වංශය කරණ කොට ඉන්දියා දේශයට භාරත දේශයයි මේ දක්වා ව්‍යවහාරව එයි.

* දශරථ රජුගේ බාල පුත්‍රයාද භරත නැමැති කුමාරයෙකි. ඔහු රජ බවට නො පැමිණියේය. මේ සූර්‍ය වංශික කුමරු චන්ද්‍ර වංශික මහා භරත රජු වශයෙන් වරදවා නොගත යුතුයි.



දඹදිව 'විජය' නමැති නගරය හින්දු වරුන්ගේ මහා නගරයක්ව පැවතුණේය. එය ක්‍රි: ව: 1565 දී පමණ ඇතිවූ මහමද්වරුන්ගේ 'ටැලිකොට්' සංග්‍රාමයෙන් පසු වැටී ගියේය. නමුත් එහි වැසි "නායක්" නමැති හින්දු ප්‍රධානීන් විසින් ඔවුන්ගේ සුලු ප්‍රදේශ ආරක්ෂා කර ගත්තේය.

දකුණු දෙසින් මහමද් රජුන්ට අයත් වූයේ රටින් අඩකි. මදුරාශි ප්‍රදේශයේ සිටින සුප්‍රසිද්ධ පොලගාර්වරු සහ මයිසූර් මහරාජාවරුද මෙම නායක් වරුන් ගෙන් පැවත එන්නෝ වෙති. මහමද් රජු දවස දකුණු ඉංදියාවේ හිඳ ගස් රාජධානියක්ව තිබුන රටවල් පාලනය කළ හින්දු රජවරුන් වූකලී "මංජරාබදී" පරපුරට අයිති වෙත්.

එහෙත් ඔව්හු සුළු ප්‍රධානීන් කොටසක් බවටත් අසල පෙදෙස්හි රජ කුමාරවරු ඔවුන්ට වඩා උසස් බවටත් උරුම කියති. "රෙගුලෝ" විසින් තන්ජෝර් රටේ කරාවේ සහ "වෙම් නායක්" කොහොත් වරුණ - කුලතා කියා ප්‍රධානීන් කොටසක් හඳුන්වයි. ඒ චතාගි වරුණ කුල ආදිත්‍ය යනුයි. වරුණ කුල ආදිත්‍ය වරුන්ට නායක් නාමය ව්‍යවහාර කළ බව මෙයින් පැහැදිලිවේ. ඔව්හු යම් යම් ප්‍රදේශ ආණ්ඩු කල ප්‍රවේණීන් බැව් සැලකිය යුතුය.

"පුරාණ ඉන්දියාවේ විල්ලවාර් මීනවාර් සහ නාගයන ගෝත්‍රවලට අයත් මිනිසුන් පිළිබඳ පැරණි ද්‍රවිඩ ග්‍රන්ථ කරුවෝ සඳහන් කරයි. වර්තමානයේ වනගතව වසන හිල්ලාවෝත්, මීනාවෝත් පළමු සඳහන් දෙවර්ගයාගෙන් පැවැත එන්නවුන් යයි නෘවංශකාරයෝ කියති. නාගයෝ (නාග ගෝත්‍රික) දුනු මළපුඩු ආදිය ගෙන හැසිරෙන කොල්ලකාරී සැහැසි ජනයෝ වූහ.

කොංජීවරම (කාවේරිපුරය) පෙදෙස ආසන්නයෙහි අරුවානාඩු, අරුවානාඩු තලෙයි, ආදි තන්හි වෙසන අරුවාලර් නමින් ප්‍රකට මනුෂ්‍යයෝද එයි නාර් - මරවර්

ඔලියාර් යන නාමයන්ගෙන් ප්‍රසිද්ධ මිනිසුන් හා * පරදවාර් නම් ගෝත්‍රිකයෝත් මෙම නාග ගෝත්‍රයට අයත්හු වෙතැයි කිසිවෙක් සලකති. මෙම සියලු මනුෂ්‍යයෝ පසු කාලයක ඒ පෙදෙස්හි පැතිර ගත් බලසම්පන්න ද්‍රවිඩ ජනයන් හා සංමිශ්‍ර විය. මෙසේ මුසුවූ නාග වර්ගකයෝ පාණ්ඩ්‍ය, චෝල, කේරල යන තුන් රටක් පිහිටුවා ගෙන වෙන් වෙන්ව පාලනය වෙන්ට පටන් ගත්හ."

"උතුන්තුන් චරිත් වර සටන්කොට ගෙන වෙනස්වූ ජාතිකයන් මෙන් පැවතෙන්ට විය."

(සිංහල වංශ ග්‍රන්ථ මාලා)

ඉහත සඳහන් "මීනවර්" යනු මීනවත්, නොහොත් මීනවර් වර්ගයා වෙති. රාජපුටානාවේ දනට "අල්වාර්" නමින් සුප්‍රසිද්ධ රාජධානියෙහි ක්ෂත්‍රියන්ගෙන් සමහරෙක් දකුණු දඹදිව පදිංචි වූවාට පසු ඔවුන්ට දමිළ භාෂාවෙන් "මීනවර්" මීනවත්, යනුවෙන් ව්‍යවහාර වීමට පටන්ගත්හ, මොව්හු වනාහි රිග් වේදයේ සඳහන් කුරුරට අසල මත්ස්‍ය දෙශී රාජපුත්‍ර මත්ස්‍යවරුය, වත්මන් රාජපුත්‍ර අල්වර් දනව්ව මෙම මත්ස්‍ය රට වන්නේය. ද්‍රවිඩ භාෂාවෙන් "මීනවර්" යනු මත්ස්‍යවරු යන අර්ථයි. මොවුන් වනාහි චන්ද්‍ර වංශිකයෝයි. ඒ නිසා මේ වර්ගයාට "රාජපුත්‍ර - නා අල්වාර්" ජාතිකයෝයි මේ දක්වා කියනු ලැබේ.

---

* පාණ්ඩියවරු ඒ රට වාසභූමිය කර ගැනීමට ප්‍රථම කලයේ එහි නාගයෝ විසුවෝය. අද සිටින පරවර, මරවර, කල්ලර යනාදි වර්ගයා එකී නාගයින්ගෙන් පැවතෙන්නන් වශයෙන් සලකනු ලැබේ.

පාණ්ඩිය චොළී කේරළයෝ වනාහි බෙංගාලයේ මුහුදු බඩ රටෙන් ඔබ්බෙහි ගොඩතර බද මිනිස් වර්ගයකි. ඔවුහු මුහුදු මාර්ගයෙන් පැමිණ බුරුමය, කොචින්චිනය, ලංකාව සහ දකුණු ඉන්දියාව යනාදි රටවල් අල්ලා ගත්හ.

(පුරාණ දෙමළ කාව්‍යයන්ගේ විස්තර අනුව මදුරාසියේ වී. කනකසබෙ මහතාගේ ලිපි — තින්නවැලි ගැසටියර්)



මත්ස්‍ය රට නොහොත් අල්වාර් ජනපදය සම්බන්ධ විස්තර කුරුරට විස්තරයෙන් දත හැක. මීනවර්, මීනවත් මත්ස්‍යවරු, අල්වාර් යනාදි වශයෙන් හැඳින් වෙනු ලබන් නේ එකම වර්ගයක මිනිසුන් බැව් මෙහි ලා සැලකිය යුතුයි.

Further, speaking of the so-called Pattanavar or Karaiar, in East India, in near Madras, Thurston writes:

"They have two main divisions, Periya and Chinna "Great and Small)......some of them give themselves high-sounding titles: Ariyar, Ayyayira-Thalaeiyar (the 5000 chiefs) Arya-Nattu-Chetti (Chetties of the Ariyan country) Acchu Vellala, Karai-Turai Vellala (Sea-coast) Varuna kula Vellala or Varuna-Kula Mudali, after Varuna the God of waters, Kurukula Vamsam after Kuru, the ancester of the Kauravas"

(Races in South India, By Thurston, Vol. 6.)

තවද පෙරදිග ඉන්දියාවේ මද්‍රාසිය සමීපයෙහි පට බැඳි උන්නැහේලා නොහොත් කරාවේ මිනිසුන් වාසය කරති. ඔවුන් ගැන "තාර්ස්ටන් ඉතිහාස නතීඃ මෙසේ ලියයි:-

"මොවුන් පුංචි කරාවේ, සහ මහ කරාවේ කියා දෙකොටසක් වෙති. සමහරුන්ට උසස් අර්ථ ඇති ගරු නාමයන් ව්‍යවහාර කරති. එනම් ආරියාර්, අය්යාඊර - තලෙයී-වර් (පන්දහස් නායකයෝ) ආර්ය-නාට්ටු සෙට්ටි (ආර්යදේශයේ චෙට්ටි) අච්චු-වෙල්ලාල, කරෙයි-තුරෙයි- වෙල්ලාල (මුහුදු බඩ) ජලාධිපති වරුණ දෙවියන්ගේ නමින් වරුණ කුල -වෙල්ලාල නොහොත් වරුණ කුල මුදලි, සහ කෞරව සින්ගේ ආදි පරම්පරා කාරයා වශයෙන් වූ කුරුරජුගේ නමින් කුරු- කුල කියාද වෙති" යනුයි.

(තාර්ස්ටන් මහතාගේ දක්ෂිණ ඉංදියා කුල විභාගය
කාණ්ඩ 6 - පිටු 178)

දකුණු ඉංදියාවේ පාම්බන අසල පිහිටි කරන් කාඩු නැමැති ග්‍රාම වාසීන්ට කෞරවර් නමින් අද දක්වා ව්‍යවහාර කරති.

" Thus the General Varuna Gulata, called" Chief of the Carias, the most warlike race in the Naique's dominions " (Queiroz, 514.)

භාවය:—

"නායික්ගේ (මහාරාජාගේ) රාජධානියෙහි වැසි ඉතා මත් රණකාමී ජාතියක්වූ කරාව ගෝත්‍රයේ ප්‍රධානියාට වරුණ කුලාතා සෙනාධිපති යනු මෙයා කාරණයෙන් ව්‍යවහාර කරති."

(කියුරෝස් පෘතුගීසි ඉතිහාසය පි: 514)

## පෞරව සහ කෞරව

* කරාව යයි නම් ලත් ගොත්‍රයෙහි............මිනිසුන්ගේ කථාව මහා භාරතාදි දඹදිව පුරාණ කාලයෙහි පොත් වල සඳහන්ව තිබෙන ක්‍රමය මෙසේයි.

පරවරු යයි.........වසන්තන්ගේ කථාව මූලකී පොත් වල ප්‍රකාශව තිබෙන ක්‍රමයෙන්..........................පරව යන නාමය ව්‍යවහාරව තිබෙන්නේ පෞරව යන සංස්කෘත භාෂාවේ නාමයෙන් බේද වීමෙනි.

ඉත්තිසා පෞරව යනුද පරව යනුද සමානාර්ථයි. ඒ ශබ්ද දෙකද ප්‍රාණාක්ෂර වලින් වෙනස පේන නමුත් ශාත්‍රා-ක්ෂර වලින් වෙනසක් නැත. පෞරව යන්නෙහි අර්ථය පුරුගේ පරම්පරාව කියායි. මොවුන්ගේ කථා පිළිවෙල විෂ්ණු පුරාණයෙහි ඇ ක්‍රමය මෙසේයි.

* ශාංතනු රජුගේ කථා වස්තුව කියවීමෙන් කරාවේ මිනිසුන්ගේ උත්පත්තිය පිළිබඳ වැඩි විස්තර දැනගත හැකිය.

(යයිමන් කාසි චෙට්ටි දිස්ත්‍රික් විනිශ්චයකාර තුමාගේ ගැසටියර් පොත ක්‍රි: ව: 1834 මුද්‍රණය)



"යාතිසතු රාජ්‍යං නෛවප්ත් යයා තිසතු හුභාද භවත්
උශන සශව දුහිතරං දෙවයාතිං ශර්මිෂ්ටාං ච වෘෂී පර්ණි
මූපයෙ මෙ අත්‍රානු වංශ ශ්ලෝකො භවති,
යදුඤ්ච තුර්වසුංචෛව දෙවයානි ව්‍යජායත
දුහ්‍යුං, චා නුඤ්ච, පුරුඤ්ච, ශර්මිෂ්ටා වෘෂී පර්ණි'.

මෙහි අභිප්‍රාය නම්; යාති තෙම රාජ්‍යයෙනොකැමැති වූයේය' යයාති වනාහි රජ වූයේය. උශ්න ශය්ගේ දුවවූ දෙවයානියද, වෘෂී පර්ණිගේ දුවවූ ශර්මිෂ්ටාද යන දෙදෙනකු බිසොවරුන් කොළේය. යදුද, කුර්සුද යන දෙදෙනකු දෙවයානිය වැදීය. වෘෂී පර්වණීගේ දුවවූ ශර්මිෂ්ටා තොමෝ දුහ්‍යුද පුරුද යනාදි තුන් දෙනෙක් වැදීය. පුරු, යාති-රජහුගේ පුත්‍රයෙක් බව ප්‍රකාශයි. මේ පුරු රජහුගේ දරු මුණුපුරන් ආදි කොට ඇති පරම්පරාවේ සමූහයාට අනන්ත පරම්පරා ගණනක් දක්වාත් "පෞරව" යන නාමය අයිති වේ.
ඒ බව මෙයින් දතයුතු.

තස්‍ය නාපස්‍යෙ යස්‍ය තො බහුරථ
ඉතෙ‍්‍යතෙ පෞරවාඃ

ඒ සූරවීර රජහුගේ පුත්‍රතෙම නාපංජය නම් වූයේය. ඔහු කෙරෙන් බහු රථ නම් රජ රජ වූයේය; මේ පෞරවයෝ හෙවත් පුරු රජුගේ පරම්පරාවේ වූවෝ මෙසේ යයි එම පුරු රජුගේ පරම්පරාවස්ථානයේදී කියන ලදී. පුරු රජුගේ පරම්පරාවට පෞරව යන නාමය ව්‍යවහාර කරණ ලද බැව් මෙයින් පෙනීයයි. මේ පෞරව යනනාමය දෙමළ භාෂාවෙන් පරව කියා ව්‍යවහාර කරති. පරවරු යයි කියන්නෙත් මේ නාමය ඇත්තෝමයි. මෙහි දක්වන පුරු රජුහා කුරු රජුද (පෞරව සහ කෞරව) යන දෙදෙනා අතරෙහි නෑකම කුමක්දැයි බැලූ කල කුරු රජ පුරුහුගේම විසිහත් වෙනි මුනුබුරා බව විෂ්ණු පුරාණයෙහි පෙනේ. මේ දෙදෙනාම එකම චන්ද්‍ර වංශිකයෝ වෙත්.

* වෙළඳ කුල කාසි චෙට්ටි විනිශ්චයකාර තුමා තම ගැසටියර් පොතෙන් තව දුරටත් මෙසේ ප්‍රකාශකර තිබේ.

"තවද මේ (කරාව) ගෝත්‍රය පිළිබඳවූ කරුණු පුරාණ සහ නම් ඇති පොත් වල සහ මහා භාරත යෙහිද කියා තිබෙනවා ය යන්න දෙමළ පොත්වලින් දැනගන්ට තිබේ."

තංසුහු ගේ පුත්‍ර තෙම තේජස් ඇත්තාවූ වේදය හදාරත්තාවූද සතුරන් මඩින්නාවූද සුරෝධ නම් රාජ ඍෂිහු ධර්මනෙත්‍ර නම් වූයේය. ඔහුගේ දේවී තොමෝ උපදන නම්විය.

ඕ තොමෝ ඵෙලිකගේ පුත්‍රවූ දුෂ්මාන්තද සුෂමාන්තද ප්‍රවීර සහ අනඝද යන පුතුන් සතර දෙනෙකු ලැබීය. දුෂ්මාන්තගේ පුත්‍ර තෙම චතුාහි බල සම්පන්නවූ භරත නම් වූයේය. ඇතුන් දශ දෙනෙකුගේ ශක්තිය ඇත්තාවූ පූජ්‍ය වූ හෙතෙම සර්වදමන නම් වූයේය. පූජ්‍යවූ දුෂ්මාන්ත හට සකුන්තලා කෙරෙහි යමෙකුගේ නාමයෙන් භාරතයෝ වූවෝද චක්‍රවර්ති භරත නම් පුත්‍රතෙම උපන්නේය."

(ශ්‍රී සුමංගල ඉතිහාසයෙන් උපුටා ගන්නා ලදී)

පෞරව හෙවත් පුරුගේ පසලොස්වෙනි මුණුපුරු දුෂ්මාන්තා රජ "පුරු" නීති ප්‍රකාර සකුන්තලා හා විවාහ විය. මේ පෞරව හෙවත් පුරුකුල දුෂ්මාන්ත රජුට ද ච සකුන්තලා දේවිය විසින් ප්‍රසූත කරණලද සර්වදමන නම් කුමාරයා පසුව දඹදිව චක්‍රවර්ති පද ප්‍රාප්ත මහා බල සම්පන්න භරත රජු වශයෙන් ප්‍රසිද්ධ විය. මෙතුමන්ගේ නාමය කරණ කොට ගෙන මුළු ජම්බුද්වීපයට ● භාරත භරත) දෙශයයි නම් විය.

මේ භාරත චක්‍රවර්ති රාජයාව දෙමල භාෂාවෙන් පාරදර් චක්‍රවර්ති" හෙවත් "පර්දර් අරශන්" කියාද හඳුන්වනු ලැබේ.

දෙමල භාෂාව උගත් කාසි චෙට්ටි දිසත්‍රික් නඩුකාර මහතා 'කුරු' කුලයට අයත් 'කරාව' "පරවර, 'පරම්පර්' 'යනාදි ගොත්‍ර නමයක් ඇති බව කියා තිබේ. (කාසි චෙට්ටි ගැසටියර් පොත) මෙයින් පරම්බර් යන ගොත්‍රයට අර් දී තිබෙන්නේ භරත රජුගෙන් පැවත එන පරම්පරාව යනුවෙනි.



"පරවර මිනිසුන් ගේ (පාරදර්) ඉතිහාසයේ ප්‍රකාර ඔවුන් චතුාහි භරත රජුගෙන් පැවැත එන පරම්පරාව" වන්නේය............චන්ද්‍ර වංශයට අයත් මෙම රජු "ඌඩි" (අයෝධ්‍ය) දෙශය ආණ්ඩුකරන ලදී.

පරවර මිනිසුන් ගේ විවාහවලදී ඔවුන්ගේ ගෞරවනීය ප්‍රාචණි කුලයට අයත් විජමය ජනක කොඩි, කුඩ, හා තාත්ත, මාන්නා දිය චාරිත්‍රානුකූලව පාවිච්චි කරති.

වර්තමාන කාලයේ පරවර ප්‍රධානීන් විසින් "පාතිගීසි" ආණ්ඩු කාලයේදී ලැබුවාවූ නම්බුනාමවලින්, අනුව ක්‍රියා කරති. "පාතිගීසින්" ගෙන් ලද්දාවූ "අල්කුසැඳ" නාමයක් තවමත් ඔවුන්ට ව්‍යවහාර කරති. පෘත්ගීසි" වංශවත් නාමපදයක් අනුවවූ "ඩොන්" යන්න තවමත් ඔවුන්ගේ නාමවලට සම්බන්ධ කරගනු ලැබේ.

ලංදේශීන්ට ඔවුන් යටත් වූවාට පසු රෝමානු කතෝලික සභාවෙන් ඔවුන් වෙනස් කිරීමට ලංදේශීන් විසින් බොහෝ දුරට උත්සාහ ගත් නමුත් ඒ උත්සාහය කිසිසේත් සඵල නොවීය. 'පරවර' ප්‍රධාන මුලාදෑනියා, ඔවුන්ගේ "ජාතිවලමේ මොරෙයි" නැමැති චාරිත්‍රය අනුව පත් කර ගනු ලැබේ. ඒ මුලාදෑනියාට එකී ඨානාන්තරය අනුව පැළඳීමට කදීම ඇඳුමක් ද ඇත්තේය. මොහුට අතික් 'පරවර' වර්ගියා ඉතා උසස් ලෙසට ගරු කරනු ලැබේ.

තූත් කුඩි ප්‍රදෙශය ලංදේශීන්ට සහ ඉංග්‍රිසීන්ටත් යටත් වූවාට පසු "පරවර" මිනිසුන් ගේ ප්‍රධාන මුලාදෑනියා පත් කිරීමේ බලය ආණ්ඩුව සතුවිය. නමුත් දූතට ඒ බලය ඔවුන්ගේ කුලයට භාරවී ඇත්තේය. මේ මුලාදෑනීන් විසින් කළයුතු රාජකාරි අතරෙන් මුතු කිමිදීම සම්බන්ධව කටයුතු වලට වග කිව යුතු බලයක් ඔවුන්ට ඇත්තේය.

"ජාතිවලමේ මොරෙයි" නැමැති චාරිත්‍ර අනුව ආඥාකරණ කිසියම් තීන්දුවක් ඇද්ද, එය ප්‍රශ්නයක් නොකර භාරගැනීම එම කුලවන්තයන්ගේ ප්‍රධාන අංගයෝ වෙති.

"ජාතිවලමේ මොරෙයි" නැමැති මේ මුලාදෑනියාගේ සහකාර මුලාදෑනි දෙදෙනාට A "අඩප්පන්" සහ "පට්ටන් කට්ටි" නම්වෙත්. ඊට පහත් අනික් මුලාදෑනියා චනාකි B "සිත්තාසි" නම්. ගමක් පාසා C "පට්ටන්-කට්ටි" මුලාදෑනි සිටිත්.

"ජාතිවලමේ-මොරෙයිගේ" ආඥාව ප්‍රකාර ඒ ඒ ගම්වල නඩු අනඩු විසඳනු ලබනවත් හැර ඔවුන්ගේ ප්‍රධානියාගේ නඩත්තුවට "කානික්කෙ" නැමැති බදු මුදලක් අය කිරීමට ඔවුන්ට බලතල ද තිබේ.

තූතුකුඩි ප්‍රදේශයෙහි "පරවර" මිනිසුන් දෙවර්ගයකි. "ජාතිවලමේ මොරෙයි" ප්‍රකාර එක වර්ගයක් උසස් කුලවන්තයින් වශයෙන් සලකනු ලැබේ. මේ ප්‍රධාන වර්ගයා "මේසකාරර්" (මේසකාරයෝ) නමින් පෙනී සිටිත්. කෑම වර්ග මේස පිට තබා ගත ආහාර ගන්න බැවින් එසේ ව්‍යවහාර කරත්.

A "Addappan or adddappanar = A chief headman, a King, a Ruler, among Parathars.

'අඩප්පන්" නොහොත් ,,අඩප්පනාර්" පරදර් වර්ගයට අයත් ප්‍රධානියෙක්-රජෙක් -ආණ්ඩුකාරයෙක් යන අර්ථයි.
("පරද කුල පාණ්ඩියම් ජේසාමි" නැමැති දෙමළ පොත 168 පිටුව)

B මෙය නඩු සම්බන්ධව සිතාසි බෙදන පියොන් හෙවත් "බෝදා" විය යුතුයි.

C "Pattankatti" - Tax gatherers and Headmen among Carreyars, Parathars etc.

"පට්ටන් කට්ටි 'කරාවෙ" සහ පරදර් කොතුවලට අයත් ආඥාම් අයකරන්නෝ සහ ප්‍රධාන මුලාදෑනි.

දෙශවලමෙ පොත; කෞතුකාගාර පුස්තකාලය අංකය 15-A 19-272 පිටුව



දුප්පත් "පරවර" මිනිසුන් ධීවර කර්මාන්තකාරයන්, නාවිකයන්, හා මුතු කිමිදින්නන් වශයෙන් යෙදී සිටිත්. ඔවුන් මේසකාරයන් වශයෙන් ගණන් ගනු නොලැබේ.

නුමුත් "ජාතිවලමේ මොරෙයි" චාරිත්‍ර සම්බන්ධයෙන් ඔවුන්ටද බලතල තිබේ. ලුහුඩින් කීයහොත් පොහොසතුන්ට සහ වෙළෙඳුන්ට පමණක් "මේසකාරර්" යන නාමය අයිති බැව් පෙනේ. උසස් තත්වයේ "පරවර" මිනිසුන්ගේ විවාහ මංගල්‍යයන් බොහෝ ප්‍රසංශනීය අන්දමට පවත්වනු ලැබේ. මේ උත්සවයන් හින්දුවරුන්ගේ මංගලෝත්සව වලට බෙහෙවින් සමානය. "පරවර" මිනිසුන් හින්දුවරුන් වශයෙන් සිටි කාලයේ සිට මේ සිරිත්-විරිත් පවත්වාගෙන එනු ලබන බව මුත් කොයි කාලේ සිට පැවැත්වීමක්දැයි කිය නොහැකිය.

විවාහ මංගල්‍යයන් චාරිත්‍රානුකූලව සිඩවූවායින් පසු දෙවස්ථානයෙහි සිට දුටුවන් විස්මයට පත්කරනාකාර පෙරහරක් මනාලියගේ නෙදරට යනු ලැබේ. මේ පෙරහරට "විරුදු" නොහොත් කොඩිවර්ග ගෙනයනු ලැබේ. මේ කොඩිවර්ග "විරුදු" යනාදිය පරවර මිනිසුන් ගේ රාජකීය මුතුන් මිත්තන්ට අයිතිව තිබුන "අඩයාලම්" වශයෙන් විශ්වාස කරනු ලැබේ. මේ "විරුදු" වර්ගවලට අයත් නොයෙක් ආකාර අඩයාලම් විසි එක් වර්ගයක් ගෙන්නම් කර ඇත්තේය.

මේවා-නාගයෙක්, ඉර, හඳ, මොණරෙක්, හංසයෙක්, හක්ගෙඩියක්, මත්ස්‍යයෙක් තල් අත්තක්, ආදී ලකුණු වලින් යුක්තය. මේ හා විශාල කුඩයක්ද, පල්හක් සහ ආයුධවර්ගයක් ද, ත්‍රිශූලයක් ද, ගෙනයන්නේය.

මනාලයාගේ ඇඳුමට "කප" යයි කියති. මනාලයාගේ ගමන් මාර්ගයේ සුදුරෙදි (පාවාඩ) මගදිගට අතුරනු ලැබේ.

"වාසපඩිමරියෙල්" නැමැති "කඩුලුරුකිම" හෙවත් "කඩුලු බුලත් දීම" වැනි සිරිතක් ද මනාලිය කැඳවාගෙන යන අවස්ථාවේ පවත්වනු ලැබේ.

හිංදු භක්තිය අත්හැර සිටින්නාවූ මොවුහු (පරවර වර්ගය) ඥාතියෙකු හා සරණ බන්ධනයට ඇතුලත් වනවිට සියලු කල්හිම පිළිපැදිය යුතු "මොරෙයි" නම් සිරිත අනුගමනය නොකරති. එහෙත් පෙර කාලයේ මොවුන් මේ චාරිත්‍ර අනුගමනය කල බව දක්වන රමනීය උත්සවයක් ඔව්හු සමහර විට තවමත් පවත්වති. "වාසපඩිමරියෙල්" නැමැති මේ උත්සවයේ ප්‍රධාන අංගය නම් මනාලයා සහ "මොරෙයි" සිරිත අනුව මනාලිය නාකරකාර බන්ධනයට ඇතුලත් වියයුතු ඇගේ ඇවැස්ස මස්සිනා අතරත් සිදුවන ව්‍යාජ වාදයකි. දෙව මෙහෙයෙන් පසු මනාලයා මනාලියගේ නිවස ට ලඟාවූ විට මනාලියගේ ඇවැස්ස මස්සිනා පැමිණ ඔහුගෙන් මෙසේ ප්‍රශ්න කෙරේ.

(මනාලියගේ ඇවැස්ස මස්සිනා මෙසේ අසයි.)

සුවඳ හමන්නාවූ මල්දමකින්ද මනාසේ බැඳගත් ජවංවකින්ද කෝඩු සලු පිලියෙන්ද උත්තර සාටකයකින්ද මනාලයෙකුසේ සැරසුණු ඔබ පෙරහැරකින් නගරය ඔස්සේ සැරිසරා කුමක් නිසා මෙහි පැමණියෙහිද?

(මනාලයා මෙසේ පිළිතුරු දෙයි.)

මේ සභාවේ රැස්ව සිටින කතෝලිකයිනි, මාගේ ඉල්ලීම සාධාරණ බව යුෂ්මතුන්ට පෙන්වා දෙන්නෙමි. මාගේ වදනට සවන්දෙව්.



A ශුද්ධවූ කන්‍යා මාතාවට පූජා කරණලද අති පරිසුද්ධවූ දෙවස්ථානයෙහිදී, මාගේ ශාන්තවූ පූජක තුමා අද උදෑසන මාහට මනාලියක් සරණකර දුන්නේය. මා දුන් මෙහි පැමිණියේ ඒ මනාලිය ලබා ගැනීමටයි.

(මනාලියගේ ඇවැස්ස මස්සිනා යළිත් මෙසේ කියයි.)

"ඔබ මෙසේ ඇය සෙවීමට පැමිණීම යුක්ති සහගත වුවත් සරණ බන්ධනයෙන් පසු මෙපමණ වේලාවක් ගත කොට ඔබ කුමක් නිසා පැමිණියෙහිද? පන්දම් අතින් ගෙන කොඩි කුඩ සේසත් ගත් මේ සමූහයෙන් යුත් පෙරහැරක් කුමටද? මෙලෙස B පාවාඩ දැමීම කුමටද?"

(මනාලයා මෙසේ පිළිතුරු දෙයි.)

මා මෙසේ මෙහි පැමිණීමට හේතු අසව. මේ මනාලිය මා විසින් භාර්‍යාව වශයෙන් ගත යුතුය යනු අප ගැලවුම්කාරයාවූ ජේසුස් තුමාගේ නියමයයි. ඔබගේ පූරසාරම් කථාව නවත්වා වහාම මනාලිය මඟුල් මඩුවට කැඳවා එනු."

(මස්සිනා)

"මගුල් මඩුවේ සිටින යුවතිය මාගේ නියම මනාලිය වේ. ඔබ මට රන් මිළ දහසක්ද, අසුන්ද, අලි, ගවදෙනුන් සහ වස්සන්ද දෙන්නෙහි නම් ඔබට ඇව භාර්‍යාව වශයෙන් පාවා දෙන්නෙමි."

---

A පරදර් වර්ගයා හින්දු ලබ්බිකයින් වශයෙන් සිටි කාලයේ හින්දු දේවාලයට අධිපති දෙවිඳුවගේ නාමය කියා තිබේ.

B පාවාඩ දැමීම පරවර මිනිසුන්ට අයිති සිරිතක් සෙයින් "මදුරාසි දෙශවලමේ" ප්‍රකාර ඔවුන්ට එයින් බාධාවක් නො කරනු ලැබේ.

(මනාලයා)

හෙට ඉර උදාවනවිට ඔබ ඉල්ලන සියල්ලම මම දෙන්නෙමි. ඒ බවට ලකුණක් වශයෙන් මේ රන් මුදුව ගනුව. මහලු "අවුවයියාර" නැමැති කිවිවරිය කියන්නාක් මෙන් අප ත්‍යාග ශීලී භාවය ගැන ඉතා ප්‍රසිද්ධ බව ඔබ මනාව දන්නෙහිය."

(තින්නවලි ගැසටියර් පො. 122-123-124-125 වෙනි පිටු)

" තවද ............... මදුරාශි දිස්ත්‍රික් ගැසටියර් නම් පොතේ (ක්‍රි. ව. 1917) තුන්වෙනි පරිච්ඡේදයේ 120 පිටුවේ තින්නවැලි පලාතේ කුල ප්‍රභේද සම්බන්ධව විස්තර කරණ දකුණු ඉංදියා ආණ්ඩුව, ප්‍රධාන වංශිකයින් "THE PRINCIPAL CASTES" යනුයෙන් මුල් අංකය දක්වා තිබෙන්නේ ඒ මේ "පරවර" නොහොත් පරදර් වර්ගයාට බව සැලකිය යුතුයි. මේ නයින් තින්නවෙලි පලාතේ වාසය කරන පරවර මිනිසුන් ඒ පලාතේ ප්‍රධාන වංශිකයින් වශයෙන් ඉංග්‍රීසි ආණ්ඩුව පවා උසස් අන්දමට සලකන බව මොනවට අවබෝධ වන්නේය."

මෙහි යට දැක්වුනු සාක්ෂින් ගෙන් භරත, කෞරව, පෞරව යනු එකම ගෝත්‍රයක් බවත්, එයින්ම "පරදර්" නොහොත් පරවර යන්නවද බිඳී පවතින බවත්, පරවර යෝද කුරු වංශිකයෝ බවත්, භරත (භාරත) යනුද පෞරවයෝම බවත් මනාව පැහැදිලිවේ.

"දකුණු මධුරා පුර රජය කල මධු රජු කඳ කුමරු විසින් මරණ ලදී. එසේ මරා එහි තිබූ ඉතා පුරාණ කෝවිලක් අතපත් කර ගත ඒ කෝවිල පරිස්සමට පරවර ස්ත්‍රියක්වූ මීනච්චි නම් මණු හොත් උත්තමියට භාර කරණ ලදී.



එළෙස් බාරදුන් හෙයින් අද දක්වා ඒ කෝවිලේ බලයද ප්‍රධාන කමද ඒ පරවර ගෝත්‍රිකයන්ට අයත්ව පවතිමයි.''

(ශ්‍රී ලංකාද්වීප වර්ණනා පිටු 55)

මදුරා පුර මනුකුල A මීනාක්ෂි නැමැති දේවතාවිය කරණකොටගෙන පාරදර් වර්ගයාට මනුකුල ආදිත්‍ය හෙවත් මනුකුල සූරිය නාමය පට බැඳුනු බව ඔවුන් විසින් කියනු ලැබේ. සොළී රට කාරිකාල රජුන් දවස කුරු රට කෞරව යුධ මහාබල ඇතියක් එ රජු සෙවනේමෙහෙ කල බව ඉංදියානු ඉතිහාස පොත්වල සඳහන් වී තිබේ. මොහුට "කරිකාල ආදිත්‍ය" කියාද ව්‍යවහාර කර තිබේ.

B නෙඩුමුඩි කිල්ලි රජ මොහුගේ මුණුපුරෙකි. මෙම රජුගේ අග නුවර කාංචි පට්ටනම විය.

"Very little can be said with certainty about the PANDYA kingdom in its earliest days; but of its anti' quity there is clear evidence. According to some versions of the Mahabharata, Arjuna visited the Country (Pandya Country)."

(Tinnevelly Gazetteer-Early History—Chap. ii - Page 41.)

"පාණ්ඩි රාජධානියේ අතීතය ගැන සත්‍ය වශයෙන් කිව යුතුව තිබෙන්නේ බොහෝ ස්වල්ප වශයෙනි................ මහාභාරතයෙහි සඳහන් සමහර පාඨ අනුව අර්ජුන තෙමේ මේ රටට පැමිණ තිබේ."

ශාස්ත්‍රාචාර්ය කෝල්ඩ්වෙල් මහතාගේ තින්නවැලි ඉතිහාසයේ සඳහන් ප්‍රකාර, දකුණු ඉන්දියාවේ පාණ්ඩවවරු ඒ නමින් පෙනී සිටිනු ලැබුවේ කුරු රට පාණ්ඩව පරපුරට සම්බන්ධ කමේ උරුමය ජනවුරු කරගැනීම පිණිස ය."

---

A මීනාක්ෂි (මීනාච්චි) මත්ස්‍ය ඇස් ඇත්තී යනුයි. මෘගාක්ෂී මෙනි,

B මෙම රජු දවස ගජබා රජු විසින් ලක්දිවට සොළී සහ කුරු කුල සිර සෙනගක්ද ගෙනෙන ලද්දේ ය.

"The Kauravas who are no doubt a northern remnant of a race in Ceylon and South India, where it forms a distinct caste, still holds a prominant place."

(Indian Ethnology, by H. Neville, C.C.S.)

මෙහි භාවය :-

"ලංකාවේ සහ දකුණු ඉන්දියාවේත් නිත්‍ය පදිංචිකාරයන් මෙන් වාසය කරන කෞරවයන් වූකලී උතුරු ඉන්දියානු වංශයකින් පැවත එන්නන් බව නො අනුමානව කියන හැක. එය වෙනම වංශයක් වශයෙන් පවතිනවා පමණක් නොව තවමත් උසස් තත්වයක තිබේ."

(ඉන්දියන් එත්නෝලොජි, එච්. නෙවිල්, සී. සී. ඇස්.)

## கவுர வடுகர்

## කවුර වඩුගර්

කුරු නොහොත් කෞරව දේශයෙන් දක්ෂිණ ජම්බුද්වීපයට පැමිණ පදිංචි වූවන්ගෙන් ඇතැම් අයට කෞරව වඩුගර් යනුවෙන් ද්‍රවිඩයෝ ඔවුන් හට ඇමතුවෝය. එහි අර්ථය උතුරු ඉංදියානු කෞරවයෝ යනු සී. එදත් අදත් එහි සාමාන්‍ය වඩුගර්වරු මහමත් වඩක්කරු වර්ගයක් පදිංචිව සිටිනා බැවින් ඉහත සඳහන් උතුරු ජම්බුද්වීප වාසීන් වෙන් වශයෙන් හොඳුනාර හඳුනා ගැනීම පිණිස කෞරව යන අරුත් මුසු "කවුර වඩුගර්" යනුවෙන් ඔවුන්ට ව්‍යවහාර කරන්ට විය.

එපමණක් නොව මේ "කවුර වඩුගර්"වරුන්ට "නායකර්" කියාද එයම කෙටි වශයෙන් "නායිදු" කියාද ගරු වශයෙන් මේ දක්වා භාවිතා කරනු ලැබේ. භරත හෙවත් බරතර් (පරදර්) සහ කෞරවයෝ "නාග"ගොත්‍රයට අයිතිය යන විශ්වාසයෙන් "නායිදු" හෙවත් "නායක්කර්" නාමය ඔවුන් හට ඇතිවී ඇතැයි විශ්වාස කළ හැක.



"The Vadugans, Kammavans and Kambalattans, all of whom bear the title Nayakan or Nayudu."

(තින්නවලි ගැසටියර් පිටු 88.)

භාවය: A"වඩුගන්, කම්මවන්, සහ කම්බලත්තාන් යනාදී මොවුන් හට "නායක්කන්" (නායක්කර්) නොහොත් "නායිදු" යන පටබැඳි නාමය අයිති වන්නේය."

මෙම "නායක්කර්" නාමය කෙටි වශයෙන් "නායක්" කියාද පාවිච්චි කරති.

---

A අර්ජුනස්‍ය පශුලූපස්‍යං නාගකන්‍යායා මියා වාන්නාම පුත්‍රොභූත්; මණිපුරපති පුත්‍ර්‍යාඤ්ච පුත්‍රිකාධර්මේණ බභ්‍රුවහනං නාම පුත්‍ර මජීජනත්"

භාවය:-

අර්ජුන කුමාරයාහට දව උලුපී නැමැති නාගකන්‍යාව ඉරාවත් නම් පුත්‍රයෙකු ප්‍රසූත කොළේය.

මණිපුරයට ස්වාමියාවූද මව් පක්ෂයෙන් මුත්තණුවූ රජුගේ දියණියද (අර්ජුන) පාවාගත්තා ලදුව (ඇයිසින්) බභ්‍රුවාහන නම් පුත්‍රයෙක් ප්‍රසූත කොළේය

මෙහි සඳහන් උලුපී නාග කුමරිය මෙන්ම මණිපුරයෙහි රජුද නාග ගෝත්‍ර ඇත්තෙකි. මෙම නාරජු අර්ජුනගේ මෑණියන් වන කෞන්තය හෙවත් කුංදි බිසවගේ බන්ධුවරයෙකි. සවකීය මවගේ නෑකම කරණකොට ගෙන මෙම නාග රජු අර්ජුන හට මුත්තනුවන් වූ බව සැලකිය යුතුයි. එහෙත් මුත්තනුවන්වූ රජුගේ දියණියන් වන නාග කුමරියද අර්ජුන පාවා ගෙන බභ්‍රුවාහන නැමැති පුත්‍රයෙක් උත්පත්ති කොළේය.

කුරුරටේද නාග වනයක් තිබේ. කුරුරට අශෝක ශිලා ලිපිය අනුව මෙහි වැසියෝද කුරු රැට් නාගයෝයි.

කෞන්තය බිසවද, අර්ජුනද, ඉරාවත්ද, බභ්‍රුවාහනද, කුරුකුලයට සම්බන්ධකම් තිබෙන්නාසේම නාග ගෝත්‍රයටද ඔවුන්ගේ සම්බන්ධකම් තිබෙන බව මෙයින් පෙනේ.

තවද කුරුරට නාග වනයෙහි සිටි නාගයින්ද මෙකියන ලද කුරුරැටියන්ට නෑ සබඳකම් ඇතුව සිටි බව විශ්වාසකළ හැක.

ඉහත කියන ලද නාගගෝත්‍ර සම්බන්ධය හේතුකොටගෙන කවුරවඩුගර් යනාදි කුරුකුල වර්ගයාට, නායිදු, නායික්, නායකර්, යන නාග නාමයන් ඇතිවූ බව වටහා ගත හැක.

සිංහල භාෂාවෙන් නයිදෙ කියාද ස්ත්‍රීලිංගානුකූලව නාච්චිරේ (නාග අක්ෂි) කියාද ව්‍යවහාර වන්නේ ඉහත සඳහන් නාමයෝ වෙති.

මොරටුව, පානදුරේ, මීගමුව යනාදි පලාත්වල කරාවේ ස්ත්‍රී පුරුෂයින්ට නයිදෙ සහ නාච්චිරේ යනුවෙන් අමතා තිබේ.

"අළු ත් කුරු කෝරලෙ කුරු කු ලා වේ
ජග ත් විජය කුරුරට මහ කරා වේ
රජු ත් සමග සමුදුර ගොස් හරා වේ
අඩු ත් තුනිය කළුරට කුත් දිරා වේ"

(මුක්කර හටණ පුස්කොළ පොත)

"පරවර නම් මිනිස්සු ජාතිය............ලංකාවේ මුහුදු (බඩ පලාත්) කරේ වෙළඳාම පිණිස විත් සිටිය හෙයින් පිණිසි වරු (සිරිලක් දිවයින පළමුව සොයා ගත් ශිෂ්ට ජාතිය පිණිසියන් වරුයි. ඔවුන්ට මේ මනරම් දූපත හමුවූයේ ක්‍රිස්තු වර්ෂයට පෙර 1034 පමණ කාලයේදීයයි සලකනු ලැබේ. එය සොයාගත් තැනැත්තා කවරෙක්දැයි දැනගන්ට නැත. නමුත් මේ කාරණය ඔප්පුවීමට ප්‍රමාණවත් කරුණු "ශිකනර්" නැමැති පඬිවරයා විසින් විරචිත ග්‍රන්ථයට ඇතුල්න්වේ. ඒ. බටුවර් මහතාගේ ලිපි යක ආශ්‍රයෙනි) ව්‍යවහාර කල "පරවර" මුහුදු කරේය යන අර්ථ ඇති තපවාන් නොහොත් පරවාත් යන නාමයද *සංස්කෘත භාෂාවෙන් රාවණාගේ දිවයින නොහොත් යාඥවීමේ වනාන්තරය යන අර්ථ ඇති තපෝරාවත් යන නාමයද, තවත් සමහරෙකුගේ කල්පනාවේ හැටියට ලංකාවේ රූපය තාම්බුල පත්‍රයකට බඳු නිසා එයට මගධ භාෂාවෙන් දී තිබෙනවාය කියන තම්බපාන්නය යන නාමයද ඉහතකී අරාබිවරුන්ගේ සිරන් ඩිප් යන නාමයද

(හෙළදිව රජනිය ක්‍රි. ව. 1853 මුද්‍රණය.)

"පෙර අතීත කාලේ කුරු රටින් පැවැත ආ රජකිස වක්ද කුමාරයෙක්ද ප්‍රෝහිත බමුණෙක්ද සිවාණ කෙනෙක්ද පිරිවර සහ ඇවිත් රාවනා යුධයට පසු රාම රජුගේ නියෝගයෙක් විසූ හෙයින් කුරුරට නම්විය.

* සංස්කෘත



අප බුදුන්ගේ ශාසනයේදී ගජබාහු රජ ඒ කුරුරටින් ඇවිත් විසූ රට දකුණියකට දූත් හෙයින් අලුත් කුරුව වියයි දැනගත යුතුයි. පෙර පිනු රජ කාලේ බාල කිලිදුන්ට රා පෙවූ හෙයින් රාගම් පත්තුව විය. එහි පළමු කාලේ වෙල මැද දූවක නාගස් දෙක පිහිටි හෙයින් දූනගහ පත්තුව විය. තුන් රාජ්‍යයකින් ප්‍රසිද්ධවූ මෙරටට පෙර මහත් වී බෑදී ද්‍රොන මුඛයක් හා ඒ දිගින් මුහුදින් සගවිවක් ගිය. නැතදු.........ගොඩැල්ලක් ඇත. ඒ ළඟ සීමා පහුර සම්පජෙයහි දෙළුන් ගෙඩිසේ සත්රුවන් නිධානයක් ඇත' මෙම රටට වයඹ දිගින් කම්මල් තොට හා ඔ තෙරක් ඇත්තේය. නැගෙන ඉර දිගට මහ නියම් ගමක්ද ඇත. ඒ ගම වෙල මැද මහ මලක් ඇත්තේය."

"මේ මුහුදු බඩ උපන් ඇත්තෝ බොහෝ අධික ජය ඇත්තෝයි දත යුතුයි."

(කෞතුකාගාර පුස්තකාලයේ අංක AO/13 දරණ කුරුණෑගල විස්තරය නැමැති පුස්කොළ පොතෙනි.)

"ධූතරාෂ්ට්‍ර රජුගේ බිසෝවූ ගාන්ධාරියගේ ශාපය කරණකොට වනයෙහි විසූ වැද්දෙකු විසින් කෘෂ්ණා තෙමේම විද මරණලදි. කෘෂ්ණාගෙන් පංච පාණ්ඩව වරුන්ට ලැබුන නිමක් නොවූ තරම් උපකාරයන් සලකා එයට කෙලෙහි ගුණ සැලකීමක් වශයෙන් කෘෂ්ණාගේ හට සේනාව "කුරුවංශික" සහදේව නම් පාණ්ඩව කුමාරතෙමේ විසින් රක්නා ලදී. මේ කුමර තෙම ලක්දිවට පැමිණ එකල විසූ ලක් දිව් වාසීන් හා සටන් කොට ලක්වැස්සන් රාශියක් දඹදිවට ගෙන ගියහ." රාවණා රජුගෙන් පසුවූ රාමරජ දවස ලක්දිවට පැමිණි "රාවණා රාජාවලියෙහි" සඳහන් කුරුරට පිරිස මේ සහදේව කුමරු ආදීකොට ඇති පිරිස විය හැකියයි, සැලකීමටද ඉඩ තිබේ. එසේ නැතිනම් රාම රජුගෙන් කුරුරට සිට ආ පිරිසකට දෙවුණුයි යටකී * "කුරුකුලාව" නැමැති ග්‍රාමයේ තාවකාලිකව විසූ රාජකීය කුරුරට පිරිස මේ ඉහත දැක්වුණු සටණ හා සම්බන්ධ කම් ඇත්තෝ යයි සිතීමට ඉඩ තිබේ."

* හලාවත ප්‍රදේශයේ කුරුකුලිය නැමැති ගමක්ද මඩකලපු පලාතේ කුරුකුල කුඩි නැමැති ගමක්ද තිබේ. මේවා කෞරවයින් ගේ පදිංචිය එහි ඇතිවීම හේතුකොට ගෙන ඇතිවූ ග්‍රාම නාම යෝ වෙති.

# විජය රජ කාලය

"මෙසේ බුඩාන්තර තුනක් ගිය කල බුදුන් පිරිනිව් දිනෙහි නික්ම, සත් වෙනි දින ලක්දිවට පැමිණි, විජය රජහු සිරිලක රජ කරණ සමයෙහි තමත් වහන්සේ හා සමග ආ සත් සියයක් යෝධයින් අතරෙන් සමහර දෙනෙක් මුහුදින් ගොඩ බසින තැනම ගෙවල් කොට මුහුද කෙලවර දිය සමීපයෙහි වසන හෙයින්.................. ලංකා භාෂාවෙන් ඔවුන්ට "කරාව" ය යි කිව්හ."

(සන්න සහිත පාලි ජනවංශ පුස්කොළ පොතෙන් උපුටා ගන්නා ලදි.)

ලක්දිවට විජය කුමාරයා හා සමග අමාත්‍යයන් සත් සියයක් පැමිණි බව කිව් පමණ මිස, ඔවුන් වනාහි අසවල් ගොත්‍රවලට අයත් ජනයෝද යනු මහාවංශයෙහි සඳහන්ව නැත.

මහාවංශයෙහි අමාත්‍ය නාමය ව්‍යවහාර කරන ලද අන්‍ය ස්ථානවල ක්ෂත්‍රියයන් නොහොත් රාජ වංශිකයන් අරභයා අමාත්‍ය නාමය කියා තිබෙන බව මෙතනවට පැහැදිලි වේ.

විජය කුමාර තෙම රජදූවක නැති බැවින් සිරිලක අභිෂේකයට අකමැති වූයෙන් ඔහුගේ සත් සියයක් ඇමැතියෝ මුතු මැණික් ආදී බොහෝ පඬුරු නෙත්වා දකුණු මදුරා පුර පඬි රජුව දූයාද පිණිස යවා, එම රජගේ විජයාසි නැමැති දියණිය විජය රජුගේ මෙහෙසිය පිණිස ද එරට අමාත්‍යවරුන්ගේ දියණිවරු මෙහි සිටි අමාත්‍යයන්ගේ භාර්යාවන් පිණිසද ගෙන්වා පාවා ගත්හ.



පාලි ජනවංශයෙහි සඳහන් මුහුද සමීපයෙහි, එනම් තම්මැන්නා අඩවිය අසල පදිංචිවූ විජය නම් බංගාලි කුමාරහුගේ යෝධයින් සත් සිය දෙනා නොහොත් අමාත්‍යයින් සත් සිය දෙනා අතරෙන් මුහුදු සමීපයෙහි පදිංචි වූ අමාත්‍යයන් සමූහයකට කරාවේ යන නාමය අයිතිවූ බවත් මෙ කියන ලද කරාව නම් ලත් අමාත්‍යයන් සමූහයද මදුරා පුර අමාත්‍ය දූවරු පාවාගෙන සිටිය බවද, ඔව්හු සමූහය පමණක් කුරු කුලයට අයිති ක්ෂත්‍රියයන් විය යුතු ය යි මහාවංශයේ හා ජනවංශයේ කරුණු අනුව සිතීමට ඉඩ තිබේ.

විජය රජහුගේ අමාත්‍යයන් අතර කුරුකුල ඇමැතියන් සිව් දෙනෙක් හා තවත් අමාත්‍ය පිරිසකගේද නාමයන් හා පදිංචිවී උන් ස්ථාන පිළිබඳ විස්තර පහත දැක්වේ.

1 ඔච්චු අමාත්‍යයා - ඔච්චු කච්චියේ උන්නාය
2 කලච් කියන අමාත්‍යයා - තඹරාවිල උන්නාය
3 "කුරුවත්තියා" කියන අමාත්‍යයා - කුරුදූවේ උන්නාය
4 රත්නා කියන අමාත්‍යයා - රාමපිටියේ උන්නාය
5 මාරාති කියන අමාත්‍යයා - මාරාපිටියේ උන්නාය
6 "කරාති" කියන අමාත්‍යයා - කරදෙනපිටියේ උන්නාය
7 වරාති කියන අමාත්‍යයා - රාමාපිටියේ උන්නාය
8 කල්ලරු කියන අමාත්‍යයා - කලාපිටියේ උන්නාය
9 උපතිස්ස කියන අමාත්‍යයා - තිස්සපිටියේ උන්නාය
10 සේරතිස්ස කියන අමාත්‍යයා - සේරත්නපිටියේ උන්නාය
11 දේවතිස්ස කියන අමාත්‍යයා - දෙවගනාපිටියේ උන්නාය
12 "කුරාති" කියන අමාත්‍යයා - කුරුපිටියේ උන්නාය
13 "කරාති" කියන අමාත්‍යයා - කරාපිටියේ උන්නාය
14 යාමදේව කියන අමාත්‍යයා - ගල්පිටියේ උන්නාය
15 දෙවනාති කියන අමාත්‍යයා - දෙළුත්පිටියේ උන්නාය
16 මෝදරාති කියන අමාත්‍යයා - මෝදරපිටියේ උන්නාය

17 සාවන්ති කියන අමාත්‍යයා - වන්නාපිටියේ උන්නාය
18 වෙනංකති කියන අමාත්‍යයා-වෙට්ටුමුන්නේ උන්නාය
19 පරාති කියන අමාත්‍යයා - පිලිවලපිටියේ උන්නාය
20 වරාතිසස කියන අමාත්‍යයා - වරාපිටියේ උන්නාය
21 රුත්බල කියන අමාත්‍යයා- කිරිඋල උන්නාය

මින්, කුරුවන්තියා, කරාති, කුරාති, කරාති, යන සිව් දෙන කුරුකුලයෝ යි.

(කෑගලු පලාතේ මාන්ගෙදර වලව්වේ තිබුන පුස්කොල පොතේ අත් පිටපතකින් උපුටා ගන්නා ලදී.)

"දඹදිව කාලිංග චක්‍රවර්ති රජහුගේ මුණුපුරු වූ විජය රාජ කුමාරයන් ලක්දිව එන ගමනේ සත් සියයක් යෝධයන්ට පලමුවෙනි යෝධයාණෝ නම්......................විජය රාජ කුමාරයින් කරා ආ හෙයින් කාරවන්න.........කාරවනන කුමාරයින්ට යුවරාජ තනතුරුද, ගම්වර සොලසක්ද දී බොහෝ රාජ්‍යාභ්‍යන්තරව නොයෙක් ලෙසින් උපස්ථාන කොට වසන කල්හි ඔවුන් හට කාන්චීපුර නුවරින් විවාහ මංගල්‍යයක් ලදින්...........................ඉක්බිති නොබෝ කලක් ගියායින් පසු දරු සදෙනෙක් ලැබ මෙසේ වසන කල විජය රාජ කුමාරයාගේ කථා මාත්‍රයකින් ඒ කාරවනන යුව රජ්ජුරුවන් තමන්ගේ මෙහෙසියන් හා සමග වැඩිමහලු කුමාරිකාවුන් දෙදෙනා හා වැඩිමහළු කුමාරයන් දෙදෙනා හා විජය රජ්ජුරුවන් ළඟ සිටුවා ලාබාල කුමාරවරු දෙදෙනා හා සමග යුව රජ්ජුරුවන් කාංචි රට වැඩ කාංචි පුර නුවර අග්‍රරාජ්‍යය කොට කම් වූ පරිද්දෙන් මිය පර ලොව ගියාහ."

එයින් පැවති ආ අයට "මචම කොනාත කාරවනන" කියාද "කරාව" කියාද ප්‍රසිද්ධ වූවෝය. ඔවුන් බොහෝ කෲරය. අකුසල් කිරීමෙහි භය නැත. යුධයෙහි දක්ෂ



යෝය...... ඉතා තීක්ෂණවූ වික්‍රම ක්‍රියාද ගෘහ කර්මාන්තයෙහි දක්ෂවූ නියාවද කාලිංග චක්‍රවර්තිහුගේ මුණුපුරු වූ සිංහබාහු රජහුගේ පුත්‍රවූ අභය ඇති විජය නර පතිහු ලක්දිව රජකරන කල තමන්ගේ විජිතයෙහි අගමැති කමට හා විසිතුරු මාලිගාදිය කරවීමට හීසියුම් කමින්ද මන්ත්‍රී කමින්ද යුක්තවූ කාංචිපුර නුවරින් කරාවේ ගෘහපතින් සුවිසි දෙනෙක් ගෙන්වා ලංකාවීප යෙහි ගිඳිනා ලෙස කෙත් වත් ගව මහිෂ වස්ත්‍රාභරණ ආදීන් ඔවුනොවුන්ට දී සම්මත කළාහ."

(තමන්කඩුවේ කොඩිකාර ගම පන්සලේ වනවාස ස්වාමීන්ගේ "ජලනඥනය" නැමැති පුස්කොල පොතෙන් පිටපත් කරගන්නාලදි.)

## පඬුවස් දෙව් රජ කාලය

### වෙඩි අර්ශන්, නොහොත් වෙඩර් අර්ශන් මල් රජ

පඬුවස් දෙව් රජ, රජ කරන අවදියට විජය රජ්ජුරුවන්ගේ දිවීදෙස් පඬුවස් රජට වැදිලා, සීත දූකලා මුනිාව නැගී නොසිටද වැද ඔත් සද පුරදරා ලත්බාර තිසා සිරිලකට පැමිණ පඬුවස් දෙව් රජුට වන් දිව්දෙස් දූකලා මල් රජ ("Mal Occurs for Vaddhas") "මල් යනු * වැද්දන්ට අයිති නාමයකි) (Ancient Ceylon. Page 37 Museum Library No. 6-B 35 by H. Parker 1909) සිරිලකට ගෙනි සන්ධ චක්‍ර, ඉසිර, රාහු කැඳවා කිසද, රාහු ගොස් මල්

* "රජවරුන්ගෙන් සහ සමහර පුරෝහිත බ්‍රාහ්මණයින්ගෙන් පැවැත එන සමහර පරම්පරාවල් ඔවුන්ගේ පස මිතුරන්ට කියෙන් සිය කැමැත්තෙන්ම වනවාසයට පත්වූවෝය. එසේ වූවන්හට වැදි වංශිකයෝයයි කිව්හ."

(Niti Niganduwa, Page 6. By T. B. Panabokke)
(Museum library No. 15-B 3)

රජුගේ උයන උෟරුවෙස් මවා ගෙන පාළු කරන්ඩ වන් නාග. ඒ මල් රජ මෙවැනි පලතුරු රස පැදගිය බිසවගේ ඇති කල කුමාරයායයි දනගතයුතුයි. තපස් වරයා මහා ආනුභාව ඇති කෙනෙක. මාතෙල් මලෙන් උපදවා දුන් නයි දනගත යුතුයි. මල් රජ උරුවෙල් දනව්වේ නුවර කරවා උන් නා දනගත යුතුයි. මල්රජ උයන පාළු වෙන බව අසා සෙනග ගෙන වට කරවා බැඳි ගැසුව්ට ඇවිත් මල් රජු ගේ කොටු පතට පැන්නව්ට මල්රජුගේ විදි සරය වලක්කා සිට රජු මුණතින් පැන දුවන්ඩ වන්විට රජු උෟරු පාරේ එලවමින් එහු ඔදවා ගන ඇවිත් තුනි කුඹියට වන්සඳ, එත තින් මුහුද වන් සඳ, රිඩි මල්ලන් මල් රජන් කිත්සිරු සඳන් දස සිරු තු ා් දෙන එතතින් මුහුදු දියට පැන එන විට එදුට් මුද සිරිලකාට අතර තුර පලමු රාවණා ගේ අධම් යෙන් රාවනාගේ කෝවිටයන් විදි හාරලක්ෂයක් මාලිගා පස්විස්සක් මුදට සිලී ගියායයි දනයුතුයි. ඒ මුදු කලා වෙන් රාවනාගේ මේ සිරි ලකට ගොඩනැගී තොටට උෟරා තොට නම් විය. මල්රජ පාරේ එලවමින් ශිරිලක මුලුල් ලක් දුවපු උෟරා ගල් කුලක් මවා දමා රාහු ගිලිසඳ, රජු එගලට කොට කොටා කුමණ කාරණාවක්දුයි සුන සිතා සිටි සඳ, සක්දෙව් රජ මල් රජුට පෙණී සිටී සඳ, මල්රජ බමුණු දෙදෙනසේ විලස මවාගත් දිව්ශදුස් මුදු සිංහන්න කරවා ගිය සඳ, පඩුවස්දෙව් රජ 32 ක් අවුරුදු රාජ්‍යය කල සඳ, ඔහු පුත් අබා රජ විසි අවුරුද්දක් රාජ්ජය කලෝ.

(කෞතුකාගාර පුස්තකාලයේ තැන්පත් කර තිබෙන අංක 7/84 දරණ "සිරිලක අසුර" නැමැති පුස්කොළ පොතෙන් උපුටා ගන්නා ලදී.)



# කුල කෝට්ටන් හෙවත් කුල කෝ-ඉට්ටන් නැමැති කුමාරයා ගේ ලංකා ගමන.

"ශාලිවාහන සකපාද දිශිතයන් 358 වැන්නෙහි දඹදිව කාවේරි පට්ටනමේ මනුනීති කන්ද චෝලන් නැමැති රාජයාගේ පුතනුවන් වන කුලකෝට්ටන් මහ රජ හෙල දිව ත්‍රිකුණාමලයට පැමිණ ගොන්නසාර් දේවාලයේ පූජාවන් පවත්වන අතර තම්පලාගම සිව ලිංගම් දෙවාලය කඩාවැටී විනාශවී තිබෙන බව ආරංචිවී ඔහු එහි පැමිණ දෙවාලය සහ අනිකුත් අතුරු ආවාස ප්‍රතිසංස්කරණය කිරීමෙහි යෙදුනේය.

මෙකල අනුරාධ පුර රජ කරන පාණ්ඩු රජ (පඬුවස් දෙව්) රට මැද සංචාරය කරණ අතර මනාත්තී දල් (වැලිගොඩ යන අර්ථයි.) නැමැති ග්‍රාමයට ක්‍රමයෙන් පැමිනුණේය. එවිට එහි පදිංචි කාර දමිල ප්‍රධානීන් රුස්ව පිට රටවලට කරවල පටවා යවන සිංහල වාණිජ - සමූහයකට විරුඩව පඬුරජ ඉදිරියෙහි පැමිණිලි කරමින් සිංහල වාණිජයෝ මෙම ගමෙහි කරවල ගබඩා කරන බවත් එහි තිබෙන .....ශුද්ධ වස්තුවක් වන වතුර ලිඳ අපිරිසිදු කරණ බවත් මේ කරදර නිසා ඔවුන්ගේ අති පරිශුද්ධ දේවාලය පවත්වා ගන යාමට පූජක පක්ෂයට මහත් අමාරුවක් වී තිබෙන බවත් යනාදි ඔවුන්ගේ දුක් ගැනවිලි වැඩි දුරටත් කියා පෑවෝය.

පඬුරජ පැමිණිල්ල විනිශ්චය කර වරද කාර සිංහල වෙළඳුන්ට නීති ප්‍රකාර දඬුවම් පමුණුවන්ට යෙදුණේය. ඉක්බිති ධීවර කර්මාන්තයෙහි සිංහල ජනයාගේ අසමර්ථ භාවය පඬුවස් දෙව් රජුට පෙනී ගියෙන් එහි කර්මාන්ත යෙහි දක්ෂ පක්ෂ මූක්කර නැමැති වර්ගයක මිනිසුන් ගෙන්වා සිංහල කරවල වෙළෙන්දන් ඔවුන්ට අධිපති කොට පැවැතීමට ආඥාවක් තැබ්බවීය. තවද මුක්කර ජනයාට දෙවාලය තිබෙන ප්‍රදේශයෙන්ද බැහැර යාමට අණ කලෙන් මුක්කර ප්‍රධානීන් වන උසුමන සහ සෙත් දන් ඇතුළු විශාල මුක්කර සේනාවක් මඩකලපුව ආසන්නයෙහි පාන්තෙක සහ වලෙයි ඉරාවු නැමැති ගම් වලට ගොස් පදිංචි විය.

මෙසේ පඬුරජ අනුරාධ පුරයෙන් බැහැ . චාරය කරණ අවධියෙහි යටකී කාවේරිපට්ටනම කුල කෝට්ටන්රජ ත්‍රිකුණාමලයට පැමිණ සිටින බව පඬුවස් දෙව් බිසවට ( බද්ද කච්චානා ) ආරංචිවී, සිංහල හේවා හමුදුවක් යවමින් කුලකෝට්ටන් රජුව පරාජය කිරීමට අණ කළේය. සිංහල හමුදුව ත්‍රිකුණාමලයට පැමිණ ඒ රජුගේ සේනාව හා සටන් කිරීම පහසු නොවන බව තේරුම් ගත්තෝ, දෙපසෙහි සමාදානයකට සතුටුවී, සිංහල හමුදාවෝ එරජුගෙන් තොගයකුත් තෑත්ත මාන්නද ලබාගෙන පෙරලා අනුරාධ පුරයට පැමිණියෝය. මිට පසු කුලකෝට්ටන් රජුට විරුඬව යුඬයක් සිදුවී නැත.

මෙම රජු වන්නි ප්‍රදෙශ දියුණු කිරීම පිණිස ඉන්දියානු සමුද්‍රාසන්න රටවලින් වන්නි කුමාරවරු හත් දෙනෙක් සහිත පිරිසක් ගෙන්වා මෙහි පදිංචි කරවා දේවාලය හා ඊට අයත් ඉඩම් කඩම් සම්බන්ධවද කටයුතු කිරීමට පැවරුවේය. කුලකෝට්ටන්රජ පෙරලා කාවේරිපට්ටනමට ගියේ, නොබෝ කලකින් පරලෝ සැපත් විය.

කල්යාමෙන් තවත් වන්නි පරම්පරාවක් 59 ක් පමණ පඬිරටින් මෙහි පැමිණ පදිංචිවූයෙන් පසු කලකදී වන්නි ප්‍රදෙශ ඔවුන්ට බෙදවිය. ඉක්බිති ඔවුනොවුන් අතර කෝලාහල ඇතිවීමෙන් ජයගත් පසු කෙනෙකු ප්‍රධානියකු විය. එහෙත් ඔහුගේ ප්‍රධානත්වය ටික කලකට පමණක් සීමාවිය.

වන්නියාර්වරු අතරෙන් සංතිර වන්නියාර්, නැමැත්තා දක්ෂයෙක්ව සිටිබව දනගන්ට තිබේ. නමුත් ඔහුද මරුමුවට පත්කරන ලදින් අන්තිමේදී වන්නිවරු හත් දෙනෙක් වන්නි ප්‍රදේශ පාලනය කිරීමට යොදා ගන්න. මෙසේ මොවුන් වන්නි කුමාරවරු වශයෙන් ආණ්ඩුකර ගන එන අතර ශකවර්ෂ 51 දී අග්‍රබෝධි මහාරාජයා විසින් ඔවුන් යටත්කර පලාත් පාලන අදිකාරම්වරු වශයෙන් පත්කරනලද්දේය.



මීට ඉහත සිංහල රජවරු වන්නියාර්වරුගැන කිසි සැලකිමක් කළේ නැත. ඔවුනොවුන්ට රුචිවූ පරිද්දෙන් වන්නි ප්‍රදේශ ආණ්ඩු කරගෙන තිබේ.

(යාල්පානම් වෛපාව මාලෙයි. බ්‍රිටෝ පරිවර්තනය)

## දෙවන පැතිස්ස රජ කාලය

මෙසේ කල්යාමක් ගිය කල අප බුදුන් පිරිනිවි දෙසිය හත් වැනි වර්ෂයට පැමිණි සඳ නැවත ලක්දිව රජ කරන දෙවැනිපැතිස්ස නම් නරෙන්ද්‍රයන් සමයෙහි දඹදිව ධර්මාශෝක නරපතීන් විසින් විපුල තෙදයෙන් සකල භය හැර අභය ගෙනදෙන ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ හා සමග ශ්‍රී ලංකාද්වීපයට එවන මිහිඳු කුමාරයා හා සංඝමිත්‍රාවන්ද දෙදෙනා වහන්සේලා සමග A ධනු ශිල්ප යෙහි නියුක්ත, වැදි පේරුවට අයත් වැදි පුතුන්ද ඛඩ්ග, කොන්ත, තෝමර, පළිස් ආදී යුඬයෙහි සපත් අයද මුතු කුඩ, සේසත්, චාමර ඉම් ඈදීය අපට නිසිය, අපගෙන් ඇතිවූ රාජ කුමාරවරු යද්දී, අපට හිඳීම යුතු නොවෙයි, කියා එකුන් පණසක් පමණ එහි බෝ මැඩ කර්මාන්තයට ආවාහුය.

(ජලතනදන පුස්කොළ පොත.)

දෙවැනි පැතිස්ස රජු කළ මහා බෝධිය සමග ආ B බෝධි ගුප්ත - සුමිතත-චන්ද්‍ර ගුප්ත-දේව ගුප්ත - සුයශී

---

A "අශෝක රජු විසින් ලංකාවට එවනු ලැබූවන්ගේ ගෝත්‍රයෝනම් ක්ෂත්‍රිය කුල අටෙක, සිටු කුල අටෙක, බ්‍රාහ්මණකුල අටෙක, කෙළෙඹි කුල අටෙක. දුනු ශිල්ප දන්නා කුල අටෙක යනාදි (23) විසිතුන් වර්ගයක ජනයා යයි බෝධිවංශයේ දැක්වේ.

B ජය ශ්‍රී මහා බෝධියගේ, ජයමහ බෝධියගේ, බොධියගේ, බොධිය බදුගේ * යනාදි පෙළපත් නාමයන්ගෙන් පෙනී සිටින කුරුකුලයින් මේ දක්වා ලංකාවේ සිටිති. ඔවුහුද මහබෝධිය සැවුව් ආ ක්ෂත්‍රිය යන්ගෙන් පැවැත එන්නෝ වෙති.

• "Baduges" (i. e. Vadugans or Northerners) the Emissaries of the Madura Rulers"

බදුගෙ නාමය (වඩුගන් නොහොත් උතුරේ වැසියා යන අර්ථයි.) මොව්හු මදුරේ රජ දරුවන්ගේ අමාත්‍යවරුව සිටි පිරිසකි.

(Tinnevelly Gazetteer C H P-ii-58)

ගුප්ත - ගෞතම - ජුතින්ධර - යන රජකුමාරවරුන් අට දෙනාට බෝධිපාලනය පිණිස උසස් තනතුරු දී ලක්දිව නවතා ගත්තේය. ඔවුන්ගෙන් පැවතෙන්නෝ මේ තාක් උසස් වලව්වල වෙසෙත්මය.

එසින් සූරිය ගුප්ත කුමාරයාගෙන් පැවතෙන්නන්ට A අර්ණව ශ්‍රේෂ්ඨ සූර්ය ගුප්ත කුරුකුල සූරිය නාමය කියත්.

අර්ණව ශ්‍රේෂ්ඨ කී හෙයින් ඒ B සමුද්‍රයට ශ්‍රේෂ්ඨ රජ කුලයක් බව පැහැදිලිවේ. ධුරාවේ ගෝත්‍රයේ අය වළුන්ට "සිංහ" හේවා නාම උරුම වෙත්තාක් මෙන් කරාවේ ගෝත්‍රයේ අයවළුන්ට "කුරුකුල" හේවා නාම උරුම නාමයන් හැටියට පවත්වා ගෙන එන බැව් පෙනේ. මෙකී කරාවේ ගෝත්‍ර "කුරු කුල" නාමයන්ගෙන් හා ධුරා ගෝත්‍ර "සිංහ" නාමයන්ගෙන් යුත් වන්නි උන්නැහේලා ගෙන් පැවත එන්නෝ අනුරාධපුර උතුරට මේ තාක් වෙසෙත්මය."

(දෙහිවල ශ්‍රී මහාබෝධි විහාරාධිපති ජී. ශ්‍රී ශීලානන්ද අධිකරණ නායක ස්වාමීන් විසින් ලියන ලද "මනුරජනිය" පිටුව 70)

---

A කුරුණෑගල පලාතේ දිද්දෙණියේ සිටි සූරියවන්නි උන්නැහේද සූරිය ගුප්ත කුමාරයාගෙන් පැවැත ආ කෙනෙකි. මෙතුමා කුරු වංශිකයෙකි.

B අට කුල ක්ෂත්‍රියන්ගෙන් සමුද්‍ර වංශයද එකකි.
("ජාතිප්‍රභේද පුස්කොළ පොත කෞතුකාගාර පුස්තකාල අංක 7-J7)



# දුටුගැමුණු රජ කාලය

දුටු ගැමුණු රජුන් දවස ජයසිරි ආදිත්‍ය කුමරු එතුමාගේ හේවා පිරිස වූ 360 දෙනෙක් සමග මොරටුA ප්‍රදේශයෙහි පදිංචි විය. මෙසේ නොබෝ කාලයක් අතික්‍රාන්ත වූ පසු මේ පිරිස මොරටුවේ මුල් පදිංචිකාරයන් වශයෙන්ද ඒ ප්‍රදේශය ගම් මානයක් කිරීමෙන්ද එහි මූලිකයෝ වූහ.

කෞරවයෝ වූ කලී සිංහල රජුන්ගෙන් විශ්වාස වන්ත භාවය දිනාගත සිටි වර්ගයක් බැවින්, මුහුදු මාර්ගයෙන් ගොඩවදින සතුරන් මැඩලීම පිණිස කරාවේ යුද්ධකාරයින් මුහුදු බඩ ප්‍රදෙශ වල පිහිටි සඳවුරු වල සහ ගම් වලද නතර කරණ ලදී." මෙසේ බෝවූ ඔවුහු ඔවුන් අතරෙන් කාරණා කාරණා දත් වැඩිමහල්ලන් පස්දෙනෙක් හා තවත් උදවිය ගේද උපදෙස් ඇතිව "පඤ්චායට්" නැමැති සභාවක් මගින් ඔවුන් අතරේ සිදුවෙන නඩු විසඳා ගන්නා ලද්දේය.

මේ විනිශ්චය සභාවලදී ඔවුන්ගේ පැරැණි නීති රීති වලට අනුකූලව කටයුතු කරනවත් හැර මේ කෞරවයෝ රාජ පාක්ෂික භාවයෙන්ද කීකියට අවනත භාවයෙන්ද ප්‍රධානීන්ට සහ වැඩිමහල්ලන්ට ගෞරව කිරීමෙන්ද ජීවත් වීම ඔවුන්ගේ ජන්ම ගතියක් කොට පැවැත්තේය. ඒ වූ කලී ආසියාතිකයින්ගේ උසස් ධර්මතාවකි."

---

A මොරටුව යුධ භටයින්ගේ මුර+අටුව යන්නෙන් බිඳුනු නාමයක්යයි (Guards Piller) කියති.

(මේ 1946 ජුලි 2 වෙනි දින "ඩේලි ස්" පත්හි පලවූ ලිපියක් ආශ්‍රයෙනි.)

'දඹදිව Aගන්ධාර දේශයෙහි ද කෞරවයෝ පදිංචි වූහ. ඔවුහු කොට්ඨාශ නවයකට බෙදී සිටිති. නව කොට සින් කෙනෙකාවසක් රජකම් කිරීමට තෝරාගන්නා ලදී.

මෙම පේරුවෙන් පැවත ආචාවූ කණ්දරාය කාර වත්තයB නැමැති දෙදෙනෙක් ලංකාවට පැමිණ දුටු ගැමුණු මහ රජාණන් බැහැ දුටු සිටි තැනේදී ඔවුන් දේදෙ නාට තමන් කඩ දෙකට බෙදා වන්ති කම් පවරා දී ඒ ප්‍රදේශය ආණ්ඩු කිරීමට අවසර දුන්නේය.

(සලාවත සිටි ආඩි අප්පන් සූරිය වන්නි උන්නැහේට අයිති පුරාණ ලිපි)

මෙයින් පැවත එන කෞරව වන්නිවරු අද දක්වා තමන් කඩ පලාතේ සිටිති. තිම්රු පුල්ලේ වන්නි උන් නැහේද එයින් කෙනෙකි.

---

A ධෘතරාෂ්ට්‍ර කෞරව රජුගේ බිසව වූ කලී ගන්ධාරයෙ රජුගේ දියණිය වූ ගන්ධාරී නැමැති බිසව වන්නේය. ඈ එක් සියයක් කුරු කුල කුමාරයන්ගේ මෑණියෝය. මෙතුමියට මහා භාරතයෙහි ඇතැම් තැන "කාන්ති" කුරුති යනුවෙන් කියාපායි.

එහි අර්ථය කරාවේ ස්ත්‍රිය යනුයි. ඔවුන් ඇඟලන හැට්ටයට "කබාස් කාන්ති" කියාද ව්‍යවහාර වෙයි. (සිංහල භාෂාවෙන් කබා කුරුත්තු යයි කියති.)

B අටකුල ක්ෂත්‍රියයන්ගෙන් "කාරවත්ත කුලය" ද එකකි. (ගිනි ප්‍ර බෙද පුස්කොළ පොත කොළඹ කෞතුකාගාර පුස්තකාල අංක 7-J7 කි, පත්‍රිකාව)



තවද (දුටුගැමුණු) රජු හා යන මලසට එක්දහස් පන්සියයක් ප්‍රෝහිත බ්‍රාහ්මණයෝය සාරදහසක් අමාත්‍ය යෝය A පටබැඳි ධිසෝවරුන්ගෙන් එක්දහස් සියයක රජ කුමාරවරුන්ගෙන් පස් දෙනෙක."

(රිදී විහාර අස්ත පුස්කොල පොත හා රිදී විහාර උත්පත්ති කථාව ක්‍රි: ව: 1904 මුද්‍රණය. 5 පිට)

රළුනර "පරවර" මරවර තිම්ලර කණ්ණඩි තෙළිඟු කෛවර්තික සිංදුර යනාදි නා නා දෙශවලින් ඇවිත් (දුටුගැමුණු) රජු පිරිවරා සිටින දෙමළ මහා සේනාවෝය.

(රිදී විහාර අස්ත පුස්කොල පොත)

## භාතිය තිස්ස රජ කාලය

"........මල්ලවූ මලක්කාවට ගියෝය. එකල කාක මුක්කරුන්බ ගොස් උන්ගේ රජහු සිටියේය. ඔව්හු තල මුදලියායි ප්‍රකටව නැලව බලකොටුවක්ද කර ගත්හ. මෙහෙතම කලා ඔයෙනුත් කැලණි ගඟෙනුත් මොරණිය හෙලෙනුත් යන මේ අතර රට අල්ලා සුළු රජව විසීය. එකල ඔව්හු විසින් පෙර පිනැති රජුන් විසින් කරනලද වැව් පොකුණු කෙත් වත් අත් පත් කර ගත්හ. ආරාම විහාර දාගැප් පිළිම සිඳ බිඳ බුද්ධ සසුන නැති කෙළේය. මෙසේ සාවුරුද්දක් තික්ම ගිය කල්හි භාතිය තිස් අභය

---

A මේ අත්දමට කරාව ගෝත්‍රයේ ප්‍රධාන මිනිසුන්ට "පටබැඳි මිනිස්සු" යන නාමය බොහෝ කාලයක සිට ව්‍යවහාර කරනු ලැබේ.

(ආචාර්ය පෝල් පීරිස් මහතාගේ පෘතුගීසි ඉතිහාසය ආශ්‍රයෙනි.)

එමෙන් ම පටබැඳි කුමාරයන්, පටබැඳි මුදියන්සේ, පටබැඳි මුහන්දිරම්, පටබැඳි කෝරාල, පටබැඳි ආරච්චි යනාදි වශයෙන් කරාවේ ප්‍රධානීන්ට ව්‍යවහාර කළබව පැරණි ඉතිහාස ලේඛනාදියෙහි සඳහන්වේ. අද දක්වා ව්‍යවහාරව එන බවද දතයුතුයි.

නම් දෙටු රජ කුමරු තෙම ලත්දිව රාජාභිෂෙකව අනුරාජ පුරයට පැමිණ තුණුරුවන් කෙරෙහි පහන් සිත් ඇතිව පිංකරණුයේ, තමන් රාජ්ජය වාසීන් රැස් කරවා අනුරාධපුරය සතර ගව්වක් හී නුසුදුසු වල් හරවා තුමූ උයන් පාලයන් ලවා මල් උයනක් කරවා මාලාකාරයන් ලවා මල් ගෙන්වා රුවන් මැලි දාගැප් තුන්මාල පියව සතරගුල් සඳුන් ගල්වා...............තවද හස්ති ශෛලපුරය හෙවත් කුරුණෑගල නුදුරු මෙහි දඹදෙණිය නම් ගම වසත්තාවූ මුදලි නම් එක් ඇමතියෙක්හු තල මුදලියාට සොරෙන් ගොස් අනුරාධපුර භාතිය තිස්ස දෙව්මහරජාණන් සමීප යටඑළඹ එකත් පසෙක සිට ශලකරණ සේක්, දේවයන් වහන්ස බුඩාත්කුරවූ ඔබවහන්සේ හැර සාසනයෙහි පහන් සිත්ඇත්තෝ නම් මතු කවරේද? කිය නොහැක.

මහරජාතනි, දූන් වතාහී දෙමළ වර්ගයෙහි තල මුදලියායි යන අධිපොතියෙක් ඔහුගේ හත්දහස් අට සියයක් මුක්කර සේනාවෝද හාර දහස් හැත්තෑවක් පමණ සිංහල ජනයෝය, යන මොවුන් වසග කොට ගෙන කලාඹයෙනුත් කැලණීයහෙනුත් මොරතියහෙලෙනුත් අතර රට අල්ලා, ආරාම විහාර පිළිම දාගැප් සිඳ බිඳ දමා සඟුන් රටින් නෙරපා හැර සසුන විනාශ කරන්නේ වේ කිව්හ.

එබස් ඇසූ භාතිය තිස්ස රජු දෙම්නසට පැමිණ ඔවුන් රටින් නෙරපනු පිණිස අයොනකි පට්ටලමට හසුන් දෙවා දූතයන් යැවීය. රජහු මීසින් යවන ලද හසුන් පත දූත ඔවුන් මහත් ප්‍රීතියෙන් පිණා, යුද්ධයෙහි දක්ෂ දෙමළ කරාවේ සේනාපතීන්ගෙන් නවගොත්‍ර නව දෙමනකි. පෙර් ඉළුටව්-කෝ ඉට්ටන්, කාලිංග ඉට්ටන්-නල්ලන්ගවන් පාලවන්-ඉවිවන් මුදවන්-තේවර්, වෙඩි අරශන්, මරවරායර් හා ඔවුන්ගේ හත්දහස් අටසියය (7800) ක් නවගොත්‍ර



දෙමළ සෙනාවෝද යුද්ධ උපකරණ සලස්වා ගෙන දීසාකාර නැලිගෝටයා මොවුන් කවා පොවා නැව් නංවා තුමූත් නැව් නැඟී පීනා විත් කාරදූවට ගොඩබැස්හ.

එවිට කාරදූව නම් විය. එයින් නික්ම කුදිරමලේට පැමිණ ක්‍රමයෙන් අවුත් අනුරාධපුර නුවර භාතිය තිස්ස රජ සමීපයට පැමිණියෝය. එවිට රජ්ජුරුවෝ සතුටුව දීසාකාර නැලි ගොටයා රජ්ජුරුවන් අභිමුඛයට ගෙන්වා, පිළිසඳර කථාකොට ලේකම් බලා යුද්ධයට යුතු භාණ්ඩ යත් දෙවා රජ්ජුරුවන්ගේ යුද්ධ සේනාව දෙදහස් හත්සිය අනූවක්ද දෙමළ සේනාව හත්දහස් අටසියයක්ද (7800) යන මෙකී සියල්ලන් කාද්‍ය භෝජ්‍යයෙන් කවා පොවා සන්නාහ සන්නද්ධව යුද්ධයට සැරසී රජ්ජුරුවන් වැඳ සමුගෙන මෙසේ විචාළෝය. දේවයන් වහන්ස, කොතැන්හි කඳවුරු ලත්දූයි කීහ. මෙසේ රජ්ජුරුවෝ අවසර දෙවා වදාරණ සේක්, ත්‍රිමේඝවර තපසර ඉන්නේ මැදගම පල කලල් ගෝරුවේ දූව මැද කඳවුරු ලවා සටන් කරවයි අවසර දුන්හ. එකල්හි දෙමළෝ එයින් නික්ම නුවර වැව වාඩි හැර එයින් නික්ම කළුවැල්ලා පොතාන වාඩි ඇර තරගොඩ වාඩි ඇර මැද ගම්පල තපස්සරයින් විචාරා පණිවිඩ දකිමින් කලල්ගෝරුව හඳුන්වා ලීය.

එකල කලල්ගෝරුවේ කඳවුරු ලා යුද්ධයට සැරසී තුඩ කොඩි සේසත් නංවා යුද්ධ ගෝසා පතුරුවා තලමුදලියාට දන්වන ලදුව තලමුදලියාද තම සතු සේනාව කාද්‍ය භෝජ්‍යයෙන් කවා පොවා සන්නාහ සන්නද්ධව (7970) හත් දහස් නවසිය හැත්තෑවක් යුධ සේනාව සහිත යුද්ධෝපකරණ සලස්වා තුමූද සැරසී අවුත් යුද්දයට වනී. ඉක්බිති දෙපසෙහි මහත් සටණක් විය. එකල භාතිය තිස්ස රජුගේ සේනාවට ජය අත්විය. මුක්කර සේනාවට පරාජය විය.

Aතල මුදලියා එක් වෙඩි පහරකින් මළේය. භාතිය තිස්ස රජහුගේ සේනාවෝ මෙසේ බොහෝ මුක්කරුන් මරා තැලව බල කොටුවට වැදී එය සිඳ බිඳ දමා තිබූ වස්තූන් රැගෙන විත් අනුරාධ පුරයට පැමිණ ජය ලත් නිශාව සැලකළෝය. රජහු ඔවුන්ට සතුටුව දෙමළෝ කවා පොවා සිංහලෙන් නැලි බැඳ හිර දෙවා, දෙමළේ ලඟට ගෙන්වා අපමහ සෙනෙවිරත්නයන් හට මෙසේ වදාරණසේක: මාගේ මේ රාජ්‍යයේ බස්නාහිර ජනවිය කළු රටද කැගෙණ හිරට මාරගස්හින්න සහ නැව්ගලද දකුණට මොරණියේ කාත්දෙන් බුළුවල ගල්පඩි හෙලටද; බස්නාහිරට තුන්පෙන් ගංදුරු කංදෙන් කැලණි ගඟටද යන මේ මායිම් තුල රට රක්නා පිණිස රට දෙවා කරාවේ දෙමළුන් රුඳවූහ. මේ තල මුදලියාට තිබූ රටයයි දත යුතුයි. ඉතුරුවූ දෙමළුන්ට දකුණෙන් රටදී පොරොත්තු කරවූහ."

(සිවලා කුලමේ රාමනාත මුදියන්සේලාගේ මුදියන්සේගේ වන්නි කථා පුස්කොල පොතේ පිට පතකින් උපුටා ගන්නාලදී.)

---

A තලමුදලියාගෙන් පැවත එන කාකමුක්කර පරම්පරාවේ මිනිසුන් ගල් ගමුවේ ද තැලව යන ගමේ සහ කරුණෑගල දිස්ත්‍රික්කයේ සහ වන්නිබද ප්‍රදෙශවලද සිටිති. ඔවුන්ගෙන් සමහරෙක් වන්නි නම් කර තිබේ, ඔවුන් වන්නි පේරුවේ මුදලිවරුය වැදිපේරුවේ මුදලිවරුය යනුවෙන් බෙදී සිටිති.

තලමුදලි නොහොත් තල මුදියන්සේගේ පරාජයෙන් පසු මොහුගේ වැදි පේරුවේ මුක්කර මුදියන්සේලා අතරෙන් බොහෝ දෙනෙක් භාතිය තිස්ස රජුගේ යුධ බල ඇණියට බියෙන් වනාන්තරයට පලාගොස් වැදි කර්මාන්ත කරමින් මැනික් ගැරීමට පටන් ගෙන ඒ වන ප්‍රදෙශයෙහි පදිංචිවූ බවත් එවක් පටන් ඒ වැදි මුදලි වරුන් පදිංචි වූ රටට "වැදිගමුව" කියාද පසුව සබරගමුව කියාද නම් ඇතිවූ බවත් දනගන්ට තිබේ. මුක්කරුන් විසින් ගරනලද මැනික් පතල් සබරගමුව පලාතේ වනාන්තර වල මේ දක්වා බොහෝසේ දකින්ට ලැබේ.



තවද භාතිය නම් සිංහල මහ රජහු කාලයෙහි මේ ශ්‍රී ලංකාද්වීපයට කාක මුක්කරා නම් දෙමළෙක් ගොඩ බැස ඔවුන්ගේ *තල මුදලියා කියන රජා ගල් ගමුවට පැමිණ වැව් බැම්ම කපා වතුර හැර කොටුවට වැව ගෙන බොහෝ සැඩි දෙමළුන් සමග කලා ඔයෙන් මෙගොඩත් මා ඔයෙන් මෙගොඩත් අයිති කරගත කල් යවන කල්හි භාතිය නම් රජහට එයින් තවත් රටට යුධ කරන බව සඳහා අයියෝත්ති පට්ටලමට පත් හසුන් යවා නවගෝත්තරයක් දෙමල හමුදුව ගෙන්වා ඔවුන්ගේ නම් අසා ලේකම් බලන්ඩ අවසර කීසේක.

| | | |
|---|---|---|
| පෝවිට්ට(න්) වරයාගේ | හමුදුව | 100 |
| කෝවිට්ට(න්) වරයාගේ | හමුදුව | 700 |
| කාගග වරයාගේ | හමුදුව | 300 |
| ඉච්චංඩ වාග් වරයාගේ | හමුදුව | 150 |
| තල්ලන්ඩවගේ | හමුදුව | 1400 |
| පැලවගේ | හමුදුව | 800 |
| මූලවංශ තේවරයාගේ | හමුදුව | 400 |
| වෙඩි අරශන්ගේ | හමුදුව | 900 |
| මරවරයාගේ | හමුදුව | 151 |

මෙසේ භාතිය සිංහල මහ රජාතෝ එසේම තේසාව සා කාලතුවක්කු ලේකං බලා ගබඩාවෙන් වියදම් දී යුධයට යන්ඩ නියම කල විට, හේවාකමින් අපි දිනුවාම දෙන්නේ මොනවාදැයි ඇසිය. එවිට රජහු විසින් කියන්නේ නම් සිංහල රටින් නැතම් දෙමිෆ් රටේ සිටුවමි, ගම්කිම් දෙමියි කීහ, එවිට මඟුල් ගන්නා පිණිස කාර තැලි ගොඩ ගසා රජහට බාරදී සටනට තික්ම සත් දවසින් එන බව කිවෝය.

---

* රණින් බැඳපු ගල් වෙරලුව ගෙලේ පැළඳලා කදිම ට
සැනින් සුරත දරා කඩුව රජත රත්න සැදි මොනව ට
අනින් රාජ ගිරිමල් රට කොසරිඳු ලෙස රණ පිටිය ට
ලසින් වැදුනි තල මුදලිඳු රණකෙළි කෙල ගල් ගමුව ට

(මුක්කර හටන)

එකී ලෙසින් සත් දවසින් හේවාකමින් ආවාය. එවිට මහ රජාණන්ගේ බස් බිත්ත නොවන ලෙසින්. කුඹිහිර සහ බත් සලස්වා තබාගත අනුරාධ පුරයෙහි සිටි කල පළමුකොට බත් ඉල්ලුවෝය. බත් දෙන පොරොන්දුවක් නැත. හිර දෙමියි කීහ.

නොයෙක් ලෙසින් සත්‍රිත් සලස්වා තිබුණේය. එරිපද් දෙන් මහ රජුගේ බලය, දෙවියන්ගේ බලය තිබුන හෙයින් බඩගිනි වැඩි නිසා - හිර එපාය බත් ඉල්ලුවෝය. ඔවුන්ට නොයෙක් ලෙසින් කෑම දුන්නේය. ඉක්මණින් හිර සත්‍රිත් පිටව යැවූහ. නැවත බත් කා හිර ඉල්ලුවෝය. හිර එපයි කී නිසා ඔවුන්ටත් තමුන්ටත් එක විටම කෑම දෙන්ට බැරි නිසා ඔවුන් යැව්වාය කිවූය. ඉන් පසු ඔවුන්ගේ රටවලට යන්ඩ අවසර ඉල්ලුවෝය. අවසර නොදී හේවා කම නිමදූයි කීහ. ස්වාමිනි හේවා කම නිමක් නැත. අපට බැරිය කිවූහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහුය. තල මුදලියාට තිබුන රට යුඩකර තමන් ගනුවයි කීහ. එවිට යුඩ යන්ඩ කලඹනා ගනිමින් රථ වාහන කාල තුවක්කු නව සියක් රථ පිට පටවා, යන්ඩ නික්මුනෝය. එවිට රජ්ජුරුවෝ ගමන් ඉදිරියට වැඩිසේක. නුඹ වහන්සේ කම් නැත කිවූහ. කොයි තැන කඳවුරු බඳිමුදැයි කී විට ශ්‍රී පරමේශ්වර යින්ගේ මැදගං-පොලද කලල් ගෝරුවේද කඳවුරු බැඳ කලල් ගෝරුවේ සිටාණන්වත් වියහියදම් දීමට බාර දී රජු නුවරට වැඩිසේක. ඔවුන් ගොස් කලල් ගෝරුව සහ කලා වැව කාල තුවක්කු මා නා තබා තල මුදලියා එක ඉස් රට අනු පිටින් ගල්ගොමුවට ගොස් ඔවුන්ව පෙනී කට දී ආපසු ගොස් සරක්කුවට වැදුනෝය. තල මුදලියාගේ හමුදාව සටනට නික්ම උන්නැනේදී ඔවුන්ගේ සූදනම් මදි කමින් මොවුන්ගේ කාල තුවක්කු නවසීයම එක එක විටම ගිනිලූහ. තල මුදලියාගේ සේනාව නැසී ගියේය.



එතැනින් ඔවුන්ගේ කොටුව අල්වා සිඳ බිඳ දමා තරංගොඩ ගලට ගොස් තුන් මසක් වාසීකර සිටියෝය. රජුගෙන් පතිවිඩ දකිමින් පොතුපිටියේ වාඩි හැර, නුවර වැවේ වාඩි හැර, කළු වැල්ලා පතාගේ වාඩි හැර අනුරාධ පුරයෙහි වැඩඋන් හාතිය දෙවි මහ රජුන් දැක සිටියෝය. බොහෝ සන්තෝෂයෙන් අප මහ සෙනෙවිරත් ගෙන්වා ගෙන බස්නායක හජන්ත භූමිය කළුරේට කඩයිම් කර සන්නස් ලැබුනාය. *අයෝත්ති පට්ටනමෙන් ආ කරාවේ දෙමළුන්ඩ මුදුතෙර රට වලට සන්නස් ලැබුනේය. මෙහි බොහෝ කොට පිං රැස්කර උපාසක ධර්මයෙන් රජකම් කොට වැසියන්ට අභය දී පෙර පටන් රදල කම් කරපු රදල මුත්තිල වන්නිවරුන්ගේ නම් වලට අපිරිමාන නොව රදල නම්දී එරජ දිව්‍ය ලෝකයට ගියේය. සිඬිරස්තු. සුභමස්තු.

(බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙන් වෛද්‍යාචාර්ය ඇන්ඩ්‍රියස් නැල් මහතා විසින් පිටපත් කල “වන්නි උපත” පොතෙන් උපුටා ගන්නා ලදී. සිළුමිණ ඓතිහාසික අතිරේකය 8. 8. 1937)

මෙහි ඉහත සඳහන් වන්නි කථාවස්තු දෙක අතරේ සුළු සුළු වෙනස් කම් පෙණී යන නුමුත් එකම පුරාවෘත කථාවක් බැව් මොනවට තේරේ. මේ වෙනස් වීම් සිදුවී තිබෙන්නේ මුල්කාලයේදී ලියනලද ලේඛනයන්ගෙන් යම් යම් අය විසින් පිටපත් කර ගන්නා අවස්ථාවලදී යම් යම් වෙනස්කම් සිදුවීම නිසායයි සිතිය හැක.

අපවිසින් කියවනලද එකම පුරාවෘත කථාවල් අඩංගු පුස්කොල පොත්වල එකට එක විරුඩ කරුණු සටහන්වී තිබෙන බැව් නොයෙක් විට දක්නා ලද්දේය. මේ සමානම වන්නි කථාවන් 22 ක් පමණ අප විසින් කියවා ඇත්තේය. ඉහත සඳහන් වන්නි කථා පුවත් ලියන ලද කතෘ ඉන්දියා වාසික් සියළු දෙනාම දෙමල වර්ගයාය, යන කල්පනාවෙන්

* දකුණු සිරිලක කුරුකුලයින් නොහොත් කරාවේ මිනිසුන් අතරෙන් බොහෝ දෙනෙක් අයෝධ්‍ය දේශයෙන් පැමිණි චන්ද්‍ර සූර්‍ය වංශික යුඩ භටයින් ගෙන් පැවත එන්නෝ වෙති.

**අයෝත්ති පට්ටනමෙන්** මෙරටට පැමුණුන කරාවේ නව ගෝත්‍ර යුධ සේනාධිපතීන් නවදෙනා ඇතුලුව, ඔවුන්ගේ කරාවේ යුධකාර වංශික නවගෝත්‍ර සේනාවන්ටද" කරාවේ දෙමළු" කියාද ඇතැම් තැන "දෙමලෝ" කියාද දක්වා තිබේ. වර්තමාන කාලයේ පවා ඇතැම් සිංහල මිනිසුන් මුළු ඉන්දියාවම දෙමල රටක් වශයෙන් සලකති. මෙය සම්පූර්ණයෙන්ම වැරදි සැලකීමකි. වර්තමාන කාලයේ පවා "**අයෝධ්‍යය**" යන සංස්කෘත නාමයට ද්‍රවිඩ භාෂාවෙන් **අයෝත්ති පට්ටනම්**" යයි කියනු ලැබේ. දැනට මෙම රාජධානියට "ඖඩ්" යන නාමයද කියති.

අයෝධ්‍යය වූකලී සූර්ය වංශිකයින්ගේද චන්ද්‍ර වංශික භරතවරුන්ගේද යනාදී ආර්යවරුන්ගේ ජනපදයකි. මෙය උතුරු ඉන්දියාවේ පිහිටා තිබේ.

මෙහි යොදා තිබෙන සිතියමෙන්ද අයෝත්ති පට්ටන මෙහි පිහිටීම සම්බන්ධව දත හැක.

චක්‍රවර්ති පදප්‍රාප්ත මහා භාරත රජතෙමේ අයෝධ්‍යය නොහොත් අයෝත්ති පට්ටනම ආණ්ඩුකල බැව් ඓතිහාසික කරුණු ගෙනහැර දක්වා පෙන්නුම කර ඇත්තේය. ඉන් නිසා භාතිය තිස්ස රජුන් දවස මෙරටට ගෙන්වන ලද යුධකාර වංශිකයින් දෙමළුන් නොව එක හෙළාම චන්ද්‍ර වංශිකයින් සහ සූර්ය වංශිකයින් බැව් මෙයින් වටහාගත යුතුයි.

අයෝධ්‍යයෙන් පැමිණි භරත වංශිකයින්ට හෙවත් පරදර් නොහොත් කෞරව නැමැති කුරු කුල යුධකාර සේනාවට නලමුදලියා විසින් යටත් කරන්න තිබුන ප්‍රදේශය වන කලාඔයෙනුත් කැළණි ගඟෙනුත් මෝරණිය හෙළෙනුත් මා ඔයෙනුත් මායිම්වූ ගම් නියම් ගම් සියල්ලම අයිතිකරදුන් බැව් ඉහත සඳහන් වන්නි කථා පුවතෙන් හෙළිවෙයි.



එසේම ඒ ඒ පෙදෙස්හි මෙහෙයනා ලද භරත වංශික කුරු කුල යුධසේනාවන්ගෙන් පැවත එන සූරිය කාරණවේ, චන්ද්‍ර කාරණවේ, කෞත්තිය නොහොත් (කොනන) කෝන් කාරාවේ යනාදී නාමයන්ගෙන් යුත් පරම්පරාවල් අද දක්වා වාසය කරති.

රාම රජුන් දවස සිරිලක කුරුණෑට (කුරුකෝරලය) යනුවෙන් ප්‍රදේශයක් ලබාගත් විසු පළමු පැමිණි කුරුරට කුරුකුලයන්ගේ දරුමුණුපුරාදීන් හා භාතිය තිස්ස රජු දවස මෙදිවයිනට (අයෝධ්‍ය) අයෝත්ති පට්ටනමෙන් පැමිණි සේනාවන්ට "කුරුකැටිනැයෝය" හෙවත් කුරුමනුෂ්‍යයෝය කියා ව්‍යවහාර කලහෙයින් *කුරුණෑගල කියා නම් "වීය"යි රාවණා රාජාවලියේ හා කුරුණෑගල විස්තරය යන පුස්කොල පුරාණ ලේඛනයන්හි සඳහන්වී ඇත. කුරුරට අගනුවර හස්තිනා පුරය සෙයින් එම අරුත් හා අර්ථ සම්බන්ධයක් ගැනෙන සේ කුරුණෑගල යන නාමය ඇතිවූ බවද සිතාගත හැක.

---

* "මෙකල ලක්දිව වයඹපළාතේ අගනුවර බවට පත්වී තිබෙන කුරුණෑගල නගරය වනාහි වටිනා ඓතිහාසික කරුණු රාශියකින් සමලංකෘත වූවකි.

මේ පිළිබඳ ඉතුන්වන සොයාබලන්නෙකුට දහතුන් වෙනි හා දහතරවෙනි ශතවර්ෂවල ලියන ලද විත්ති පොත්වලිනුත් කඩයිම් පොත්වලිනුත් කරුණු උපුටා සංග්‍රහ කරණලද "කුරුණෑගල විස්තරය" නැමැති ග්‍රන්ථයෙන් කරුණු රාශියක් දත හැකිය.

මේ නගරවරයට කුරුණෑගල යන නාමය සම්මතවී තිබෙන්නේ "කුරුරටින්" පැමිණි මිනිසුන් එහි විසූ නිසා හෝ "කුරුමිණියාගල" නැමැති පර්වතය එහි අවස්ථිතවූ නිසායයි සිතීමට කරුණු තිබේ."

(රාජනීතිඥ එච්. ශ්‍රී. නිශ්ශංක, පාර්ලිමේන්තු මන්ත්‍රී තුමා විසින් කරන ලද කථාව-හෙළදිව පුවත් පත 5. 10. 1947)

අයෝධ්‍ය පට්ටනමෙන් මෙහි ආ යුධකාර කුරුකුල වගීයාගෙන් පැවැතෙන්නන් මෙහි පහත සඳහන් ග්‍රාමයන්හි වාසය කරනු ලබත්.

දිද් දෙණිය, තෙල්ලිය, කටුපොත, පාලගම, තෙරියාව, දෙමලමානෙ, එඬර ගල්ල, සෙන්දිරියා පිටිය, පොතුබෝව, කොටගෙදර, එල්ලා ගොන්න, කුරුප්පු වත්ත, කෙත් තානේ, කහගොල්ල, ගිරිවැව, වලස්වැව, ඔතුවෙල, කෝත් ගොල්ල, මැල්ල පිටිය, මොරගොල්ල, දෙහෙල් ගමුව, පොර මඩලෙ, අඹරපනේ, උඹපල, ගොඩිගමුව, උල් හිටියාව, බුල්නෑව, මාතගැවේ, සියඹලා කැළේ, ආරගොඩ සහ තවත් ගම්ය. මෙහි ගම් ප්‍රධාන කුරුකුලයින්ගෙන් සමහර දෙනෙකුගේ නාමයන් මෙහි සඳහන් කිරීම මැනවයි සිතමු.

එනම්:-

| | |
|---|---|
| පොතුබෝවේ, | වරුණ සූරිය මුදියන්සේලාගේ උක්කුරාල ආරච්චිමහත්මයා සහ පාඨශාලා කළමනාකාර තැන. |
| දිද්දෙණියේ, | කුමාරසිංහ වෙලප්පු, වරුණසූරිය, පාලප්පු |
| පොතුබෝවේ, | බුදල් ගෙදර රමනාථ මුදියන්සේලාගේ අච්සඳහාමි |
| එම | සියඹලාගෙදර බාලසූරිය මුදියන්සේලාගේ ඩිංගිරිහාමි හිටපු ආරච්චි මහත්මයා |
| එම | සියඹලාකැලේ මුහන්දිරම්ලාගේ වෛලප්පු |
| කොටගෙදර, | වරුණසූරිය මුදියන්සේලාගේ සිමප්පු |



| | |
|---|---|
| * සෙන්දිරියාපිටියේ, | හේනේ ගෙදර වීරසූරිය මුදියන්සේලාගේ කපුරුහාමි |
| * කෙත්තානේ, | පරණ ගෙදර වීරසූරිය මුදියන්සේලාගේ පුංචප්පු. |

මෙහි ගම්වල කුරුකුලයින්ට අයත් පිරිමින්ට මුහන්දිරම කියාද, සත්‍රීන්ට, එතන හාමි, සහ ලමා එතනා කියාද ගෞරවාර්ථයෙන් ආමන්ත්‍රණය කරත්. සූරිය කාරාව යයි ඔවුන් කියා ගනිති. "කෝත්" කාරාවයයිද අන්‍යයන් විසින් කියනු ලැබේ.

---

* සෙන්දිරියාපිටිය වත්තේගෙදර විජේසූරිය මුදියන්සේලාගේ මුතු මැණිකේ

| | | |
|---|---|---|
| එම | පරණගෙදර විජේසූරිය මුදියන්සේලාගේ විජේසූරිය | |
| එල්ලගොන්න, | සජ්ජගහමුල වත්තේ වණිසූරිය මුදියන්සේලාගේ පුංචිරාළ | |
| එම | තෙල්ලිගෙදර වර්ණසූරිය මුදියන්සේලාගේ බණ්ඩාර මැණිකේ | |
| පොතුබෝවේ; | පරමාගොල්ලේ ගෙදර වර්ණසූරිය මුදියන්සේලාගේ අප්පුහාමි | |
| කෙත්තානේ | පරණගෙදර වීරසූරිය මුදියන්සේලාගේ අප්පුහාමි | |
| ගොජරාගම | කුරුකුලත් අරශන් ඉලංගසිංහලාගෙ පුංචි අප්පුගේ කුමාරි, බටහිර හතලිස්පහ, | දිවුල්ලැව. |
| එම | කුරුකුලත් අරශන්ලාගේ කුමාරංගේ තෙන්වණී, බටහිර හතලිස්පහ, | එම |
| එම | කුරුකුලත් අර්ශන්ලාගේ ඉලංගසිංහ කුමාරංගේ (වේල්අයියර්) වෙලයිර, බටහිර හතලිස්පහ, | එම |
| එම | කුරුකුලත් අර්ශන්ලාගේ ඉලංගසිංහ බණ්ඩාරියගෙ පත්තිණි, බටහිර හතලිස්පහ, | එම |
| එම | කුරුකුලත් අර්ශන්ලාගේ කාන්දගේ (වේල්අයියර්) වෙලයිර. බටහිර හතලිස්පහ, | එම |
| ඔතුවෙල, | වර්ණකුලසූරිය ජයසිංහ මුදියන්සේලාග් පුංචප්පු මහත්මයා. අළුත් ගෙදර. | |

නාවක්කාඩු ප්‍රදේශය ආණ්ඩුකල නවරත්නසිංහ, ඉරණසිංහ, රාජවන්නි මුදියන්සේලාගේ පරම්පරාවද අයෝධ්‍යයෙන් පැමිණි යුධ සේනාධිපතීන්ගෙන් පැවත එන පරම්පරාවකි. "මෙතෙම සීතාවක රාජසිංහ රජුන් දවස ඔළුපැලියාවේ පදිංචිව සිටිමින් නාවක්කාඩුවේ ප්‍රභූ කුමාරයා වශයෙන් ප්‍රසිද්ධව සිටි කුරුකුලයෙකි." යුධ සේනාධිපති පැලවාද කුරුකුලත්තාර් කෙනෙකි. ඔහු ගෙන් පැවත එන පරම්පරාව කුරුණෑගල පලාතේ සහ දකුණු පලාතේද ගම් කීපයකම වාසය කරති.

ද්‍රවිඩ භාෂාවෙන් "කෝන්" යනු රජුට සහ ඇතැම් විට එංඩිරුත්ටද ව්‍යවහාරකරන නාම පදයකි.

## ගජබා රජ කාලය

"එයින් මෑත භාගයෙහි ගජබාහු නරපති තෙමේ යට කියන ලද කුරුරටෙහි පරණ සිටියවුන් එහි එක් පසකට යවා ඊට පරණ කුරු රටයයි නම් තබා තමන් විසින් දඹදිව කුරු රටින් අලුත ගෙනෙනලද හිර සෙනග කුරු රටෙහි අනික් පසෙහි නවත්වා ඊට අළුත් කුරුරට යයි නම් තබා ලූයේය."

(ගජබා කථා සහ සොලී වංශ පේරුව නැමැති පුස්කොල පොත්වලින් උපුටා ගන්නාලදී.)

ගජබාහු රජ නීල සේනාධිපතියාගේ ද ආධාර ඇතිව සොලී රටට වැද යුධාරම්භ කෙළේය. මේ කාලයේ කුරුරට කරාවේ යුධකාරසේනාවක් සමූහයක් සොලී රජු යටතේ සවන් කරමින් සිටි හෙයින් ඒ සෙනගද ගජබාහු රජුට පාවාදෙන්ට යෙදුනෙන් මේ හේවායින් සමූහයද ලංකාවට ගෙනැවිත් අලුත් කුරුරට හෙවත් අලුත් කුරු කෝරලයේ දඹුගමුව ප්‍රදේශයෙහි ගම් බිම් දී පදිංචි කරවන ලද්දේය. මෙයින් පැවත එන පරම්පරාවල් බොහොමයක් ඒ පලාත්වල අද දක්වා සිටිති. ඔවුන්ගේ මුල් පරම්පරාව යුධ සිරකාරයින් වශයෙන් ගෙනා නමුත් ඔව්හුද අනිකුත් කෞරවයින් වැනි නියම "කුරුකුලත්තාර්වරුය."



අලුත් කුරුකෝරලයේ සිටින කුරු රටියන් සියල්ලෝම ගජබාහු රජුගේ සිර සෙනග වශයෙන් කරුණු නොදත් ඇතැම්හු උපහාසාත්මකව ව්‍යවහාර කරත්.

පරණ කුරු කෝරලයේ කඩයිම්:-

"පොළහුන් නයින් වස්ත්‍රා කඩ ට එක් කෙ රේ
උරිරු රස බොජුන් පළුව ට එකතු ක රේ
මී සූරු රස බුලත් පව්ව ට යටත් නෙ රේ
ගජතු පෙර එළිය ඒ මැද ට අසු කෙ රේ

මමත් දනිමි සකි නුඹ කියන මා රු වා
ඔනලේ ගලට නයි මංකඩ අමා රු වා
රහල ගලේ කෙල කෙල ඉන්න සි රු වා
මෙතැන මැද නොවෙද සකි පරණ කු රු වා

රණ ගුණ පොකුණ මූරුතේ කඩවත මැදි නා
ගුණ සොඳ මාතලා ගල බෙරවිල පෙණෙ නා
අ හු පිණි ඇල්ල සහ කලු උණ ගමලන් ය නා
කිණි හිරි ගලට දිප්පනෙන් කොන පෙනෙ නා

වැ ල් බැදිනුගේ පසුකර මල් තලා ව ට
හ ල් කුඹුරෙන් ආවම බතලේ ගල ට
ප ල් ලේකොණේ හෙණ වැදි ගේ ඇතේ සි ට
නැ ල් ල වැටුණ දෙරුවෙන් දුනු තිබු ගල ට

රහල ගල පසුව කරගල මහ ගල ට
කුරුමිණි ගලෙන් බලවත් ගම කඩවත ට
ඇල්පිටි කන්ද මුදුනේ ගල් තලාව ට
පරණ කුරුවට කඩ ඉම් නිමයි ව ට

(කඩයිම් සිව්පද පොතෙන් උපුටා ගන්නා ලදී.)

පරණ කුරු කෝරලය හෙවත් පරණ කුරු රට වෙනස් කර එහි යවන ලද සියල්ලෝම කුරු කුල හෙවත් කුරුවංශිකයින් බැව් සැලකිය යුතුයි." කුරුකුල'A "වරුණ කුල" යනාදි කුරුවංශික නාමයන්ගෙන් පෙනී සිටින නොයෙක් පරම්පරාවල් අද දක්වා මේ පලාතේ සිටිති. ඔව්හු අද දවසේ උඩරැටියන් මෙන් පෙනී සිටිති. පරණ කුරු කෝරලය වනාහි හතර කෝරලයෙන් එක් කෝරලයකි. මෙම කෝරලයෙහි පදිංචිවූ කුරුකුල මිනිසුන්ට උරුම ඉර හඳ කොඩිය දැනට හතර කෝරලයටම අයිතියයි කියා ගනිති.

දෙවුන්දර දේවාලයෙහි දේව කාර්‍යයෙහි නියුක්තව සිටි කුරු රට හස්තිනා පුර Bවේද වියාසර් පුත්‍රයින්ට අයිති මෙම කොඩිය අලුත් නුවරට ගිය පෙලහරට ගෙන ගියායින් පසු ආපසු දෙවුන්දරට ගේනා හතර කෝරලයේ තබා ගන්ට යෙදුනේය, ඊට හේතුව පරණ කුරු රට හෙවත් පරණ කුරු කෝරලයෙහි සිටි කුරුකුල හෙවත් කෞරවයින් මෙම ඉර හඳ කොඩියට උරුම කියා සිටි බැව් නැයි දැනගන්ට තිබේ.

---

A දෙබොමඩ ගෙවසූවාර්‍ය සිඳ පොත්දෙණියේ මුහන්දිරමලාගේ හේතුහාමි පී. සී. මැම්බර්

එම සිඳපොත් දෙණියේ මුහන්දිරමලාගෙ සිංගිරි මැණිකේ

එම වර්ණසූරිය මුදියන්සේලාගෙ උක්කුරාල ගුනරත්හාමි

එම එම

තල්ගමුවේ, ඩබ්ලිව්. ඇම්. ඉලංගසූරිය (වැලිමැත්තෙගෙදර)

එම වීරසූරිය මුදියන්සේලාගෙ වීරසූරිය. තැන්නේ ගෙදර

B ව්‍යාස මහ සාමිවරයාට දෙමලභාෂාවෙන් "වේද වියාසර්" යයි කියනු ලැබේ. මොහු කෞරව හෙවත් කුරුකුලයින්ගේ ආදි පිතෘවරයාය.



සාරාවෙ මහ කොඩිය
(ජේ. ඩබ්ලිව්. පෙරේරා මහතාගේ කොඩි පොත)



කෝට්ටේ මලව්ව පේරුගේ ගරු ජේ. ඩබ්ලිව්. ප්‍රේරා අභිනීතිඥ තුමන් විසින් ආණ්ඩුවේ නියෝගය ප්‍රකාර සකස් කරන ලද" "පැරණි සිංහල කොඩි" පොතේ අන්තිම භාගයේ අවුරුදු 400 ක් පමණ පුරාණ කරාවේ කොඩියේ සිතියම-චන්ද්‍ර, සූර්ය තාරකා මුතුකුඩ, තල්පත් සක්ගෙඩි, චාමර, පංදන්, පාරවලලු, නාගයෙක් මත්ස්‍යයෙක්, හස්තියෙක්, රජෙක්, ඔටුන්නක්, ගෙන්ඩුවක්, කඩුවක්, මානෙල්මල්, වීකරල් යනාදිය සටහන් කර තිබේ.

මෙම කොඩිය පොලොන්නරුව පලාතේ විසූ කරාවේ මුදලි කෙනකුගෙන් පැවැත එන්නන් අතර තිබී සොයා ගන්නා ලදින් දැනට හිංදු දේවාලයක එය සුරක්ෂිත කොට තබා තිබේ.

"රා ම දෙව් රද දෙවුන්දර සිට අලුත් නුවරට වඩින ග ම නේ
සෑ ම සිව්රඟ සෙනඟ සැදෙමින් මඟුල් දිව පෙරහරින් සොඳි නේ
සෝම රිවි රුව පිහිටි කොඩියද පෙරටුකර අා සෙයින් එ දි නේ
ජ ම හත් මාතයක් සිව් කෝරලේ හට වහි එතැන් ප ට නේ"

(හතර කෝරලේ ලේකම් මිටියෙන් උපුටා ගන්නා ලදි.)

මෙම ඉර හඳ සහිත තාරකා පිහිටි කොඩිය දෙවුන්දර සිට අලුත් නුවරට අා පෙරහරේ පෙරටුවෙන් ගෙනත් තිබෙනවා මිස, එය සිව් කෝරළයට අයිති කොඩියක් නොව දෙවුන්දරට අයිති කොඩියක් බැව් මේ කවියෙන්ම පැහැදිලි වෙයි. එපමණක් නොව මෙම කොඩිය හතර කෝරළේට අයිති කර දුන් බවටද සාක්ෂියක් නැත. මෙම කවිය සහ මෙයට සම්බන්ධව තිබෙන කව් පසද සසඳ බැලූ කල දෙවන රාජ සිංහ කාලයට පසුව මේ කාව් ප්‍රබන්ධ කර තිබෙන බැව් පේරේ. මෙහි සඳහන් පෙරහර වනාහි දඹදෙනිපුර නැමීබඹර කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු රජ කාලයේ අලුත් නුවරට ගිය පෙරහරකි.

ඉහත සඳහන් කවියට විරුඬව දෙවුන්දර වීර වරුණ රංපට බැඳි තිලවීර නැමැති කුරුකුල කවියෙකු විසින් කියනලද කවියක් මෙසේය.

"වේද ව්‍යාසර මෙකුන් පුත් තේනුවර පෙරුමා හස්ති නා
හා ද විචිත් දෙවුන්දර දේවාලෙ අදිපති විමෙ නා
පෑ ද සිත තම කොඩිය ඉර හඳ පෙරටු කර ආවා වි නා
ඒ ද මානය එයින් සිව් කෝරළේහට ඇන්නෑ හි නා"

මේ වේදව්‍යාසර් පුත් තේනුවර පෙරුමාල්ගේ මී මුත් තනු කෙනෙක් හස්තිනා පුරයෙන් පැමිණ දෙවුන්දර දේවාලයේ ප්‍රධාන තිලයක් ලබාගත සිටින අවස්ථාවෙහි ඔහුගේ පරපුරට අයත් ඉරහඳ කොඩියද, අලුත් නුවරට පෙරහැරේ පෙරටු කරගත ගිය නමුත්, ඔහුගේ වංශයට අයත් සියලුම කුරුකුල වශීයා ඉරහඳ කොඩිය සහ තවත් තාන්න මාන්නද මේ දක්වා ඔවුන්ගේ මඟුල් අවමඟුල් වලට පෙරටු කරගත යන්නෝය.

## දෙවුන්දර සිට අළුත් නුවරට ගිය පෙරහරේ විස්තර

දඹදෙනි පුර නැමි බඹර කලි කාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රම බාහු මහරජ දෙව ප්‍රතිරාජ නම් අමාත්‍යයා දෙව් නුවරට (දෙවුන්දරට) පිටත් කොට දෙව රාජ ප්‍රතිකඩය (රාමදෙව්රද) හා මහ රන්ආවුද දෙරව සේනා සමග පෙරහරින් වැඩමවීමට අණ කෙළේය. ඒ පෙරහරේ මූලික වූවෝනම් පෙර දෙවුන්දර දෙව භවනය සාදා දෙව්නුවර සහ දේවාලයේ ප්‍රධාන ධූරවලට පත්ව සිටි දා පුළු රජුගේ පුත්‍රයන් දෙදෙනෙකුගේ පරම්පාරාවෙන් තොසිඳ පැවැති ආ නවරත්න බණ්ඩාර සහ සූරිය බණ්ඩාර යන කුමාරයෝ දෙදෙනාය. ජයවර්ධන කෝට්ටේ රජ කාලයේදී රයිගම් පුරයේ කුමාරයෙකු සමග සරනුවී විසිදුනමට ගොස් සිටි ඒ කුමරුන්ගේ සහෝදරියකගේ දරුවන්ගෙන් පැවැත ආ



බුඩඝෝෂ නම් කුමාරයෙකුගේ පරපුරයෙන් පැවත ආ නවරත්න බණ්ඩාර දිසානායක කපුරාල, අළුත් නුවර දේවාලයට දේවරජ පෙති කඩය සහ රන් ආවුද වැඩම කිරීමේ මූලිකයෙක් වූයේය.

*දෙව් නුවර වැසි ඉහතකී පෙලපතෙන් පැවත ආ නවරත්න බණ්ඩාරට ශ්‍රී බුඩ වර්ෂ 1779 නිකිනි මස අව දසවක් දින සතුටු පඬුරු වශයෙන් සත් කෝරළේ කටුගම්පල හා ඇලබොඩ යන ගම් වර දෙකක් රජු විසින් ප්‍රදානය කරණ ලදී. එපමණක් නොව සතර කෝරළයට අයත් ගම්වර සහ මහදිශාවද දෙන්ට යෙදුනා ඇත. දෙවුන්දර (දෙව් නුවර) තිලවීර රන්පට බැඳි කිරි එතනා කුමාරිහාමිද මේ පරම්පරාවේ කුමාරියෙක.

දෙව් නුවර රජකළ දපුලුසෙන් යුවරජුගේ කාලයේදී දේවරාජ ප්‍රතිකඩය සහ සඳුන් රූපයත් අලුත් නුවරට වැඩමකළ බව සඳහන්ව තිබෙන බව පැරණි පොත පතෙන් දැනගන්ට තිබේ.

---

* දෙවුන්දර හෙවත් දෙව් නුවර ඉතිහාසය

"ගිරිහෙළපුරය" යනු මෙයට පූර්වයෙහි ව්‍යවහාරවූ නාමයකි. කිනිහිරි උපුල්වන් දිව්‍යරාජයානෙමේ දෙවුන්දරට පැමිණියේ දක්ෂිණ ජම්බුද්වීපයේ මලය ප්‍රදෙශයෙන් යයි කියති. දෙවියනෙමේ කිහිරිකොටයක වෙස්ගෙන නදී මාර්ගයෙන් අවුත් සමුද්‍රාවතීර්ණ විය. ක්‍රමයෙන් දක්ෂිණ ලංකාවට සමීප වූයෙන් ගිරිහෙළ පුරයෙහි ගොඩ බසිනු කමැතිවූ දෙවියනෙමේ සික්කාඩුව සමීපයෙහි පිහිටි වෑහිගම දේවාලයේ කුරුකුලයට අයත් කපු නිලමේට ඒ බව සිහිනෙන් දක්වීය.

කපු නිලමේ පෙරහැරක් සූදානම් කොටගෙන දෙවියන් පිළිගැනීම පිණිස ගිරිහෙළ පුරය දෙසට ගමන් ගත්තේය. දෙවිනෙමේ "කිරළවැල්ල" නම් මුහුදු තෙරෙසි රළයකින් ගොඩ ගසන ලදි. එහෙත් පෙරහැර එනු ප්‍රමාදවූයෙන් වෙනත් රළයකින් නැවතත් සමුද්‍රාවතීර්ණ විය. "සිංහාසන වැල්ල" පසු කරගෙන පාවෙමි ගොස් "මඟුල් වැල්ලට" පැමිණ එහි වෙරළ සමීපයේ පාවෙමි සිටියේය. එකල පෙරහැරින් එන්නාවූ කපු නිලමේ දෙවියන් දැක දියට බැස මහත් ගෞරවයෙන් ගොඩ ගෙන තුර්‍යනාද සහිතවූ එම පෙරහරින් ගිරිහෙළ පුරයට කපු නිලමේගෙ කර පිටින් මැඩවවා ගෙන ගියේය.

සත්වෙනි විජයබාහු රජු විසින් වේද වියාසර් තෙත් නුවර රජපෙරුමාලා නැමැති කුරුකුල නිලමේට දෙවුන්දර දේවාලය සම්බන්ධව දෙවා වදාල ශ්‍රී සන්නස

"ස්වස්ති ශ්‍රී වෛවස්වත මනු සංඛ්‍යාත මහා සම්මත පරම්පරානුයාත සූර්යවංශෝත්භූත ත්‍රි සිංහලාධීශ්වර නව රත්නාධිපති ශ්‍රීමත් සිරිසඟබෝ ශ්‍රී විජයබාහු චක්‍රවර්ති ස්වාමීන්වහන්සේට දසවන්නෙත් මතු අවුරුදු පොසොන අව සතවකැ නැකැති වේද වියාසරුන්ට පලමු පටන් ප්‍රවෙණිව පැවැත ගෙන ආයෙන් දොලොස් දහස් කෝරලය බද A සිත්තවියට ගිම් නැගෙනහිරින් මාවත කොකුන් බස්නා ඇල හා දකුණු දිගින් පරගස මහ වෙල මාන්කඩ ඉම හා බස්නාහිරින් ලෙතදූව ගල්කොල්ල ඉම හා උතුරු දිගින් සුදුගල ඉම හා මෙකී සතර මායිමට ඇතුළත්වූ සරි යත් මීට වාඩුවට සිටි තුඹාගොඩ ගමට ඇතුලත්වූ මෙකි බද ගම් මුදල ගසකොළ වල්විල කුඹුරු ඔවිටි ආදීවූ තැන් උත්පලවණ්ණී දෙවි මහ රජ්ජුරු සන්නක කොට අවුරුදු එකකට පඩුරට පනම් දසයක් බැගින් පසිඳ ප්‍රයෝජන විඳිනා නියායෙන් නැකැති වේද වියාසරුන් මෙකු පුත් තෙත්නුවරප්පෙරුමාල ඇතුලු වූවන්ගේ දරු මුණුබුරු පරම්පරාවට ආ චන්ද්‍රාර්කස්ථායිව ස්වස්තිරව පවතිනා පතනට

A සිත්තැටියේ පැවැත්වූ සරස්වතී පූජාව

"............වැඩමකරවූ භික්ෂූන් වහන්සේලා විසින් සෙත් පිරිත් වැදූරු ඉක්බිති කුඩා ළමයින් සැටදෙනෙකුට අකුරු කරවීම කරවනලදී. ඒ ලඟට වූයේ සරස්වතී පූජාවයි. පුරාණ චාරිත්‍රානුකූලව මංගලාචරණ ආදි කොට ඇති පඤ්චෝපචාර සරස්වතී පූජාව දෙවිනුවර (දෙවුන් දර) ශ්‍රී විෂ්ණු දේවාලයේ නායක පූජක ආර්. පී. ඩී. තේනබදු මහ බෙත්මෙ නිලමේ තුමා විසින් අත්‍යාලංකාරයෙන් සිදුකරන ලදී."

(සිළුමිණ පත්‍රය 5.9.1937)

මෙම කපු නිලමේ වනාහි පුරාණයේ දෙවුන්දර සිටි හස්තිනාපුර කෞරවයෙකුගෙන් පැවත එන්නෙකි.



පරාක්‍රමබාහු රජ පේගුවට යවන ලද යුධ නැවක සැලැස්ම.



සලස්වා පත්ලියා දෙන්නේයයි ජවගඹින කෝට්ටේ මාලිගාවේ සිංහාසනයේ වැඩහිඳ මුදලිවරුන් මැද වදාල මෙහෙවරින් මේ සන්නස් තාම්බු පත්‍රය ලියාදුන් බවට සන්නස් තිරුවරගත් පෙරුමාලුම් වම්ස."

නවවෙනි ධර්ම පරාක්‍රමබාහු රජු කෝට්ටේ රජ කරණ සමයෙහි ඔහුගේ මලනුවන්වූ සත්වෙනි විජයබාහු රජු ක්‍රි. ව. 1530 – 1534 දක්වා දෙවුන්දර රාජ්‍යය කෙළේ ය. මේ බව රයිස් ඩේවිස් මහතා විසින් ප්‍රසිද්ධකල දෙවුන්දර ශිලා ලේඛණයෙන්ද පෙණෙන්. හෙතෙම ධර්ම පරාක්‍රමබාහු රජු කාලක්‍රියා කල පසු දෙවුන්දර හැර කෝට්ටෙයට පැමිණ ඔහුගේ මරණය දක්වා එහි වෙසෙමින් රාජ්‍යය කෙළේය.

## මහා පරාක්‍රමබාහු රජ කාලය

i වෙනි පරාක්‍රමබාහු රජු දවස * පිට රටවලට යවන ලද සිංහල රජුන් සතු නෞකාවන්හි සේනාපති වරුන්ද කපිතන් වරන් හා නියමුවන්ද, කොඩිකාරයින් යනාදි

* නිව්සිලන්ත, වැසි ශාසත්‍රාචාර්‍ය බැනට් බිෂොප්තුමා මෙසේ කියයි:–“නිව්සිලන්ත දේශ වාසී “Maori” මවෝරි (මෞර්‍ය) ජාතික යන්වූ අපේ මුතුන්මුත්තන් වනාහි ක්‍රි. ව. 1250 දී පමණ ලංකාවෙන් සහ දකුණු ඉන්දියාවෙන්ද යාත්‍රා රැගෙණ එසි පැමිණියෝය.”

(The Ceylon Daily News, December, 1938.)

මහා පරාක්‍රම රජුන් දවස ක්‍රි. ව. 1150 - 1186 මහ බලගතු නාවික යුධ හමුදාවක් කීර්තිනගරගිරි සහ ආදිත්‍ය ද්‍රවිඩ අධිකාරි (සූරිය තමෙල් කුමාරයා) යන “මහමරක්කාල්” නොහොත් “අද්මිරාල් වරු” දෙදෙනාගේ ප්‍රධානත්වයෙන් බුරුම රට පේගුවට යවන ලදී. මොවුහු කුසුම් යන ස්ථානයට ගොඩ බැස සතුරා පරදවා නගර ගිනි තබා එහි රජුද මරා දමන ලදී. මහා වංශය මෙසේ කියයි:–

“මේ යුධ සේනාව සහිත නාවුක සමූහයා, සාගරය මැද යාත්‍රා කරන දූපතක් වැනි විය. සමහර නෞකාවන් තුණාටුවලට අසුවී අන්‍ය රටවලට ගොඩබටහ.”

(Mahawansa 76-56)

“තමෙල් නම් දෙමල රජ කුමාරයෙකුගෙන් පැවත එන පවුලක ලදවියද දූතව කාරණෙව් කියා ඉඳිති.”

(ශ්‍රී ලංකාදීප වර්ණනා. 92 පිටුව)

සාහිත්‍ය පරාක්‍රමබාහු රජු විසින්, සොඟුරව ආදිත්‍ය කුරු අරශ නිලයිට්ට කුමාර තමෙල්, නමැති ක්‍ෂත්‍රියයෙකු යුවරාජ තනතුරට පත් කර ගත් බැව් “කාරගොයි කොන්වෙස්ට්” නමැති ඉංග්‍රීසි ග්‍රන්ථයේ 58 වෙනි පිටුවෙහි සඳහන් වී තිබේ.

වශයෙන් කුරුකුල නිලධාරීන් සේදී සිටි බැව් මෙහි පහත සඳහන් ආණ්ඩුවේ මහා තෝම්බු කාර්යාලයන්හි මහා භාරකාර ශාස්ත්‍රාචාර්ය ජේ. පෙරේරා මහතාගේ (1933 නත් දෙසැම්බර් ක්‍රිස්මස් කලාපය වන "සිලෝන් කෝෂරි ඉලස්ට්‍රේටඩ්" සිංහල රජුන්ගේ නෞකා පිළිබඳ (එම කලාපයේ 23 හා 52 පිටුව සම්බන්ධවූ) විස්තරයෙහි සඳහන්ව ඇත.

## NAVIES OF THE SINHALESE KINGS.

It would be equally interesting to know whether there still survive any of the descendants of the officers and naval ratings of Prakrama Bahu's and later times. Probably yes, judging by the extremely lively "remains" of modern times of the vocational classes and castes of ancient Ceylon. Firstly, there are the Chonakar or Yonakar, viz. Ionians, or Greeks, a term applied by the Sinhalese to all foreigners from the North-West presumabaly in order to pay out those fastidious strangers, the Greeks, for calling *them* barbarians. Then there are the Karawas, who were given large concessions by some of the Sinhalese kings for fighting their battles for them, and whose names suggest their ancient callings such as Maha-marakkalage, of the house of the (Captain of the) big ship, Malimige, of the house of the Pilot, Kodikarege, of the house of the Standard-bearer, &c., &c. During the comparatively recent Portuguese and Dutch times, the former survived every manner of persecution, due to the original Portuguese antipathy to the Moors, or Mohammedans, of Morocco, and the fact that they were the most formidable rivals to both the Protuguese and the Dutch in their inland and maritime trade, and blossomed out at the end of the Dutch administration into an artillery corps; and the latter, who among other difficult "Jobs" assigned to them by the Dutch had to fish out lost anchors, make "Pandals" and supply fish and oysters for the Governor's table, acquitted them-selves bravely in many a hard-fought encounter in the Kalutara and Bentota districts between the Portuguese and the Dutch. Both of them still possess their old grit and indipendence and should make admirable recruits.



"පරාක්‍රම බාහු රජ කල හා ඊට පසු කාලවලදීත්, නාවික යුධ මූලාදෑනීන් හා ඔවුන්ගේ පිරිසගෙන්ද පැවතෙන්නෝ අද දක්වා සිටිනවාද යනු දැනගැනීම වැදගත්ය.

ලංකාවේ කුල හා පංක්තිවල අයින්ගේ රක්ෂාවන් පිළිබඳ විභාග කරන අතර වර්තමාන පරම්පරාවත්, පැරණියන්ගෙන් සමහර විට පැවතෙන නිසා, එසේම යයි කිය හැකිය.

පළමුව "චෝනක" හෙවත් "යෝනකයෝයි." ඔවුන් වනාහි "අයිවෝනි" නොහොත් "ග්‍රීක්" වරුයි.

එකල සිංහලයෝ වයඹ දිසින් පැමිණෙන විදේශීන්ට චෝනක නොහොත් යෝනක යන නාමයන් පුරුද්දක් වශයෙන් ව්‍යවහාර කිරීම සිරිතක් විය. තමන්හට ම්ලේච්ඡයෝ යයි කී හෙයින්, ඔව්හුද මේ අමුත්තන්වූ ග්‍රීකයින් හට, යෝනක නාමය කියන්ට ඇත.

මී ලඟට, "කරාවේ" මිනිසුන් වෙති. ඔවුන් සමහර සිංහල රජුන්ගේ යුධවලට ගොස් එතුමන් ලා වෙනුවෙන් සටන් කළ හෙයින්, ඔවුන්ට බොහෝ වර ප්‍රසාද දෙවා වදාරා තිබේ.

ඔවුන්ගේ ආදි නිල හඳුන්වන නාමයන්වූ "මහ මරක්කල ගේ" (මහනැවේ කැප්ටන්) "මාලි මගේ" (නැවේ නියමුවා) 'කොඩිකාරගේ' (කොඩි භාරකරු) සහ තවත් නිල වලි නාමයෝ වෙති."……………………………………

දෙවනු කී අයින් (සමහර කරාවේ මිනිසුන්) නොයෙක් අසීරු සීමාන්තවල යෙදෙමින් සිටින අතර, ලංදේසීන් විසින් ඔවුන්ට මුදේ නැතිවූන "නැන්ගුරම්" සෙවීමටද, තොරන් තැනීමටද, ආණ්ඩුකාරයින්ට මසුන් සහ බෙල්ලන් සැපයීමටද, ආඥ පනවන ලදී.

පරංගීන් හා ලන්දේසීන් අතර කළුතර සහ බෙංතර පලාත්වල සිදුවූ තදබල යුධවලදී, මොව්හු (කරාවේ යුධ හමුදාව) ඉතාමත් නිර්භීත භාවයෙන් සටන් කර තිබේ. මේ දෙවගීයා නවමත් ඔවුන් ගේ යුධකාමී භාවයත්, නිදහස් තත්වයත් රැක ගෙන සිටිති." යනුයි.

(By A Riemers, Archivist, Government of Ceylon.)

තවද මරක්කල සත්හඩුගේ, මරක්කල සත්නාදිගේ, මරක්කල හන්නැදිගේ, පොඩි මරක්කලගේ. යන වලිනාම ඇති කරාකුලයින් දකුණු පලාතේ සිටිති. ඔවුන් යුධ සේනාධිපතීන්ගෙන් පැවතෙන්නෝ වෙති.

පෙරකල, මුන්නේස්සරමට ගොඩ බට මලල බණ්ඩාර කුමාරවරු ගමන්කල යාත්‍රාවලට "මරක්කාව" යන නාමය කියා තිබෙන බව "මලල බණ්ඩාර වලිය" නැමැති වන්නි කථාවේ, මෙසේ සඳහන්ව තිබේ.

"මරක්කාව කොයි අතටද පදින් නේ
සිංහල රටට යන්නට අපි කියන් නේ"

තොණ්ඩාවලට මරක්කාව යයි කියා තිබෙන බවත්, ඒ වාගේ ප්‍රධානීන්ට "මරක්කලගේ" යන නාමය අයිති බවත් මෙයින් හැඟේ.

## දෙවන පරාක්‍රමබාහු රජ කාලය

එකුරක නොහොත් එකුර සෙනෙවි ප්‍රධානව 700ක් ආයුධ සේනා හමුදාව ලංකාවට පැමිණියාහුය. එකල දඹදෙණි පුර ආණ්ඩු කල රජ ද්‍රෝහි මිත්ත සෙනෙවියාව එකුරගේ එක් කඩු පහරකින් කපා හෙළීය. ඉන්පසු ආර්‍යය, සිංහලය යන සියළු සේනාවෝ සමගිව යාපව්වට ගොස් භුවනෛකබාහු කුමරු දඹදෙණියට ගෙන අවුත් අභිෂේක කළෝය. එකුරගෙන් පැවත එන පරපුර "එකුර අජිත දෙව ආදිත්‍ය" නමින් මේ දක්වා පැවතෙන්නෝය. මේ පිළිබඳ විස්තර පසු භාගයක පලවේ.



## පළමුවෙනි භුවනෛකබාහු රජ කාලය

මෙසේ කලින් කලට රාජ්‍යයට පැමිණෙන රජතුමාණන් මෙම වංශානුගතව පැමිණෙන හෙයින් භුවනෛකබාහු නරශ්‍රේෂ්ඨයන් විසින් පස අනූවක් පමණ කාංචි පුර නුවරින් මෙම ලක්දිවට ගෙන්වා ගෙන මුහුදු කරදිය මලල්ල වට පරසතුරන් විසින් වන අනතුරට ගම්වර දී ඔවුන්ට රජ කරුණාවන් දෙවා එහි පිහිටවූහ. එතැන් පටන් ඔවුන්ට ගම නොයෙක් කටයුතු තබවා පස් මෙහෙකම් කරන්නාවුන්ද සලස්වා රක්ෂා කළාහ.

(තමන්කඩුවේ * කොඩිකාර ගම වනවාස හාමුදුරුවන් ගේ ජලතාඥය පුස්කොළ පොත.)

"තමලිංගමුවේ රජයා හා (ජාවක රජ) සටනට කුරුරට කුරුකුල සේනාසින්ද "පරවර" සේනාසින්ද දඹදෙනිපුර කාලිංග පණ්ඩිත පරාක්‍රමබාහු මහරජු විසින් යවා තිබේ."

(බුද්ධ රක්ඛිත හාමුදුරුවන්ගේ දඹදෙනි අස්න පුස්කොළ පොත.)

දඹදෙනි පුර කාලිංග පණ්ඩිත පරාක්‍රමබාහු රාජ්‍යය කරන කාලයෙහි ඔහුගේ දෙවැනි පුත් භුවනෛකබාහු යාපව්වෙහි ආණ්ඩුකාරයා වශයෙන්ද තිලෝක මල්ල කුමරු මහවැතල ආණ්ඩුකාරයා වශයෙන්ද සිටියේය.

(ආණ්ඩුවේ ලංකා කථාව-රාජාවලිය-සහ-මහ වංශය)

කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යනා නමින් ප්‍රසිද්ධවූ දඹදෙනිපුර දෙවැනි පරාක්‍රම බාහු රජකාලය තුලද ඔහුගේ පුත්‍රයින් වන 4 වෙනි විජයබාහු රජකාලයේද 1 වෙනි භුවනෛකබාහු රජකාලයේද කරාවේ නොහොත් කුරුකුලයින් ලංකාවට කිපවිටක්ම ගෙන්වා තිබෙන බැව් මෙහි පහත සඳහන්වේ.

---

* "යන අඩි පාර බලමින් වන සතුන් නේ
දෙනා වෙඩි පාර කෙණ හඩමෙන් ඇසෙන් නේ
සිත දුඩි ගෝර අය මයි මෙසි සිටින් නේ
ගම කොඩිකාර පසුකර යව ලසින් නේ"

"මනින්දය, සුබනෝය, වසෙන්ත කුරුය, නන්ද කුරුය, ගජ කුරුය, පුණ්ණ කුරුය, උසබ්භ කුරුය, යන ක්ෂත්‍රිය කුමරුවන් සත් දෙනෙකු යටතේ සේනාව මෙරටට ගොඩ බැස්සාහ."

(කකුසන්ද ස්වාමීන්ගේ දඹදෙනි අස්න පුස්කොළ පොත.)

ඉහත සඳහන්වූ ක්ෂත්‍රියයෝ වනාහි කෞරව නොහොත් කුරු වංශික රාජ පුත්‍රයා ආර්යයින්වරුය. මෙහි පහත සඳහන් කෞරව ආර්ය ජනයාද මේ කාලයේදීම දඹදිව සිට දඹදෙනියට පැමිණ තිබේ.

"මිත්‍රද්‍රෝහී මිත්ත සෙනෙවිරත්‍ය, ඨකුරක, සහ සත්සියයක් ආර්ය ක්ෂත්‍රිය හේවායෝයි.......................................
මිත්තගේ චැටුප් ප්‍රතික්ෂේප කළබැවින් මිත්ත සමීපයට කැඳවනු ලැබිය. එවිට භුවනෙකබාහුගේ රහස් ආඥාව පිට ඒ නිර්භීත ඨකුරක තෙමේ වහාම ඉදිරියට පැන මිත්තා සෙනෙවියාගේ හිස එක පහරින්ම කඩුවෙන් කපා හෙළීය."

(ලංකා කථාව-රාජාවලිය-සහ-මහ වංශය)

# V භුවනෙකබාහු රජ කාලය

මෙම රජු ක්‍රි. ව. 1374 ගම්පල අගනුවර කර රාජ්‍යය කරණ ලදී. මේ කාලයේද කුරුරට කාංචිපුර කාවේරි පට්ට නම කිලක්කරේ ආදි දඹදිව පිහිටි රටවලින් කරාවේ හෙවත් කෞරව නොහොත් කුරුකුල පේරුවලට අයත් ජනයා ලංකාවට පැමිණ තිබෙන බැව් දැනගන්ට තිබේ. මේ කාලයේ පැමිණි ජනයාගෙන් ප්‍රධානියාට *සේනාධිපති ධූරය පත් කොට කඩු පැළැන්දු බව දැනට කොළඹ කෞතුකාගාරයෙහි තබා තිබෙන මෙතුමාට අයිතිව තිබූ කඩුවේ සටහන් කර තිබේ.

---

* රන්පටබැඳි කුරුකුල නාථවූ බණ්ඩාර සාමිව, භුවනෙකබාහු රජුගේ සේනාපති වශයෙන් පත්කර ගන්නා ලදී.



ඒ මෙසේයි:-

"ස්වස්ති ශ්‍රී.........ප්‍රවර විරාජමාන ජනදීශ්වර............
විජයරාජ සෙනෙවි මහවාසලදීය.

ශ්‍රී බුද්ධ වර්ෂ සහස් නවසිය සතලොස් වැනිවූ කාල ශ්‍රී ලංකා ......යුවරාජ සෙනෙවි ධූරයා පත්කරන ලැබ කෞරව ආදිත්‍ය අරසනිල ඉට්ටු ඉලෙ නාග......නම්දූ කගය ලබනට යෙදුනේ මෙ......... වෙසක පුර පසළොස් කුජදින ජයවර්ධන පුර රජවාසලදීය."

භුවනෙකබාහු රජු ගම්පල රාජ්‍යය කරන සමයෙහි ඔහුගේ සහෝදර විජයබාහු කුමරු ජයවර්ධන පුර යුවරජු මෙන් සිටි බව පෙනේ. ඔහුට මහවංශයේ වීරබාහු කියාද රාජාවලියේ විජය බාහු කියාද ව්‍යවහාර කර තිබේ. මෙම යුව රජු 1399දී පමණ ජයවර්ධන පුර අගරජ වශයෙන් සිටින අතර ක්‍රි. ව. 1411 දී පමණ චීනුන් විසින් ඔහු ප්‍රයෝගයෙන් අල්ලා චීන රාජ්‍යයට ගෙනයන ලදී. පසුව නිදහස ලැබී ලංකාවට හැරීවිත් රජකම සම්බන්ධයව යුද්ධක්ද කර ඉන් පැරදී ශ්‍රී පාද අඩවියට පලාගොස් තපස් වරයෙකු වශයෙන් බොහෝ කාලයක් ගතකර තිබේ.

(රාජකීය ආසියාතික සංගරාව 1903-1905,18 වෙනි කාණ්ඩය.)

## "Kauravir Adittakuru Arasanilaitta Kumara Thamel"

In the era of Buddha 1792 the great king of Siri Lanka Sahitya Pandita Prakrama Bahu appointed Kaurava Aditya Kuru Arasa Nila Itta Kumara Thamel second King enthroned him & invested him with a sword set with gems of nine classes. This was done at Siriwardana Wasala on Tuesday full moon in the said Year."

මෙහි කෙටි විස්තරය:-

"බුද්ධ වර්ෂ 1792 ට පැමිණි සඳ ශ්‍රී ලංකාධිපති සාහිත්‍ය පණ්ඩිත පරාක්‍රමබාහු මහරජ, කෞරව ආදිත්‍ය කුරුඅරශනිලයිට්ට කුමාර තමෙල් තෙම, යුවරජ පදවියට පත්කර, නවරත්නයන් සහිත ඛඩ්ගය පළඳවනු ලැබුවේ මෙම වර්ෂයේ පසළොස්වකට පැමිණි අඟහරුවාද සිරිවර්ධන වාසලදීය."

(කරාව ගොසි කොන්වෙස්ට් පි. 58)

XIII කොටස

# හෙණ්ඩන් හේරත් බණ්ඩාර වලිය

—— ලිපියේ කොටසකින් ——

තොප විසින් කළයුතු මෙහෙවර වන්නි බණ්ඩාරට කර දෙව්යයි කියා භුවනෛක සිරිත් විරාජමාන මහරජාණෝ වදාල පුවත මෙසේ දතයුතු.

තවත් ඔබට ඔලගම් - නිඳගම් අතුදලුපත' උඩුගම්පල - කිරවැල්ල - මහර - කරදන - වත්තල - කැලණිය - දුගොන්න - බඹපනේ - උඩුකහ - යටිකහ - යටිහේන - මාදළු පිටිය - නාගොඩ - තෝපුව - ජෝරගොඩ වත්තල - බෝලඳ - මල්වාන - කප්පෙතාට - හල්පේ - බලනල්ල - බෝතලේ - හෙට්ටි මුල්ල - උළගල්ල - මූනමලේ - උදන්විට - කහඹිලියා පිටිය - තෝරවතුර - එණුවණැල්ල - අලව්ව - මාතලගමුව යන මෙකී ඉඩම් ප්‍රවෙණි භුක්තියේ හිමිකොට ඔබට රට මායිම්:-..............................

## කුරවසිංහ වන්නි බණ්ඩාර

ඊට ඉක්බිති කුරවසිංහ කුමාර තෙම නොබියව සැල කරන සේක් දේවයන් වහන්ස! මමද පුත්තලම් ජනපදය රක්නා පිණිස ඔබවහන්සේගෙන් ලබාසිටින නමුත් නිතර වියවුල් වන බැවින් ඒ සතුරන් පරාජය කළහැකි යුධයෙහි දක්ෂවූවන්ගෙන්ද ඔවුන්ට සුතු අවි ආයුධාදීන්ද; මා හැඟි ලැගුම් ඉඩම්ද ඊට සුදුසු පරිවාර අතවැසියන්ද ලැබෙන ලෙසට සැලකෙළේය. රජ්ජුරුවෝ ඔබට සතුටු රත්තරන් පටි සළුනයක්ද-රත්තරන් කම්බිලියක්ද-රන් මණ්ඩයක්ද සුරන් වලන් සයක්ද - දෙවාවදුරා - 'කුරවසිංහ කුමාර වන්නි බණ්ඩාර'යයි කියා රන් පට බැඳ ඔබට සරඹයෙහි දක්ෂයින්ගෙන් නවසිය හැටක්ද එසේම ධනු ශිල්පීන් - ගෙන් හත්සිය හැත්තෑවක්ද; සෙසු පාබල සේනාවන් දෙදස් හාරසිය පණසක්ද දෙවා මොවුන් සුතු යුධ භාණ්ඩයන්ගෙන් කාලතුවක්කු වෙඩි මුලක්කත් කඩු කස්තාන



තෙප්න - ලන්ස - පට්ස්තාන - තෙප් කොන්න - අඩයටි - තෝමර - පලිස් යනාදි වාහික යුද්ධෝපකරණයන්ද දෙවා ඔබට නානාප්‍රකාර දුසාදීන්ගෙන් හය දහස් හාරසිය තෙපණසක්ද; ගෝවිකම්හි නියුක්ත වූවන් ආදිකොට ඇති සෙසු කර්මාන්ත කාරයන්ගෙන් එක්දහස් අටසිය හැටක් පමණ දෙවාවදාළ එකී මෙහෙවර ඒ ඒ කාලයෙහි යටත් පහත්ව කරදෙව්යයි වදාළ පනත දතයුතු.

ඒ ජනපදය තුලෙන් බට නිඳගම් අසා වදාළ මාදම්පිටිය - බිදුම්කඩ - සලාවත හෙවත් හලුපිටිය - නාවක්කඩුව - ඉළුක් වත්ත - තඹරුවිල - බුලත් තම - කණ්ඩෝව - කෙහෙල් අත්ගම - අස්තුකුලම - කොම්භාලාන - දෙහිවත්ත - බේරුවලාන - වැදිගම - මුන්නේස්සරම - තලයාය - ඔත්තැවැව - කෙටේවත්ත - ඇත්තොට - රඹුක්වැල්ල - සිවලාකුලම - අන්දරවත්ත - එළුපිටිය - පරපේ ගමුව - කල්දුම්මුල්ල - කල්ලුන්න - හෙට්ටිමුල්ල - මරින්තිකල්ල - කල්ලතිරිල - තම්බුවටන - තබ්බෝව - බොරවැව - ගල්ගම ඉළුක්වැව - කුමරපල - කුරුකුලම - බොරුල්ලේ ගම - වරුනම්මන - බෙලිවත්ත - යන මේ ඉඩම් හැර තවත් හයසිය හැත්තෑවක් ඔබට නින්දගම් යයි කියා හේරත් බණ්ඩාරගේ අයදුම පිට රට මායිම්කර මහමෝදර නැව්තොටින් - වෙල් පරිප්පුවේ දූ ගොඩින් - වැදි කෙවුලන්ගේ දුන්න කෙටු ගලෙන් - පන්තිරිප්පුවේ හවරි නුගෙන් - පොරව කෙටු ගලෙන් - හෙට්ටි පල එද්ද හැටිය කන්දෙන් දෙමව් ගලෙන් - වුරද තොල්ලා හින්නෙන් - අළුත් වැවේ දියගිල්මේ ගල් වැඹෙන් කන්දෙ විහාරේ ගල් පඩි පෙලෙන් - තිරම්මන ගොයේ කළු ගල් ගොඩින් - තෝනි ගලෙන් - ඇටඹුරුවා ගලෙන් - පසු වුල්ගම දුන්න කෙටු ගලෙන් - ඉළුක් හේනේ කොණ්ඩ ගලෙන් - කළුගල්ලේ කන්දෙන් - දෙදරු ඔයේ මෝදරින් කරදියට මායිම් කර පනිටුවා ශ්‍රී හස්තයෙන් දෙවා වදාරා-

(සිළුමිණ ඓතිහාසික කලාපය 1938 අප්‍රේල් 24. පිටු 24, 23)

## බණ්ඩාරවරු

උතුරු ඉන්දියානු රජුන්ට ඥාති සම්බන්ධය ඇත්තවුන්ට 'බන්දූර්" කියන්නාසේම දකුණු ඉන්දියානු රජුන්ගේ ඥාතීන් හටද "සම්බන්දූර්" යයි ව්‍යවහාර වෙත්. ඇතැම් විට මෙය "බන්දූර්" යයි ලුහුඬු ශබ්දයෙන්ද යෙති

මෙනම සිංහල වංශ වාසීනු "බණ්ඩාරය" කියා පෙරළා ගෙන භාවිතා කරනු ලබත්. අතීත සිංහලාධිපතිවරයින් දවස "බණ්ඩාර" යයි භාවිත කරනු ලැබූවෝ ක්ෂත්‍රියයෝයි. මෙහි පහත දැක්වෙන විස්තරයෙන් එය මනාව පැහැදිලි වේ.

"බණ්ඩාර' නාමය ව්‍යවහාර කරන ලද්දේ රජ කරන පවුල්වල කුමාරවරුන්ට පමණකි. උඩරට රාජධානිය බිඳ වැටෙන තෙක්ම මේ ව්‍යවහාරය මෙසේම පැවැත්තේය."

(1937 පෙබරවාරි 5 වෙනි දින, ආචාර්ය රඹුක්වැල්ලේ සිද්ධාර්ථ ස්වාමීන් විසින් රාජකීය ආසියාතික සමිතියේ දී කියන ලද්දකි.)

"බණ්ඩාර" යනු "රජු පිළිබඳ" යන අර්ථයෙහි වැටේ.

(රොබට් නොක්ස්ගේ ඉතිහාසය 178 පිට)

A "බත්ඩාර වත්ත" යනු රජුට අයිති වත්තකි.

(ඈ.ජ්. ඊ ගුණරත්න තෝම්බුවේ මුදලිතුමා)

"බන්ඩාර ගම" ගබඩා නම් හෙවත් රජුට අයත් පුද්ගලික ග්‍රාමය (දෙශවිලමෙ)

---

A මිරිස්සේ බණ්ඩාරමුල්ලේ යන ගම වැසි "බණ්ඩාරවරු" කුරුකුලයට අයත් ක්ෂත්‍රියයෙකුගෙන් පැවතෙන්නෝ වෙති.

දකුණු පලාතේ ගාලු දිස්ත්‍රික්කේ කොග්ගල බණ්ඩාරවත්තේ පදිංචිව සිටි පී. ජ්. ද සිල්වා බණ්ඩාර මහත්මයා වනාහි ලෝකයේ අම්ලාප ව්‍යාපාරයේ දෙවෙනි කතීර මරයා වශයෙන් හැඳින්වත්තෙකි. පඳුමුවැත්තා අමෙරිකාවේ පුසිපුව් ජොන්සන් මහතාය.



ද්‍රවිඩ ජාතියෙහි "පණ්ඩාරම්" කුලයයි ගෝත්‍රයක් තිබේ. මොවුන්ගේ පාරම්පරික රක්ෂාව නම් දේවාල වල තඹ පිත්තල හැළිවලත් ඔවුන් භාරයේ තබා ගැනීම සහ අනිකුත් සුළු සුළු දේව කාරියෝවෙත්. මොව්හු තඹ පිත්තල හැළිවලින් නිතර දෙවේලේ සුඩ කරන අතර එයින් නැගෙන ශබ්දය නිසා මොවුන්ට මෙසේ කියති.

"පණ්ඩාරම් පඩ ප ඩං ග
පාන සට්ටි ලොඩ ලොඩං ග"

මෙය උපහාස පිණිස වේ.

"සොළීකරෙන් හිරභාරයට ගෙනා "පණ්ඩාරම්" වරුන්ට (මුත්තුරාස) "මුත්තු රාජ කුලම්" යයි කියා තිබෙන බව පෙනේ. මෙහි අර්ථය "කපු කුලය" යනුවෙයි. අළුත් කුරු කෝරලේ පණ්ඩාරම් වරුන් විසින් අස්සද්දනු ලැබූ කුඹුරට ඔවුන්ගේ කුලය ප්‍රධාන කොට "මුත්තුරාජ වෙල" යන්න සැදූන බව පෙනේ."

## ශ්‍රී පරාක්‍රමබාහු රජ

ශ්‍රී පරාක්‍රමබාහු රජ දවස කෞරවර ආදිත්‍ය කුරුවීර අරස නිලයිට්ට මහානාගට සේනාපති ධුරය සඳහා දුන් සන්නස් පතක බඩිගයක සටහණය.

"ශ්‍රී බුද්ධ වර්ෂ...හස් නවසිය නව පනස් වැනි ශ්‍රී ලංකා දීප්ති ජයවර්ධන පුර ශ්‍රී සඟබෝධි ශ්‍රී පරාක්‍රම බාහු මහ රජ විසින් කෞරවර ආදිත්‍ය අරසනිල ඉට්ට මහා නාගට..........සේනාපති දූරය සහ කණීය සකස් කොට හිමිකර දුන්නේ වෙසඟ පිරි දසවක් ලත් කුජ දින සිරි වඩන වාසල දීය"

මෙම කඩුව සහ මීට ඉහතින් දැක්වූන කඩුවද මේ දක්වා කොළඹ කෞතුකාගාරයේ පහතමාළේ අල්මාරියක තැන්පත් කර තිබේ.

### * VI පරාක්‍රමබාහු රජු දවස කුරුකුලයෝ නමොබුඩාය.

කෝට්ටේ නුවර වැඩසිටින ශ්‍රී පරාක්‍රමබාහු දේව ස්වාමි දරුවාණන් වහන්සේ සිංහාසන මස්තකයට වැඩ වදාරමින් කේශර සිංහ විලාසයෙන් රාජ්‍යශ්‍රී සම්පත් විඳ වදාරමින් වැඩ සිටින ප්‍රස්ථාවට ත්‍රිසිංහලපියය අල්ලමැයි සිතා එසේ සිතමින් පුත්තලමට නාගපට්ටලමට පුත්තාලදෙශයේ සිට සිංහලාධිපතිවූ අපගේ දෙව ස්වාමි දරුවාණන් වහන්සේට මුක්කරුන් සේවාකමට සැදී පැහැදී සිටින ප්‍රස්තාවට

---

* සවෙනි පරාක්‍රමබාහු රජු සමයෙහි සොල්ඩාරෙන් භාරත වංශික හෙවත් කුරුකුල කුමාරයින් සමූහයක් ලක්දිවට පැමිණ පදිංචිවූ බැව් සියණෑකෝරලයේ ගණේමුල්ලේ අමුණුගොඩ විහාරස්ථානයේ ගල් අතලෙක්හි කොළා තිබෙන ලිපියෙන් හෙලිවේ. එයට "කුඹුම්රිසේ සෙල්ලිපිය" යයි කියනු ලැබේ. එකී භාරත වංශිකයින්ගේ නාමයෙන් මෙසේයි.

1 භාරිත ගෝත්‍රයේ අග්‍ර පෞරෝහිත වෙත්ගඩක්කුවාරන්
2 එම සරස්වති තේනු සරප් පෙරුමාළුන්
4 එම අවධානීන්
5 එම බෙණ්ඩාගම් චක්‍රවර්තීන්
6 එම ආනන්ද සට්ට වෙත්කඩක්කුවාරන්
එම විනායකප් පෙරුමාළුන්
7 එම සෙත්ය බජ්ජළුන්

(ගම්පොළ ඉතිහාසය)

"භාරත රජුගෙන් පැවත පරම්පරාවට අයත් කුරු නම් රජ පාලක තෙම විශෙෂ ස්ථානයක් ගෙන තිබේ. මොහු ගෙන් පැවත එන දරු මුණුබුරු ආදී කොට ඇති පරම්පරාවට ම කෞරවයෝ යයි කියති. මොවුන් වනාහි දීර්ඝ කාලයක් භාරතය අණ්ඩුකළ වංශයයි. කල්යත් යත් මේ භාරත ගෝත්‍රය වූ කලී කුරු හෙවත් කෞරව වංශ යයි ප්‍රසිඩම්ය. කුරු ක්ෂෙත්‍රය හෙවත් කුරු රට වනාහි ඔවුන්ගේ රාජධානිය වන්නේය."

(A History of Indian literature, by Maurice Winternitz P. H. D. Vol. i, Page 317)

"පරවර මිනිසුන්ට, "භාරත ගෝත්‍රිකයෝ" යයි මේ දක්වා කියනු ලැබේ."



එබවට නොයෙක් අමාත්‍ය මණ්ඩලෙ රදල වරුන් දක්කවා ගෙන සක්‍ර දෙවෙන්ද්‍ර විලාසයෙන් වැඩ සිට ගණ මුත් එක්ක පුඩ කරන්ඩ කාට පුළුවන්දැයි කියා වදාළ තැනේදී නොයෙක් අමාත්‍ය මණ්ඩලේ රදලවරු සැල කරණ සැටි නත් බෝමා කාලයක් මූළුල්ලේ ආසිරි බොවන්ඩ මේ සිංහල විපෙ තැනැයි කියා ඔප්පු කල තැනේදී මීට ආකාර කෙසේදැයි කියා අසා වදාල තැනේදී නමැතත් අමාත්‍ය මඩලෙ රදල වෝරු ඔප්පුකල විත්තියේ වගනම් උන් එක්ක සේවාකම් කරනොතිත් කාංචිපුර, කාවෙරු පට්ටලම, කීලක්කාර මේ කියන රටතුනේ සිටින හේවා හමුදාව ගෙන්නා ගත්තොත් සුදුස්සකැයි කියා.....

දීරවීරද සිර ගම්භීර රවි වංශාධිපතිවූ ශ්‍රී පරාක්‍රමබාහු උතුම් අපගේ දෙවස්වාමිදරුවානන් වහන්සේට නොයෙක් අමාත්‍ය මණ්ඩලෙ රදලවෝරු ඔප්පු කළ සැල කල තැනේදී සිංහලවීපය එකච්චක්‍රවර්තීව රාජ්‍ය ශ්‍රී කර වදාරන්නාවූ උතුම් අපගේ මහවාසලින් යෙදිච්ච පයිඩෙට මහ කප්පුරුගෙ වැඩ රාජකාරිය කරණ සිටින නොයෙක් රදලවරු එක්ව සිටගෙන මගකරුණා පනතින් යෙදුනාය කියා මේ මුක්කරුන් එක්ක හේවා කමට උදවු උනෝතින් නොයෙක් නානාන්තර ලැබෙනවාය කියා මහවාසලින් වදාල පණිතේ සැටියට කැඩපත් තුනක් ලියා පෙරකී දෙශවල් තුනට අනි කඩිනමින් පිටත් කර ඇරියාය.....

එනුවරාල් තුනේ සිටිය නිලමක්කාරයෝද සේවා සමූදුවද කාංචිපුර දෙශයට එක්වෙමින් රාජාධිරාජවූ රාජගම්භීරවූ රාජ උඩවජවූ ත්‍රී සිංහලාධි පතිවූ අපගේ දෙවස්වාමි දරුවාණන් වහන්සේගෙන් යෙදිච්ච පයිදේ ඉස් මුදුනේ ධරාගෙන සත් දවසක් සැණකෙළි නටමින් නැවැත සිංහලේට නොඩබැස යෙදිච්ච පයිඩෙට එන නිල මක්කාරයින්ගේ වගනම්.....

වච්චු හාච්චු දෙවරෙද්, කුරු කුල හාච්චු දෙවරෙද මානික්ක තලවෙන්ද, අදි අරස අඩප්ප උන්නැහේද, වර්ණ සූර්ය දෙඹර නාද අඩප්ප උන්නැහැද, කුරු කුල සූරිය මුදියන්සේද, පරද කුල සූරිය මුදියන්සේද, අරසනිල ඉට්ට මුදියන්සේද, මේ කියන නිලමක්කාරයෝ නවදෙන ඇතුලුව ආරච්චි ගම්වලින් දහඅට දෙනෙකු ඇතුලුව හේවා සමුදුවත්තෙන් සත්දහස් සත් සීය හතළිහකුත්-ඇම්බැට්ටයෝ ඇතුලුව තොලීල් කාරයෝ පස් දෙනෙකුත් සමගව හම්බාම් තුනකට රුවල් බැඳ පදිංචි වෙච්ච වෂීයේ වගනම්.

ශ්‍රී ශුධ සකරාජ වර්ෂයෙන් එක්වාදහස් එක්සිය පණස් වර්ෂයට පැමිණි මෙම වර්ෂයෙහි මීන රවි පහළොස් භාගවූ පස්විම ලත් රිවි දින රෙහෙන නැකත සිංහ ලග්නයෙන් කුරු හෝරාවෙන් පිටත්ව කැළණි පුරේට ගොඩ බැස්සාය.

සෙන්කඩ සයිලාසනාධිපතිවූ උතුම් අපගේ කෝට්ටේ නුවර වැඩ සිටිය ශ්‍රී පරාක්‍රම්බාහු දෙවසවාමි දරුවාණන් වහන්සේ ඔප්පු කළ තැනේදී නවම්නි ප්‍රසාදමකුට මනි චූලි මාලාවංයන් යුක්තවූ උතුම් අපගේ කෝට්ටේ මහ වහසලින් කරුණා පණතිත්.

කාංචිපුර දෙශෙ සිට ආ නිලමක්කාරයෝ සුඛ සූර්ය වංශාධිපතිවූ අපගේ දෙවසවාමි දරුවාණන් වහන්සේගේ ශ්‍රීපාද පත්මෙ දූක නමස්කාර කරපු තැනේදි දෙසක්කාර ගොල්ලට බොහෝසේ කරුණාව සම්පත් ලැබෙත්. එ ඇර පඩි ප්‍රසාද ලැබෙමින් දෙසක්කාර ගොල්ල දිසාව බලා වදුරමින් රවි මඩලේට තීක්ෂෙන්නාවූ අපුර විලාසයෙන් සොභාව දූන වදුරමින් හේවා පන්නේට සමෘඕාූයායි කියා සිතා වදුරමින් පුත්තලමට ආ මූක්කරුන් එක්ක යුඬයට යන්ට පුළුවන්දූයි කියා අසා වදාළ තැනේ උතුම්වූ මහ වහසලින් යෙදිච්ච පයිඩෙට සතුරු මුණය බිඳ ලාසුසුමූයි කියා උතුම්වූ මහ වහසලට ඔප්පු කළතැනේද් දුනු තුවක්කු කඩු කස්තාන ජම ජාඩි කිරිච්චි කෙටේරි වලතඩි වක්‍රා වලලූ ලන්ස පරිසාන මෙකී ආයුධත්.



යෙදිච්ච පයිඩෙට පුත්තලමට සේවා කමට ගොස් තුන් පැයෙකින් කොටුව ඇරෙව්වාය. මහවහසලට පඤ්ස වාදි පිණිස හේවා කමින් එක්දහස් සන් සියයක් සේනාව කපමින් වැටුනාය. නැවත නාග පට්ටලමට යුඬයට ගියාය. ඉන් හතලිස් දවසක් හේවාකම් කරණ වේලාවට මානික්ක තලවෙන් කියන නිලමක්කාර උන්නැහැ හේවා කමින් වැටුනාය. එසින් දෙමස් පෝයක් හේවාකම් කරමින් නාග පට්ටලම ඇල්ලුවාය.

මෙසින් දෙදස් අටසියයක් සේනාව වැටුනාය. නැවතත් මෙකොටු දෙකේ තිබුන රතු කොඩි දෙකත් මේ කොටු දෙකේ නිලමක්කාරයින් දෙන්නාගේ තරම් දෙකත් කොඩ දෙකත් දක්කාපු තැනේදි බොහොසේ සතුටු සන්තොසව වදුරමින් ගන්වර ලැබීමට උතුම් මහවහසලින් දෙවා වදාල පණතයි.

මැදිත් ඔරුවද අත ඕලන්ද මුන්නේශ්‍රමද ලගින් මුණ පාණ්ඩ යෙදී පයිඩෙ කිව්වාය. දෙ කම්මල තඹරා විලද හුණු පිටියේ වීදියද පෙරියමුල්ලේ වීදියද කම්මල වීදියද කොළොම් පිටියද මහ වීදියද වැල්ලේ වීදියද කුරණ වීදියද මීගොමුව සහද ප්‍රවේණිව සැලැස්වීමට තඹෙන් ශ්‍රී සන්නසක් පිහිටුවා ලැබුනාය. එ ඇරත් රාවණා කොඩියද, ඉර හඳ කොඩියද, මාල දෙරියණද, වට්ටප්පු පේරුස් මුදුද, රන් කස්තානද, රිදී කස්තානද, රන් හවඩි රිදී හවඩිද රන් බිත්දි රිදී බත්දි රන් බස්තන් රිදී බස්තන් කුඩලා බරණද වඩනතල ඇතු අලි සවරන් දෙකද, රිදී තැටි රිදී කුසලාන්ද රිදී කෙන්දි රිදී වලන්ද මෙකී නානාන්තර ලැබෙමින් දහ අට තොටමුණේ වෙළඳාමට යෑවාට එනවාට තීරුව සුභං මුදු මිලනැති හැටියට උතුම්වූ මහවාසලින් පයිඩ යෙදුනාය. නැවත රාජ පහං පවතිනා තෙක්කට මීගොමුව සහද පරවෙනි වයි කියා යෙදී නවාතැන් පදිංචි කළාය.

සේවාතම් සමර උතපසු තාරුකා මණ්ඩලය පිරිවරා ගත් පූර්ණ චන්ද්‍ර දිව්‍යරාජයාගේ සිංහාසන මස්තකයට වැඩවදාරමින් යෙහෙන් රාජ්‍ය ශ්‍රී විඳ වදාරණ ප්‍රසාදාවට ගොප්ප්‍රතිතා දේසේ සිට පරගිකාර ගොල්ල සිල්වාරමක් නොනායෙක් තානාන්තර අරගත තෙත්ති ලංකාධිපතිවූ උතුම් ශ්‍රී පරාක්‍රමබාහු දෙවසාමී දරුවාණන් වහන්සේට නොයෙක් දුකුම් දක්කවා මූත පාපු තැනේදී එ ඇරත් පරගිකාර ගොල්ල උතුම්වූ මහවාසලින් යෙදීච්ච පයිඩේ වග නම් ප්‍රතිකාල් දෙසෙ සිට මේ සිංහලම්පෙට කුමක් කාරණාවක් පිණිස ආවා දැයි කියා දිවස්ලා වදාල තැනේදී පරගිකාර ගොල්ල මහ වාසලට ඔප්පු කරණ වගනම් අපේ දෙසෙ හේවා කෝලාහලකාන් බෝ තිසාත් වෙළඳම් නැව් දුල්භ තිසාත් ඔබවහන්සේගේ පාද පද්මයට යටත් වෙමින් කොළඹ තොටමුණේ ගෝ සමක් අතුරා ගන්නා පමණින් වාසියක් මහ වහාලින් ලබා ගත තල අඩි බඳිමින් ජීව ගත වෙළඳම් නවාම නරගත බඩ රක්ෂාකරමින් උතුම්වූ මහවාසලටත් රාජකාරිය කරමින් සිටින්ට ඕනෑය කියා ඔප්පු කර සිටින්නේය. පරංගිකාර ගොල්ලගේ වීක්කිය මහවාසලට ඔප්පු වෙමින් එපමණ කිම් වාසිය තමන්ට සත්තස් ශ්‍රී සත්තස පිහිටුවා ලැබුණාය, නැවතත් පරංගිකාර ගොල්ල විසින් සමක් ගනිමින් සිත්කර, වාත්තු කරවා වටේට ඇද බඳිමින් එ ඊට මැදි වෙමීන් කිත් වාසිලේ පදලං අල්ලමින් කළුගල් තාප්ප තරකොට බඳිමින් කොටුවේ මුර සමත්තා ගත්තාය. මෙනත වැඩ සිටින්ට තපුරුයි කියා සීතාවක නුවරට වැඩියාය.

(1936 ක්වු නොවැම්බර් මස 1 වෙනිදා සිළුමිණ පත හා සම්බන්ධ දෙස්තර ඇන්ඩ්‍රියස් නැල් මහතා විසින් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙන් පිටපත් කරනන්නා ලද ලිපිය.)



# * දෙන් ජුවන් ධර්මපාල රජ කාලය

## "ආදිත්‍ය-බණ්ඩාර-වලිය"

"අපේ පියා වයෝවෘද්ධව සිටි කාලේ කාන්සිව දකුණු උරයේ පැවිදි වේදනාව කියමින් හේවා කමේදී ලැබු ඊතල් පාර වේදනාවට කාරණාවය කිය කියා යටගිය දවස සිහිකරමින් අපට දුන් අවවාදය පුරුතුගීසි අප සිංහල ජාතිය සමග ආයේත් තද සෙනේයේ අද ඉඳිති. කාලයක් පැමිණේ ඒ කාලයේ වෛර බැඳ සටන් කෙරේ. අපහට මේ තඩුමාත්ත සත්තස් ගම්බිම් දුන් රජ්ජුගේ පරම්පරාවද පිටරටින් වික් සිංහල රජ ගබඩාවෙත් රැකිම ලැබූ අප සිංහල රාජ්‍යයට රජ පක්ෂව සිටීම ජාති මාන්නය බවය. හරිකමය. මෙසේ කියාපාන කථා ප්‍රවෘත්තිය කියමින් සටහන් කර තබන්ට නියම කර දුන්නේය."

ජම්බුද්වීපයේ රජ පුත් රට ආර්‍යවංශ ක්ෂත්‍රිය සෙන් සමුහයක් ජය සූරෙන් දරුමල්ලන් සමග වික් මිලෝදයේ බලෙන් සෙප්පායත් ලබා හස්ති ශෛලපුර අසල ගම් කර ඔහුගේ තිබි ගබඩා පුරවන්ට නිලකාරයෝ පත්කර සිටිනා කාලයේ චෛත්‍ය වඳින්ට පැමිණි අංකියා රට හොරා ගනිමින් සිටි මල්ල හා ජා මිනිසුන් කොටවා ඔවුහුගේ නොඩ බැසීම නොදෙන්ට ප්‍රාක්‍රම බාහු නරනිඳු අතට විජයබාහු කුමරිඳු ක්ෂත්‍රියන් ලවා උතුරු කඩුලු විටින් විට මුර කෙරෙව්වා ඉන්පසු ආරජ්ජු සිංහල බල පුරුෂයන්ට රං ඔටුණු කාර හිස දැරූ මිත්ත මැරූ ඨකුරු නම් ගජ පුරුෂයා ලවා සරඹ පුරුදු කරවා ලැය.

ඒපෙලේ ඉන්න මැන ක්ෂත්‍රිය බලයුත් අඩිදෙව නෙත් පැවතෙන තුඹෙ ආනා සතර කෝරළේ රං කොත්දිවෙල වලව්වේ හින්න බැස්සාය. මාගේ මැණියන්ට උපන් එකම දරුවා මමමය මට බත් කැව් දවසේ පඤ්ච ක්ෂත්‍රා (පංචායුධ) මාවට තබා ආර්‍ය ක්ෂත්‍රිය සූර්‍ය වංශයේ

* ඨකුර අර්ථ දේව ආදිත්‍ය ඇප්දුරු සිල්වා මුදලි තැනව මෙරජ්ජුගේ මුත්තකුවත් වන බුවනෙකබාහු රජ්ජු විසින් තම යුධ හමුදාවේ අග ස්තාධිපතියා වශයෙන් පත්කර ගෙන තිබේ.

අදිපතීත්වට හිමි ආදිත්‍ය යන නම දිවු බව මා මව් කියා වැඩෙන කාලයේ ආදිත්‍ය බණ්ඩාර නමින් ප්‍රසිද්ධ තරුණ වයසේදී මාගේ පියා මට සටන් හරඹ පුරුදු කරවද්දී තුමූ පිය තර තිඳු සමග සරව්වී සිටිය රාජ කුමාරයෙක් යාපාවෙන් ඊත් රත් කොත් දිවෙල වලව්වේ ගෙදර සැඟවී සිට මා සමග හරඹ පුරුදුවී තුමූ භාර්‍යා කුමාරි ද දූ චන්ද්‍රවතී කුමරිය සමග යද්දී මගේ මාමාගේ දූ සිරිබර කුඩා මැණිකෙව කැඳවා ගෙන ගියාය.

කලක් ගියාට පසු පනිවිඩ දූතයා පතගෙන රත් කොත් දිවල ආතාවදී මාව පිටත් කර ගත ජයවර්ධන පුර බුවනෙක බාහු යන නාමයෙන් රාජ්‍යශ්‍රියට පැමිණි යටකි කුමාරයාට මාව බාර කළා. මෙ කාලේ මායාදුන්නේ සහ රයිගම් බණ්ඩාර සහෝදර දෙ කුමරුත් තරතිදුව රහස් මරන්ට වරපුරුෂයින්ව වෙස් පෙරලා ජයවර්ධන පුරට එවා සිටින බව දැනී මාව දිවුරවා රජ මඳිර හා රැ රැකාවලට රජසල ආරක්ෂාවට පත් කර අණ ලැබී වසද්දී තරතිදු යනෙන සැම තන්හි රැකාවලට ක්ෂත්‍රා රැගෙන මට යන්වෙන්ට අත දුන්නේය. මෙකල වෙඩං කුමරු සමග සරණ වී සිටි චන්ද්‍රාවතී කුමාරිකාවගේ පුත් දරු දැකීවී රජ වාසලම නැවතී ඔව් රූපශ්‍රීමත් කුමාරිකාව ඉස්නානයට යනෙන කල මා නැත සිරිබර මැණිකේව කැඳවා ගියාය. ආමෙව්ය. මුත් ඒ ලිය සමග කථාවීම උගහටයි. මේ ගමන් සමහරක් වලමට ආරක්ෂාවට යන්ට අණ විය. කාලේකදී නැතා කෙරේ පෙම් බැඳ ලියා ගත් කවිපත් එකතු කළ සිරිබර මාලය යන පොත හා මග සත්කස උඹට බාරයි.

චන්ද්‍රවතී කුමරියගේ පුත් කුමරුට රාජ්‍යශ්‍රිය අත්වෙනාවාට වෛරව වලකනු නිසා කැලණි ගඟ ගං ඉවුර හා සීතාවක පවුරු ගොඩනගා ගත්තු මෙසේ කලයන සමයේ දී දිනක් රජවාසල පැවැතුන් ඇත්තන්ට පරංගි එවූ සේල ත්‍යාගි දී තිබී ඒ ගැන සෝදිසියකදී අපේ කවි පත් දැක



තරතිදුව දන්වා මුත් රජ මා වෙත කරුණා නිසා අප දෙදෙන සරණ කිරීමේදී මපිය, ආතා සහ නෑදෑයින් ගෙන්වා ගත්තාය. මේ කුවුඹ ජයවර්ධන පුර වැද්දී මායාදුන්න මරක්කල හා සිංහල සෙන් එක් තැන් කර ජයවර්ධන පුර වදින්ට එනවාය සැලවී, පරංගි හා සිංහල සේනාගද මගේ ආතා පියා මමද ගුරුබැව්ලේ මහ සටන් කර ගිනාවකට ගොස් පවුරු ගිනි ලා මහ ජය ලැබූවත් මා ආතා පියා ද නැසී ගියෝය. සටන් පොලේදී මිතුරුවූ කප්පිතා දී සිල්වා පුරුතුගීසි මහතුන් අයදීමෙන් යුධ ජය කොඩි දැමූ කාලේ උපන් දරු උඹව කොමලොන් තොටදී පෙඩෝ ද සිල්වා කියා ක්‍රිස්තන් කළාය. පේඩෝ ගුරුතුමාගේ නම යටිහතට, දී සිල්වා කප්පිත්තාන් මහතාගේ නම එකතු කිරීමක් ලැබීය. පරංගි රජ වාසල සමග ගජ මිතුරුව සිටිද්දී දී සිල්වා කප්පිත්තාන් ගේ අයදීමට යුධ ජයගත් නිසා මහ මංගල්‍යයක් පවත්වා රජ වාසල දී මට කඩු පළඳවා මගේ පරම්පරාවට කඩු පැලදීමට අවසරලා මුහුදු නදී උයන් තොට හතර මායිම තුල පැවිදි තැනි තලා මුරටුව ගව පාලන කිමද මා කුඹුරුද බෝදුවේ කුඹුරද ඊට ගොඩකිම මහවත්තද මහසන් තස් පිට අප මහ බුවනෙක බාහු නරනිඳු යටගිය කල මට දෙවාවදුලාය. මෙවකට නරනිඳු සහ ධර්මපාල කුමාරයාව ආරක්ෂාවට රජවාසල මූර සිරීමට පත්කල හමුදාවට පුරුතුගීසි බසින් ගාර්දිය කියා නම් තබා මා මුල්කර මා පත්කර අතදී වදලාය, යුධය සංසිදී කලක් වසද්දී උඹේ සොහොයුරියන් නිසා කැපූ ලිඳ කපද්දී රජ අණ අත පසුව් මට මරණය නියමව බයාදුව උඹලා පෙරහර ගස්වා යමින් අළුත් ලිඳේ අළුත් දිය පිරී කඩ බැඳ එවක් නරනිඳුට දක්වා යටගිය දවස යුධ කල හැටි සිහි උපදවා කියා ඔප්පු කර සමු ලැබූ හැටි උඹට මතක ඇත. එවැන්නේ නරනිඳු ලිඳ මූලයා කියා නම කී බස්ද දනිත්. රුවැන්වැලිගොඩ සේවාකමට ගොස් සිටින මගේ පුතුන් ගෙන්වා සත්නස් කිමි වගාකර ආදර බුහුමන්ව සහෝදර හතර දෙනාවද සොහොයුරියෝ දෙදෙනාද සමග හොඳින් කල්යවා උඹලාගේ මැණියෝ භූමදාන කළ මේ මහ වත්තේ මරණින් පසු මා භූමදානයේ යොදනු."

(ආදිත්‍ය වංශය නැමැති පොතෙන් උපුටාගන්නා ලදී).

ඉහත සඳහන් ජයපුර තකුර සෙනෙවියාගේ පරපුරේ ඵකුර අණී දේවාදිත්‍යගෙන් පසු ඇති වූවන් සම්බන්ධ විස්තර පහත පළවේ.

"Another distinguished Military Chief was Pedro Silva (named after the Roman Catholic Priest who baptised him) the son of a distinguished Commander. A descendent of his was, on the 20th "January 1765, appointed Mudaliyar of the Alutkuru Korale by the name of 'Anthony Rowel Warnakula Aditha Weerasuriya. Arasanilayitha"

මෙහි භාවය:-

(කරාවේ මුදලි වරුන් ගැන කථා කරන ඇ.ෆ්. ඒ. ගුණරත්න ගාල්ලේ තෝම්බුවේ වලව්වේ මුදලිතුමා තම "ලන්දේසි කාලය" නැමැති පොතේ මෙසේ ලියා තිබේ.) "රෝම සභාවේ පූජක තුමෙකු මගින් බව්තීස්ම ලැබ එතුමා නමින් පෙනී සිටි *සුප්‍රසිද්ධ යුධ සේනාධිපතියෙකුගේ පුත්‍රයෙකුවූ පේද්‍රු සිල්වා මුදලි තුමාද යුධ හමුදාවේ නවත් සූරවීර ප්‍රධානියෙකි. මෙතුමාගෙන් පැවැතෙන්නෙක්

* මෙහි සුප්‍රසිද්ධ යුධ සේනාපතියෙකු ගැන ගුණරත්න මුදලි තුමා සඳහන් කර තිබෙන්නේ, මොරටුවේ මහවත්තේ වලව්වේ විසූ "ආදිත්‍ය බණ්ඩාර" සෙනෙවිරත් සම්බන්ධව බව සැලකිය යුතුයි.

මේ පරම්පරාවේන් පැවතුන සමහරෙකුගේ නාමයන් මෙසේය.

ඵකුර අණී දේව ආදිත්‍ය, ජුසේ ද සිල්වා, රෝම නුවර වතිකානු මාලිගාවේ "චැවලියර්" සිටුතුමා. මෙතුමාගේ එකම දියණියවූ ඵකුර අණී දේව ආදිත්‍ය, කැතරින් ද සිල්වා කුමරිය, ධනවත් චාල්ස් හෙන්රි ද සොයිසා දිශාපතිතුමා හා විවාහ විය.

මොරටුවේ රාවතාවත්තේ විසූ ඵකුර අණී දේව ආදිත්‍ය ද්‍රිමිංගු ද සිල්වා හෙවත් දුංගි රේන්දු රාල. මොහු මෙහි සාතීගේ පියාගේ මව් පක්ෂයෙන් සාතීගේ මුත්තනුවෝය.

මොරටුවේ ලුනාවේ විසූ ඵකුර අණී දේව ආදිත්‍ය අන්දිරිස් ද සිල්වා මයා

කොළඹ ඵකුර අණී දේව ආදිත්‍ය හැරී ද සිල්වා ආණ්ඩුවේ අක්ෂි වෛද්‍යාචාර්ය තුමා.

මොරටුවේ විසූ ධනවත් ඵකුර අණී දේව, ආදිත්‍ය සී. පී. ද සිල්වා මයා.



ක්‍රි. ව. 1765 ජනවාරි 20 වෙනි දින "අන්තෝනි රෝවල් වර්ණකුල ආදිත්‍ය වීරසූරිය අරශ නිල ඉට්ටු යන නමින් අළුත්කුරු කෝරළයේ මුදලි ධුරයට පත්කරන ලදී."

# දොන් ජුවන් ධර්මපාල රජ කාලය

දොන් ජුවන් ධර්මපාල රජතුමා දවස විසූ කුරුකුල නිලධාරින් ගැන ඇ.ෆ්. ඒ. ගුණරත්න මුදලි තුමා තම "Dutch Times" පොතේ මෙසේ ලියා තිබේ.

* "දොන් ප්‍රනාන්දු මහ සෙනෙවි කොළඹ සිටියේය. පසුව මෙතුමා ගෝවට ගියේය." යනුයි.

"මාතොට ලැබගෙන ගිය සමරකෝන් රාල (දොන් ප්‍රනාන්දු සමරකෝන්) මාතොටින් සේනාව ගෙන ධර්මපාල රජ්ජුරුවන්ට උදව්වට ඇවිත් පනහවත්තට පැමිණියේය....

...එදිරිල්ලේ රාල රයිගම් කෝරළේ උඩුවර සිටින විට සමරකෝන් රාල කොළඹින් පිටත්ව ඇවිත් යුධ කර එදිරිල්ලේ රාල ඇල්ලුවේය."

(රාජාවලිය පිටු 70–71.)

මෙම දොන් ප්‍රනාන්දු සමරකෝන් රාලගෙන් පැවත එන "පරම්පරාව" "සමරකෝන් පට බැඳියේ" යන නාමාවලියෙන් මේ දක්වා දකුණු පළාතේ සිටිති.

ක්‍රි. ව. 1575 දී පෙත්කුට්ටි ආරච්චි නැමැති කොළඹ මහ පට බැන්දුව (කුරුකුල නිලමේව) මායාදුන්නේ රජු හා රහස් ලියුම් ගනුදෙනු කිරීම සම්බන්ධව සාංකා තර පෘතුගීසින් විසින් ඔහුව මරුමූවට පත් කරන ලදී.

(ආචාර්‍ය පීරිස් පෘ. ඉ. 1 කාංඩ 197 පිට)

* දොන් ප්‍රනාන්දු සමරකෝන් රාල, දොන් ජුවන් ධර්මපාල රජුගේ සුප්‍රසිද්ධ සේනාධිපතියෙකි. මොහු ගැන "රාජාවලි" යෙහි කීප තැනකම සඳහන් වී තිබේ.

මේ කොළඹ මහ පට බැන්ද කෝට්ටේ රජුගේ අන්තේවාසිකයෙක්වූ බව නොපෙනේ. රජුගේ මිත්‍ර සහකාරයකු සෙයින් ආධාර ඉල්ලූ විටක තමාගේ සේනග රජුට සහාය වශයෙන් යුද්ධයට සෙන ගියා පමණකි. මෙතුමන්ගේ ලම්බාතැනීගේ සොහොන් කොත කොළඹ පැරණි සුසාන භූමියෙහි තවමත් දක්නට තිබේ. "ඒ සොහොනේ සටහන් කර තිබෙන වස්තුන් ගෙන් එකක් මසුන් යුවළෙකි. ඊය, ඵලිහ, හක්කියා යනාදි අන්‍ය ලක්ෂණයෝද වෙති.

(Paper Entitled Inscriptions at St. Thomas' church Colombo. By Dr. Paul Peeris.)

ගැමුණු රජු විසින් කරවනු ලැබූ රත්නමාලි චෛත්‍ය රාජයාගේ ශද්වතා කොටුවේ, තිබී හොබ්ද මෙහි සඳහන් රජ මංගල වස්තූන් සම්බවූ බැව් පත් මගින් ප්‍රකාශ විය. එනම්:-හක්ගෙඩිය, මත්ස්‍යයෙක් ඉබ්බෙක්, ජය කොනාතය, නන්ද්‍යාවර්තය, ස්වස්තිකය යන මේවා ය.

සමිඳුගන් වසන්තෙස්ගේ ශ්‍රී පතුල්හි පිහිටි මඟුල් ලකුණු වලින් එකක් මත්ස්‍ය යුවලකි. "සොලී රජුන්ගේ රං කාසි වල මත්ස්‍යයෙකුගේ රූපය හා පාණ්ඩ්‍ය රජුන්ගේ රං කාසි වල මත්ස්‍ය යුවලගේ රූපද රාජාලිංග වශයෙන් සටහන් කර තිබෙන බැව් South Indian Coins නම් පොතෙන් ප්‍රකාශවේ. පණ්ඩි රාජ්‍යයට අයත් යුධ කොඩියේ රාජාලිංගය මත්ස්‍ය යුවලකි. දොළොස් වෙනි ශතවර්ෂයේ දී වීරපාණ්ඩ්‍ය නම් පඬි රජු ලංකාව ජයගෙන ඔහුගේ මත්ස්‍ය යුවල බැඳි කොඩිය සීගිරිය කඳු මත්තෙහි නංවන ලදැයි පඬි රට ඉතිහාසයෙහි සඳහන් වී තිබේ. "නැගෙනහිර පළාතේ පහළ බින්තැන්නේ තිබෙන ගල ශිලා ලිපියෙහි අන්තිමට ලක්ෂණව හා විශාල ලෙසත් කපා ඇති කාවන්තිස්ස රජ පෙළපතේ මුද්‍රාවෙහි පිටේ කවුච හා වරල් පත්ද වල්ගය සහ ඇන්ද කරමලද සහිතවූ මත්ස්‍යයකු පැහැදිලි ලෙස සටහන් කර තිබේ."

(තෙවිල් තප්‍රබෝන් 39 පිට - 1885)



දූනව කෞතුකාගාරයේ පිට මාළේ තබා තිබෙන කීර්ති නිශ්ශංක මල්ල රජුගේ සිංහාසනයට අයත් ගෙල මය සිංහ රූපයේ මත්ස්‍ය රූපය සටහන් කර තිබේ. මත්ස්‍ය සටහන මංගල රජ අඩයාලමක් බැව් මෙයින් ප්‍රත්‍යක්ෂ වේ.

## * මල්වානේ ගිවිසුම

දොන් ජුවන් ධර්මපාල රජුට උරුමක්කාරයෙක් නොසිටියෙන් එතුමන්ගේ අන්තිම කැමැත්ත ප්‍රකාර ලංකා රාජ්‍යය පෘතුගාලයේ රජතුමාට ක්‍රි. ව. 1597 දී මල්වානේ ගිවිසුමෙන් පවරා දෙන ලදී.

* මෙකියන ලද මල්වානේ ගිවිසුම වර්ෂ 1815 දී ඉංග්‍රීසින් හා උඩ රට නිලමවරුන් අතර මහනුවරදී අත්සන් කරගත් ගිවිසුමට වෙනස් දෙවෙනි නොවන බව සැලකිය යුතුයි.

"උ තු ම් රිවි කුල රජුන් ඈ වී ගියෙන් ඉස්පඤ්ඤය ප ති
තොසිම් තෙද බල දොන් පිලිප් නම් නරපතින් හට වික් මැ ති
ඇතැ ම් ගොවි කුල මැතිවරුන් හා කරාවේ සුදිරික් මැ ති
සු ර ම් සිරිලක ගිවිස දුන් බව මෙයින් දැනගනු යහප ති"

මෙහි සුදිරික් මැතියයි සඳහන් කරන ලද්දේ දොන් තොමේ රූළිගු පවටත් කව්ටි නමින් ප්‍රසිද්ධව සිටි මැතිඳු බව ඉතිහාසයෙන් පෙනේ.

"රූළිගු" යනු සිංහලෙන් ලියන කල "සුදිරික්කු" යයි බොහෝ දෙනෙක් ලියති. මේ මහතාගෙන් පැවතෙන පරම්පරාව පානදුරේ සුප්‍රසිද්ධ රූළිගු පෙළපත වන්නේය. ජෙරමියස් දියෙස් මැතිනියද මෙතුමා ගෙන් පැවත එන මිනිබිරියකි.

මේ මැතිඳු නම් දැනට ලඩකාවෙහි උදාර නිලිනයෙන් සුප්‍රසිද්ධ වූ ඇවූවරියක්වූ පානදුරේ ජෙරමියස් දියෙස් මැතිණියගේ මුතුන්මිත්තා යයි සලකනු ලැබේ. ලක්දිව සකල කාන්තාවන්ට ගෞරවයක් වූ සම්සත ජන සම්මානනීය වූ මේ කුල ජ්‍යෙෂ්ඨ මැතිණි තොමෝ පානදුරයෙහි ඉතාමත් පුරාණ කාලයෙහි සිට උත්කෘෂ්ට භාවය සජනය කරමින් එන්නාවූ රූළිගු පෙළපතෙහි කාන්තාවකි. මේ පානදුරේ රූළිගු පෙළපත මිස "කරාවේ" යයි සඳහන් වූ එබඳු මහශ්‍රෙෂ්ඨයෙකුගෙන් පැවත එන්නේ යයි සැලකිය හැකි වූ අන්‍යතර රූළිගු පෙළපතක් ලංකාවෙහි නොමැත්තේය. එයින් මේ පෙළපත පැවත එන්නේ දොන් තෝමස් රූළිගු පටබැඳි මන්ත්‍රීශ්වරයානන් ගෙන් යයි පිළිගත යුතු බව ප්‍රත්‍යක්ෂය.........මේ මැතිණිය විසින් කරන ලද්දාවූද සාම්ප්‍රතයෙන් කරනු ලබන්නාවූද ලෝක සංග්‍රහයන්ගේ ස්වභාවය දැනගැන්ම පිණිස මෙහි එකක් සඳහන් කිරීම ප්‍රමාණ වේ. එනම් මූලදීම ලක්ෂයක් ධනය වින්‍යාසකොට දීමෙන් කොළොම් පුරයෙහි පිහිටුවන ලද බෞද්ධ බාලිකා මහා විද්‍යාලයයි. මේ විද්‍යාලය වෙනුවෙන් ම අද දක්වාත් විටින් විට කරනු ලබන්නාවූ ධන පරිත්‍යාගයන් විශාල බව නොයක් විට අසන්ට ලැබේ........"

(පණ්ඩිත ඩබ්ලිව්. ඒ.ජ්. ගුණවර්ධන මුදලි තුමාගේ "සුභාෂිත වර්ණනා" විතීය සංස්කරණය-සංඥාපනය, පිටු IX, X.)

"මේ ශිවිසුමට අත්සන් කළ වංශාධිපතීන් අතරෙන් කරාව ගෝත්‍රය වෙනුවෙන් අත්සන් තබනු ලැබුවේ පච්චන් කච්චි තොමේ රුද්‍රිගු තුමා ය."

(ආචාර්ය පෝල් ඊ. පීරිස් පා. ඉ. 1-312-560)

# පළමුවෙනි විමල ධර්ම සූරිය රජ කාලය

## කුරුකුල කෝනකොත් කෞරව වංශයේ රදළ වරු

## "වරුණ කුල ආදිත්‍ය අරශ නිලයිට්ටන් දොන් මැනුවෙල් දියෙස්"

* පේරාදෙණියේ රාජාවලියෙන් පැවත එන වීරසුන්දර බණ්ඩාර, කන්ද උඩ රට පෙරළි කරන විට රාජසිංහ රජ වීරසුන්දර බණ්ඩාරට වලගම් වට්ටාරම දෙනවාය කියා දිවුරුම් දී උපායෙන් ගෙන්වනු සඳහා වික්‍රමසිංහ මුදලිත්, සෙනෙවිරත්න මුදලිත් යන දෙදෙනා යවා කැඳවා ගෙන ඇවිත් ගොලුම්බාක්කේ වීදියේ වල කපා කොළ අතුරුවා

* පේරාදෙනියේ රජ වංශය

"පේරාදෙණියේ රාජවලිය" යනුවෙන් ආණ්ඩුවෙන් මුද්‍රිත රාජවලියෙහි ප්‍රකාශවන ක්ෂත්‍රිය වංශය වනාහි පරවර, බරතර්, හෙවත් භරත වංශය විය යුතු බව මෙම කාව්‍යෙන් පෙනී යයි.

මෙම රාජ වංශයට අයත් රජ දරුවෝ වූකලී වීරසුන්දර බණ්ඩාර, පළමුවෙනි විමල ධර්ම සූරිය රජ, රාජසූරිය අසථානය, කුමාරසිංහ අසථානය; විජයපාල අසථානය, සෙනරත් රජ, දෙවෙනි රාජසිංහ රජ, දෙවෙනි විමල ධර්ම සූරිය රජ, වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජ සහ මාතලේ බණ්ඩාර යනාදි උතුමන් වන්නේය.

"මිහ විකුම් පරවර නරවර නා — කෙසර
බල පාමින් සිරිඳු සර නා
දිහ සුරම් පති සෙ සෙසා සිරි නා — ලසර
කුල සෝල රජසිංහ සර නා

(මදහසමාලෙ පුස්කොළ පොත)

ඉහත සඳහන් රජ දරුවන් දවස කරාවේ ගෝත්‍රිකයින් හට මහනුවර මහ අදිකාරම් ධුරයද, මාතලේ මහ දිසාපති තනතුරුද, ඌවේ කුමාර පදවියද. මන්නම්පිටිය, මඩබැද්ද. ඇලගමුව, අඹන, පඩිපිට සහ ඌව පළාතන් ගම්වර වශයෙන් දෙවා වදාරණ ලදී.



සහා ජිබා වීරසුන්දර බණ්ඩාර මැදිකර ගෙන මුදලි දෙදෙනා අලෙන් ඇවිත් වල දෙකොණෙන් යන විට වීරසුන්දර බණ්ඩාර බොරු වළේ වැටී උල් ඇනී මළේය....

...වීරසුන්දර බණ්ඩාර මළ බව කන්ද උඩ රටට සැලව වීරසුන්දර බණ්ඩාරගේ පුත් කොන්තප්පු බණ්ඩාර සහ කල්ලප්පු කියන අයත් වෙන්වෙලා කොළඹට ඇවිත් ධර්මපාල රජ්ජු දක බොහෝ මාන්න ලැබ තම්භීට රාළගේ දේනියන් කසාද බැඳලා කුල වැදී කොළඹ උන්නාහ."

(ආණ්ඩුවේ රාජාවලිය 64 පිටුව)

"කොන්තප්පු බණ්ඩාර ක්‍රිස්තියානි ආගම වැළඳ ගෙන දොන් ජෝන් නමින් කොළඹ විසුවේය. මීගමුවෙන් කුල කාන්තාවක් හා සරණ වී මෙසේ වාසය කරන අතර පෘතුගීසි ජනරාල් තැන්පත් දොන් පේද්‍රූ හටනේ යුධ හමුදාවේ සේවය කළ කදිම පෙනීමකින් යුත් මනුවෙල් දියෙස් නැමැති මුදලි තැන සමග බොහෝ මිත්‍රව විසුවේය. මෙම කුමාරයාට මහනුවර රජකම සහ දෝනා කතිරිනා කුමරිය ලබා ගැනීමටද සවකීය ජීවිතය රැක ගැනීමටද මෙම දියෙස් මුදලි තැනගෙන් හොඳයක් විධියේ උපකාර සහ අවවාද අනුශාසනාද ලැබුන බව දැනගන්ට තිබේ."

(පැරණි ලන්දේසි ලේඛන)

"වර්ෂ 1590 දී වරුණ කුල ආදිත්‍ය අරශ නිල ඉට්ටන් මනුවෙල් දියෙස් අන්දරාදි මුදලි තුමාව, දොන් ජෝන් විමලධර්මසූරිය රජ තුමා විසින් උඩ රට රාජධානියෙහි මහ අදිකාරම් ධුරයට පත්කර ගන්නා ලදී."

("මෝනිං ලීඩර් පත්‍රය" 14. 10. 1907)

"සවදේශික යුධ හමුදාවේ සේනාපතියා වනාහි කරාවේ ගෝත්‍ර මනුවෙල් දියෙස් මුදලි තුමාය."

(ගාල්ලේ තෝම්බුවේ වලව්වේ ඈෆ්. ඊ. ගුණරත්න මුදලි තුමාගේ "Dutch Times" ලන්දේසි කාලය නැමැති පොත හා සම්බන්ධයි.)

"පෘතුගීසි ජනරාල් තැන්පත් දොන් පේද්‍රූ යටතේ යුධ හමුදාවේ සේවය කළ මනුවෙල් දියෙස් නැමැති මුදලි තැන මෙකල මහනුවර රාජධානියේ දොන් ජෝන් රජුගේ (විමල ධර්ම සූරිය) මාලිගාවේ සියලුම සිංහල නිලමවරුන්ට වඩා උසස් කීර්තිමත් අධිපතියා විය."

(පිල්ලේ තස් ලංකා ඉතිහාසය)

"එමෙන්ම පාත රට කෞරව ගෝත්‍රයෙහි බොහෝ උතුමන්ද ජනේශ්වරවූ ඇමැති තනතුරු ලැබ සිටිය බව පෙනේ. ඔවුන්ගෙන් සමහරු නම්:- කොළඹ මහ මුදලිකම ලබා සිටි, විමලධර්මසූරිය රජ්ජුරුවන්ගේ පළමුවැනි අධිකාරමවූ මානුවෙල් දියෙස්ගේ පෙලපත."

(බුද්ධ ශාසන මහා සූර සේනාපති, යන "රාජ දත්තිය නාමධාරී ඇම්. ධර්මරත්න පඬිතුමන්ගේ" ගහපති විභාගය නැමැති පොත.)

"මින්පසු අසවේදු සේනාපති තැන විසින් ඉමැනුවෙල් දියෙස් නම් මුදලි තෙමනකුගේ උපදෙස් පිට විමලධර්මසූර්ය රජු රහසින් මරවන්ට කුමන්ත්‍රණය කොට ඝාතක සොරුන් පස්දෙනෙක් මධ්‍යම පලාතට යවන ලද්දේය. නමුත් දියෙස් මුදලි තැන විසින් ඒ බව විමලධර්මසූරිය රජුට රහසින් දන්වූ පසු රාජ අමාත්‍යයෝ ගොස් බලනේ කන්දේදී ඒ සොරුන් අල්වා මැරුවෝය."

(ආණ්ඩුවේ ලංකා කථාව)

"මනුවෙල් දියෙස් වරුණ කුල ආදිත්‍ය අරශ නිල ඉච්චන් මහනුවර මහ අධිකාරම් තුමාගේ මුණුපුරෙක් පසු කලකදී ලංදේශීන්ට පක්ෂවී තිබේ. ඔහු වනාහි කළුතර සහ වලල්ලාවිටි කෝරල බද ලංදේශීන් යටතේ අධිකාරම් ධුරය දරූ ලූවිස් දියස් ද අන්දරාදි මුදලි තුමාය·



මෙතුමාගේ මරණයෙන් පසු ස්වකීය පුත්‍රයෙක්වූ දොන් කෝලියස් දියස් අන්දරාදි (විජය රත්න) මුදලි තුමා එකී ධානාන්තරයට පත්විය. මෙම පේරුවට අයත් A දොන් මැනුවෙල් දියෙස් අන්දරාදි මුදියන්සේ, මේ කාලේදී පමණ ලංදේශි ආණ්ඩුවට පක්ෂවද පෘතුගීසි සහ සිංහල ආණ්ඩුවලට විපක්ෂවද සිදුවූ යුධ කිපයකම සේනාධිපතියා වශයෙන් පෙනී සිට තිබේ."

(පෝලන්ත දේශ තානාපති වැන්සන්ඩන් විසින් ලියන ලද "ලක්දිව ප්‍රධානීන්" නැමැති පොත.)

"මැනුවෙල් දියෙස් උඩරට මහ අධිකාරම් තුමාගෙන් පැවැත එන පරම්පරාවට අයත් උද්විය අතරෙන් දැනට සමාදන විනිශ්චයකාර තැන්පත් ආර්. ඇස්. ද පොන්සේකා සල්පිටි කෝරලය කරවන මුදලි තුමාද කෙනෙකි."

(පෝලන්ත දේශ තානාපති වැන්සන්ඩන්,)

"විමල ධර්ම සූර්ය රජු ආරක්ෂා කළ මැනුවෙල් දියෙස් සිංහලයෙකි."

(ඇලෙක්සැන්ඩර් වැලිව්ට මහතා විසිනි.)

පළමුවෙන්ම ලංකාවේ මහමුදලි ධුරය සහ මහ අදිකාරම් ධුරයද ලත්, මනුවෙල් දියෙස් මුදියන්සේගේ සම්පූර්ණ නාමය, වරුණකුල ආදිත්‍ය අරශනිලයිට්ට දොන් මනුවෙල් දියෙස් අන්දරාදි විජයරත්න, යනුයි.

## මනුවෙල් දියෙස් මහ අදිකාරම

"කුරුණෑගල B පියදාස ජයරත්න නම් මහතෙකු විසින් මේ මස 1 වෙනි දින දිනමිණ පත් මගින් අසන ලද පැණයකට පිළිතුරු වශයෙන් මේ ලිපිය සපයනු ලැබේ.

මනුවෙල් දියස් නම්වූ නිර්භීත පුරුෂයා ගැන මහවංශ තුන්වන කාණ්ඩයේ සිංහල ප්‍රතිකාල් කලහ ගැන ලියන ලද පරිච්ඡේදයේ "එම්මානුවෙල් දියෙස් නම්වූ ලක්ෂණ

A මොහු මනුවෙල් දියෙස් මහ අදිකාරමගේ මුණුබුරෙකි.

B මෙම පියදාස ජයරත්න මහතා මේ ග්‍රන්ථයෙහි ප්‍රකාශක වන්නේය.

ප්‍රතිකාල් මිනිසෙක් නිරවශේෂයෙන් ඒ රහස විඩිවූ පරිදි දන්වා" යන පිළිවෙලින් ලියා තිබෙන බවක් "පරංගි කුමන්ත්‍රණය" යන මාතෘකාවෙන් මා විසින් සපයන ලද ලිපියක ඔහු සිංහලයෙකැයි සඳහන් වන බවත් ප්‍රකාශ කරමින් මෙහි සත්‍යය කුමක්දැයි විස්තර කරණ ලෙසද ලියුම්කරු ඉල්ලා සිටියි.

සිංහල යෙක්ද? මහා වංශයේ තුන්වන කාණ්ඩය නැමැති පොත නුදුටු හෙයින් එහි ඇතුලත් වී තිබෙන ප්‍රවෘත්තිය ගැන යමක් කීමට ඉඩක් නැත. මට දකින්ට ලැබුන ඉංග්‍රීසි සිංහල ඉතිහාස පොත් කීපයකම කුමන්ත්‍රණය ගැනත් මනුවෙල් දියෙස් ගේ චරිතය ගැනත් ලියවී තිබෙන කරුණු වලින් පෙනීයන්නේ, ඔහු ප්‍රතිකාල් ජාතිකයෙකු නොව සිංහලයෙකු බවය. නුමුත් මේ කොයි පොතකවත් මොහු අසවල් ජාතියට අයත් මිනිසෙකැයි පැහැදිලි වශයෙන් කියා නැත. පරංගින් යටතේ සේවය කල සිංහලයන්ද පරංගි නම් වලින්ම පෙනී සිටි හෙයින්, සිංහලයා කව්ද? පරංගියා කව්දැයි තේරුම් ගැනීම දුෂ්කරවන අවස්ථාද බොහෝය. දොන් කොස්මේ - දොන් මනුවෙල් - දොන් අන්ද්‍රේ - යන නම් වලින් පෙනී සිටි අය මුදල්වරුන් බව ප්‍රකාශ වන නිසා මිස එසේ නැති නම් ඒ නම් වලින් පමණක් සිංහලයන් හැටියට අඳුනා ගත නොහේ.

අන්තෝනියෝ බැරැටෝ නැමැත්තාද ප්‍රසිද්ධ සිංහල රණ සූරයෙකි. නුමුත් මේ නමින් නම් හේ සිංහලයෙකැයි කාටවත් අවබෝධ නොවේ. එම්මානුවෙල් හෙවත් මනුවෙල් දියෙස් මුදලි කෙනෙකි. පසුව මහ මුදලි කම දක්වා උසස් කරනු ලැබූ බවද ඇත්තකි.

මුදලි කම්:-

සයිමන් ද සිල්වා වාසල මුදලි මහතාගේ ලංකා කථාවෙහි — මනුවෙල් දියෙස් ගැන සඳහන් වන්නේ මෙසේය:-



"අසවේදු සේනාපති තැන විසින් ඉම්මැනුවෙල් දියෙස් නම් මුදලි කෙනෙකුගේ උපදෙස් පිට විමල ධර්ම රජු රහසින් මරන්ට කුමන්ත්‍රණය කොට ඝාතක සොරුන් පස් දෙනෙක් මධ්‍යම පලාතට යවන ලද්දේය. නමුත් දියෙස් මුදලි ඒ බව රජ හට රහසින් දන්වූ පසු රාජාමාත්‍යයෝ ගොස් බලනේ කන්දේදී ඒ සොරුන් අල්වා මැරුවෝය."

ප්‍රතිකාල් ජාතිකයෝ එම අණ්ඩුව යටතේ හෝ සිංහල රජු යටතේ මුදලි නාම නොදැරුවෝය. එය ස්වදේශීය ප්‍රධානයන්ටම නියමව පැවැති නිලයෙකි. ලංකා කථාවෙන් උපුටාගත් ඉහත කී වගන්තිය දෙස බලන කවරෙකුට වුවත් මනුවෙල් දියෙස් සිංහල මුදලි කෙනෙකැයි නිරායාසයෙන්ම වැටහී යන්නේය.

මනුවෙල් දියෙස් සිංහලයෙකැයි පිළිගත යුතු බවට තවත් සාක්ෂ්‍ය කීපයක් දැක්විය හැකිය. මොහු ගැන අන්‍ය කොයිම පොතකටත් වඩා කරුණු සඳහන් වන්නේ පෘතුගීසි භාෂාවෙන්ම ලියන ලද "කෘයි රෝස්ගේ" ඉතිහාසයේ යැයි සිතිය හැකිය.

එහි කීප පලකම මනුවෙල් දියෙස් යන නම කියවේ. පිරෝ ලෝපේස් ද සව්සා නම් පරංගි ජනරාල් විමල ධර්ම සූරිය රජු හා යුද්ධ කොට පරාජය වී මරණීය තුවාල ඇතිව සිරිබාරයට ගනු ලැබූ අවස්ථාවෙහි, නොමැරී ඉතිරිවූ පරංගින් හෙන් හා සිංහල ලස්කිරිඤ්ඤ කාරයන්ගෙන් යුත් හේවා කාණ්ඩායමක් ද රජුට අසුවී මහනුවරට ගෙන වුත් සිර කරන ලද්දේය.

මනුවෙල් දියෙස් ඒ සමග විය. ජනරාල්ගේ ඉල්ලීම පරිදි ඔහුගේ පුත්‍රයාට ටික කලකදී නිදහස දෙන ලද්දේය. ඇතැම් දෙවගැති කෙනෙක්ද එසේම නිදහස් කරනු ලැබිය. ඊට කලකදී පරංගි කාරයන් කළ සාහසික

ක්‍රියා නිසා ප්‍රකෝපයට පැමිණි විමල ධර්ම සූර්ය රජ තුමා ඉතුරුව සිටි පරංගි කාරයන්ගෙන් කොටසකගේ ඇස් අඳ කර කොළඹට එවා ඉතුරු කොටස සම්පූර්ණයෙන්ම මරා දැමූ බව කායිරෝස් කියයි. මනුවෙල් දියෙස් ඉතිරි වුනේ සිංහලයෙකු නිසාය. නමුත් ඔහු මහනුවරින් පලා ගියේ මේ අවස්ථාවෙහිය. සිරකාරයෙකු හැටියට ඔහුගේද කන් විද තුබූ බවත් ඔහු හොඳ පෙණුමක් ඇති තරුණයෙකු බවත් මිය ගිය සව්සා ජනරාල් වෙනුවට පත්වූ ජෙරනිමෝ අසවේදු ජනරාල් මනුවෙල් දියෙස් දැක පැහැදී විමල ධර්ම සූර්ය රජු රහසින් මැරවීමට ඔහු හා කුමන්ත්‍රණයක් කල බවත් කායිරෝස්ගේ පොතෙන් පෙනේ. මනුවෙල් දියෙස් ජෙරනිමෝ අසවේදු ගෙන් ලැබුන තෑගිත් රැගෙන රජ තුමා මරන්ට පොරොන්දු වී ආපසු මහනුවරට ගිය නමුත් කිසිවක් නො කළේය.

ජෙරනිමෝ අසවේදු තමා යටතේ සිටි සිමෝ පින් හෝ නම් ලස්කිරිඤ්ඤ නායකයා ලවා රජතුමා මැරවීමට නැවත කුමන්ත්‍රණයක් කලේ මීට අවුරුදු ගණනකට පසු වය. ඒ කාලේ රජතුමාගේ විශ්වාස සේවකයෙක්ව සිටි මනුවෙල් දියෙස් නැවතත් පරංගීන් වෙත පලා ගියේය. එසේ ගියේ චර පුරුෂයෙකු වශයෙන්ම යයි සිතාගන්ට ඉඩතිබේ. නමුත් ඔහු අස්වේදුට ඇඟෙව්වේ මහත් පශ්චාත් තාපයකට පත්ව ආපසු තමන් ගේ පක්ෂයට ආ බවය.

ප්‍රතිකාල් රජුවත් ක්‍රිස්තියානි ආගමටත් පක්ෂ පාතවන බව කියා කඳුළු වගුරුවා පාපොච්චාරනය කල මේ තරුණයා කෙරේ ස්ථිර ලෙස විශ්වාස කල ජෙරනිමෝ අසවේදු සිමෝපින්හෝව ආයුධ කොට තබා විමල ධර්ම සූර්ය රජුට විරුද්ධව කල කුමන්ත්‍රණවල සියළු විස්තර දන්වා ඒව අවසර ඉල්ලා සිටියේය. මනුවෙල් දියෙස් නැවතත් පරංගින්ගෙන් පුළුවන් තරම් තෑගි බෝග ලබා ගෙන ගොස් රජ තුමාට සියලු පුවත් හෙලිකොට රජතුමා ආරක්ෂා කළේය.



## ආගම හා සරණ බන්ධනය

මෙපවත් ලියන කායිරෝස් මනුවෙල් දියෙයිගේ චරිතය ගැනද කරුණු ස්වල්පයක් දක්වමින් ඔහු ක්‍රිස්තියානි ආගම අත්හැර බුද්ධාගම වැළඳගත් ස්ත්‍රියක් හා බුද්ධාගමානුකූලව සරණ බන්ධනයට ඇතුලත් වී සිටි බවත් ප්‍රකාශ කරමින් ජෙරනිමෝද අසවේදුලා ඒ හරිය නොදැන සිටි බවත් කියයි. මෙයින් පෙනෙන්නේ ඔහු වරක් ක්‍රිස්තියානිය වැළඳ සිටි සිංහලයෙකු බවයි. තමාගේ ජීවිතය ආරක්ෂා කලාවූද තමා කෙරේ ස්ථිර භක්තියකින් හා පක්ෂපාත භාවයකින් ක්‍රියා කලාවූද මේ තැනැත්තාට විමල ධර්ම සූරිය රජතුමා මහ මුදලි කමින් සංග්‍රහ කිරීම පුදුමයට කරුණක් නොවේ.

ඔහු පරංගි කාරයෙක් නම් මහ මුදලි කමකට පත් කරනු ලැබේද? යනු මතුවෙන ප්‍රශ්ණයකි. සිංහල භාෂාවට අතිරේක වශයෙන් පෘතුගීසි භාෂාවද හොඳින් දැන සිටි මනුවෙල් දියෙස් රාජ්‍යයේ ප්‍රධාන භාෂා පරිවර්තක නිලධාරියා හැටියටත් යම් යම් අවස්ථාවලදී රජතුමාගේ ප්‍රධාන නියෝජිතයා හැටියටත් ක්‍රියාකල හෙයින් ඔහු නමින් පමණක් නොව නිලයෙන්ද නියම මහමුදලිවරයාව සිටි බව පෙනේ.

## පරංගීන්ට කල ද්වේෂය

පරංගි කාරයන්ට පවා මෙබඳු තනතුරු පැවරීමට බාධාවක් නැතැයි යමෙකුට කියන්ට ඉඩ තිබෙන නමුත් විමල ධර්ම සූර්ය රජ තුමා ගැන නම් එසේ කීම යුක්ති යුක්ත යයි නොහැඟේ. එතුමා පරංගීන් කෙරේ කිසිම විශ්වාසයක් නොතැබූ කෙනෙකි.

ඔවුන් කෙරේ දරාගත නොහැකි ද්වේෂයක් පැවති නිසාත් ඔවුන් නිසා රටට සිදුවී ගෙන එන විනාශය තේරුම් ගෙන තිබූ නිසාත් එතුමා ලංදේශීන්ගේ සහාය පවා

ඝොයත්ට පටන් ගත්තේය. මරණ මංචකයේ දී පවා තම සහෝදර සෙනරත් කුමාරයාටත් ඇමැතිවරුන්වත් අමතා රජතුමා කියා සිටියේ පරංගි ජාතියට අයත් කොයිම සිර කාරයෙකු කෙරේවත් විශ්වාසය නොතැබිය යුතු බවය.

මනුවෙල් දියෙස්, රජුට හිතවත් රාජ පාක්ෂික ප්‍රතිකාලෙක් වූවාහු නම් එතුමා එසේ නොකියයි. පරංගින් යවතේ සිය රජ තුමාගේ පක්ෂයට හැරී ආ * සිංහලයන් කෙරේ එතුමා තදින් විශ්වාස කෙළේය. ඔවුන්ට නැගි බෝගද දී උසස් තනතුරුවලටද පත් කල බව පෙනේ.

ඩොමිනිකස් කොරයාද එසේ බුහුමන් ලැබූ කෙනෙකි. මනුවල් දියෙස් එබඳු රණ සූරයෙකු නොවූවත් අන්‍ය මාර්ගවලින් කොරයාටත් වඩා රජතුමාට ප්‍රයෝජනවත් විය.

## ලන්දේසි නෞපතියා

විමල ධර්ම සූර්‍ය රජු පරංගින් ලංකාවෙන් පලවා හැරීම සඳහා කුමක් කටයුතුදැයි කල්පනා කරමින් සිටින අතර ඕලන්ද නැව් කාණ්ඩයමක් මඩ කලපුවට පැමිණි බවත් එහි අධිපතියා රජ තුමා සමග සාකච්ඡා කිරීමට කැමැත්තෙන් සිටින බවත් දැනගන්ට ලැබුනේය. මේ ප්‍රස්තාවේදී ඕලන්ද අද්මිරාල් තැන්පත් ජෝරිස් වැන් ස්පිල් බර්ජන් සම්මුඛවී ඔහු පිළිගෙන සෙංකඩගල නුවර රජ වාසලට කැඳවා ගෙන ඒම සඳහා රාජකීය නියෝජිතයා හැටියට යවන ලද්දේත් මනුවෙල් දියෙස් මහ මුදලි තුමාය.

* ජයවීර බණ්ඩාර මැරුම් කෑවායින් පසු, මීගමුවෙන් පැමිණි ඔහුගේ යුධ සේනාව විමල ධර්ම සූරිය රජුට පක්ෂව සටන් කළ හෙයින්, මේ කරුණේ යුධ හමුදාවට තමන්කඩුවේ මත්තම්පිටිය ගම්වරය දෙන ලද්දේය.



ඕලන්දයේ ඔරේන්ජ් කුමාරයාගේ හසුනකුත් ඇතිව පැමිණි අද්මිරාල් සමග රජතුමා පැවැත්වූ රහසිගත සාකච්ඡාවට මහ මුදලිඳු සහභාගි වූවාටද සැක නැත. මනුවෙල් දියෙස් ප්‍රතිකාල් ජාතිකයෙක් වී නම් ප්‍රතිකාලුන් ලක් දිවින් නෙරපීම පෙරදැරි කොට ආරම්භවූ ඒ කටයුතු වලට මෙයාකාරයෙන් ඔහු මැදහත් කරගනු ලැබේයයි කවරෙක් සිතයිද?

මේ සිඩියට ටික කලකට පසු ලංකාවට සම්ප්‍රාප්ත වූ තවත් ඕලන්ද නැව් කණ්ඩායමක අධිපතියෙක් වූ සිබෝල්ට් ද වැට්, ප්‍රතිකාල් නැව් වගයක් අල්වා ගත ඒ නැව්වල සිටි ප්‍රතිකාළුන් රහසේ නිදහස් කර හරින්ට යන බව රජ තුමාට සැලවූ විට එකී ප්‍රතිකාලුන් නිදහස් නොකොට රජතුමාට භාරදිය යුතු බව නැව් පතියාට දැනුම් දීම සඳහා මඩකලපුවට ගිය නියෝජිතයාත් මේ මනුවෙල් දියෙස් මහ මුදලි තුමායි. සුරාවෙන් මත් ව රජතුමා ඉදිරියේ නුසුදුසු අන්දමින් කථාකරන්ට ගොස් මරණයට පත් වූයේ මෙකී ද වැට් අද්මිරාල් තැන බව මෙහි දී මතක් කළ යුතුයි.

මනුවෙල් දියෙස් පරංගි කාරයෙක් වී නම් පරංගින්ටම විපක්ෂවූ මෙබඳු වග කිව යුතු රාජ කාරි පිළිබඳව නියෝජිතයා හැටියට ඔහු පත් කර යැවීමට රජතුමා කැමැති වේද? මනුවෙල් දියෙස් පරංගි කාරයෙක් නොව සිංහලයෙකැයි පිළිගැනීමට මේ කරුණු ප්‍රමාණයයි හැඟේ."

(ඇලෙක්සැන්ඩර් වැලිවිට මහතා, දිනමිණ 10. 2. 1939)

### පරංගි සංහාරය හෙවත් සිංහල ප්‍රතිකාල් මහා යුද්ධය නැමැති කාව්‍යයෙන් උපුටා ගන්නා ලදී.

157

“දි ගෙ ස්  නම් මුදලිඳුන් සිංහල රජුට හිතවත් බැව්  දූ නා
ස රෙ ස්  වී දෙන් ජැරනිමෝ අසවේදු නම් සෙන්පති  තැනා
ප රෙ ස්  බසයෙන් නිගා කොට බැන තොරෙයක් ඇවිලිලි කිය  මී නා
ර හ ස්  අපගේ එළිදරව් වුන සැටි කෙසේ දූයි ඇසු  තැනා

158

මූ දලි  නැත බිය සැකක් නැතුවම කියයි මෙලෙසින් හඬ  න ගං
සා දලි  තුර පිටතින් ඉතා ඔප මට්ටමින් තිබුනත්  සු ගං
එ පි ලි  එකිනෙකා ගැලෙව්වට හරයක් දකින්නට නැති  ර ගං
වි සා ලි  නවු සමයන් කමන් නිලයන් මොටද ලබමින්  නි ගං

159

ර හ ස්  මෙ මගෙන් එළිදරව් වන බැව් කියා අපහස  සා ලේ
උ ස ස්  ගති ගුන වෙනස් කරගත් හෙයින් පැටලී ඔය  දූ ලේ
අ වි ස්  වස් කටයුතු වූ නිහරුත් දෙයක් නම් නැත මා  සොලේ
එ වි ස්  නර දූන් තුමට කියමිද නතර වී අන් සතු  පි ලේ

160

ගෙ න් න  මින් මා නමන් නිලයන්;ආගමත් සර පැටෙව්  වේ
උ න් න  නින් සැඩ පරුස බසයෙන් බනින්නට දූසි ඉලව්  වේ
ඔ න් න  ගත්වය කියා සස්නෙනත් සාබායත් ගැලෙව්  වේ
මෙ න් න  මම යනවාය කියමින් ගියයි එවෙලෙම වලව්  වේ”

(27, පිටුව හා සම්බන්ධයි)

“භීම වික්‍රමවත් වූ ඒ විමල ධර්ම සූරිය රජු මැරවීම පිණිස ප්‍රතිකාල් ඇමැති තෙමේ එකල රහසෙහිම, මීනීසුන් මරණ සොරුන් යහපත් වූ සෙන්කඩගල් පුරවරට යවාත් දුෂ්ට වූ සිත් ඇත්තේ ඒ කරන්ට නො හැකි විය.



එම්මානුවෙල් දියෙස් නම් ලක්ෂණ ප්‍රතිකාල් මිනිසෙක් නිරවශෙෂයෙන් ඒ රහස් විධි වූ පරිදි දන්වා යම් හෙයකින් සිංහල රජුගේ ජීවිතය රැක්කේ ද එහෙයින් එකල ඔහු කෙරෙහි පැහැදුනා වූ රජතෙම — සියලු මුදලිවරුන් අතුරෙන් ශ්‍රෙෂ්ඨයයි සම්මතවූ මහ මුදලි ධූරය පළමු කොට ම ඔහුට දෙවීය. එතැන් පටන් ලංකාවේ මහ මුදලි නම් සවදෙශිකයන්ගේ තනතුරු අද දක්වා පවතී.

(මහාවංශ පරිශිෂ්ට සංග්‍රහය 3 පරිච්ඡේදය 100 පිටුව 3 කාණ්ඩය. 1936 මුද්‍රණය)

(“මනුවෙල් දියෙස් ප්‍රතිකාල් මිනිහෙක් නොව එක හෙලාම සිංහලයෙක් ය යනු අපේ වැටහීමයි” කතීෘ)

“මහනුවර විසූ විමල ධර්ම සූරිය නම් ලංකාවේ මහ රජානන්ගේ ප්‍රධාන අමාත්‍ය ධූරය එනම් මහ අධිකාරම් තනතුර මීගමුවේ මනුවෙල් දියස් අත්දරුදී මුදියන්සේට ලැබී තිබුන බව නොක්ස් උන්නැහේගේ පොතෙන් ගෙන මෙහි පලකරන්නෙමි.”

“ක්‍රි. ව. 1590 දොන් පේද්‍රුරු සෞසා නැමැති පෘතුගීස් සෙනාධිපති නැත මුලු ලංකාව යටත් කරගන්නා අදහසින් යුධයට පිටත්ව මහනුවර දිශාවට පිටත්ව ගියාය. මේ කාලයෙහි දොන් ජෝන් හෙවත් විමල ධර්ම සූරිය කුමාරයා මහනුවර රජකම කෙළේය. මෙම දොන් ජෝන් බාල කාලයේදී ගෝවේද, කොළඹ සහ මීගමුවේද පරංගි පාසල්වල යටතේ තැනුනේය.

ඔහු මහ රාජසිංහ රජ යුධයෙන් පරදවා ලංකාව තමාම දාණ්ඩු කළේය. මොහුට විරුද්ධව යුධයට ගිය දොන් පේද්‍රුරු සෞසාගේ යුධ සේනාවෙන් 1224 ක් සිංහල මනුෂ්‍යයෝය. ඔවුන්ගෙන් වැඩි දෙනා රෝමානුකාර

මීගමුවේ මිනිස්සුය. ඔවුන්ගේ ප්‍රධානියා මනුවෙල් දියෙස් මුදියන්සේය. දොන් ජෝන් බලැති යුධ සේනාවක් සමග මහනුවර දිශාවට එන කල පරංගි ගොල්ල එහි සිටීමට භයව ගන්නොරුවේ කොටුවට දිව්වෝය.

එහි සිටිනෙගන උපකාර ඉල්වා කොළඹට පණිවිඩ කාරයන් ඇරියෝය. ගන්නොරුවේ සිටිය නොහී ඉතා කත්‍රිනාද රැගෙන පරංගි ගොල්ල වලානේ කොටුවට ගියෝය. දොන් ජෝන් රජ පරංගින් පසු පස්සේ ගොස් වලානේ කොටුව ලඟදී යුධ කෙළේය. මේ යුධයෙහිදී පරංගින් සම්පූර්ණයෙන් පරදවා දොන් ජෝන්, පේද්‍රුද ඔහුගේ පුත්‍රයාද, මානුවෙල් දියස් මුදියන්සේද, තවත් සමහරුන්ද සිරභාරයට ගත්තාය.

මෙම දොන් ජෝන් රජ මීගමුවේ සහ කොළඹ සිටින කාලයෙහි ඔහුගේ නම කොන්නප්පු බණ්ඩාරය. එකල්හි මනුවෙල් දියෙස් මුදියන්සේ සමග ඔහු ප්‍රධාන මිත්‍රව සිටියේය. එබැවින් මානුවෙල් දියෙස් මුදියන්සේ රජ වාසල මුදලි කමට පත්කර ගන්ට යෙදුනාය.

මෙසේ මනුවෙල් දියෙස් මුදියන්සේ කල පක්ෂ ගැන සන්තෝෂවූ දොන් ජෝන් රජ මොහුව මහ අමාත්‍ය තන තුරට පත් කෙළේය."

(ඉතිහාස වර්ණනාව 1873 මුද්‍රණය)

"In respect of the Civil Government, they appointed Puthaththamby a Vellalan, to Mudali for the revenue branch of the Government and Manuel Andirasu (Manuel Andaradi) a man of the Kurukula caste to be Mudali for the writing branch.

An intimacy sprung up between the two Mudaliyars and Andaradi being one day at Puthaththamby's house on an invitation to dinner, happened to have a sight of his host's wife a woman of transcendant beauty and was inflamed with a violent passion for her. She was sister of Kailasa Vanniyar."

(Yalpanam Vaipava Malai)



මෙම කථාවේ සම්පූර්ණ විස්තරය මෙසේය.

ක්‍රි. ව. 1658 දී පෘතුගීසින් පරදවා ලංදේශීන් විසින් ජාපනය අල්ලා ගන්නා ලදින් අන්තෝනි අම්රාල් දිසාව වශයෙන්ද කුරුකුලයෙකුවූ මනුවෙල් අන්දරාදි, මුදලි වශයෙන්ද ජාපනයට පත් කර හරින ලදී. එවකට ජාපනේ සිටි වෙල්ලාල කුලීන ධනවතෙකුවූ දොන් ලූවිස් පූදත්තම්බි හා අන්දරාදි මුදලි කුළුපග මිත්‍රයෝ වූහ.

වරක් පුදත් තම්බි සිය නිවසේ පවත්වන ලද ආදර සංග්‍රහයකට අන්දරාදි මුදලි තුමාට ආරාධනා කෙළේය. මේ පැමිණි අවස්ථාවේ පූදත්තම්බිගේ අභිරූපී පියම්බිකාව ව, අන්දරාදි මුදලි විසින් දක්නා ලදින් ඈ කෙරෙහි පිළිබඳ සිත් ඇතිවී ඈ හට රහසේ ආදර හසුනක් යවන ලද්දේය.

මෙම ආදර හසුන සම්බන්ධව පූදත්තම්බිට දැන ගන්ට ලැබී අන්දරාදි මුදලි හා වෛර වීය. පසුව පූදත්තම්බි සහ ප්‍රතුගීසින් සමූහයක්ද ලංදේශීන්ට විරුඩ රාජ ද්‍රෝහීන් මෙන් තඩු වීසඳු අන්දරාදි මුදලි විසින් ඔවුන්ව මරණීය දණ්ඩනයට යටත් කරණ ලදී.

පූදත්තම්බිගේ රූපත් භාර්‍යාව වූ කලී කෛලාශ වන්නියාර්ගේ සහෝදරියෙකි. පුරුෂයාගේ මරණයෙන් දරාගත නොහැකි ශෝකයට පත් තැනැත්තී සිය දිවි ඇද නාගත මළේය. මේ නිසා අම්රාල් දිසාව මුහුදේ ගිලී මළ බවත් අන්දරාදි මුදලි හස්තියෙකු ගෙන් පහර කා කල් පිටියේ දී මළ බවත් යාල්පානම් වෛපාව මාලෙයි නැමැති පොතෙහි සඳහන් වී තිබේ.

---

"ක්‍රි. ව. 1658 සැප්තැම්බර් මාසයේ දී ජාපනේ සිටිය දොන් ලූවිස් පූදත්තම්බි සහ තවත් ප්‍රතිකාල්වරු ඕලන්දක් කාරයින්ට විරුඩව සංගමයක් කරන බව, දොන් මැනුවෙල් දි අන්දරාදි මුදියන්සේට අසුවී සංගමයට අනුකූල වූ සියල්ලන් මරණයට පත් කළාය."

(හෙළ දිව් රජනිය. 1853 මුද්‍රණය)

මේ කතාන්තරය "මාන්තොට්ටමේ සිටි ද්‍රවිඩ ජුවන් කෝස්තාන්ගේ පුත් දෙන් දුවිත් විසින් පබඳ කළ "පුදත් තම්බි නාඩගම" පොතෙන් පිට පත් කර ගත්තක් බව දැන ගන්ට තිබේ. මොහු පුදත්තම්බිගේ පක්ෂයේ කෙනෙක් බැවින් පුදත්තම්බිගේ භාර්‍යාවගේ පතිව්‍රතා (පතිවත) ගැන ව්‍යාජ වර්ණනාවක් කර ඇති මුත් අන්දරාදි මුදලි තුමා මීට පසුව එනම් වර්ෂ 1659 දී කළුතර උසස් රාජ කාර්‍යයන්හි යෙදී සිටි බව බෝල්ඩියස් දෙව ගැති තුමාගේ ඉතිහාසයෙන් ප්‍රකාශවේ.

දෙන් මනුවෙල් දියෙස් අන්දරාදි, මහනුවර මහ අදිකාරමගේ මුණුපුරෙක් වූ රෙනෝල්ඩස් දියස් අන්දරාදි මුදලි තුමාගේ රණ සූර භාවය කරණකොටගෙන, ඔහුට ලන්දේසි ආණ්ඩුව විසින් අමුණු (65) හැට පහක නොහොත් අක්කර (58) පණස් අටක් විශාලත්වය ඇති කොළඹ නගරයේ ග්‍රෑන්ඩ් පාස්හි මහ වත්ත නැමැති ඉඩම නින්දගම් කර තෑගි කරන ලදි.

මෙම භූමිය මේ දක්වා මෙම පරපුරට අයිතිව තිබේ. ජොහානිස් දියස් පොන්සේකා තොටමුනේ මුදලි, ෆ්‍රැන්සිස්කස් දියෙස් පොන්සේකා මුදලි, මානික්කු දියෙස් පොන්සේකා මුදලි, කළුතර සහ පානදුරේ තොටමුණේ මුදලි තැන්පත්ව සිටි සෙලෙස්තිනු දියෙස් පොන්සේකා මුදලි මැනුවෙල් දියෙස් පොන්සේකා මුදලි, කළුතර දිසත්‍රික්කයේ මුදලි සහ වැල්ල වත්තේ සිටි බෙන්තර දක්වා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරි යනාදීහු ද මහනුවර මහ අදිකාරම් පරම්පරාවෙන් පැවත එන්නෝ වෙත්.

ජාපනේ මුදලි වංශයෙන්, ලන්දේසි ආණ්ඩුව යටතේ මෙහෙ කළ මනුවෙල් අන්දරාදි හෙවත් දෙන් මනුවෙල් දියෙස් අන්දරාදි මුදලින්සේද, මහනුවර මනුවෙල් දියස් මහ අදිකාරමගේ මුනුබුරෙකි. කළුතර මහ වලව්ව මේ කාලට මෙම පරපුරේ මූලික ස්ථානය විය.



"දියෙස් අන්දරාදි මුදලි-පරපුරේ පවුල්වල බොහෝ දෙනෙක් ම පරංගි සහ ලන්දේසි ආණ්ඩු යටතේ උසස් තනතුරු දැරුවෝය. රෙනෝල්ඩස් දියෙස් අන්දරාදි ලන්දේසි ආණ්ඩු කාලයේ උසස් තනතුරු කීපයක් ම දැරූ මුදලිවරයෙක් විය.

මෙතුමා ක්‍රි. ව. 1770 දී කළුතර වලව්වේදී ඉපිද කොළඹ ඕලන්ද සිමිනේරියේ බොහෝ දුරට ශාස්ත්‍රයන් උගෙන අවසානයේදී ගොවි වෛශ්‍ය වංශික අබේසිංහ මහ මුදලි තුමාගේ උපදෙස් පරිදි ආණ්ඩුවේ ස්ථානාන්තරය කටද පත්විය. නොබෝ කලක් ඇවෑමෙන් "ටිවුලර්" මුහන්දිරම් කෙනෙක්වී දක්ෂ පක්ෂ අන්දමට රාජකාරි කර ගෙන එන අතර ඔවුන්ගේ මුතු-මිතුන් පර පුරට මෙන් ඔහුටද (Military Cordelier) කොමන්දේ මුදලි ධුරයක් ලැබුනේය.

ඔහු ප්‍රධාන ඔහුගේ සේවා හමුදාව කොළඹ කඩවත් හතර ඇතුලු ප්‍රදේශය භාරව සිට ඔහුගේ පාරම්පරික යුධ කාර වංශයට අයත් රණකාමිත්වය පිළිබඳ මොනවට පැහැදි ලන්දේසි ආණ්ඩුව ඔහුට අක්කර 58 ක භූමිභාගයක් එවකට කොළඹ නාගලම් පාස් (ග්‍රෑන්ඩ් පාස්) නැමැති ප්‍රදේශයෙන් සතුටු පඬුරු කොට දෙන ලදී.

එක් අවස්ථාවකදී අබේසිංහ මහ මුදලි තුමාට විරුද්ධ බලගතු හතුරු පිරිසක් එතුමන්ව අල්වා බැඳ බේරේ වැවේ ගිල්වා මරන්ට තැත් කරන වේලාවේදී අන්දරාදි කොමන්දේ මුදලි තුමා වහා එහි පැමිණ එකී සතුරු කාණ්ඩයට මරු පහර දී මහ මුදලි තුමාගේ දිවි ගලවා ගන්නා ලදී.

ක්‍රි. ව. 1793 දී අබේසිංහ මහ මුදලි තුමාගේ එකම දියණිය ගාල්ලේ ගුණරත්න අතපත්තු මුදලි තුමාට විවාහ කරදීමේ උත්සවය කොළඹ වුල්ෆෙන්ඩාල් දේවස්ථානයේදී සිදුකර කයිමන් දොරකඩ පිහිටි කරුණාරත්න මහ වලව්වේදී ඒ සඳහා මංගල සංග්‍රහයක් පවත්වන්ට යෙදුනේය.

මේ උත්සව සංග්‍රහයට ලන්දේසි උතුමාණන් වහන්සේ හා ආර්යාව ඇතුලුව බොහෝ උසස් නිලධාරින් ද ඔවුන්ගේ භාර්යාවන් ද පැමිණ සිටියෝය. සංග්‍රහ අවස්ථාවේ අන්දරාදි කොමන්දේ මුදලි තුමාට කිසිම වෙනසක් නැතිව මහ මුදලිඳු සිය අසුන ළඟම අසුනක හිඳුවාගෙන සංග්‍රහය භුක්ති වින්දේය.

මෙම කථාවත් මගේ මුත්තනු කෙනෙක් වන දොන් කොර්නේලියස් දියෙස් බණ්ඩාරනායක ලන්දේසි හමුදාවේ මුහන්දිරම් රාළහාමි විසින් මට විස්තර වශයෙන් කියා දෙන ලදී.

මෙතුමා අවුරුදු 92 ක් ආයුෂ ගෙවා මීට අවුරුදු 25 කට පමණ ඉහතදී මරණප්‍රාප්ත විය. අබේසිංහ මහ මුදලි තුමාගේ මරණාසන්න කාලයේදී එතුමාගේ බූදලයේ අන්තිම කැමැති පත්‍රයට බලකාරයෙක් වශයෙන් අන්දරාදි මුදලි තුමාවද පත්කර තිබේ.

ලන්දේසි චිත්‍ර ශිල්පඥයෙක් වන "හාෆෙන්ස්' (Haafens) විසින් අදින ලද අබේසිංහ මහ මුදලි තුමාගේ ප්‍රතිරූපයක් මෙම අන්දරාදි මුදලි පරපුරේ කෙනෙකු ළඟ තිබී ප්‍රේරා මහ මුදලි තුමාගේ පියාණන් වන ඒබ්‍රහම් ප්‍රේරා ගුණවර්ධන කුරුවේ මුදලි තුමා විසින් එය ලබාගෙන ඔහුගේ මුණුබුරුවූ ගාල්ලේ අතපත්තු සහ වාසල මුදලි තැන්පත් නිකෝලස් දියෙස් අබේසිංහ මහතාට එය තෑගි කරන ලදී."

(ගාල්ලේ තෝම්බුවේ වලව්වේ ගුණරත්න මුදලි තුමාගේ "ලන්දේසි කාලය")



# පළමුවෙනි විමලධර්ම සූර්ය රජ සහ සෙනරත් රජ කාලය.

ඌවේ කුමාරයා - ඌවේ යුවරජ - ඌවේ මහරාළ කුරුවිට මන්ත්‍රී - කුරුවිට බණ්ඩාර - කුරුවිට රාළ හොඳහාත් වීර ආදිත්‍ය කුරුකුල අන්තෝනියෝ බැරත්තෝ.

| | |
|---|---|
| මීගමු පුර පව | ර |
| වීර ඉට්ටන් පරපු | ර |
| බැරත්තෝ නම් පත | ර |
| මැතිඳු කුරුවිට තුමා වැරස | ර |

(පටබැඳිපේරුම පුස්කොළ පොත)

'කුරුවිට රාළ වනාහි මසුන් මරන්නෙකුගේ පුත්‍රයෙකි."

(ආචාර්ය පීරිස් පෘ. ඉ. 1, 385 - කිව්රෝස් ඉ. 480, පිටුව)

මසුන් මරන්නන්ට පෘතුගීසි භාෂාවෙන් "පෙස්කදෝරු" (PESCADORE) යන නාමය ව්‍යවහාර වූ බව පෙනේ.

| | |
|---|---|
| "යේසුස් - ක්‍රි - ස් - | තු |
| දෙවි සමයට පත් | තු |
| අන්තෝනි බැරත් | තු |
| නැමැති සෙබලෙක් හුගුණ යුත් | තු" |

| | |
|---|---|
| "මහසත් ගුණැති සෙනරත් රජුට නිව | රැ දී |
| මඳකුත් නොසලකා යෙදුවෙන් නපුරැ | ස දී |
| ගුණවත් අසත් කුරුවිට මැති බැට | යෙ දී |
| විසුවොත් ඔබට මතුවට අවැඩ නිව | ර දී |

(අලගියවන්න, කොස්තන්තීනු හටන)

"වෙනු මෙන් විකුම් ඇති
පවර කුරුළුට මහ මැති
මෙර සිත් මෙන් බ ලැති
මිහත් මාතෝ මන්ත්‍රි අදි පති

සහෝදර බුවි පුරු
දෙකට්ටුව සමඟින් සරු
*අප්පු සාමි චරු
ගොල්ලකුත් පිරිවර සඳ ගරු

කුමර කෙලියෙහි තුරු
පිරිවැරූ කරුණා සුරු
අප්පු සාමි චරු
සමග තයිදේ සාමි වරු ගරු

(විමල ධර්ම සූරිය සහ දෙවන රාජ සිංහ රජුන් දවස උඩ රට සිටි අළුදෙනියේ කිවිඳු ගේ රාජසිංහ වර්ණනා කාව්‍යය නම් පුස්කොළ පොත.)

"විමලධර්ම සූරිය දෙවි සවාමි දරුවාහන් වහන්සේගේ ආඥාවෙන් වීර ඉට්ටන් කීර්ති පට්ටන් කට්ටි උන්නැහෙද තවත් අමාත්‍යයන් දෙදෙනෙක්ද සේනාපතියන්ද කෝරාල වරුන්ද ආරච්චි වරුන්ද කංකානම් වරුන්ද තවත් නොයෙක් පරිවාර සේනාවන්ද කැටුව හේවා හැටේ සිට සබරගමුවේ ඉම දකින තෙක් සංතාසි ආඩි දෙමළුන් ලුහු බඳවා ගොස් ගිරි තපසවරයා අල්ලා කොටා හෝ තෙර උල හිඳුවාලූහ.

---

* "අප්පුහාමි නාමය, මහ මුදලි-මහ අදිකාරම්-මුදලි-මුහන්දිරම්-රටේ රාළ - කෝරාල යන මොවුන්ගේ පුත්‍රයින්ට පමණක් අයිති නාම පදයකි."

(ක්‍රි. ව. 1832 ජනවාරි 1 වෙනි දින, දොන් ආබ්‍රහම් ද සේරම් විජේගුනරත්න උප මහ මුදලි සහ පිරිස විසින් රොබට් විල්බට් හෝර්ටන් ආණ්ඩුකාර තුමාට ඔප්පු කරන ලද සංදේසය)

("අප්පුහාමි නාමය, මුදලිවරුන්ගේ පුත්‍රයින්ට පමණක් ව්‍යවහාර කරන ගරු පදයකි."

(ආචාර්ය පෝල් පීරිස්. ලන්දේසි ඉතිහාසය)



......එවක් පටන් බෙලිහුල් ඔය නම් විය.....මතුවටත් හදිකම් නොකරණ තැනට රට සමක්තෑ කල නිසා ඇමැ-තියන් තුන්දෙනාටත් පරිවාර සේනාවටත් ගම් බිම් රාජ සම්මානදී.

වීර ඉට්ටන් දිවාරත්න සලුප්පර යන මන්ත්‍රීන්ට තොප්පි කඩු රත් සලු ඇත් අස් ඉර හඳ බැඳි කොඩිය රාවණ කොඩිය චඩන තල අත්ත රංමාල රිදී මාල ...ශ්‍රී හස්තෙන් දෙවා වදාල ඇත."

(පට බැඳි පේරුව පුස්කොළ පොත.)

## මතුරට

"සම්බුද්ධෙ දබ්බසාථෙ නිබ්බුතෙ මාඝ මාසෙ පක්ඛසම්ං කණ්හං භාගෙ චාතුද්දසාවිහෙ ලංකින්දෙ රාජ රාජෝ විමල ධම්මාභිධානො කාරුඤ්ඤ තාල පතෙතා බාරසං ලෙඛාපිතා:—

ශ්‍රී ලංකා ඕප රුහුණ දනව්වට අයත් උභව පුරප්‍රවර නම් කඳයුරු බඳ මන්දුරම් පුර මහත් අදම අනාධාර රාජ විපක්ෂ දේශක්කාර මිසිදිටු ගත් මල්ලගිරි නම් දෙමල ආඩි ගුරුවෙක් ගීතාවත රාජ සිංහ ලකිසුරු අතින් හිංදු දෙවොල් පවුරු පදනම් කරවා ශිව ප්‍රතී බිම්බ අඹවා නොයෙක් චිත්‍ර කර්මාන්ත නිමවා සිරිපිරි නගරයකුත් බොවා උභව පුරප්‍රවර හම් නියම් ගම් ගොඩ මඩ රදල කෝරළ දේවාල බුඩාලත් සඩංගු කර මිරිකා බැල මෙහෙවර කම් ගෙන කප්පමුත් සුංනමුත් ගෙන උඩ හේවා හැටේ ගම් නිහක් පස්මහ වෙහෙරක් දේවාලයක් පඩුරුත් අනාදරයෙන් ගෙන මිනිසුන් අළුගා සිව ගැති කොට මහත් නපුරු සිඩ කරන්ට වන.—

එකල ලංකා චූඩාමාණික්‍යක් බඳු ශුද්ධ සුගන්ධී වංශොද් භූත තේජාභිරාම විමල දහම් සූරිය චක්‍රවර්ති සවාමීන් වහන්සේ ලංකා රාජ්‍ය ශ්‍රී පැමිණ වදාල ගමන් සිරිලක සමස්ත වාසීන් ශිව සමයෙන් මුදවනුවස් කෘත්‍යාරම්භකර

ලංකා තලයෙන් ශිව ගැතියන් පහවැ එකරට යන ලෙස අණකර වදාල පසු අති පරුෂ කර්කශ දෙමළ ජනයා නොමයක් උපායෙන් ලංකාවාසීන් හා ඉවතන් නේපාල සොළී පාණ්ඩවාදි ජනයා රැස් කර

දේවස්වාමි දරුවාණන් ගේ අණවින කඩකරන්ටත් රට තොට වනසන්ටත් පටන්ගෙන නොයෙක් අරගල කරණ්ටත් ආරම්භකල සඳ

මහත් රාජාභි මානයෙන් දේවස්වාමීන් වහන්සේ යෙදුනු සේක් සියලු ප්‍රදෙශවල ජනයා රැස්කරවා ලක්දිව සෑම තැන්වලම සිව තවුස් දෙමළුන් කැතිගාත්ඩන් සිව දෙවොල් සිඳින්ඩත් ඒ ඒ තැනම සේනා යවා මංදුරම් පුර සංග්‍රාමයට

රණසූර ඇමැති තිදෙනෙක් ද වෙතත් ඇමැති වරුද කෝරල්ලාද ආරච්චිල්ලාද අතවැස්සෝද කංකානම්ලාද කදමළු කාරයෝද කදනං කාරයෝද සිංගාරක් කාරයෝද වෙඩික් කාරයෝද දුනු පලිස් කාරයෝද ඇත් පන්තිවල අස් පන්තිවල අයද වැදි පංගු කාරයෝද වඩුවෝද තවත් නානා අතවැස්සෝද

ආඥකල පණ්ඩිතින් දිවාරත්න, හළුවඩන, වීරසූරිය යන ඇමැති රාලලා තිදෙනාද දරහඩ කුඹුරේ, මිනිගස් වත්තේ, මදු වඩ ගින් කෙණ්ඩේ මඩුවේ රාලලා පස්දෙනාද උඩුවල යටිවල නායේ රාලලා තිදෙනාද බජ්ජල සහ වලපොත්තේ වෙද ඇදුරන් දෙදෙනාද පුස්සල මංකඩ අරාවේ තැනත් රාලලා දෙදෙනාද මාවේ ආරච්චිල්ලා දෙදෙනෙක්ද කංකා නම් විරුද දුනු පලිස් වඩන්නෝද

අනවර කාරයෝද කද මල්ල කාරයෝද තොලිල් පහේ අයද මහත්සේ එවා මන්දුරම් පුරය වටලා දෙමළ සිව සෙනගත් කොටු කෝෂටන් වනසාපු තැනේදී ගිරි නම් තවුසා ජීවග්‍රහයෙන් ගෙන බෙලිහුල් නෝ ගෙරදී දෙව සාමින් වහන්සේ වෙත පැපු සඳ මහත් අනදරැ කළ ඔහු ගිරියේ වැල ලා මරවා මහත් සේනාවට ඒ ප්‍රදේශය අයත් කරවා



උඹව රටට අඩත්තු බෙලිහුල් ඔයේ නැගෙනහිර ප්‍රදෙස උඹව සීමාව පසු ගන්වා හේවා හැට ගල ගොඩ නිලයට දෙවා මතු මේ කෝරලය හේවා හැට බාර ගන්වා පත්තිති පරම්පරාවේ ගම් දෙවොල් එලසම සලසවා...

ගැහැට ලත් රාජ පක්ෂ ඇමැතියන්ටත් මෙමෙහකරු පසිඩ කාරයන්ටත් කරුණා පණතින් අභිමාන පොරොත්තු විධි සලසවා මතු කී රාලලාටත් ආරච්චිලා කංකානම් මෙමෙහෙ-කාර ජනයාටත් ඉම් කර භාර දී යෙදිච්ච පනත නම් මතු ඉම් රට සොඳ රහට රකින්ඩත් රාලලාට පසිඩ පනත් දෙවා...

වීරසූරිය, දිවාරත්න, හළුවඩන තීදෙනාට තොප්පි [illegible]ගලකුත් කඩුවකුත් සළුවකුත් ඇතෙකුත් අසෙකුත් රුවණා කොඩියකුත් වඩන අන්තකුත් මාලයකුත් සංඛය කුත් දෙවා පට බැඳ සෙස්සන්ඩත් සවඩියකුත් මාලයකුත් පේරැසකුත් අච්චයකුත් මහල්ලයකුත් කුඩයකුත් හැඳකුත් පුටුවකුත් දෙවා ආරච්චිලා කංකානම් ගොල්ලටත් පොරොත්තු සලස්වා...

අනවර කදමල්ල කාරසිනුත් වනම් පහත් දුරසිනුත් මෙහෙ පිණිස පොරොත්තුදී සියල්ලටම මතු උවදුරු රකින ලෙස පනත් කර නිදහස්ව වසන්ඩත් පණවා එම පෙදෙස "මතුරට" නමින් භාර කර වදාල පනත මතු නො නස්නා ලෙසටත් පංගාර්තු පනත කඩ කළොත්...

යටිපල්ලේ වැලි සරියැ ගෙරි කවුඩු බළු සරියැ හැම අය බද්දෙන් නිදහස් කරුණා පනත් තාල පත්‍ර පංගාර්තු ලේකම් පත්‍රය දෙවා වදාළ පනතයි."

සිඞිරස්තු.

(කොළඹ කෞතුකාගාර පුස්තකාලයේ තැන්පත් කර ඇබෙන පුස්කොළ පොත.)

"ක්‍රි. ව. 1618 දී කොන්ස්තන්තීනු ද සා පෘතුගීසි සෙන්පති තැන හා අන්තෝනි බැරුන්තෝ ප්‍රධාන සිංහල සේනාවක් අතර මේ අසල ලෙල්ලෝ පිටියේදී යුධයක් විය.

සීතාවක රාජධානියට අයත් කුරුවිට වංශවත් පෙළපතක අධිපතියෙක්වූ මෙතෙම යම්කිසි කාරණක් නිසා පෘතුගීසින් වෙතට ගොස් ක්‍රිස්තියානිය වැළඳ ගෙන...

අන්තෝනියෝ බැරුත්තු නමින් ප්‍රසිද්ධව විසූයේ නැවතත් බුද්ධාගම වැළඳ ගෙන සිංහල රජු හා එකතුව පෘතුගීසින් හා සටන් කරමින් කුරුවිට රාල නමින්ද ප්‍රසිද්ධව සබරගමුවේ විසුවේය. සෙනරත්, (විමල ධර්ම සූරිය ඇතැම්) රජතුමා විසින් මොහු ඌවේ උප රජ කතතුරට ද පත් කරණ ලදී."

රත්නපුර ලක්ෂමණ මහ සමන් දේවාල ලිපිය (50) පිට බලන්න.

(පණ්ඩිත කිරි ඇල්ලේ ඥානවිමල ස්ථවිරයන් වහන්සේ විසින් ලියන ලද සපර ගමුවේ පරණ ලියවිලි නැමැති පොත)

"කොස්තන්තීනු ද සා ජනරාල් තැන තම යුධ හමුදාවත් කැටිව ලෙල්ලෝපිටියට ප්‍රවිෂ්ටව කඳවුරු පිහිටුවා ගත් බැව් මායා දුන්නේ රජුට සැලවූ වහාම තම සේනාධිපතීන් සියලු දෙනාටම ඔවුනොවුන්ගේ සෙබලුන් සමග ලෙල්ලෝ පිටියට හදිස්සියෙ කඩා පැන පෘතුගීසි බල ඇනිය විනාශ කර දැමීමට ආඥා කෙළේය.

රාජ නියෝගය ප්‍රකාර සියලුම සෙනවියන් පෘතුගීසින් හා සටනට රණ භූමිය කරා ගමන් ගත් නමුත් අන්තෝනියෝ බරෙත්තො නොහොත් කුරුවිට බණ්ඩාර පමණක් තමා අසනීපයෙන් සිටින බව අඟවා සිංහල බල හමුදාව සමග නොගියේය.



එහෙත් පෘතුගීසි හමුදාව හා සිංහල හමුදාව මුණ ගැසී භයානක අන්දමට සටණ කෙරීගෙන යන අතර කුරුවිට බණ්ඩාර නැමැති අන්තෝනියෝ බරෙත්තෝ තෙම යුද සරඹ පුරුදු අන්දමට දෑතට කඩු දෙකක් ගෙන හදිසියේ රණ පිටියට වැද බඹ දෙකක් පමණ අහසට පැන පැන සතුරන් කෑති ගසන්ට වන්නේය.

මෙසේ සියගානක් විනාශ කර අතිකුත් සිංහල හමුදු වේද ආධාර ඇතුව ලෙල්ලොපිටියෙ සටනින් අන්තෝනි බරත්තෝ ජෙනෙවි තැන මායාදුන්නේ රජුට ජය අත්කර දුන්නේය.

මීට කළගුණ සැලකීමක් වශයෙන් රජ පවුලට නෑකම් ඇති කුරුවට කුමාරි නැමැති රූපත් කාන්තාව අන්තෝනියෝ බැරුන්තෝට පාවා දුන්නේය."

(මුඛ පරම්පරා කථා)

"මෙහිදී (අට්වාපිටියේදී) අන්තෝනියෝ බැරුට්ටෝ කෙරෙහි පෘතුගීසීන් අතර භයක් ඇතිවිය...."ප්‍රධාන වශයෙන් ධෛර්යය සහ නිර්භීත භාවයෙන්ද අගපත්වූ මෙතෙම පේදුරු බැරුට්ටෝගේ සහ සමර කෝන් රාලගේ සම්භර ශේෂ්වාමින් ගේද සහාය ඇතුව රජුගේ යුධ බල ඇනියේ ගමණ වලක්වන ලද්දේය."......

"කෝට්ටේ ධර්මපාල රජුගේ යුධ හමුදාවේ මහ සේනාධිපති සමර කෝන් රාල යටතේ සුළු යුධ නිලධාරියෙකුව සිටි අන්තෝනියෝ බැරුට්ටෝ පසුව සිංහල රජුගේ පක්ෂය ගෙන පුදුම අන්දමේ රණසූරයෙක් විය."......

"යුධ කිරීමෙහි දක්ෂ පක්ෂ භාවය කරණකොටගෙන හෙතෙම ඌවේ කුමාරයා වශයෙන් පත් විමටද හේතු සම්පන්නවූ... "මොහු වනාහි කරාවේ පුත්‍රයෙකි."...........

එවකට ඔත් පලව සිටි සෙනරත් රජුගේ ප්‍රධානත්වයෙන් සිංහල නිලම වරුන් ගෙන් යුත් මහ සභාවක් මගින් ඌවේ කුමාරයාට දියතිලක නුවරට කැඳවා හෙතෙම සහ මීගමුවේ රාලත් (බොස්කෝවර්) ලාබාල කුමාර සිංහ කුමරුගේ භාරකාරයින් වශයෙන්ද සෙනරත් රජු අපවත් වෙන්ට යෙදුනහොත් ඔව්හු උඩරට රාජ ධානිය ආණ්ඩු කිරීමටත් (ක්‍රි. ව. 1613) අගෝස්තු මස 18 වෙනි දින පත් කරගන්නා ලදී."... (සිංහලයෝ වූකලි) සූර්ය වංශයට අයත් කෙනෙකු විනා අන්‍යයෙකු රජු බවට නොපතත් ෂකෝය."

(ආචාර්ය පෝල් ඊ. පීරිස් තුමාගේ පෘතුගීසි ඉතිහාසය)

"රාජ ද්‍රෝහී නම් සිතිනුත් නොසිතිය යුත්තෝය. අරාජකවද නො විසිය යුත්තෙය, එහෙයින් මහ රාජ තැන් පත්ව සිටියවුන් නැති තැනක යුවරාජව සිටියවුන් හෝ උතුදු නැත්හොත් රාජ කුමාරවරුන් හෝ උතුදු නැත හොත් බිසෝවරු හෝ රාජ්‍යයට තැබිය යුත්තේය."

ක්‍රි. ව. 1198 - 1207 - රජ පැමිණි කීර්ති නිශ්ශංක මල්ල මහ රජු විසින් පොළොන්නරුවේ පිහිටුවන ලද ශිලා ලිපිය හා සම්බන්ධයි)

ඉහත ශිලා ලිපියෙන් පෙනෙන අයුරු ලක්දිව රජ යුවරජ, කතතුරු වලට ක්ෂත්‍රියයන්ම පත් විය යුතු බවද එය නොබිඳී පැවැත ආ ආඥාවක් බවද එහෙයින් ඉහත සඳහන් පුවතේ පැහැදිලි වන "ඌවේ කුමාරයා" නොහොත් අන්තෝනියෝ බැරැටෝ සිංහල ක්ෂත්‍රියයෙකු වශයෙන් සෙනරත් රජු සහ සිංහල නිලම වරුන්ද මහ ජනයාද මහ රජුගේ අභාවයෙන් රජයට සුදුස්සා කොට තැබිය.



දෝනා කතිරිනා බිසවගේ මරණය හේතු කොට ගෙන බරපතල ලෙස ගිලන්ව සිටි සෙනරත් රජු ඌවේ කුමාරයා සහ මීගමුවේ රාලත් තම ලාබාල පුත්‍රයින්ගේ සහ අපවත්වූ රජුගේ (විමල ධර්ම සූරිය) දූ කුමරියගේද භාරකාරයින් වශයෙන් පත්කර ගන්නා ලද්දේය."

(පර්සිවෙල්ගේ ලංකා ඉතිහාසය)

"ක්‍රි. ව. 1613 දී පතිණ හාරිස්පත්තුවේ හේරත් නම් දිසාපති කෙනෙක් පෘතිගීසින් වශහයට ගොස් රජුගේ (සෙනරත්) පුත්‍රයින් සහ ඌවේ උප රජුන් (අන්තෝනියෝ බැරැත්තෝ) මරවන පිණිස කුමන්ත්‍රණය කොට සෙනග රැස් කලේය."

(අණ්ඩුවේ ලංකා කථාව)

"ක්ලන්ගි මෙසේ යුධ කල මරක්කලයෝ ලංකාවේ සිට එන අපේ නැව් තුනක් ඇතදී දුටහ. ඒ සියල්ල කුරුඳුවලින් පුරවා තිබුණාහ. සිංහල රජුගේ නැව් ප්‍රැන්සිස්කෝ පෙරේරා යටතේ විය. තවත් නැවක් ලාංකික නිලධාරියෙකු වන අන්තෝනියෝ බැරැටෝ විසින් ඇණවන ලදි."

(ගැස්පර් කොරයාගේ ඉතිහාසය)

"දේශක්කාර කාරවංත කුල උසතුංග ඌවේ යුවරජ උඩුමාලේ අසථානය, විජයපාල අසථානය මාලිගා තැන්නේ පහල වලපිවේ වැඩ සිටියාහ.

මීගමුවේ මුදියංසා මල් වත්තේ අළුත් වලව්වේ පොරුත්තු වෙන්ඩ යෙදී කළු හමුදුවට කටුනහ ලන්දේ මඩු කූඩම් ගනවා කාවල් තබන්ඩ වරම ලැබුනාය. රටේ මිනිස්සු වාදයෙන් වෛර බැඳලා ලංකාධි හේරත් රාලට පස්ස වෙමින් කරපු හේවාකමට කරුමෙ අත්පිට පල දුන්නාය.

ගේරස් රාල උල තියලා මරවත්බ යෙදිව්ව කාරණාවට රට සමත්තු උනාය. බිබිලේ ගම පෘතුකාලතෝ අටුකොටු තනව තනවා රට ගම කොල්ලෙට යටත් වෙලා තිබෙන අවස්ථාවට මහ අමාරුවෙන් සතුරු සෙනඟ වැනසුනාහ."
(ඇස්. පී. බී. මුතුබණ්ඩාර මහතාගේ ලිපිය, දිනමිණ 18. 2. 37)

"ක්‍රි. ව. 1613 නේ ජූලයි මාසය තුල දෝනා කතිරින බිසව අසනීප හේතු කොට ගෙන මරණාසන්න තත්වයට පැමිණියාය. මෙතුමිය විසින් උඩුවේ යුවරජුත් මීගමුවේ රාලත් කැඳවා ඇගේ දරුවන්ගේ පාලනය ඔවුන් දෙදෙනාට භාර කරන ලදි.

ඇගේ අවසාන දවස්වල වැඩි වශයෙන් කථා බස් කලේ උඩුවේ යුවරජු සමගය. මෙතුමිය අන්තිම හුස්ම හෙලන වේලාවෙහි උඩුවේ යුවරජුට හා මීගමුවේ රාලටත් ආමන්ත්‍රණය කර "ස්වාමිවරුනි සියලු පෘතුගීසීන්ද හරි හැටි ෂටකල මැනවයි" කියමින් ස්වර්ගස්ථ විය." "කුමාර සිංහ අස්ථානය ළදරුවියේ සිටින හෙයින් රාජ්‍ය පිළිබඳ සියලු කාර්‍යයන්හි භාරකාර ධුරය ඉසිලීමටත් කුමාරයා රාජ්‍ය කටයුතු සඳහා පුහුණු කරවීමටත් ආරක්ෂා කරගැනීමටත් සුදුසු මේවාගේ ශ්‍රේෂ්ඨ කාර්‍යයක් ඉෂ්ට කිරීමට හැකිවන විශ්වාස කටයුතු අය තෝරා ගැනීම තුඹලාට භාර කරමියි වදාල සේක.

එක් එක්කෙනා තම තමාගේ කැමැත්ත ලියවිලිවලින් ප්‍රකාශ කළහ. මීගමුවේ කුමාරයාත් උඩුවේ කුමාරයාත් ඉතා සුදුස්සන් හැටියට එකච්ඡන්දයෙන් තීරණය විය. ඉන්පසු රජතුමා ඔවුන්ට හිමි ළදරු කුමාරයා කැඳවා මේ සම්බන්ධයෙන් තුඹ කැමැති අය තෝරා ගත යුතුයි කී හෙයින් කුමාරසිංහ කුමාරයාද පෙර කී කුමාරයින් දෙදෙනා රජුට දක්වමින් ඔවුන්ගේ ආරක්ෂාව යටතේ සිටීමට සතුටු බැව් ප්‍රකාශ කෙලේය. රජතුමාගේ අදහසත් මෙයවූ බැවින් එතුමාද ඒට එකඟ විය.

(පිලිප් බෝල්ඩියස් දේවගැති තුමාගේ ගමන් විස්තරය.)



"මාතෘ භූමියේ නිදහස උදෙසා මෙතරම් නිර්භීතව යුධ කල (අන්තෝනියෝ බැරුත්තෝ වැනි) වීරවරයන් දිසි වූ ලංකා ඉතිහාසයේ ඇත්තේ ඉතා ස්වල්ප දෙනෙකි.

මේ වීරයා මායාදුන්නේගේ අභිවෘද්ධිය නොසලකා (පෘතුගීසීන්ටත් ඔවුන්ට පක්ෂපාත සිංහලයින්ටත්) ඝෝර ආඥාදායකයෙකු මේ ක්‍රියා නොකර සිටියේ නම්, සිංහලයන්ගේ අභිමතය පරිදි ස්වදේශික කුමාරයෙක් ඔවුන්ට ලබා ගන්ට තිබුණේය."

(පරනැන්ඩි කියුරෝස් පියතුමාගේ ඉතිහාසය)

# කුරුකුල අන්තෝනියෝ බැරුය්තෝ සම්බන්ධ වැඩි විස්තර

ජයවර්ධනපුර කෝට්ටේ (සවැනි) (6) vi පරාක්‍රමබාහු A මහ රජ සමයෙහි කාංචීපුරය – කාවේරි පට්ටනම කීලක්කරේ යනාදි දඹදිව ප්‍රදේශවලින් මෙරටට ගෙන්වන ලද කුරුකුල හෙවත් කෞරව නොහොත් කරාවේ යුධකාර

---

A හයවෙනි පරාක්‍රමබාහු රජ සහ පරවර යුධය

පැරකුම්බා රජතෙම සිය යුද බල සේනාවක් සොලී රටට යවා පරවර, පරතර් හෙවත් භරත වංශික "කුරු උඩයන් මල්ලවරායන්" නැමැති කෞරව සේනාධිපතියෙකු හා ඔහුගේ යුද බල සේනාවත් පරාජය කළ බව මේම කවෙන් පෙනේ.

"හි ර  සර පැරකුම් රජ කී මෙව  ර
කැ ර  මුඳුනත සෙන් වැද සොලීයා පු  ර
ව ර  *කුරුඩයන් මාලවරාය (මල්ලවරාය)  ර
ඇ ර  යු පැලඹෙන නෙදණින් බාසු  ර"

(පැරකුම්බා සිරිත)

මල්ලවරායර්, විල්ලවරායර්, විල්ලවරායන්, බූපාලරායර් බූපාල-රායන් යන මේ නාමයන් පරවර සහ කරාව ගෝත්‍රිකයින්ට පමණක් අයිති බැව් "බරත කුල ෂරිත්තිරම්" නම් ද්‍රවිඩ පොතේ 112 වෙනි පිටේ සඳහන් වී තිබේ.

* කුරුඋඩයන් යනු — කරාවේ මූලාදෑනියා, වෙයි.

වංශයෙහි සෞතවීරත් මුදියන්සේලාට *මීගමුව ඇතුළු ගම් කීපයක්ම ඔවුන් විසින්ම ආණ්ඩු කර ගැනීමට ප්‍රදානය කරන ලද්දේය.

මේ කථාවස්තුව සටහන් වී තිබෙන පැරණි වන්නි කථා නැමැති පුස් කොළ පොත ලන්ඩන් නුවර කෞතුකාගාර පුස්තකාලයේ තිබී එහි පත් ඉරුවල ඡායා රූප පිටපත් අන්ඩ්‍රයස් නෑල් දෙස්තර මහතා විසින් ගෙණැවිත් දැනට කොළඹ කෞතුකාගාර පුස්තකාලයේ තැන්පත් කර තිබේ.

මීගමුව කුඩා රාජධානියක් වශයෙන් පහළොස් වැනි සත වර්ෂය තුළ පට බැඳි රදළවරුන් විසින් ආණ්ඩු කරන කාලයේ දූල් ඔරු පාරු අයිතිකාර ධනවත් කුරුකුලක් කාර් හෙතෙකුගේ පුත්‍රයෙකු වූ හිඳු ලම්බිත වීර ඉටිවන් නැමැති මැරවර තරුණයෙක් විය.

මෙතෙම ක්‍රිස්තියානිය වැළඳගෙන අන්තෝනියෝ බැරටිටෝ නමින් ජයවර්ධන පුරයට පැමිණ දෙන් ජුවන් ධම්පාල රජුගේ අග්‍ර සේනාධිපති තැන්පත් ජයවීර සමරකෝන් පට බැඳිගේ දෙන් ප්‍රනාන්දු තොමොහොස් සමරකෝන් රාල යටතේ සුළු මුලාදෑනි ධුරයක් ලැබ පෘතුගීසි යුධ ශිල්පය හා ඔවුන්ගේ තන්ත්‍ර මන්ත්‍ර මනාසේ ප්‍රගුණ කෙළේය.

* "මේ විපයේ ඇති තොටමුණු අතර ප්‍රධාන නගර හතක් වෙයි. ඒවා විශාල නගරයෝය. එයිනුදු ප්‍රධාන නගරය ලංකාවේ රජු සවකීය රාජ සභාව පවත්වන කොළඹ නගරයයි. මෙය දකුණු වෙරළේ පිහිටියේය. දකුණු වෙරළේ තවත් තොටමුණු පහක් වෙයි. පානතොරේ (පානදුරේ) වේරළුවාලි (බේරුවල) ලිසාමබත් (අළුත්ගම) ගබලිකුවම්ම (බෙලිගම) තෝනිජ්යර් (දෙවුන්දර) උතුරු වෙරළේ පිහිටි තොටමුණ මනිම්බෝබු (මීගමුව) නම්ය.

කොළඹ හැර මෙයි කිශන සෙසු නගරද රජවරු යයි කියා ගන්නා පාලකයන් වගයක් විසින් ආණ්ඩු කරනු ලැබේ. නුමුත් සියලු පාලකයෝ ම කොළඹ රජුට කප්පම් ගෙවමින් ඔහුට යටත්ව ක්‍රියා කරති."

(කස්තන් යේ දුගේ ඉතිහාසය)



මෙම අන්තෝනියෝ බැරටිටෝ නැමැති තරුණයා වනාහි මීගමුවේ පැරණි පරම්පරාවල් වශයෙන් සලකන, කුරු කුල සූරිය, වරුණ කුල සූරිය, මිහිඳු කුල සූරිය, මඤ්ඤ කුල සූරිය, බරත කුල සූරිය, අර්ශ කුල සූරිය යනාදී කෞරව ගොත්‍ර අතරෙන් එකකට අයිති කෙනෙකු බැව් විශ්වාස කරනු ලැබේ.

ඉක්බිති පරංගි යුධ හරඹ මොනවට පුහුණුව ලත් මෙතෙම සමරකෝන් රාල හා කිසියම් හේතුවකින් අමනාපයට පැමිණ රහසේ මහනුවරට පලා ගොස් දෙන් ජෝන් විමල ධම් සූරිය රජුගෙන් සෙනෙවි ධුරයක් ලදින් රජුට සහ දොනා කත්‍රිනා බිසවට ද බොහෝ ඇලුම්ව රජ මාලිගාව අසල රජු විසින් ත්‍යාගී කරන ලද වලව්වක විසුවේය.*

මේ කාලය තුළ උඩ රට රාජධානිය යටත් කර ගැනීම පිණිස පරංගි සේනාව අනවරතයෙන් බල සම්පන්න අඳමට මෙහෙය වූ නමුත් අන්තෝනියෝ බැරැක්තෝ සෙන්පති තැනගේ සහයෙන් ඔවුන්ව බරපතල විනාශකාර පරාජයකට පත්කර පලවා හරින ලද්දේය.

* මෙකල පහත රට ප්‍රදේශ පරංගි බලයට ද උඩරට සිංහල බලයට ද යටත් ව තිබුන නුමුත් පරංගීහු අවකාශ ලැබුන ලැබුන පරිදි උඩ රට රජුගේ දෙශ මායිම් තරණය කොට රට කොල්ල කෑම් ආදී බලහත්කාර කම් කළෝය. මෙය පරමාණු කරගත් ශ්‍රී පාද ආදියෙහි බාරකාර සන්නාසියෝ සිංහල රජුට විපක්ෂව ඔවුන්ද බලහත්කාරකම් කිරීමෙහි නිරත වූහ.

අන්තෝනියෝ බැරටිටෝ විමල ධම් සූරිය රජට පළමුවෙන් ම කල මෙහෙය නම් ශ්‍රී පාදයෙහි සහ මතුරටෙහි දමරිකා භාවයෙන් සිටි සන්නාසි සභාවරයින් මැඩ පැවැත් වීමය. මෙම කාර්‍යයෙහි යෙදුන අන්තෝනියෝ බැරටිටෝ සහ ඔහුගේ සහකාරයින් දෙදෙනා ඇතුලු අනිකුත් සේනාවෝද සුළු කාලයක් තුල සන්නාසි සමූහයා සහමුලින් විනාශ කරණ ලදී.

මේ අඳමේ විජය ග්‍රහණ රාශියක ප්‍රධානීයා වශයෙන් ප්‍රසිද්ධ වී සිටි අන්තෝනියෝ බැරැත්තෝ සෙන්පති තැන කෙරෙහි පෘතුගීසීහු බොහෝ බියපත් වූහ. ඔහුගේ රණ සූර භාවය සම්බන්ධව දඹදිව ගෝව රට සහ සිරිලකද අස්සක් මුල්ලක් නෑර ප්‍රසිද්ධ විය.

පාතුගීසි ඉතිහාස කරුවෙක් වන පර්නැන්ඩි කීරෝස් පූජක තුමන් විසින් කියන පරිදි පලමුවෙනි ඌවේ කුමාරයා වශයෙන් පෙනී සිටියේ තෝමේ, අප්පු නැමැති ක්ෂත්‍රියයෙකි.

විමල ධර්ම සූරිය රජුගේ මරණින් පසු ස්වාමි විප්‍රයෝගික දෝනා කත්‍රිනා රාජ්‍ය සරණ කරගැනීමේ අදහසින් මහ නුවර රජ මාලිගයට පැමුණුන අවස්ථාවෙහි මෙතුමා සෙනරත් කුමරු විසින් ඉතා පහත් අඳමට කඩුවෙන් ඇණ මරණ ලදී.

මේ කාලයෙහි අන්තෝනියෝ බැරැට්ටෝ සෙන්පති තැන දෝනා කත්‍රිනා බිසවගේ ප්‍රධාන ආරක්ෂකයා වශයෙන් මාලිගාවේ ම විසූවත් සෙනරත් කුමරුට දෝනා කත්‍රිනා බිසව විවාහ කර ගැනීමටද මග සලසා දුන්නේය. දෝනා කත්‍රිනා බිසව සහ අන්තෝනියෝ බැරැත්තෝ ද භක්තිමත් රෝමානු කතෝලිකයින් වශයෙන් සිටි හෙයින් අන්තෝනියෝ බැරැත්තෝගේ උපදෙස් අනුව දෝනා කත්‍රිනා බිසව ඇතැම්විට ක්‍රියා කෙළේය.

රජු සහ බිසව ඔහු කෙරෙහි නොපමණ දුරට පැහැදී සිටියාද කිවහොත් රාජකීය නාවික බලයද එහි ප්‍රධානත්වයද ඔහුට සහ ඔහුගේ ඥාති පුත්‍රයා වන අද්මිරාල් පේදුරු බැරැත්තෝටත් භාර දෙන ලදුව "මහනුවර" කිස්තෙනාය" "ඔලන්ද" "මීගමුව" "සම්පත" "වාසනාව" විශ්වාසය" යනාදි යුද්ධ නැව් ද ඒවායේ කපිතන්මරු වූ "සංදරප්පුය" "ක්‍රිස්තෙනාය" "හිංනප්පේය" "ඔර්දියාය" "මාරසිංහය" "සංදරප්පුය" සහ "වන්දිගේ නයි හාමි" යන උප අද්මිරල්ලාගේ මෙහෙයීමෙන් ත්‍රිකුණාමලයේ කොට්ටියාර් වරායෙන් පෘතුගීසින්ගේ නාවික බල ඇණිය හා යුද පිණිස පිටත් විය.



මේ යුද්ධ නාවික බල ඇනිය මීගමුවට උතුරෙන් හලාවත සම්පයේදී ද මන්නාරමේ දීද පෘතුගීසින් ගේ ලොකු කුඩා නැව් කීපයක්ම අල්ලාගෙන "ලිවරිස්" හය ලක්ෂයක් පමණ කොල්ලකාගෙන ආපසු ත්‍රිකුණා මලය කරා ගමන් ගත්තාය.

අතරමගදී තවත් පෘතුගීසි නැව් කීපයක්ද ඔමස් රට සිට එන්නාවූ ධනයෙන් පිරි මුස්ලිම් ජාතීන්ට අයිති නැවක්ද අල්ලා ගත්හ. ඒ නැව්වල සිටි පෘතුගීසින් මුහුදට විසිකර ඔවුන්ගේ අඹුදරුවන්ද කාපේරි වහළුන්ද කොමරු මහ නුවරට ගෙනාවෝය. සෙනරත් රජුගේ ආඥාව පරිදි

කොල්ලකා ගන්නා ලද දේපල නාවික මුලාදෑනීන් හා සේවකයන් අතරේ බෙදා ගත්හ. මෙය ක්‍රි. ව. 1612 දී අන්තෝනි බැරැත්තෝ සහ පේදුරු බැරැත්තෝ අද්මිරල් ගේ සහ අතිකුත් සිංහල නාවික කපිතන් වරුන්ගේද සහාය ඇතිව ලබන ලද විශාල ජයග්‍රහණයකි.

මෙසින් උඩරට රජුගේ මුහුදු බලයේ වික්‍රම භාවය වැට හුණු පෘතුගීසින් රජු හා සමාදානයෙන් සිටීමට යස පාඩමක් ඉගන ගත්තෝය.

තෝමෙ අප්පු නැමැති ක්ෂත්‍රියයෙක් පලමුවෙනි ඌවේ කුමාරයා වශයෙන් පත්වී සිටි බවත් ඔහුගේ කණගාටු දායක මරණය ගැනත් මුලින් සඳහන් වී ඇත. දෙවැනි ඌවේ කුමාරයා වශයෙන්ද නැවැත ඌවේ උපරජු වශයෙන්ද (ඌවේ වෙස්රෝය්) (Viceroy of Uva) සිංහලේ ආණ්ඩු කාරයා වශයෙන්ද පත්වූයේ අපේ මේ කථාවස්තුවේ වීරවරයා වන කුරුකුල වීර ඉව්වන් නැමැති තරුණ අන්තෝනියෝ බරත්තෝය.

තුන්වෙනි උඩරටේ කුමාරයා වනාහි විමල ධර්ම සූර්ය රජුගේ සහ දෝනා කත්‍රිනා බිසවගේ දෙවෙනි පුත්‍රවූ කුමාර සිංහ ඇපාණෝය. අන්තෝනියෝ බරෙන්තුව උඩරටේ කුමාර පදවියට සහ උඩරටේ යුවරාජ පදවියට පත්වී සෙනරත් රජුගෙන් දායාද වශයෙන් ලත් උඩරටේ ප්‍රදෙශය සහ මඩකලපුව සම්බන්ධව විස්තරයක් අලගිය වන්න මුකවෙටි තුමා විසින් තම කොස්තන්තිනු හටන නැමැති කාව්‍යයෙන් මෙසේ ප්‍රකාශ කර ඇත්තේය.

"පෙරලියක් සහ ල ක
උඩරට නර නිඳුන් ද ක
පලකර සුගුණ තෙ ක
තොපෑ මදකුත් සබ්කපට සැ ක"

"උඩරට නිරිඳු ගෙ න
උඩව තුන් කිඳ ලැබ ගෙ න
බදුල්ලෙහි ඉඳ ගෙ න
නැතැවී සහ සෙබලුන් සදු ගෙ න"

"වෙල්ලස්ස දෙගො ඩ ත්
මඩ කලපුව පාන ම ත්
කඳුකර කොස් ගම ත්
වැල්ලවා සහ එතර මාව ත්"

අන්තෝනියෝ බරෙන්තෝ නම් උඩරටේ යුව රජු බදුල්ලේ මාලිගාවෙහි (දැනට කච්චේරිය පිහිටි ස්ථානය) වෙසෙමින්, උඩුකිඳ, යටිකිඳ, මැදිකිඳ ඇතුළත් උඩව ප්‍රදෙශයද එගොඩ සහ මෙගොඩ වෙල්ලස්ස පලාතද, මඩකලපුව, සහ පානමද, කඳුකර කෝරළයද, කොස් ගම සහ වැල්ලවායද, එගොඩ මාවත, ආදි සියළු ප්‍රදෙශය හිමි ප්‍රභූ කුමාරයාවූ බැවී මෙයින් අතැඹුලක්සේ පෙණියයි.



මෙතුමා පළමුවෙන්ම උඩවට පැමිණ වාසය කලේ කටුගහ ගම් මානය අසල දැනට මාලිගා තැන්න නමින් ප්‍රසිඩ ස්ථානයෙහි පිහිටි මාලිගාවේය. එහි කුමාර සිංහ සහ විජයපාල යන ලඳරු කුමාරයන් දෙදෙනා ද යුවරාජ අන්තෝනියෝ බරෙන්තෝ සමග වාසය කළෝය.

මේ අසල පිහිටි මල්වත්ත නැමැති ස්ථානයෙහි පිහිටි වලව්වේ මීගමුවේ රාල නැමැති ලංදේසි ජාතික මාර්ෂල්ද බොශ්තෝවර් මහතා කුමාරයින් දෙදෙනාගේ ප්‍රවේශම පිණිස මුර සෙබලුන් සමග විසුවෝය. මේ කාලය තුල හාරිස් පත්තුවේ හේරත් දිසාපති නැත පෘතුගීසි පක්ෂය ගෙන රාජ පුත්‍රයින් සහ උඩවේ යුවරජුත් මරණ ලෙස කුමන්ත්‍රණය කොට සේනාගක් රැස්කර ගෙන උඩව රටට ඇතුල් විය.

නුමුත් ඔහු අදහස සපල නොවී හේරත් දිසාපති නැත සහ ඔහුගේ සෙනග සුළු සටණකින් පසු උඩවේ යුවරජු සහ ඔහුගේ හමුදාව විසින් මරා දමන ලදී.

## මෙහි පහත ජේන පුවත් මුඛ පරම්පරා කථා ඇසුරෙන් දක්වමි.

පෘතුගීසීන් සමූහයක් උඩ රට නිලම කෙනෙකුගේ සහාය ඇතිව උඩවට ඇතුල් වූ බව හපුතලේ කඩවත කන්දේ මුර සිටි සෙබලුන් ගෙන් උඩවේ යුවරජට ආරංචි වී,

තෙමේ මාලිගාතැන්නේ සිට සිය සේනාවන් කැටිව ලඟ ලඟින් ඉදිරියට ගමන් කෙළේය, හපුතලේ ගම් මානයට දකුණු දෙසින් පිහිටි (දැනට කොළ තැන්න නොහොත් කොල-හල තැන්න) මීවියාවතේදී උඩ රට නිලමේ ප්‍රධානව පෘතුගීසි සේනාව මුණගැසී දෙපස අතරේ මහත් සටනක් විය.

මේ සටනින් පෘතුගීසීන් හා ඔවුන්ට පක්ෂපාත සිංහල සේනාවන්ද සහමුලින්ම විනාශ කර දමන ලදී. එවක් පටන් ඒ ස්ථානය කොළහල තැන්න වශයෙන්ද කල්යාමේදී කොල තැන්න නමින්ද ව්‍යවහාරව පැවත එන්නේයි.

පරාජයට පත් පෘතුගීසීන් විසින් දමාගිය ක්‍රිස්තු සාන්තුවරයෙකුගේ "සුරුවම" යුවරජුට හමුවී එය යටකී ස්ථානයේ පිහිටි ගල් විවරයක සුරැකිව තැබ්බ විය. එදින රෑ බෝ වීමෙන් තදබල වර්ෂාවක්ද වූයෙන් එබඳු අවස්ථාවක ක්ෂත්‍රියයන්ගේ ලැගුම් ගන්නා ස්ථානයවූ හපුතලේ ගමේ පිහිටි "ඉඩම" නැමැති ස්ථානයට යුවරජ තෙමේ පැමිණියේය.

අවස්ථාවෝචිතව යුවරජු සඳහා අඩුක්කු (ආහාර) පිළියෙල කිරීමට "ඉඩමේ" වැසියන් අසමර්ථ වූයෙන් ඒ යාව විසි, "මඩම" වාසී එය දැන ඔවුන්ගේ ශක්ති ප්‍රමාණයෙන් "කුරක්කන් තලප" පිස, යුවරජුන් බැහැදැක, අඩුක්කු පිණිස ඔප්පු දුන්නේය.

විඩාවෙන් පසුවූ යුවරජ ලද්දවූ "තලප අඩුක්කු" සතුටින් පිළිගෙන සප්පායන්වී, එදින නිසාභාගය ඉඩමේ පොරොත්තුව, පසුදා මාලිගාතැන්න කරා ගමන් ආරම්භ කර "තුඹලාට උවමනා දෙයක් කියවයි" තලප අඩුක්කු දුන් "මඩමේ" මිනිසුන් පිළිවිසීය.

එවිට "මඩම" වාසීනු; දේවයන් වහන්ස! "අපේ මේ "මඩම" "ඉඩම" කරගන්ටත් "ඉඩම" "මඩම" කර වීමටත් ආඥාවක් පණවා වදාළොත් මැනවයි බැගෑපත්ව යාඥා කළෝය.

එ ඇසූ යුවරජ, "එසේ ආඥාවක් පැණවීමට මේ අවස්ථාවක් නොවෙයි" කියමින් තම තඩුපත "මඩමේ" මිනිසුන්ට මාන්නයක් කොට තබා ගැනීමට අවසර දී පිටත්ව ගියේය.



"මෙම තඩුව අත්තිමට හිමිකර ගෙන සිටි "මඩමේ" වැසි පුරුෂයෙක් හපුතලේ ගමට යාබදව පිහිටි හෙල-කදුරු ගමුව නිගම බද වස්කුඹුරේ කෙනෙකු ලඟ උකසට තබා රා බීමේ ලු"

(මෙහි "කදුරු ගමුව" යනු එවකට උඹෙව් කඳ වුරක් වශයෙන් පිහිටි නියාළු, හැඟවීම වස් ව්‍යවහාර වන්නක් බවත්, එය මෙම ගම මධ්‍යයේ පිහිටි (මිටියාවත) දැනට දියතලාව නැමැති සුප්‍රසිද්ධ යුද්ධ කඳවුර පිහිටුවා තිබෙන පෙදෙසම වියයුතු බවත් සැලකිය හැක.)

"මෙයට අවුරුදු 125 කට පමණ ඉහතදී පරවර වෙළෙන්දෙක් නුවර එළියේ සිට වනගත මාවතකින් කඩවත කන්දට (හපුතලේ) එන අතර, යට කියන ලද කොළහල තැන්නේදී මධ්‍යම රාත්‍රිය ඉක්ම ඝන සැරේට මිහිදුම ගලා තිබුණේය. අන්ධකාරයෙන් අන්ධකාරයට පත්ව තිබුන මේ අවස්ථාවේ ඔහු ගමන් ගත් තවලම් පාර වැරදී මංමුළා විය.

"වන සතුන්ගේ මුර ගැසීම නිසා බියට පත්ව දෙවියන් යදිමින් සිටි ඔහුව, යටි රැවුල දිගට වඩාගත් ලෝගුවක් ඇඳි වටි මීතිමෙහක් හමුව, කඩවත කන්දෙ කඩපල (හපුතල වවුම) තෙක් ඔහු කැටුව ගොස් කඩපලට ඇරලවා කොල තැන්නේ ගල්විවරයේ සඟවා තිබෙන "සුරුවම" ගැන දැනුම් දී නොපෙනී ගියේය.

පරවර වෙළෙන්ද පසුවදා කොල තැන්නේ ගල් විවරය සොයා ගොස් සුරුවම රැගෙන එහිම කුඩා පල්ලියක් ඉදිකර "සුරුවම" තැන්පත් කෙළේය. එවක් පටන් මේ දෙවස්ථානයට "වනවාස පාවුලු මුනිඳුයාගේ පල්ලිය"යි කියති.

මෙම දේවස්ථානය බොහෝ "හාස්කම්" ඇති ස්ථානයක් හැටියට පැවතුන බව බොහෝ දෙනාගේ හැඟීමයි. දැනට මෙම ස්ථානය නටබුන් ව යන තරමට පත්ව තිබේ."

"උඩවේ යුවරජ නොහොත් කුරුවිට රාළ මහ පලාත කෝරළයේ දිගල තැන්නේ කිරිඹරුවේ මහත්මී නැමැති කාන්තාවක් සරණ පාවාගෙන සිටියේය. එතුමන්ට දාව ඇට ලැබුනාවූ ජයසූරි නැමැති කුමරුට පසු කලකදී මායාදුන්නේ රජු විසින් මාතොට, ජයසෙන දෙඩම් පහල නම් ගම්වරය තිළිණ ගම් කර දුන්නේය."

තවද මෙම යුවරජු උඩු කිඳ මීරහ වත්තේ ගම්මානය අසල කුඹුරු යායක් අස්වද්දවා එයට වතුර සැපයීම පිණිස වැවක්ද බන්දවා එතුමන්ගේ වැඩ කරුවන් සමූහයකට පවරා දුන්නේය. එවක් පටන් එ වැව පිහිටි ගමට "බණ්ඩාර වැව" යයි කියති. මෙගම් වැසියෝ "කුරුවිට රාළ" ගැන තවමත් ආඩම්බර වෙති.

"බණ්ඩාර වෙල" යනුද මෙම යුවරජ විසින් අස්වද්දන ලද (කුඹුරු) වෙල් යායක් නිසා ඇති වූවකි. ඒ "වෙල්" යායට ජලය සැපයූ වැව දැනට ගොඩකර එය වර්තමාන ක්‍රීඩා භූමියක් කොට ඇත්තේය.

"ඉහත සඳහන් ඉතිහාස ගත ස්ථාන, එවකට මාලිගා තැන්න නොහොත් යුවරජ මන්දිර ස්ථානය පිහිටි භූමි භාගයට හැතැප්ම 8ක් පමණ අභ්‍යන්තර සමුදුරින් පිහිටියෝයි."

(මුඛ පරම්පරා කථා)

"පරංගි කාරයෝ සබර ගමුවේ සමන් දේවාලයේ කොටුව කරගෙන යුධ මූලැදනියෙක්ද හේවා කණ්ඩායක්ද එහි නැවති සිටියෝය. මේ කාලයේ කුරුවිට බණ්ඩා කියා කෙනෙක් සිටියේය. මොහු පරංගි නිසා අත පය දිග අරින්ට බැරිය කියමින් ලිපමුල අළුගොඩේ නිදන සිරිතක් තිබුනේය.

සමන් දේවාලය ලඟින් ගෙනයන කදමලල බොහෝ විට ඒ හේවායෝ උදුරා ගනිති. සත්කාරයන් ගෙන් බොහෝ විට කුරුවිට බන්ඩා නුඹද? ඔහු නුඹ අඳුනන්නෙහිද? ඔහු ගේ හරඹ දුටුවෙහි දැයි යනාදීන් අසති. ඔව්හු අපි නොදනුමුයි කියා යති.



කුරුවිට බන්ඩා සමහර විට දෙබර මැස්සන් සහිත දෙබර වද කඩා මුට්ටියක පිරිවැස්ස බැඳ එසේම ඇටි කෙසෙල් කැනට පිරිවැස්ස බැඳ කර තියා ගන ඒ සමීපයට යයි. කඳ උදුරා ගන්ට පරංගි එන කොට කඳ බිම තියා දුවයි. හේවායෝ කැවුම් කන්ට මුට්ටිය ලිහන කොට දෙබරු අනිති. මෙමෙස් නොයෙක් විට හිංසා කෙළේය.

දවසක් කුරුවිට බන්ඩා යුධයට සැරසී කඩුව හිරි තලත්තේ අකුලාගෙන කොටුව නොහොත් දේවාලේ ළඟට පැමිණියේය. හේවායෝ ඔහු නවත්වා නුඹ කුරුවිට බණ්ඩාද ඇසුවෝය. නොවෙමියි කීය. නුඹ ඔහු දුටුවෙහි දැයි ඇසූහ.

එසේය දුටිමි කීය. නුඹ ඒ හරඹ අපට පෙන්වන්නෙහිද ඇසූහ. එසේය කඩුවක් දෙන ලද්දේ නම් පෙන්වන්නෙමියි කීය. ඔව්හු කඩුවක් දුන්නෝය. යම් ආකාරයකින් හිරි තලාත්තේ අකුලා තිබුන කඩුව මාරුකර ගන උඩ පැන පරංගින් කපන්නට පටන් ගත්තේය.

සේරම කපා දේවාල දොරටුවෙන් ඇතුල්වෙන්ට යන කොට සොල්දර උඩ සිටි යුධ මූලැදනියා කඩුවගෙන බන්ඩා උඩට පැන්නේය. බන්ඩාද කඩුවෙන් ඔහුට කෙටිය. ඔහු ගේ කඩු පහර බන්ඩාටද වැදී දෙන්නා එතන මළහ.

එම දෙදෙනා කොටා ගත් ආකාර දක්වන රූප කෙටූ ගල්ලෑල්ලක් දේවාලයේ බිත්තියේ අදවන තුරු තිබේ."

(ඒ. ජේ. ඩබ්ලිව්. මාරම්බේ රටේ මහතා විසින් කුරුවිට රාල නොහොත් අන්තෝනියෝ බැරුන්තෝ ගැන සිය පොතේ ලියා තිබෙන පුවත වේ. 52 පිටුව)

## කුරුවිට රාල

1 යේසුස් කිරි ත් තු
දෙවි සමයට ප ත් තු
අන්තෝනි බැ රු ත් තු
නැමැති සෙබෙලෙක් නුඹුන පුත් තු

2 පෙරලියක් සහ ල ක
උඩරට නරනිඳුන් දූ ක
පලකර සුගුණ නෙ ක
නොපෑ මදකුත් කපට ගුණ එ ක

3 උඩරට නිරිඳු ගෙ න
ඌව තුන් කිඳ ලැබ ගෙ න
බදුල්ලෙහි ඉඳ ගෙ න
නැතවි සහ සෙබළුන් සදා ගෙ න

4 වෙල්ලස්ස දෙගොඩ ත්
මඩකලපුව පාත ම ත්
කඳු කර කොස් ග ම ත්
වැල්ල වා සහ එතරවා ම ත්

5 එදෙස නොයෙකුත් ර ට
නතු කරගෙන තමන් හ ට
තම සෙන් සහ කප ට
සපර පුර කඳවුරට සුදු කො ට

6 දෙනවක පස් රට ත්
මාතොට දෙසත් බලව ත්
කුකුල පස් යොත් න ත්
අවුල් කරමින් සදා පෙරලි ත්



අන්තෝනි බැරුත්තෝ * යන අපූර්ව අභිදානයකින් හැඳින්වෙන හරි සිංහලයන් කීප දෙනෙකුගෙන් එක් කෙනෙකු වූ කුරුවිට රාල නැමැති සදානුස්මරණීය වීර සිංහලයා වරින් වර නොයෙක් වෙස් ගනිමින් සිටි සිංහල කවියෙකු වූ අලගියවන්න මුකවෙටිගේ අදහසේ හැටියට නම් පෙරළි කාරයෙකි.

ගුණමකු සෙබළෙකි. එසේ වෙතත් ඉහත ජේන පද්‍ය වලිය, ඇති අලගිය වන්නගේ කුහක්සතන්තීනු හටණ කියවන්නෙකු මෙහි පහත පළවන පද්‍යය කියවීමෙන් පසු කුරුවිට රාල ගැන කුමක් සිතන්නේද.?

"අහස් පොළෝ මැව් සුරිඳුට ප්‍රතිකාල් රජුට ත්
අපස් සකම් කළ අන්තොනි බරුත්තුගේ බල ම ත්
දෙතිස් දත්ම බිඳ හළ ලෙස පොඩි කරයුග කොපුල ත්
දෙතිස් දෙකමෑ රුපු මැතියත් නොයාදෙමින් එකකු ත්',

එහෙයින් අවකාශය සහ පොළෝ තලය මැවූ දේවතා බල මහිමයටත් ප්‍රතිකාල් රජ උදහසටත් රුහැණීව නැගී බබළොව තෙක් කීර්ති තේජස නැංවූ සිංහලයාගේ අභිමානයට මනඃ කාන්තිමත් වාතාවරණයක් වූ කුරුවිට රාල ගැන ලියමි.

සොළොස් වෙනි ශත වර්ෂයේ සිංහල රාජ යුගය අනුක්‍රමයෙන් පිරිහෙමින් සිංහලයන්ගේ අගනුවර දඹදෙනිය කුරුණෑගල, ගම්පල රයිගම සහ කෝට්ටේ ආදි ස්ථානවලට සංක්‍රමණය වන කනගාටුදායක යුගයේ මස් මරන්නෙකුට පින්වත් දරුවෙක් උපන්නේය.

---

* ඌව ඉතිහාසයයෙහි:-
"අන්තෝනි බරෙත්තු පෘතුගීසි ජාතික වුවද පෘතුගීසින් හා
පරම සතුරුවූ අන්තෝනි බරෙත්තු සෙන්පති තැනද සිංහල රජුන්
විසින් ඌවේ උප රජයට පත් කරන ලද්දේය" යයි ලියා තිබේ.
අන්තෝනියෝ බැරුත්තෝ පෘතුගීසි සාරයෙකු නොව නියම සිංහල
සෙගුරවයෙකු බැව් ඔහු සම්බන්ධව මෙහි විස්තර වන ඉතිහාස කරුණු
වලින් මනාසේ අවබෝධ වේ.

* නමක් සංඥා ඇති කිරීමට අපොහොසත්වූ මස් මරණ ප්‍රියෙකුට දුව නමක් නැති කුටියක උපන් මේ දරුවා කාලයත් සමග වඩා වර්ධනය වූයේ, එවකට සමරකෝන් රාලහාමි සමරකෝන් මුදලි යටතේ ඔහුගේ ලස්කිරිඤ්ඤ හමුදාවේ මුරසේවක යෙකු මෙන් තරුණ ජීවිතය ආරම්භ කෙළේය.

පෘතුගීසින් යටතේ තුබූ සිංහල යුධ හමුදාවේ, නායකත්වය හොබවූ සමරකෝන් මුදලිගේ සහෝදරයාවූ එම්මැනුවෙල් මුදලි හදිසියේ මරුදමා පෘතුගීසින්ගේ සේනාවේ මහත් පෙරළියක් ඇතිකර කුරුවිට රාල මහමගට බැස්සේය. මේ වනාහි ක්‍රි. ව. 1603 පමණ කාලයයි – නිර්භීත වූත් අන්තනෝමතිකවූත්, සීමාන්තික වූත් ක්‍රියා කරණකොට ගෙන මොහු සිංහලයන් අතර මෙන්ම පෘතුගීසින් අතරද නොමැරෙන නමක් මේ සුලු කාලය ඇතුලත ඇති කළේය.

පෘතුගීසින් අතර ළදරු වයස ගෙවා ඔවුන්ගේ භාෂා ශාස්ත්‍ර හදුරා, ඔවුන්ගේ යුධ ශිල්පයෙහිද සුරු බුහුටි ඇත්තෙකු වූ මොහු ඔවුන් අතරදී ප්‍රසිඩවූයේ අන්තෝනි බැරෙන්තු නමිනි. ඔහුගේ වෙන්වීම පෘතුගීසින්ට වූ බලවත් පාඩුවකි.

ඒ පාඩුව අතරම ඔවුන් තුළ බලවත් සංතාපයක් හා සංවේගයක් ඇති කරවමින් ඔවුන්ට යටත්ව තිබූ මාතර හා සපරගමුව යටපත් කර සපරගමු දිසාවේ කුරුවිට ජය බිම බවට පමුණුවා කුරුවිට රාල යන නියම සිංහල අභිධානයෙන් ඒ පළාත පාලනය කෙළේය.

බලයෙන් බලයට පත් කුරුවිට රාල එවකට උඩ රට කරවූ විමල ධර්ම රජුගෙන් උණුව සහ තුන් කිඳද ලැබගත්තේය. පෘතුගීසින් අතර වඩා කාන්තිමත් අවුරුදු කිපය

---

* මෙය වැරදීමකි. අන්තෝනියෝ බැරැට්ටෝ මීගමුවේ වැදගත් ධනවත් පවුලකට අයත් කුල පුත්‍රයෙකි.

(138 වෙනි පිටුව බලනු.)



ගතකර ඔවුන්ගෙන් නොයෙක් විද්‍යා ශිල්ප ඉගෙන ඔවුන්ට ණය ගැතියෙක් වූවද උපන් මව් බීමට ඇති බලවත් භක්තිය නිසා ඔවුන්ට පස මිතුරුම විය.

එහෙයින් සෑම අවස්ථාවකම ඔහුගේ කල්පනාව වූයේ පෘතුගීසින්ගේ මාර බන්ධනයෙන් තමන්ද තම රටද ගලවා ගැනීමය. මේ අදහසින් හෙතෙම කන්ද උඩරට රාජධානිය හා සමග කුළුපග කම් ඇතිකර ගත්තේවී නමුත් ක්‍රි. ව. 1617 දී සෙනරත් රජු විසින් පෘතුගීසින් හා සමග කරගත් සමාදාන ගිවිසුම නිසා මේ අභිමානවත් එඩිතර සිංහලයා සිංහල රජුටද විරුඩව නැගී සිටියේය.

"නනතුරු දුන්නොයි ද
උඩරට රජුට වෙර බැ ද
නන් අවිගත් පබ ද
මහත් සෙනගක් රැගෙන යුද මැ ද

වාසල සිටිමහ ත්
ගරුතර ඇමැති වරු නු ත්
රැක වල සිටියනු ත්
ඇනද මා සරු නොකොට මදකු ත්

සත් ගුණැති එරජු ත්
රජ කුමරුවන් සිදෙන ත්
ගැලවුනු පමණෙ මූ ත්
වෙනිත් ගැලවී සිටි කෙනෙක් නැ ත්

තෙරුවන් මහිමෙනු ත්
සුරවරන් අනුහසිනු ත්
එ රජු පින් බෙලෙනු ත්
උවදුරක් නොමවෙමින් මදකු ත්

රුදුරු රකුසන් ලෙ ද
යලි එසෙන් රජ ගෙට වැ ද
පෙට්ටි පියළිද බි ද
කොල්ල කා මුතු මැණික් බරණ ද"

මෙසින් නො නැවතුණේය. සිංහල රජ උඩ රටින් පලවා හැරියේය. සෙතරත් රජුට බියෙන් රට ගම අත හැර දමා ඉන්දියාවට පැනගොස් සිටි මායාදුන්නේ කුමාරයා නැවත ගෙන්වා රාජ බලයත් පාවා දුන්නේය.

වර්ෂ 1618 දී ලංකාවේ ජන රජු බවට පත්වූ කුස්තන්තීනු ද සා නොරොඤ්ඤා මේ වීර සිංහලයන් දෙදෙනාට විරුද්ධව යුද්ධාරම්භ කළේය. හෙතෙම ක්‍රමයෙන් මල්වාන මාපිටිගම ආදි ස්ථාන විජය භූමි කොට මායාදුන්නේ විසූ මැද්දෙගම නුවරට පැමිණ බලවත් විනාශයක් කෙළේය.

මේ සටනින් අන්තෝනි බැරුවිටෝ පසු බැස ගිය නමුත් "පානම" නම් ස්ථානයේ දී සෙමින් ස්වකීය සටන නොනවත්වා ම ගෙන ගියේය. එහෙත් 1618 – 1619 ද සටන් කීපයක් ජය අත්වන අන්දමට කරගත් නමුත් 1620 දී පෘතුගීසින් සමග කරණ ලද සටනින් මොහු පරාජය වූයේ, ජීවිතක්ෂයට පත් වූයේය.

විදේශයන් අතරද උතුරා යන කීර්තියකින් හොබවුණු කුරුවිට රාල ඔහුගේ යුද්ධ භූමියේදී මිය ගියේය. එහෙත් ඔහුගේ ඒ අමරණීය හිස පෘතුගීසි ජන රජු විසින් මහ ජනයාට ප්‍රදර්ශණය කරවනතුරු ඔහු මිය ගිය බව ලෝකයා නො පිළිගත්තේය.

සැබැවින්ම මේ සටණින් කුරුවිට රාල මිය ගියේය. සිංහල පියෙකුට දුව ඉපදී, පෘතුගීසීන් අතර හැදී, වැඩී, ජාතියට ඇති භක්ති ප්‍රේමය නිසා ඔවුන්ට රුහැණීව සිංහල සේනාව මෙහෙයවා, එපමණක් නොවේ. පෘතුගීසීන් හා සමග එකමුතුවූ සිංහල මහරජ තුමෙකුවද විරුද්ධව සටන් කර,



ජාතියට හිත පක්ෂ අයගේ, සිත් තුල අභිෂේක ලත් කුරුවිට රාල ජාතිය නිසා මිය ගියේය. එහෙත් ඔහුගේ නාමය මිය නොගියේය. බඹ ලොව තෙක් පැතුරුනු කීර්ති තේජස ඇති සිංහලයන්ගේ නාමයට සදානුස්මරණීය වශයෙන් ප්‍රසාදය දක්වන සිංහලයන්ගේ හද තුළ ඔහු අදත් ජීවමානව වැඩ සිටියි.

(සිංහල බෞද්ධයා පත 14 සැප්තැම්බර් 1946.)

උඹවේ කුමාරයා නොහොත් අන්තෝනියෝ බැරුවිටෝ කටුගහ, මාලිගා තැන්නේ වාසය කරණ කාල කිරිඹරුවේ මහත්මී නැමැති කාන්තාවක් සරණ කරගන සිටි බවත් බදුල්ලේ සිටියදී උඹවේ මහ රාල වශයෙන් මද්දුම හාමි නැමැති කුමරියක් විවාහ කරගන සිටි බවත් කුරුවිටදී කුරුවිට කුමාරිය නැමැති කාන්තාවක් හා විවාහ වැද සිටිය බවත් අපගේ පරීක්ෂණයෙන් හෙළි විය.

මද්දුම හාමි ගෙන් ලත් දරුවන් ගෙන් පැවත එන පරපුර මේ දක්වා මහනුවර පලාතේ රදළ වරු කොටසක් මෙන් පෙනී සිටිති. එමෙන්ම කුරුවිට කුමරියගෙන් පැවත එන දරු මුණුපුරාදීන් සබරගමුවේ රදල පරපුරක් හැටියටද කිරිඹරුවේ මහත්මී නිසා ලත් දරු පරපුර දෙඩම්පහල යන ගමේද මේ දක්වා පැවැත එති.

මීට අවුරුදු 200 කට පමණ ඈත තංගල්ල අසල සිදු උනාය කියන මනුෂ්‍ය ඝාතනය නිසා යම් කිසි පලියක් දෙඩම්පහල පිරිසට ගෙවන්ට වූයෙන් දෙඩම් පහල වගීයා ගෙන් පැවත ආ නයිදෙ හාමි - දෙඩම් පහල රාල යන දෙදෙනා එකී පලියෙන් බේරීම පිණිස පලා ගොස් නයිදෙ හාමි කළුතරද, දෙඩම්පහල රාල මොරටුවේද පදිංචි විය.

— මෙම අය මරණාසන්නයේදී තමා ගැන තම දරුවන්ගේ දැන ගැනීම පිණිස මෙම කවිය කියා තිබේ."

"දෙ ඩ ම් පහල කුරු කුල පරපුරෙන් එ න
ව ස ම් ගාර්දිය මහ වැල්ලේ ලිය න
මූ හ ම් දිරම් ජයසූරිය පට බැඳු න
මෙ ච ම් කෙතෙකි මම දනු සුතනෙති සුඟු න"

කුරුවිට රාලගේ (මෙතුමාගේ) මරණය සම්බන්ධව විවිධ මත ප්‍රකාශව තිබෙන බැවින් අපට එතුමන්ගේ අභාවය අරභයා විස්තර කිරීම බොහෝ අසීරුය.

එහෙත් මාරම්බ රටේ මහත්මයාගේ පොතේ, සපරගමුව සමන් දේවාලයේ සිදුවූ සටණින් මියගිය බවත්, සපරගමුවේ පැරණි ලියවිලි නැමැති ග්‍රන්ථයේ, (මහසමන් දේවාලයේ පෘතුගීසි සෙල්ලිපිය සහිත මුරගල සඳහන් පිටුව (50) "මොනු එදිරිමණසිංහ යයිද, අන්තෝනියෝ බැරුත්තෝ, (කුරුවිට රාළ) යයිද, ඇතැම් ගවේශකයින්ගේ මතයකි.) මෙයින් බැරුත්තෝ මැරුම් කෑවේ මින් කලකට පසු මාතර දී සිදුවූ සටනකින්ය. මෙය මෙසේම බවට අපටද පිළිගැනීමට අවකාශ තිබේ.

ඌවේ ඕලුවා මංකඩින් එහා පිහිටි ගංතොට ගලකින් ගලකට පැන අන්තෝනියෝ බැරුච්චෝ හෙවත් කුරුවිට රාල තම අත වැසියාට දක්කම් පෑ අන්දම සම්බන්ධව "මග සලකුණ" නැමැති පුරාණ කාව්‍යයෙහි මෙසේ සඳහන් කර තිබේ.

"ද න් ත සරම ඇති පුහුණුව සිට බා ල
උ න් ත තැනම සිට කිසිවක් නොව කෝ ල
ඔ ත් ත කියා අත වැසියට සුරු පෑ ල
පැ න් ත ගල බලා යව කුරුවිට රා ල"

බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තිබෙන නො. OR. 6607 (28) දරණ පුස්කොළ පොතෙන්, අති ගරු දේව ධර්මාචාර්ය ඇඩ්මන්ඩ් පීරිස් රාජගුරු හලාවත බිෂොප් තුමානෝ විසින් පිටපත් කර මුද්‍රණය කළ මෙම කව්‍යය, ලංකාවේ කිසිම තැනකවත් මීට ප්‍රථම නොතිබුනු බව සැලකිය යුතුයි.



# රාජසිංහ රජ කාලේ ප්‍රවෘත්ති

........"සීතාවකින් එගොඩ පරංගි කාර ගොල්ල අඩාසම් බැඳ ගත්තාය, ඒ නිසා මෙතන වැඩ සිටින්ඩ සුදුසු නැතැයි කියා සෙන්කඩ පුර නුවරට වඩලාය.

එනුවර පොරොත්තු වී සිටින ප්‍රස්ථාවට පරංගිකාර ගොල්ල කොරට වහල් කඩින් එපිට කඩයිම් ලා ගත්තාය. එමූර පැල්වල සිටගන රටෙ කැබැල්ල වැඩ රජ කාරිය ගත්තාය. එ ඇරුත්......

ධවුත සංඛ පරික්ෂිප්ත ක්ෂීර සලිලාකාර අභින්න මනු වෙසවර වූ ශ්‍රී ලංකාධි පතිවූ - උතුම් - අපගේ රාජා ශ්‍රී දෙව ස්වාමි දරුවානන් වහන්සේ සිංහාසන මස්තකයට වැඩ වදාරමින් රාජ ශ්‍රී විඳ වදාරණ ප්‍රස්ථාවට බදුල්ලේ නුවරට එනුවර වැඩ සිටිමින් ඌවේ මහ බල සේනාව

සමග අතපත්තුවේ එක් ලක්ෂ පණස් දහසක් පමණ අප්පුහුරු සමග නොයෙක් ආයුධ පන්න ඒයං වෙඩි බෙහෙත් සමූද කොට පිට උනු වගනම් නොයෙක් චතුරංගිනි සේනාව පිරිවරා ගනිමින් අසුර යුධයට නික්මෙන්නා වූ සක්‍රදේවේන්ද්‍ර ලීලාවගෙන් ඒ ඒ තැන පරංගි එක්ක යුධ කරමින් ස්ෂෞර සිංහ විලාසයෙන් ජයගෙන නැවත දලදා ගන් වෙලට හේවා කමට වැඩ වදාරන්ට

සිතා වදාරමින් නොයෙක් ඇමැත්ත මණ්ඩලේ රදල හුරුන් පිරිවරා ගනිමින් - ශාස්ත්‍රෑ කුංජර විද්‍යාකර කෙස-රින්ද්‍ර වූ—උතුම්—රාජ ශ්‍රී දෙව ස්වාමි දරුවානන් වහන්සේ දලදා ගම්වෙලේ හේවා කමට නික්මෙමින් රන දෙරණ වැඩ සිටින ප්‍රස්ථාවට නැවතත් සතුරු සේනාව ලංවී.

එන වේලාවට නොයෙක් කොඩි කුඩ ප්‍රසාද ලැබි උතුම් මහවහසලට පස්සවාදිකත් පිණිස ඊටි නොයෙක් ඇමැත් තයෝ බයාදුවෙන් පැන දිව්වාය. එවෙලාවට මහ කුඹුරෙ පලිය වඩන රාල ඇතුලුව රාජ සිංහ දේව සවාමී දරුවානන් වහන්සේ වැඩ සිටින කැටුව සිටිය නැවතත් සතුරු සෙන් ලන් වෙත්. එම පලිය වඩන රාලත් පලිහ ලිහාදමා බසින් දුවන කල නොදුවයි, යෙදී දෙතුන් විටක් දිවස් ලා වදලාය.

ඒත් දුවන නිසා අත ඇත්තන් නොදුවයි කියේය. දුන්නු පනතට බෝවා කාලයක් ආශ්‍රි බෝවන්ඩ. අත ඇත් තේ පත ඇති කොට වද කියා දුවන කල මා කුඹුරේ බත් තිත්ත කරමිය කියා යෙදුන විට, මා කුඹුරේ බත් තිත්ත කියා වෙච්චි නම් පිහාමි ඔයේ (පහාමි ඔයේ) අල කොට මීයන කොළත් තිත්ත වේදුයි කියා දුවපු නිසා, ශ්‍රී හසෙන තිබුන යකඩ පලිය බිමට දමා පලිස් පිට වැඩ සිටිමින් උඩින් ඉගිලෙන මානැටියා දැක වදාරමින් ශ්‍රී හසෙන සිටිය.

“වඩන කුරුල්ලා” ඇර වදාරමින් රාජසිංහ මැඩිලල මේනතයයි කියා වැඩ සිටින ප්‍රසථාවට ගල් දුනුගල්, පටි කිරිච්ච, කෙවේරි, ජමජාබි වලතඩි, වපතා තඩි, වානන් ශක්‍රාවෙල, එහදී තුවක්කු, අත්තුවක්කු පිරගි බොන්දික් කුලා, පුසුලන් පට්ශ්‍යාන, කඩු කසථාන, සෑකි ආයුධ ගත් තාවූ පන්සියයක් සේවා හමුදුවත් ඉස් කොපි කියන පරංගි කප්පිත්තා, මහ ගොරෙත්දුරු කියන අපගේ මිගොමුවේ මහ මුදියන්සේත් සැදී පැහැදී හේව කමට එන වේලාවට

ප්‍රවර සූයඝී මණ්ඩලයක් මෙන් වැඩ සිටිනා බව පෙර මුනේ ආ අපගේ මීගොමුවේ මුදියන්සේ දකිමින් සුඩ සූයඝී වංශාධිපති වූ දෙව සවාමි දරුවානන් වහන්සේට මේ සතුරු සේනාව දැක යුධ කරපු නම් කෝට්ටේ මහවහසලින්



යෙදිච්ච පනතට කාන්චිපුර දේසේ සිට මෙකරට අපස්ස වාදිකම් නැතිවෙයි කියා අතේ තිබුන කිරිච්චිය ගෙන යටි පතුල ඉරා සතුරු සේනාවට ලේ පෙන්නා සිංහලෙ ඇත් තා ගෑදි කැපුවයි කියා.

පරගිකාර ගොල්ල රවටවමින් ආපසු කරකවා ගෙන ගිය තැනේදී වැල්ලේ වීදියේ මුදලියා මහ වහසලට පක්ෂ වාදීකන්වූ සැටි පරංගි කාර ගොල්ල විමසමින් එම මුදලියා අවහිර කොට කළු හමුදුව, (කරුවේ යුධ හමුදුව) අතික් නිලමක් කාරයින්ටත් කොල්ලැවක් පමණ ඇන්න මූදේ යන්න එපාය, නාකොලගන් නොවෙත් යන්න එන්න එපාය. කියා ගිය කෙනෙක් ඇත්නම් කටට වෙඩිබේක් දමා ගිනි දෙනවා ඇතැයි කිය අඩ බෙර ලැව්වාය.

නැවත සඞ්ලංකෙශවරවූ උතුම් රාජ සිංහ දේව සවාමී දරුවානන් වහන්සේ ඕලන්දට කැඩ පතක් ඇර වදලා ඇත. එම පනතින්ම ඕලන්ද හේවා පන්නෙට කට යුතු සාදු පහදගෙන ඇවිත් මහ මුහුදේ සිටිය බව දැක පරංගි ගොල්ල උත්ව එත්ව නොදී රැක්කාය.

ඒ වග ත්‍රි සිංහලාධිපති වූ උතුම් රාජසිංහ දේවසවාමි දරුවානන් වහන්සේට ආරංචි වෙමින් ඕලන්ද කාරයින්ට අති කඩිනමින් ගොඩ බසින සැටියට ලියමණක් ලියා වදාරමින් ගොස් මීගමුවේ මුදලියාට දෙන්වෙයි කියා යෙදී පතිවිඩකාරයෙක් ඇරියාය.

ඔහු ගොස් මීගොමුවේ කුරුකුල සූරිය මුදලියා අතට දුන්නාය. ඒ ලියමන සිංහලේට අයිති විසවාසවූ මුදලි වරු සතර දෙන බලා අපේ වැලවරිගේ නැතුව වෙනත් මහ වාසලට පස්සවාදි කත් ඇති නිසා මේ කැඩපත ලන්දේසි ගොල්ලට දෙන්ට ඔනැය කියා.

වැල්ලේ වීදියේ මුදලියාගේ යාළු නෑකම් දරන ඉලේ නයිදේ (ඉල නාග, කොළඹ නයිදේ, නොහොත් හුලංගමුවේ කළු අඹප්පයා) කියන අප්පුට ලැබුන කැඩපතත් ඇන්න මූදේ වැටෙමින් පීනා ගොස් පසුවද පාත්වූ තුන් පෑ වේලාවට කැඩපත දුන්නාය.

එකැඩ පත බලා ලන්සි ගොඩ මූදෙන් ගොඩ ආවාය. ස්වස්ති ශ්‍රී වෛවස්වත මනු සංඛ්‍යාත දිනරත්න වංශාභිජාතවූ උතුම් රාජසිංහ දෙවස්වාමි දරුවානන් වහන්සේ සජි ජන සන්නාහ සන්නද්ධ චතුරඟිනි සේනාව පිරිවරා ගොස් මහ මුහුද ගොඩ ගමන් ගත් පරිද්දෙන් සෑදී රණ දෙරණ වැඩ සුඛ කොට ජය ගෙන සියලු මුර පොරවලුත් සේනාවත් වස්තුවත් ඕලන්ද කාරයින්ට බාර දෙමින්ම වදුරණ කපුවරල මඩියේ වැඩ සිට මීගමුවේ.

නිලමක් කාර ගොල්ලට එන්ට යෙදී ඊයන් වෙඩි බෙහෙතුත් නැත. හේවා පන්නෙත් බල මදි නිසා කොටුවට ගොස් සියළුම කටයුතු සමුඩ කොට එමෑයි කියා කොටුවට ගියාය. ඊයන් වෙඩි බේශුත් වියදමත් ලැබී යන්ඩ යෙදුනාය.

බොහො සේ කාරුණාව ලැබී සිංහලේට බොහෝ පස්ස වාදිකන් ඇති සැටිත් යෙදී අප නිසා වැල්ලේ වීදියේ මුදලියා අවහිරඋනු නිසා එම මුදලියාගේ යාළු නෑකම් දරාපු ඉලේ නයිදේ කියන අප්පුට..............හා මරාල මඩ හුණං දූව පස්දබ උඩලියන්ද බිම් පුළුවු ගන් පබුරු එපාය යෙදී ඊට සන්නස් කුඩපත් දෙවා වදාලාය.

නැවත මඩකලපුවේ ඒ රා ඔරුව (ඉරාවූර්) ලැබී යන්ට යෙදුනාය. නැවත මීගමුවේ නිලමක්කාර ගොල්ල මහ වාසලට ඔප්පු කරවන වගනම්, පළමුන් මුදුබඩ සිට ආවාය. දූනුත් මුදුබඩ යන්ට යෙදුනේ අපේ පිං මද මයි, කියා ඔප්පු කල තැනේදී අමප්ත මණ්ඩලේ ඇමැතින් දක්වා ගෙනා...



අපට විශ්වාසවූ මොවුන්ට නොතනීන් ගම් ලැබෙන්ට සුදුසුද යි අහ වදාලාය. කරුණා මහිමනාවයි ඔප්පු කලාය. වැල්ලක්කේ දිසා රාලහාමී විසින් ඔප්පු කලාය. පර හතුරට සතුරු වෙමින් උතුම් වූ මහ වාසලට පක්ෂපාත අති විශ්වාස වූ නිලමක් කාරයින්ට නින්දගම් ගබඩා ගමක් ලැබෙන්ට සුදුසුයි කියා ඔප්පු කලා ය.

එවග ඔප්පු දුන වදාරමින් මහ වීදියේ නිලමක්කාර ගොල්ලට ඇලගොමුව කියන ගමේ බාගයක් ලැබුනාය.

වැල්ලේ වීදියේ මුදලියාට අඹන නින්දගම් ගබඩා ගම ලැබුනාය. මීට අවු කොටු ලාහු යතුරුමුදු සතර මායිම් ඇතුළුව ශ්‍රී සන්නස් දෙවා වදාලාය.

ඒ ඇරත් මහ වීදියේ මුදලියාටත්, වැල්ලේ වීදියේ මුදලියාගේ ආරච්චි වරුන්ටත් තමන්කඩ එගොඩ පත්තුව කඩයිත් ඇතුළුවම ලැබුනාය.

ඒ හැර නවසිය හැත්තෑවක් හේවා හමුදුව පඹිවිටද, කොටගෙදරද, බලවත් වලද, පල්ලගමුවද, කණ්ඩාලමද, කුරියායද, අඹරපනෝද, කැකුණාවද, නාරංවිටද, තෙල්ලිය පොතුබෝව, දෙමට ගොල්ල, අතර ගල්ල, මැටිරන් ගම්මන, කලන් කුච්චිය, මාතලෙන් තමන්කඩින් සත් කෝරලෙන් මෙකී අයට සහද ප්‍රවේණිව සැලැස්මට නිත්‍යකල්‍යාණ දෙවෙන්ද්‍ර උතුම් වූ රාජසිංහ දෙව ස්වාමි දරුවාණන් වහන්සේගේ මහ කරුණා පනතින්;

මිගොමුවේ නානායක්කාර ගොල්ලට මෙ කියන ගම් සහද ප්‍රවේණියට දෙවා වදාළාය. මීගොමුවේ නානායක් කාර වරු සතර දෙනාට ඉර සඳ පවතිනා කලකට ගසන සුලඟත් පායන අව්වත් මිස වෙන හයක් නැතුව යන්ට ගියාය.

පරංගි හොල්ල රවටමින් ආපසු කරකවාගත ගොස් පලවා සිටි තැන පොරොත්තුවුණාය. ස්වස්ති නවරත්න ශ්‍රී විරාජිත ලංකා තල රාජ ධුරන්ධර අමිත පරනාමිත මකුට මණි මයූඛාකාර ලංකෘත ශ්‍රී පාද රවින්ද්‍ර චන්ද්‍රෝප ශෝභිතවූ උතුම් අපගේ රාජසිංහ දේව ස්වාමි දරුවාණන් වහන්සේ අමාත්‍ය මඩලේ රදල වරුන් දක්වා ගත, පරගි කාර ගොල්ල ආ බව මොකද නැවත පසු බැස ගිය කාරිය කුමක් නිසාද්‍යි අහ වදාළ තැනේදී.

මාතලේ දිශාව ලැබී තිබුනු වැල්ලක්කේ දිශා මහත් මින් විසින් උතුම්වූ රාජසිංහ දෙවි ස්වාමි දරුවාණන් වහන්සේට ඔප්පු කර සිටි වචනයේ සැටි නම්,

කෝට්ටේ මහ වාසලදී පුත්තලමේ මුක්කරුන් එක්ක ගේවා කමටි, කුරු කුල දේශයේ කාංචි පුර දෙශ, කිලක් කාර, කාවේරි පට්ටලම, මෙකී දේශවලට කැඩ පත් ඇර ගෙන්වා වදාරමින් හේවා පන්නයට ඇරපු තැනේදී මුක් කරුන් හා යුධ කොට ජය ගත්ත නිසා කරුණාව ලැබී බොහො සේ තාන්ත මාන්ත දී ලැබී,

මිණෙහාමුව සහද ප්‍රවේණියට ලාබුනාය, ඒ පක්ෂවාදි කමට අදත් සම් නරේන්ද්‍ර තිලොකොපෙතවූ උතුම් අපගේ රාජසිංහ දෙව ස්වාමි දරුවාණන් වහන්සේට දෙපක්ෂ නපුරු සේනාව යුධ කරපුනං නපුරයි කියා,

මිගමුවේ වැල්ලේ වීදියේ වණීකුල සූරිය අරශ නිල ඉට්ට මුදලියා අරන්අෙරුවෙක් කිමට බසිමින් ඉතේ තිබුන කිරිච්චියෙන් ඉරා ගත පස්සවාදී කමට ගිය බවක් මුත් පැරුද ගිය බවක් නොවයි,

ඔප්පු කල තැනේදී ඒ මුදලියාට බොහො සේ කරුණා තානාන්තර ලැබී වඩා තල අත්තේ පත්‍රයක් ඉරා ගත රන් පත් හිඳක් ගෙන්වා, මෙසේ පස්ස වාදිකම් ඇති ඔහු මාගේ සිංහලේ ආ වොත් බොහොසේ තාන්ත මාන්ත ගම් වරවල්ද ලැබී ආධාර වෙමින්,



........රන් දුනු සාරාම සැර ගැත වදාරමින් ජය අශ පත්‍රය බදිම්යි වදාලාය. ඒ ලියමන මීගමුවේ මුදලියාගේ තල මැඩිය සමීපවූ ජය පත්‍රය බලා පතනින්ම කළු අමුදුවත් තිලමක්කාරයෝ සතර දෙනත් බොහෝ සතුටුව පරගි කරයින්ට කියන වගනම් අපි..................තැත, වැල්ලේ වීදියේ මුදලියාගේ පට්ටම, වණී කුරු කුල සූරිය අදි අරස මෙත්ති සිංහ අරසනිල ඉට්ට කුරු කුලත්තිල් මහ මුදියන් සේ යැයි යෙදී පට බඳවා, ආරච්චිවරු පස් දෙනාටද ආරච්චි පට ලැබී සාරසින හැත්තෑවක් හේවා හමුදුවද බාර වෙමින්......

මහ වීදියේ තිලමක්කාරයින්ට පට ලැබී ආරච්චි පට ලැබී හේවා හමුදුවක් ලැබී ලංකා තල රාජ ධුරන්ධර අමිත ප්‍රකාමිත මකුට මණි මයූඛාකාර ලංකෘත ශ්‍රී පාද රවින්ද්‍ර චන්ද්‍රෝප ශෝභිතවූ උතුම්වූ......

හේවා හමුදුවත් ලැබී A දෙවීදියේ තිලමක් කාරයින් වද ආරච්චිවරු හේවා හමුදුවටත් මාලමට්ටප්පු පේරුස් මුදු රන් බන්දි, රිදීබැන්දි හවඩි කසකාන පෙස හැට්ට, කවසි හැට්ට, ජේස පට් වැඩ කරපු ජගලත්තු ලංස පට්සානෑක අලිස්වරං වඩන තල අතු ඉරගද කොඩිය, අරත්අෙරු මෙකී දේ ලැබී,

නැවතත් තිලමක් කාරයෝ සතර දෙනාට විතරණ ධන ධනෙශ්වර ප්‍රඥ වාගීසවර පර රාජේස්වරවූ උතුම් රාජසිංහ දෙවස්වාමි දරුවාණන්වහන්සේ සවීා භරණයෙන් ආභරණ පැළඳ වදාරා සතර දෙනාට සතර වරක් ගෞරව ලැබුනාය.

ඒ හැර ගබඩා ගමට මීවාද හැඹා, පැටවිල්ලට ගොනාද තුමුනුත් එළකිරි පට්ටියට දෙනුන්ද ගත්තොටෙන් කත් අදත් පණිවිඩ යෙදී ගෙන්වා වදාරමින් තිලමක්කාරයින් සතර දෙනාගේ වග නම්......

---

A "කඩු සොටි කම් බැඳ කස්තානද ලැබ ලංස පට්ස්තානද ලැ බු නා
සත් පලි මුතු කුඩ සේසත් චාමර පංච වර්ණ වස්ත්‍රා ලැ බු නා
වෙඩිද මුලක් නම් අව් අතු කම්බිලි විසිරි වඩන් තල පත ලැ බු නා
වැඩිය සියලු දේ අඩු නැත සෙනගට *රාසිං කරුණාවෙන් ලැ බු නා

* "රාසිං" යනු රාජසිංහ රජ්ජය.

මහ වීදියේ විජේරත්න කුරුකුලසූරිය මුදලියාද, සෙම්බරි ආරිය තුරෙ කුරණ අඩප්පයාද, ආරච්චි නම් වීරසිංහ ආරච්චිලද, වීරතුංග ආරච්චිලද, A ඉලංගසිංහ ආරච්චිලද, ජය සූරිය ආරච්චිලද, කොඩි තුවක්කු ආරච්චිලද, B ඉරණ සිංහ ආරච්චිලද, කට්ට පඩයර්ද, වැල්ල වීදියේ මුදලියාගේ ඇවැස්ස නෑ කම් දරාපු අයත්, අරස අඩප්පයන් ඒ ආරච්චි නම් වලින් වත්තවන ආරච්චිලද, වණි කුල සූරිය ආරච්චිලද, අන්තර පින්තර ආරච්චිලද, මෙත්ති වේල් ආරච්චිලද මුදමන් ආරච්චිලද, මහ මුහන්දිරමද, ලියන රාලද, කුඩුකෙරාලද, මේ වීදියෙන් ආ මුදලිවරුද, ආරච්චිවරු සහ තවසිය හැත්තෑවක් හමුදුවද ඇම්බැට්ටයාද, රදවාද, මෙකී සේනාව සමග ඇවිත් මුදලිවරුත් ආරච්චිවරුත් ඇතුළුව මහ හමුදුව සටණට මුණ පෑවාය.

(දෙස්තර් ඇන්ඩ්‍රියස් නැල් මහතා විසින් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙන් පිටපත්කර ගන්නා ලද ලිපියකින් උපුටා ගන්නා ලදී. මෙය දැනට කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කර තිබේ. සිළුමිණ 1 සහ 8 දිනයන්, නොවැම්බ 1936.)

මෙහි සඳහන් විජේරත්න කුරුකුල සූරිය, මුදලි සහ සෙම්බර් ආරිය තුරෙයි, කුරණ අඩප්ප උන්නැහැ කියන මුදලිත් ඔවුන්ගේ ආරච්චිවරු පසළොස් දෙන ඇතුළු හා සේනාවත් රාජසිංහ රජුගේ පසට වාසි ඇතිව කොස්තන්තීනු ද සා ට විරුඩව වැල්ල වාසේ රන්දෙනියේ, (රණ දෙනිය) වෙලේදී සටන් කළ බැව් විශ්වාස තර්ක ලැබේ.

"ලංකිත උසස්ම පවුල් වලට අයත් වූද කොළඹ ඉපිද ක්‍රිස්තියානිය වැළඳ ගත්තාවූද, ප්‍රතිකාල් ජාතික ප්‍රධානීන්ට නෑ සබඳ කම් ඇතිව සිටියාවූද සවදේශිකයන්වූ මුදලිවරු සතර දෙනෙක් මෙකල අප (ප්‍රතිගීසි) යුධ හමුදාවේ නිල ධාරීන්ව සිටියෝය.

A හතර කෝරලේ කල්ගමුවේ ඉලංගසිංහ පෙලපත. B ඉරණසිංහ රජුව, සිංහ අවතාරය ගත් විෂ්ණු විසින් මැරුවේය. එවක් පටන් විෂ්ණුව, ඉරණසිංහ, රණසිංහ, නරසිංහ යන නාමයන් ඇති උන්තේය.



ඔවුන් කෙරෙහි කොස්තන්තීනු ද සා බොහෝ විශ්වාස වත්තව සිටියා පමණක් නොව ඔවුන්ට සැලකිලිමත් වෙමින් ඔවුන් හා කිට්ටුවර සබඳ කම්ද පැවැත් විය. යුධ කටයුතු පිළිබඳ ඔවුන්ගේ අවවාද අනුශාසනයන්වද ඇහුන්කන් දුන්නේය.

මේ මුදලිවරු සිව් දෙන අපේ (ප්‍රතිකාල්) පක්ෂයේ යුධ භටයින්ගේ අණ දෙන සේනාවියන් වශයෙන්ද සිටියෝය. දොන් ඇලික්සෝ, A දොන් කොස්මෝ, B දොන් බැල්තාසර්, දොන් තියඩෝෂියෝ යන නාමයන්ගෙන් පෙනී සිටි ඉහත සඳහන් මුදලිවරු සිව් දෙන අප'තර හැදී වැඩී එක්පස්ව සිටියේ වී නමුත් මහනුවර රජ හා අපට විරුඩව කුමන්ත්‍රණ යකද යෙදුනෝය.

යථෝක්ත සිව් මුදලින් නිසා (ප්‍රතිකාල්) අප පක්ෂයේ විනාශය සම්පූර්ණ යෙන්ම සිදුවිය.

අවසාන වශයෙන්ම කිය යුතුව තිබෙන්නේ "කලු වෝ (සිංහලයෝ) සියලු දෙනාම අපගේ සතුරෝ බවය."

(රොබයිරෝ ඉතිහාසය 96 පිට.)

A "හේවාගම කිඩන්පලගෙහි සිද්ද නයිදේගේ පුතා කොළඹට ගොස් ධම්පාල රජ්ජුරුවන් දැක විජයසේකර මුදලි නමුත් ලැබ කොළඹ ඉඳගෙන නානායක් කොටුම් කොටා නැතක් හිර අල්ලා ගෙන"

(රාජාවලිය, 66 පිට)

B "රාජසිංහ රජුගේ සේනාවෝ දොන් බල්තාසර් නැමැති මුදලි කෙනෙකු යටතේ සටන් කළහ. මහනුවර රජ විසින් ඒ මුදලිට කියන නම "සීත කෝරල බණ්ඩාය" (සීතා කෝරලේ බණ්ඩා ය) මොහු කොන්ස්තන්තීනු ද සා ජනාධිපතියාගේ සෙනෙවියෙකි. රන්දෙණියේ යුධයෙහිදී සිංහල රජුගේ පක්ෂයට ගිය මුදලිවරුන් සතර දෙනාගෙන් එක් කෙනෙකි.

වැල්ලවායේ ''රත්දෙණියේ සිංහල පෘතුගීසි සටනේ දී දොන් කොස්මෝ විජේසේකර මුදලිගේ ප්‍රධානත්වයෙන් විසූ පෘතුගීසීන්ගේ පක්ෂයේ සිංහල හමුදාව ද සිංහල රජුගේ පක්ෂය ගෙන කොස්තන්තීනු ද සා ඇතුලු පරංගි හමුදාව සහමුලින් විනාශ කරණ ලද්දේය."

''අ ඟ ර කර කර ගොසින් උඩරට බඹර ගහ කඩවතේ දී
දු ඹ ර ඉර හඳ පෑව්වාසේ දිව්ස් ලා වැද සිටි ය දී
බ ඹ ර ගිස් ගෙඩි කපත්තාසේ කැපූ ඔළුගෙඩි එතන දී
ද ඹ ර හැරුනේ පරංගින්ගේ වැල්ලවායේ මෙලේ දී''

මේ සම්බන්ධ මුඛ පරම්පරාවෙන් පැවත එන
පැල් කවියක්.

"උඹ වේ රටේ මෙහල් පිට කාවල් හි ටි යේ
හූ වේ හඩට රෙක්වුනි සේනා කැ ටි යේ
ගෝවේ දස්ස සේනා රත්දෙණි පි ටි යේ
කෑ වේ රිස්ස යනතුරු ගිනි වෙඩි වැ ටි යේ

## දළදා ගම්වෙල සටන

පෘතුගීසීන් හා දළදා ගම්වෙල ඇතිවූ සිංහල සටනේදී දෙවන රාජසිංහ රජු පරාජයවී පෘතුගීසි සේනාව ලුහු බැඳ එන අතර මහ කුඹුරේ පළිහ වඩන රාල, රජ තුමා හුද කලා කොට තුමූ තැති ගෙන පළිහ මුදා දමා අතිකූත් සිංහල මුදලින් හා පලා ගියෝය.

එවිට පළිහ වඩන රාලට, ''අත ඇත්තත් නොදුවයි'' රජසිංහ රජ අන කෙලේය. එහෙත් ඔහු පන බියෙන් පලා ගියෙන් ඔහු කෙරේ කල කිරුණු රාජසිංහ රජ ඔහුට පවරා දී තිබුන මහ කුඹුර නැමැති වෙල් යාය, රඹුක්පොත



රදලවරයෙකු ලවා කිත තෙල් ඉස රජුගේ වචනයේ ප්‍රකාර නිත්ත කරන ලදී. නොහොත් මහ කුඹුර අඹිමියට පත් කෙලේයි*

මීගමුවේ මහ ගොමෙරත්දේරු කියන මුදලි තැන ප්‍රතිකාල් පස සේනාව හා පෙරමුණ යුද පිණිස එනුයේ හුදකලාව පළිහ මත හුන් රාජසිංහ රජු, දූක සතුරන් ගෙන් මෙරජ විනාශයට පත් කලේවී නම් ''කෝට්ටේ පැරකුම් රජ දවස තමන් වශීයාව ලත් රාජ ප්‍රතිඥ වලට හානියක් හා රාජ ද්‍රොහි කමක්ද වන්නේයැයි සලකා මාගමින් ප්‍රතුගීසින් රවටා ආපසු ගමන් ගත්හ.

මෙයින් රාජසිංහ රජුගේ පරාජයට පත්වීමට ලංව තිබූ අවස්ථාව දුරුවිය. මීගමුවේ මුදලි වරුන් වන කුරුකුල සූරිය මුදලි සහ වර්ණකුල සූරිය මුදලි මහ ගෝමෙරන්දේරු මුදලි යනාදීන් රාජ පක්ෂික භාවය ඇත්තෝයි තනු දූත රහසින් ලියුම් යවා මීගමුවේ සිටි මුදලි වරුන් සහිත හව හමුදාවද ඔවුන්ගේ අඹුදරු ආදීන්ද උඩ රටට ගෙන්වා ගත

මෙහි පහත සඳහන් ගම්වර හා නොයෙක් තාන්න මාන්නද දෙවන ලදී.

ක්‍රි. ව. 1630 දී රාජ සිංහ මහ රජු වර්ණකුල සූරිය වැල්ලක්කේ මුදියන්සේට මාතලේ මහ දිසාපති තනතුර දෙවිනා. මෙතුමා වඩබැද්ද යන ගම වලව්වේ වෙසෙමින් මාතලේ රට කොරවිවේය. මේ මුදලි තැන වන්දනාමාන කල ස්ථානයට ''ඇත් හොඩ දේවොල'' යැයි කියති. මොහුගේ වලව්ව කැඩී බිඳී ගොස් දැනට නෂ්ටාවශේෂව පවත්නා ස්ථානයට වලව් ගොඩැල්ල යයි කියති.

---

* මහ කුඹුරේ පලිහ වඩන රාලට දෙවෙනි රාජසිංහ රජු ඔහු කළ ද්‍රෝහි කමට දඬුවම් දී මහ කුඹුර නින්ද කරවීම පිණිස එකල සිටි රඹුක්පොත රදල වරයෙකු ලවා මහ කුඹුර හාත්පස කීන තෙල් විසුරුවන ලදැයි'' යන මුඛ පරම්පරා කථාව දියතලාවේ කොස්කණුව වලව්වේ ජ. ඩබ්ලිව්. ඇම්. රත්නායක බණ්ඩාර මහතාගෙන් දැන ගතිමු.

තවද අවස්ථාවක් පැමිණි විට "මහ කුඹුරේ බත් නින්ද උනොත් පිගාමි ඔයේ අල කොළ සහ මිවන කොළත් නින්ද වෙන්නේ නෑ'' යන්න ප්‍රස්ථා පිරුලක් වශයෙන් කියා පැම උනුව උඩුකිද වැසි ඇතැම්හු අද දක්වා කියා ගන්නෝය.

* ක්‍රි. ව. 1634 දී වෙත්තසිංහ පරත කුල සූරිය අදි අරශ නිල ඉට්ටු මහ ගොරෙත්දේරු මහ මුදියන්සේ මහ දිසාව වශයෙන්ද රජ සිංහ රජ මාලිගාවේ මහ අදිකාරම වශයෙන්ද පත් කරගන්නා ලදී. මෙතුමාට දෙන් ලියෝනාඩ් යසිද කියති.

මීගමුවේ වැල්ලේ වීදියේ වර්ණ කුල සූරිය අරශ නිලයිට්ට මුදලිඳාට මාතලේට සැතපුම් දෙකක් පමණ නුදුරින් පිහිටි අඹන නින්දගම් ගබඩා ගම ලැබුනාය.

මීගමුවේ මහ වීදියේ නීලමක්කාර ගොල්ලට ඇලගොමුව කියන ගමත් අඹක් ලැබුනාය. වැල්ලේ වීදියේ මුදලියාට හා ආරච්චිවරුන්ටත් තමන්කඩ, එගොඩ පත්තුව කඩ ඉම් ඇතුලුවම ලැබුනාය.

ඒ හැර නවසිය හැත්තෑවක් හේවා හමුදාවට මාතලේට හැතැප්මක් තරම් නොදුරුව පිහිටි පඹිවිට ඇතුළු ගම් පහ ලොහක් පමණ මාතලෙන් තමන්කඩින් සත් කෝරලෙන් ලැබුනාය.

ඉහත සඳහන් නින්දගම් වලට සන්නස් පත් රාජසිංහ රජු විසින් ලියවන ලද්දේ සෝලංග ශ්‍රී බ්‍රහමණ රාලගෙන් පැවැත ආ හුලන් ගමුවේ සන්නස් රාල මගිනි.

ඒ බැව් "මාතලේ මහ දිසාවේ කඩ ඉම් පොතේ" මෙසේ සටහන් වී තිබේ.

"එම විට හුලංගමුවේ සන්නස් රාල ගෙන්වා සන්නස් ලියවා පඹිවිට බෝ ගහ ගාවට හන්නස් පයිඩ කලහයි; අඹබෙර ලා මුදලිවරු නෙත්නා තුන්දස් අව සියයක් මහ දකුම ගෙන්වා මහ අරමුදලේට ඔප්පු දෙමින් "අනස පොලොව ඉර හඳ පවතිනා තෙක්කට දෙයියෝ බුදුවන්ඩ ත්‍රිමංගලාවේ කොට්ටුව එක මොර දඹු ගහෙන් ඇරෙව්වා විනා මාතලේ දිසාවට මදිය" කියා සැල කෙළේය."

## "රාජසිංහ රජුගේ කුරුකුල රාජ දූතයා"

උතුම්වූ රාජ සිංහ මහා රාජෝත්තමයාණන් වහන්සේගේ ආඥා චක්‍රයෙන් ගල් මඩුවේ රාලත් ජයසුන්දර මුදියන්සේත් හුලං ගමුවේ කළු අඹප්පයත් ඕලන්ද බෙතාවියට

* දෙවෙනි වරටද, මහනුවර අදිකාරම් ධුරයට පත් කරනු ලැබුවේ මෙම කරාවේ, ඹරත කුලසූරිය මහ මුදියන්සේය.



ගොස් ලන්සියා ගෙන්වා සිංහලවිජපට ගොඩ බැස රාජසිංහ දෙවියන්ගේ ආඥා චක්‍රයෙන් කොටු දහඅට බාර දෙමින් සිංහලේට මුර සැමැත්තුවාය.

(මාතලේ දිසාවේ මහ කඩඉම් පොත.)

"පෘතුගීසින්ට පහර දීමට සිංහලේ රජු විසින් ක්‍රි. ව. 1639 දී ඕලන්දයන්ගෙන් ආධාර ඉල්වන ලද්දේය. "රාජ සිංහ අදිරාජයාණන් විසින් "උඩවතුර" නැමැති නැවෙන් *ශ්‍රේෂ්ට පුරුෂයන් තිදෙනෙක් නානාපතිවරු වශයෙන්

* මේ ශ්‍රේෂ්ඨ පුරුෂයන් තිදෙනාගෙන් දෙදෙනෙක් බ්‍රාහ්මණ වංශිකයෝය. අනික් රාජ දූතයා කුරු කුලයට අයත් එකලට හුලංගමුව සමට අයිතිව තුබු පඹිවිට සිටි කළු අඹප්ප උන්නැහේ ය. මොහුට කොළඹ නායිදේ කියා ද ඉල නායිදේ කියා ද ව්‍යවහාර කර තිබේ.

මොහු වනාසි "උඩවතුර" නැමැති රාජසිංහ යුධ නෞකාවේ නියමුවා නොහොත් කපිතන් තැනය.

"වලම් ජේකොබ් කෝස්ටර් ජනාධිපතියා මහනුවරින් පිට වී සැතපුම් බාගයක් පමණ තැන් ගමන් කල පසු කොළඹ නායිදේ නැමැති අයෙක් එතුමා පස්සේ එන බැව් දක්නා ලදී. මේ තැනැත්තා මහ රජුගේ දූතයන් සමඟ වතාවක් බෙතාවියට ද ගිය කෙනෙකි.

ඔහු සමග කළු මිනිසුන් දෙදෙනෙක් ද වූහ. මේ තැනැත්තා පැමිණ එක්තරා ආගම වෙනස් කළ පෘතුගීසි පූජකයෙකුගේ බඩු මගයක් නැතිවූ බව දන්වා, ඒ පූජකයා වෙත සිට ජනාධිපති තැන වෙතට අවුත් සිටින කළු වාලෙකු ඒ හොරකම කරන්නට ඇත කියා ඔහු පරීක්ෂාකර බලන සේ ජනාධිපති තැනට කියා සිටියේය.

"එය ඇසූ ජනාධිපතියා යථෝක්ත වාලා නිර්වස්ත්‍ර කොට ඉහත කී කොළඹ නායිදේ ඉදිරියෙහිම පරීක්ෂා කරන ලද නුමුත් ඔහු වෙත තිබී කිසිවකුත් සම්භ නොවීය.

"මෙයින් කෝපයට පත් ජනාධිපති තෙමේ අධි රාජයා (රාජසිංහ රජ) විසින් තමාට පරිත්‍යාග කරන ලද ගෙල පැළඳ ගෙන තිබුන රන් දම්වැල මුදා එය කොළඹ නායිදේගේ පා මූලට දමා ඉහත කී වාලාට කරන ලද්දේ අයුතු බොරු චෝදනාවක් යයි කියමින් උවමනා දෙයක් ඇත්නම් ඒ දම්වැලෙන් ලබා ගන්නා සේ පැවසුවේය."

"නුමුත් කොළඹ නායිදේ ඒ රන් දම අනට ගෙන මහත් ගෞරව යෙන් ජනාධිපති තුමාගේ ගෙල පළඳා ආපසු නුවරට ගියේය.

(බතාවියේ ඩැග් රිජිස්ටර්)

"විජයපාල කුමාරයා රජුට විරුඬව සැරලි ගසා (රාජසිංහ) රජුගේ හටයන් ගෙන් සමහරෙකු මැරූ බවටද අනුමානයක් නැත. ජූනි 13 වෙනිදා රජු විසින් යුධ හටයන් දේසීයක් හෝ එක සීයක් හෝ පණහක් හෝ සවකීය ආරක්ෂාව සඳහා ආරක්ෂක බල මණ්ඩලයෙන් එවන සේ ඉල්ලා "කොළඹ නායිදේ" නැමැති කෙනෙකු අත ලියුමක් යවන ලද බැව් දැනගන්ට තිබේ. "කොළඹ නායිදේ" වරක් රාජ දූතයෙකු හැටියට බතාවිනට ද යවන ලද්දෙකි."

(බතාවියේ ඩැග් රිජිස්ටර්)

අපවෙත (බතාවියට) එවන ලදහ. ඔවුන් අත අපට දෙන පිණිස ලියුම් දෙකක්ද තිබුනේය. එක ලිපියක් පෘතුගීසි භාෂාවෙන් ලියන ලද්දකි. අනික මලබාර් අකුරෙන් ලියන ලද්දකි. ලියුම් දෙකේම සඳහන් වන්නේ එකම ප්‍රවෘත්තියයි. මේ ලියුම් දෙකද තානාපති වරුන් හා ඔවුන්ගෙනා තෑගි බෝගද අපේ චාරිත්‍රානුකූලව බොහෝ ගෞරව සහිතව පිළිගෙන කියවීමු. උන්වහන්සේ පෘතුගීසින් වනසාලන්ට අදහස් කරගන සිටින හෙයින් නෞකා හමුදාවක්ද පාබල හමුදාවක්ද අපෙන් උදව් පිණිස ඉල්ලා තිබේ."

(බතාවියේ ඩැග් රිජිස්ටර් පරිවර්තනය සිළුමිණ 9. 8. 1931)

## * රාජසිංහ වන්නි කථාව

ස්වස්ති ශ්‍රී සාර විරාජිත ශ්‍රී ලඞ්කෙශ්වර වූ උතුම් රාජසිංහ අප දෙව් ස්වාමි දරුවාණන් වහන්සේ සතුරන් සාද සෙංකඩගල පුරප්‍රවර නගරයෙහි ලංකා රාජ්‍යශ්‍රීයට පැමිණ වැඩ වාසය කරන සමයෙහි කොළොම් පුරය හා මීගමුවද පානකඩවුව ගනේ තැන්නේ කොටුවද කොටිකා පොල කොටුවද යන මේ ප්‍රදෙශ පරංගි හෙවත් ප්‍රතිකාලුන් විසින් යටකර ගන්නා ලදුව

එකල්හි රාජසිංහ දෙවි ස්වාමි දරුවාණන් වහන්සේ අමාත්‍යවරු හා කුමන්ත්‍රණය කොට ප්‍රතිකාලුන් ලක් තුලින් නෙරපනු සඳහා සිංහල සේනා සහිත හත් වරක් යුධකොට කාංදෙන් පහල අඩංගු කර සිටියමුත් මොව්හු නැවතත් යුධාරම්භ කළෝය.

ඉක්බිති රජ්ජුරුවෝ කෝපව මෙසේ සිතූහ. අප වැනි ආඥ රජක්හු පරදේශීන් හා යුධ කොට අප පරාජය ලබමෝ නම් ඇතැම් කලෙක රජදරුවන් අපව නිගා කරන්නෝ වෙත්ද? අපම නින්දා ලබනුවෝ වෙමුද. අපම අභාවයට යායුතු වෙමුදැයි සිතා රජ්ජුරුවෝ තමන් අමාත්‍ය මණ්ඩලයා රජවාසලට ගෙන්වා

---

* පෙනෙන කළු ගඟ එතර වැඩ සිට රුපුන් උන් තැන් බලව බ ල වා
දි ලෙ න රං කඟ අතට අරගන විදුලියක් මෙන් ලෙලව ලෙලවා
කෙ ලි න කෙලියක් ලෙසට සතුරන් කපා දමමින් පලව ප ල වා
ම සි න වා දූක රජසිඟ රජ දුවති රුපුවල් ඉ ර ව ඉ ර වා
(දස්කොන් අදිකාරමගේ "පවන" කාව්‍යය.



මෙසේ විචාරණ ලදුව, එබසට අමාත්‍යවරු සැලකර සිටින සේක් දෙවයන් වහන්ස මෙය අසාවදුල මැනව. මීගමුවේ වෙළඳ මහ මන්ත්‍රිවරු සතුරන් පරදවන යුධයෙහි දක්ෂ වූවත් සතුරන්ට අඩංගුව එක්ව සිටින බැවින් ඔව්හු හා සටන් කොට ජය නොගත හැකියයි සැළ කළෝය.

ඔවුන්ගේ වදනට රජු විසින් අමාත්‍ය වරුනි, මොව්හු රාජ ද්‍රොහියෝද? නොහෙත් රාජ පක්ෂකම් ඇත්තෝ දැයි විචාරනු ලැබූ කල දෙවයන් වහන්ස මොව්හු පෙර සිංහල මහ රජුන්ට පෙරන් පක්ෂවාදී කම් ඇත්තෝ යයි සැලකල කල ඉන්පසු ඔවුන්ගේ නම් ගොත් අසා රහසින් හසුන් පත් හා දූතයන් යැවීය.

ඒ දූතයෝ මිගමුවට ප්‍රවිෂ්ටව හසුන් පත් දුන් කල්හි ඔව්හු හසුන් පත බලා මහත් ප්‍රීතියෙන් පිනා ඔවුන්ගේ ප්‍රධාන මන්ත්‍රිවරුන් ගෙන් සිරිමල් හාමි මුදලි මන්ත්‍රිවරද කුමාරප්පේරු මුදලි මන්ත්‍රිවරද කලිඟු රාල හාමි මුදලි යන මොවුන් තුන්දෙන සතුරන්ට රහසින් විත් අවිස්සා වෙල්ලේ වැඩ සිටි රජ්ජුරුවන් වැඳ සිටි කල්හි,

ඔවුන්ගේ නම් ගොත් අසා මහත් ප්‍රීතියෙන් පිණා ඔබ හා පිළිසඳර කථාකොට හුන් කල්හි මෙසේ වදාරණ සේක් තෙපි සතුරන් හා එක්ව අප හා කල සටනේදී නොප විසින් ජය ලබන නියාව මට සැලවී යයි වදාල බසට, ඔව්හු නොබියව එසේය ස්වාමිනි කීහු. එකල්හි රජ්ජුරුවෝ වදාරණ සේක් දැනුදු තෙපි අප හා කල සටනෙහි තෙපි රාජ ද්‍රෝහියෝ වන්නව් දැයි වදාල කල්හි.

එබසට මොව්හු සිට සැල කරන්නෝ දේවයන් වහන්ස මේ අසා වදාල මැනව. අප ජම්බුද්වීපයෙන් ලක් තුලට බට තැන් පටන් මුතු මී මුතු පරම්පරා ගතව පැවැත ආවාවූ අප විසිනුදු සිංහල රජුන් කෙරේ රාජ ද්‍රෝහියන් නොවූයෙමු. රාජ අපරාධ නොකෙළෙමු. රාජ විපක්ෂ නොවූයෙමු. රාජ කරුණා රාජ පක්ෂවාදී කම් ඇත්තෝ වෙමුයයි සැළ කළෝය.

* ඉක්බිති රජ්ජුරුවෝ මොවුන්ට සතුටුව විශ්වාස බැව් දූත මෙසේ වදාරණ සේක් එම්බල වෙළඳ මන්ත්‍රිවරුනි එසේවී නම් තුඹලාට කැමැති පරිද්දකින් මේ ප්‍රතිකාලුන් අප ලංකා රාජ්‍යයෙන් නෙරපවා අපට ජයගෙන දෙන්නහු නම්,

කැමැති කැමැති වස්තුත්ද කන්දෙත් උඩරටින් මා හැගි ගම් වරද එසේම තනතුරුද පවරන්නෙමියි වදාළ කල්හි, මහබල මන්ත්‍රිවරු ඊට සතුටුව රජ්ජුරුවන් හා ඊට ගිවිසුම් කර ගිවිසුම් පත අත්සන් තැබූ පසු රජ්ජුරුවෝ ගිවිසුම් පත බලා සතුටු වූසේක.

ඉක්බිති මොවුහු තමන් ප්‍රදේශයට හෙවත් ජනපද යන්ට වර ඉල්ලූහ. එකල්හි රජ්ජුරුවෝ වර දුන්හ. ඉක්බිති තමන් ප්‍රදෙශයට හෙවත් ජනපදයට යන්ට වන්හ. මොව්හු ජනපදයට පැමිණ ඒ ජන ප්‍රධාන වරුන්ගෙන්, මහ වීරියේ අමරු මුදලි මන්ත්‍රිවරද, වරුසේකර මුදලි මන්ත්‍රිවරද, කුරුකුල සූරිය මුදලි මන්ත්‍රිවරද, සිංහප්පා මුදලි මන්ත්‍රිවරද, සිරිමල් හාමි මුදලි මන්ත්‍රිවරද කුමාරප්පෙරුම මුදලි මන්ත්‍රි වරද, කලිඟු රාලහාමි මුදලි මන්ත්‍රිවරද, කුරුකුලත්තේරු මුදලි මන්ත්‍රිවරද, සෙතරත් මුදලි මන්ත්‍රිවරද, අධිකාරම මුදලි මන්ත්‍රිවරද, යන මේ ප්‍රධාන මන්ත්‍රි වරුන් එක්ව කථා කොට,

ඔව්හු ඒ ඒ ප්‍රදේශයෙහි සතුරන්ට රහසි ගතුව ඒ ඒ ජනපදයන්හි වැද, කිනම් ජනපද ද යතහොත් කොළොම් පුර, ඇතුල් කොටුව, පිටකොටුව, මීගමුව, මාබෝදලේ, හෙට්පිමුල්ල, එළු පිටිය, හංවැල්ල, රාගම් පත්තුව, දුනගහ

* බා නු කුල පග † පාරද කුල හෙම සොත් සිරිත් රසුදුල ...
දේ නු සර ගබ් පාද පසුර තැන රායසෝ ...
පි නු සම්ර සාගර බැස මුනු සසිරි දිරි තරවර ...
හි නු විජය සිරිවර රජසිංහ භූපතේ ...
ඉ ඳු පංකජ සාදවත් නිති උදුර යස තේජසින් දිසි ...
බි ඳු මංපර වරණ කුම් සිහසේ ...
බ ඳු මිං ජය කේලි දික් යට චන්දුර ගිරි රාජ මෙන් තර ...
තා ඳු තං වර රාජසිංහ රාජතේ ...

(මදහසමාලෙ - පුස් කොළ පොත)

† පාරද කුල = පාරදර් හෙවත් භාරත කුලය —
(110 වෙනි පිටේ අඩෝලිපිය බලනු.)



පත්තුව, කම්මල, නගුරවිල, බම්පතේ, යටිගේන, මාදළුපිටිය තෝප්පුව, බොරගොඩ වත්ත, මිරිස්ස, කොටේවත්ත, දෙහිවල, අහංගම, වැලිගම, බලපිටිය, පැරැළිය, ඉළුක් වත්ත, රත්මලේ, පල්ලේ ගම, පානදුරය, මොරටුව, බෙන්පුර, කතළුව, මහතොර, කෝට්ට ගොඩ, අම්බලම් ගොඩ, කළුතර, බේරුවල, කොග්ගල, මලලගම, තෙල්වත්ත, වතවහල, අම්බලම්තොට, තංගල්ල, කොස්ගොඩ, මාතාවේරිය, කුමාර කට්ටුම, ආරච්චි කට්ටුව, හලාවත, කටුනේරිය, අඹප්පරගම, යන මෙකී ප්‍රදේශයන් හා තොකී තවත් ජනපද වාසීන් ගිවිස්වා.

විශ්වාස බස් දෙමින් යුඩයෙහි දක්ෂවූ හේවා භටයන් ගෙන් නමසිය හැත්තෑවක් පාබල හමුදාව, සියලු දේම අත් හැර දමා හිර කුඹි එක්ක කම්මල් පෝරුවෙන් කෙටේ වත්තෙන් එළු කිච්චි කඩවතින් යන මේම කඩවත් වලින් මෙගොඩ වෙමින් දළද ගම්වල රජ්ජුරුවන් වැඩ සිටි තැනට එළඹ ඌ වැද සිටියේය.

ඊට රජ්ජුරුවෝ සතුටුව කරුණාව ලැබී යුඩොපකරණ දෙන්ට සැලස්සූහ. ඔවුන්ට ලැබුන යුඩ භාණ්ඩයන් මෙසේය.

කඩු තොටි කම් බැඳ කස්තානද ලැබ ලංස පටිස්තානද ලැ බු නා
සත් පලි මුතු කුඩ සේසත් චාමර පංච වණ් වස්ත්‍රා ලැ බු නා
වෙඩිද මුලක්කම් අව් අතු කම්බිලි විසිරි වඩත් තල පත ලැ බි නා
වැඩිය සියලු දේ අඩු නැත සෙතගට රහසිංහ කරුණාවෙන් ලැ බු නා

මෙසේ රජ්ජුරුවන් විසින් මොවුන් කවා පොවා යුඩ භාණ්ඩයන් දෙවා සන්නාහ සන්නඩ කරවනු ලැබූ කල්හි රජ්ජුරුවන් වැද සමුගෙන සිංගාරන් පතුරුවා සුගඳුරු පවීන සමීපයෙහි සාගරනාදයක් මෙන් යුඩඝෝෂා පතුරුවා මහා පාතුවිය පැලි යන්නාසේ මහත් යසෝ තේජස් පතුරුවා රඟ වත්තෙන් පිටත්ව චතුරසේ අතුර නොදී සතුරු සේනාව

එදවස් පාත කට්ටුවේ කොටුවට වැද ඔවුන් තල්ලුකර එහි රැකවල් ලවා එහි සතුරන් මැද්ද නොදන පරිද්දෙන් මුර තබා එයින් නික්ම කොටිකාපොල කොටුවට වැද

ඔව්හු තල්ලුකර එහි රුකවල් ලවා එයින් තික්ම ගතෝ නැත්තේ කොටුවට වැද එහි සිටි බල සතුරු සේනාවට පහරදී ඔවුන් එතැන්හි, මන්ත්‍රී පාබල සේනාව,

මහත් බල පරාක්‍රම අගවා එහි මහත් සටන්වී ප්‍රතිකාල් වරුම පරාජය වූවෝය. ඔවුන් එයින් පලවා මීගමුවට වනි.

* ඉක්බිති රාජසිංහ රජ්ජුරුවන්ගේ යුධයෙහි සැරැසී සිටි පාබල සේනා හමුදාවට ප්‍රීති මගුල් ලවා ඔවුන් කවාපොවා සිත් සතුටු කරවා සන්නාහ සන්නද්ධව අහස ගුගුරුවන් නාසේ තූර්‍ය්‍ය ඝෝෂා වෙඩිමුලක්කම් ශබ්ද පතුරුවා මීගමු-වට ගියෝය.

මොවුන් මීගමුවට ප්‍රවිෂ්ටවන්ට ප්‍රථම මීගමුවේ ගෘහවාසී දිළිඳුන්ට බොහෝ හිරිහැර කළෝය. රජ්ජුරුවන්ගේ සේනාවෝ මීගමුවට එන කල්හි කොටුව හැර පලාගොස් කොළොම් පුරයට වනි. එහි සැඟවී හුන් ප්‍රතිකාළුන්ගෙන් එකසිය හැත්තෑවක හිස් ගහ දමන ලද්දේය.

ඔව්හු මුළු සිංහාරම් පතුරුවා කොළොම්පුරයට පිල් පත්හ, ඉක්බිති මොවුන් මුළු දියත සේනා සහිත වූවාසේ කොළොම්පුර රුකවල් ගත්හ. එකල්හි එහි සිටි සතුරු සේනාවෝ සිංහයන් දුටු කැනහිළුන්සේ ඇතුල් කොටුව පිට කොටුව විවෘත කරමින් හිස් ලූ ලූ අත දිවන්ට වන් කල්හි බොහෝ ප්‍රතිකාලුන්ගේ හිස් ගහදමන ලද්දේය.

මුදලිවරු මෙපරිද්දෙන් මහත් ධෛර්‍ය්‍යයෙන් ප්‍රතිකාළුන් හා සටන්කර ලක් තුලින් තෙරපා හැර මුළු ලංකා රාජ්‍යය අයත් කරදුන්හ. භූවිලෝක පුරන්දර උතුම්වූ රාජ සිංහ දෙවස්වාමි දරුවානන් වහන්සේ සතට කඳුලින් ප්‍රීතින්

---

*"අ ඳු රු  දුහුලි සඳු උලැහි කුලිනිගත රජ රජසිංරජ උදහ  ස් ඒ
සි ඳු රු  නොහැර රණ දෙරණ නොහැර තුරු විදුරුඅයුරු
මුත සැර වැ  ස් වී
සි ඳු රු  ගුගුල සෙනහඹිහි රුදුරු රතවතුර පබල සමුදුර පල ස් වී
රුඳු රු  සතුරු මිත්වතුර අතුරතුර තලත සෙනග පලකල රුස් වී"
(මදහසමාලේ)

"න ත ඹා  රුපු රදුන් ඔද සිඳ හල දුර  ම
ස සො ඹා  යසිත එකසත් කරපු දෙරට  ම
ම හ ඹා  රජසිහ රදවඳත ඇත අ[illegible]  ම
සා ල ඹා  සයුර සුරසෙත් වෙහෙසුතේ කි  මා"
(පවත)



පිණා ඔවුන් ළඟට කැඳවා ඔහු උරට හසාන ලා රජ මුතින් සුරතල් වඳන් දෙවා රන් පට බැඳ තන් තනතුරු දෙවා ගම්වර දෙවූහ.

මෙහි කවියක්.

ගි ත්  දරසෙ මුදලින් මුන  ලා ලා
සු න්  කර ප්‍රතිකාළුන් මුණ  ලා ලා
ඉ න්  යස කරුණා උන්ට ලැ  බී ලා
ර න්  පට බැඳගත් දෙවා ව  දූ ලා

මෙසේ මොවුන් මහත් ධෛර්‍ය්‍යයෙන් ප්‍රතිකාළුන් හා සටන් කොට සිංහල දෙවි මහ රජානන්ට ලංකා මුළු රාජ්‍යය අයත්කර දුන් ඉක්බිති රජ්ජුරුවෝ සිංහාසනාරූඪව වැඩ හිඳ ප්‍රධාන මුදලිවරුන්ට හඬගා රජ අභිමුඛවූ කල්හි.

මහ වීපිගේ අමරා මුදියන්සේද, සිරිමල් හාමි මුදියන් සේද, කුමාරප්පේරු මුදියන්සේද, අදිකාරි මුදියන් සේද කුරුකුල සූරිය මුදියන්සේද, චන්ද්‍රසේකර මුදියන්සේද කළිඟු රාලහාමි මුදියන්සේද, ගජනායක මුදියන්සේද, ඒක නායක මුදියන්සේද, සිංහප්පා මුදියන්සේද, කුරුකුලත් තේරු මුදියන්සේද, සෙනරත් මුදියන්සේද, වණී සූරිය මුදියන්සේද, බාලසූරිය මුදියන්සේද, අඩප්පරවරුද, හේවා හටයින්ද, ආරච්චිවරුද, කොඩිකාර වරුද,

රජ්ජුරුවන් සමීපයට පැමිණි කල්හි මෙසේ වදාරණ සේක. එම්බා මුදලි වරුණි, අප මෙරහ වත්තෙහිදී, පර සතුරන් හා සව මසක් සත් වරක් අප කළ සටන්හි තුඹලා ඒ සතුරන්ට ආධාරෝපකාරයෙන් සිටියෙන් ඔව්හු ජය ලැබුවෝය.

දැනුදු තුඹලා හා අප අතරේ ගත් සටන්හි සතුරන් පරාජය කොට ලංකා මුළු රාජ්‍යයම අප ලදුයේ වේදැයි වදාරා අප ගිවිසුම් ප්‍රකාරයෙහි ගිවිසුම් පරිද්දෙන් එය සැපියට මාගේ මේ රාජ්‍යය තුලින් තුඹලාට කැමැති ප්‍රදෙශ ජනපද යෙක්හි වාසය කරවියයි අවසර ලද්දේය.

සිරිමල්හාමි මුදලිහාමි සිටා නොබියව සැලකරණ සේක් දේවයන් වහන්සෑ අතරතුර නිතර සතුරන්ගෙන් වියවුල් වෙන බැවින් එය වලකනු සඳහා මමද මුහුදු බඩ පහල රට වැල්ලක්කරේ හෙවත් වැල්ලක්කේ මහතෙර දෙවුන්දර මොරටුව ගාලුව අම්බලංගොඩ,

පානදුරේ, කොස්ගොඩ, පැපිලියාන බලපිටිය මුන්මාදන, කතළුව, අහංගම, වැලිගම, අම්බලංතොට, මිහිරිපැන්න, තංගල්ල, කුරුව, ඇම්බතොට යන ප්‍රදේශයන්හි විසීමට වර ඉල්වීය."

(රාජසිංහ වත්ත කථාව)

සිරිමල්හාමි මුදලි තුමාට වලල්ලාවිටි කෝරළය බද බෙංතර ප්‍රදේශය සතුරන්ගෙන් වන වියවුල් වලක්වන අටියෙන් වරප්‍රසාද දී රාජසිංහ රජුවිසින් දෙවා වදුරණ ලදී.

සිරිමල්හාමි මුදලි තම අඹුදරුවන්ද ඔරු පාරු දැල් යනාදියද සියල්ලගෙන ගොස් බෙංතර පදිංචි විය. මේ දක්වා ඒ මුදලි තුමාගෙන් පැවත එන පරම්පරාවට ඔරු පාරු දැල් යනාදිය අයිතිව තිබෙනවා පමණක් නොව තවමත් ඔව්හු වෙළඳ වංශිකයෝයයි ප්‍රසිද්ධව සිටිති. එහෙත් මොව්හු මීගමුවේ කුරුකුලයට අයත් වානිජ වංශිකයෝයි, නොහොත් සලුප්පර්වරු වෙති.

"SALUPPER. සලුප්පර් Woollen Drapers (of Kurukulam) (ලෝමයෙන් වියනලද රෙදි වයී විකුනන වානිජ ගෝත්‍රය. ඔව්හු කුරුකුලයට අයිතිය.")

(කාසිචෙට්ටි ගැසටියර් පොත. 232 පිටුව. ක්‍රි. ව. 1834 මුද්‍රණය.)



A பரதர் - (පර්තර්, පරදර්, බරතර්,) Merchants - Paravars
පරතර්- වෙළෙන්දෙ - පරවරු.

(Jaffna, Tamil & English Dictionery. P 264)

පරතර්, බරතර් හෙවත් භරත වංශිකයෝ, පරවරු බවත් ඔවුන්ට වෙළඳ වංශිකයෝයයි ව්‍යවහාරවන බවත් මෙයින් අවබෝධවේ. භරත වංශය කෞරව නොහොත් කුරුවංශය බව සැලකිය යුතුයි.

## අවුරුදු 220 කට පෙර

## අක්ත කඩදාසියක පිටපතක්

"ලන්සි ආණ්ඩුවට රට බාරගන්ට යෙදුන කාලේදී මානුවෙල් දි අන්‍රාදින් වංශාධිපති ජනෙල් හොප්ස් උන්නාන්සේ විසින් ලංකාව එම ආණ්ඩුව යටතට අත්කරදීමේ යුධයේදී කරන්ට යෙදුනු හොඳ වැඩ රාජකාරිය නිසා මතු කී එදන්නා මුදලි තානතරට පත්කරන්ට යෙදුනා ඇත.

A செட்டி — Chetty, cast of Merchant..
සෙට්ටි (හෙට්ටි) චෙට්ටි, වෙළඳ වංශය

'මලල බණ්ඩාර සහ ආ අයගෙ සෑ ටි
තාලන් විරිදු නොවිලෙට පැවත ආ සෑ ටි
සන්බ කාද එළුමල් බඳින අය දු ටි
සතර දෙනෙක් ආවලු පරවර හෙට් ටි"

සිරිමත් සිංහලුන් ගෙන් වියවුල් බොහො ම
තෙලිඟත් බාස දන්නෝ කඩ පිල් එහෙ ම
දූතගත් සිල්ප කරනට පුහුණුව වහ ම
ගුරුගත් තනතුරට දුනු හුනු පයිනෙඩ ග ම"

(මිදෙල්ලව කෝරාලගේ රාජවල්ලිය කාව්‍යය)

"මලලු හෙට්ටි බ්‍රාහ්මණයෝ ගොඩ බැසලා පරන්පරාවයි. ඉන් පසු උඩුවෙරියේ සිට ගොසින් සාලාගම හෙට්ටි කුලම පත්තුවේ සිටියාය. උඩුවෙරියේ සිටිය හෙට්ටියෝ මඩදෙණි පේරුවත් කිනිගම පේරුවත් කඩුගත් බණ්ඩාරගේ, කුමාර බණ්ඩාර නැති උනාය."

එතම්, මානුවෙල් අන්ද්‍රාදි කළුතරට ද ලුවිස් අන්ද්‍රාදි කළුතරට සහ වලල්ලාවිටි කෝරළයටත් අධිකාරම් නිලයට පත්ව සිටියාය. මේ ඇර, ඔවුන් වංශාධිපති කොම්පඤ්ඤයේ යුධ කිපයකටම උපකාර කර තිබෙනවාය. ඉංඩියාවේ සහ වෙනත් ස්ථානවල යුධවලට මානුවෙල්ට ගිල්ඩර්ස් 20 බැගින් මාසෙට පඩි ලැබුනා. ලුවිස් අන්ද්‍රාදි පතාග දහයක පඩි සහ නින්දගම්ද ඇතිව අධිකාරම් කමට පත් කලේ අද්මිරල් වන් හෝවින්ස් උන්නාන්සේ විසින. තවද, වංශාධිපති අද්මිරල් උන්නාන්සේ විසින් යාපන පට්ටනමට යුධයට යවා එයින් ජයගත් නිසා මානුවෙල් අන්ද්‍රාදි සුබල් දූර් කියන නිලයට පත් කලාය.

ලුවිස් අන්ද්‍රාදි කළුතර ඔහුගේ නිලයට පත් කලාය ලුවිස් අන්ද්‍රාදි වෙනුවට ඔහුගෙ මස්සිනාවන ප්‍රන්සිස්කු ද සිල්වාව අධිකාරම් නිලයට වැසියන් යටත්කර පත් කලාය. ලුවිස් අන්ද්‍රාදිගේ මරණයෙන් පසු ඔහුගේ නිලය දහ අවුරුද්දක් ඇබැර්තුව තිබුනා. ඒ අතර, මානුවෙල් අන්ද්‍රාදිගේ බෑනාවන දෙන් මිවෙල් කියන අය ඒ වැඩේට පත් කලාය. ඊන්පසු දෙන් මිවෙල් සෙක්‍රතාරිස් කන්තෝරුවේ තුප්පහි නිලයට ගෙන්නා ගත්තා. ඔහුගේ අධිකාරම් කමට එම අයගේ මස්සිනාව පත්කලා. මේ කාලයේදී මෙම දෙන්නා නැසීගොස් ඔවුන්ගේ නිල අවුරුදු හතක් අටක් ඇබෑර්තුව තිබී අඹගොඩ යන ගමේ පදිංචි ක්‍රිස්තාපල් සිල්වාට අධිකාරම් නිලය පත්කලේ වංශාධිපති ඇම්. ග්ලැන්රි උන්නාන්සේ විසින. ඔහුගේ නිලය ලෙඩක් නිසා අත් ඇරී මැරී නැසියන්ට යෙදුනා. ඉන්පසු එවකට සල්පිටි කෝරලේ කෝරාල යන නිලයට පත්ව සිටිය කළුතර සමර නායක මුහන්දිරම මුදලි කමට පත්කලා, ඔහුගේ වෙනුවට දුමිංගු දි අඤ්ඤාදි අධිකාරමගේ පුත්‍රයා වන මානුවෙල් දි අඤ්ඤාදි මහ විදන කමට පත්උනා. මේක සිඩ උනේ



වංශාධිපති බේකර් උන්නාන්සේගේ කාලයේ දීය. මානුවෙල් දි අන්ද්‍රාදි මහ විදන නිලයට පත්වහිට දෙවනු එයින් අහක් වුනා. ඉන්පසු ඉහත කී ප්‍රන්සිස්කු ද රූද්‍රිගු මුදියන්සේ එම නිලය ලබාගත්තා, වංශාධිපති රොබට් උන්නාන්සේගේ කාලයේදී මරක්කල මිනිසුන්ට අයිති පත්තයක් කැඩුනු කාලයේදී ආඥවලට යටත්නුන නිසා ඔහු, ඔහුව මාරු කරන්ට යෙදුනා. එක් දහස් අටසිය විසිදෙකේ අප්‍රේල් මාසෙ 30 වෙනිද ලංසි භාෂාවෙන් ඉංග්‍රීසියට පිටපත් කළ බවට අත්සන් කර තිබෙන්නේ"

කෝල්මන්.

"වර්ෂ 1707 දී කොළඹ මෝදර කරාවේ සමූහයාට රෙනෝල් දියස් අන්ද්‍රාදි මුදලිකමට පත්කර දෙන්ට අක්ත කඩදාසියේ මේ වගත්තිය තිබේනවා,"

("පාණදුරේ පණ්ඩිත ඩී. ඇම්. ඇස්. ඇස්. ! කවිරාජ තුමාගේ, "කවි කල්ප තරුව.")

(1909 ජූලි කලාපය, 374 පිටුව.)

## කතරගම දේවාලය

(1)

"දෙව්රන් (දෙසිරන්) සහිත කරඬුව වැඩමවාගෙන පෙරහරේ යන්නේ නායක පූජක මහ බෙත්මේය."

"කතරගම සන්නසේ පෙනෙන්නේ මේ ඨානාන්තරය ගෞරව ස්ථානයක වැජඹුන බවය. අධිකාරම් කෙනෙකුගේ පත්වීමේදී පැවැත්වෙන ගෞරව සම්මාන මෙන් දොළොස් ගුනයක සම්මාන මහබෙත්මේ ධුරයට පත්වෙන්නා හට පැවැත්විය යුතුයයි එම සන්නසයෙහි දක්වේ.

"පළමුවරට කතරගම දේවාලයේ මහබෙත්මේ නිලයට පත්වූයේ "හාතිය තිස්ස" නම් කුමාරයෙකි. දෙව් නුවරරාංපට බැඳි කිරිඑතනා කුමාරිහාමි ඔහුගේ බිරින්දය."

"බෙත්මේ ධුරය හා අධිකරණ ධුරයක්ද යන උභය නිලදරුවෙකු කතරගම දේවාලයේ සිටි බව හරණ ගණිතාචාර්‍යවරයා විසින් කියා තිබේ."

"ර ති සු රු රුවින් තැණයෙන් සුරුගුරු සේම
නොමසු රු වම් දෙවන තිළිණනන් සුර දූ ම
එ ඈ සු රු "උබබෙත්ම" අදිකරණැති නාම
මැ ති සු රු බල සිටින සුරකුමරෙකු සේම"

(2)

"දිඝී කාලයක් සුවසේ පසුතරණ පිණිස සහ අන්තරාවලින් ප්‍රවේසම් වෙන පිණිසත් හැඩිදෙමළුත්ගේ කදසුරු කඩා බිඳ ලංකාව එක ආණ්ඩුවක් යටතට ගෙනාවාවූ උත්තම දුටුගැමුණු රජතෙම රුහුණු රටේ තිබෙන මහ කතරගම දේවාලය පලමුවෙන් ගොඩනගා කිරිරුලි සමත් බොක් සල් විහිසන අයිය නාරායන දෙවිවරු සතරදෙනාට කැප කලා ඇත.

කතරගම දෙවියන්ගේ ආබරණ ඇත්හාමි පිට තබා දහඅටවරක් පෙරහැර යනකල ඇත්හාමිගේ දකුණු අංසේ දළයත්තෙනේ ලගින් යන පිණිස මහබෙත්මේ නිලම තුමාට පත්කලා ඇත.

මේ නිලමේ තුමා විජය රජුසමග ගොඩ බැස්ස පෙල පතකින් ආවාවූ "ගෝරහාර්දගම" සිටිය බාතියතිස්ස කුමාරයාය. ඔහුගේ භායඝාව දෙවුන්දර කරාව ගෝත්‍ර රං පටබැඳි කිරිඑතනාය.

පොසොන් මස පසලොස්වක ලත් ගුරු දින ශ්‍රී බුධ වර්‍ෂ 1653 (1658) දී සුඩ සුයඝී වංසාභි ජාත මහා රාජාදි රාජ ශ්‍රී සඟබෝධි ශ්‍රී පරාක්‍රම බාහු රජ කරණ 39 වෙනි අවුරුද්දේ ඔටුන්න සහිත ආයිත්තන් 64 ක් පැලැඳගෙන සරසා තිබුන මාතර මාලිගාවේ ආසනේ පිට වැඩ සිට, බාතියතිස්ස කුමාරයාට දෙවියන් වැඩමවන පිණිස මහබෙත්මේ කමටද රංපටබැඳි කිරිඑතනා පෙරහැරේ පෙරටුව යාමට ඇවරිය පඳමද අයිතිකොට පත්ක රණ ලද්දේය".



"පසු කලකදී මහබෙත්මේ නිලම්තුමාට අබය සිංහ වීර වික්‍රම සූරිය (අබසිං වීරවික්‍රම සූරි) පටබැඳි නාමයෙන් රංපත්‍රය ලියවා දෙන ලදි. පිටපත්කලේ ගිරුවාපත්තුවේ දෙන් ජුවානිස්ද සිල්වා අභයසිංහ වික්‍රම සූරිය මහවිදානෙන්ගේ ඉල්ලීම පිට වර්‍ෂ 1744 ඔක්තෝම්බ්‍ර 3 වෙනි දින මාතර රිජිස්ටර් කන්තෝරුවේ දිය."

## දෙවුන්දර දේවාලය

"මෙ දේවාලයේ ඉහත තිබු විෂ්ණු රූපය අළුත් නුවරට ගෙන ගොස් පසුව දඹුල්ලට ගෙනගිය බව මුඛපරම්පරාගත කථාවකින් දැනගන්ට තිබේ."

"මෙම දේවාලයේ ප්‍රධාන කපුරාලගේ පරම්රාව අවුරුදු 800 ක පමණ පුරාණ බවත් "දෙන් කරෝලිස් අබේ සිංහ වික්‍රමරත්න කොඩිප්පිලි" නම් කපුනිලමේ අටවෙනි පරම්පරාවේ කෙනෙකු බවත් ප්‍රසිඩ කාරණයකි. මොවුන්ගේ මුල් පෙලපත නුවර කලාවියේ වැදගත් පරම්පරාවකි. මහ කපුනිලමේ යටතේ තවත් කපුරාලලා අට දෙනෙක් සිටිති."

"දෙවුන්දර ඉතා පැරණි දේවාලය කතරගම් දේවාලයයි. එහි කපුරාලලා කීප දෙනෙකි. "අන්‍රා හන්නැදි චත්තුහාමි (අන්‍රා සන්නඩ චත්හිමි) කපුරාලගේ පෙලපතේ අයින් පරම්පරාගත කපු ධුරය කරගත ආවෝය. "දෙන් අදිරියන් මහබෙත්මේ" මුහන්දිරම් මහතාද දෙවුන්දර දේවාලයේ නිලමක්කාර පෙලපතින් පැවත ආ පැරණි පරපුරක කෙනෙකි"

"පත්තිනි දේවාලයේ කපුරාලලාගේ පරම්පරාවේ අය පදිංචි ස්ථානයට "පත්තිණි" ගෙදර යන නාමය අද දක්වා ව්‍යවහාර කරති."

(දෙවුන්දර ඉතිහාසය, රුහුණු රට පුරාණ රාජධානි යනාදි පොත්පත් ආශ්‍රයෙනි.)

# චන්ද්‍රසේකර මුදලි

"ඒට ඉක්බිති චන්ද්‍රසේකර යස කීර්ති වන්නි බණ්ඩාර නොබියව සැලකරණ සේක්:-

දේවයන් වහන්ස! මමද කොළොම්පුරය සතුරන් වලක්වනු සඳහා ඔබවහන්සේගෙන් ලබාසිටි නමුත් නිතර විගවුල් වන බැවින් ඒ සතුරන් වලකනු සඳහා සිංහල යුධ යෙහි දක්ෂවූවන් ගෙන්ද ඔවුන්ට සුදුසු අවි ආයුධාදීන්ද මා හැකි ලැඟුම් ඉඩම්ද ඊට සුදුසු පරිවාර අතවැස්සන්දා ලැබෙන ලෙසට සැලකෙළේය.

ඉහට සතුටුව රත්තරනෙන් පේෂ පට වස්ත්‍රයක්ද දෙවා වදුරා දෙවතුත් රන්පට බැඳි "චන්ද්‍රසේකර යස කීර්ති වන්නි බණ්ඩාරයයි කියා නම් පටබැඳ ඔබට යුධයෙහි දක්ෂ මල්ලවයින් පරදවන සරඹ දන්නවුන්ගෙන් සාරසිය හැත් තෑවක්ද ධනු ශිල්ප දන්නවුන්ගෙන් හත්සිය හැටක්ද සෙසු පාබල යුධ හමුදාවෝ එකුන් පණස් පමණද මොවුන්ට යුධ භාණ්ඩයන්ගෙන් කාලතුවක්කු වෙඩි මූලක්කන්.

කඩු, කස්ථාන, ලන්ස, පටිස්ථාන, තෙප්කොත්ත, අඩයටි තෝමර, පාශාංශ, හුම්කම්පා, නාගභාණ්ඩ, චක්‍රඝන සැර, විදුලි සැර පොලිස් ආදි උපකරණ දෙවා වදුරා ඔබට තවත් දස දහසාදීන් ගෙන්ද, ගොවිකමෙහි නියුක්ත වූවන්ගෙන්ද, යකඩ කරණ යමත් නයිදෙලාගෙන්ද, යකඩගෙන කැති, උදලු, වෑ, පොරෝ, ආදි ආවුද කරණ ගුරුන්නැහැ නයිදෙලාගෙන්ද,

පිසන වලාම් කරණ බඩහැල නයිදෙලාගෙන්ද කිතුල්, පොල්, තල්, මල් ආදිය කපා මැද පැනි සකුරු කරන, මදිනා නයිදෙලාගෙන්ද, පැටවිලි කරණ හෙවත් පටවන මතවාල නයිදෙලාගෙන්ද,



ඛෝම කෞෂෙයාදී පට්ට වස්ත්‍ර කපාහිඳි ශ්‍රේහෙකොට ඇඳුම් මසාදෙන අන්නම් චිත්‍ර නයිදෙලාගෙන්ද, පිලි සුද්ද කරණ උන්ගෙන්ද, කුළු වියන ඔලින්ගෙන්ද, සිලි වියන තුන්නවාසිගෙන්ද, නගර සොධකයන්ගෙන්ද, වර්චස් සොධකයන්ගෙන්ද, ඇඳ පුටු පල්ලක්කි, ඉදෙලි, දෙලි, කුනන්, නැව්, පාඩා ආදිය කරණ වඩුවන්ගෙන්ද, උයන් ගොව්වන්ගෙන්ද, මාලා කරයන්ගෙන්ද, හුනු කරන්නවුන් ගෙන්ද,

වෙල්ලි දුරයින්ගෙන්ද, අගවලයින්ගෙන් හා ඇත්වල සින්ගෙන්ද, හිස රැවුල කපා අඳුම් තවන ඇඹට්ටයින් ගෙන්ද, එළු බැටළු ඔටු, ගව මලසමින් වහන් කරන සොම්ම රුන්ගෙන්ද නොකී තවත් දහසාදීන්ගෙන් එක්දහස් අට සිය ගැත්තෑවක් මෙහෙවරයින් දෙවා වදාළහ."

(xii කොණ්ඩත් හේරත් බාණ්ඩාරවලිය, සිළුමිණ
එ: ක; 17. 4. 1938)

# සිංහප්පා මුදලි

"හතළිස් පසේ වන්නි කම තකුනාච්චියා ලබන නිසා රංචි දනුමැති "පටබැඳි මූලාදෑනිවරු" එරියාවේ සිංහප්පා කුමාර සිංහ, මුදියන්සේ කියා පටබැඳ වන්නිකම ලැබුන නිසා එවෙනි මූණු පුරා ලහට එරියාවට ගියාය..........කැඳ දානයට පුද කිරිමැටියාව කිරිබත් දානයට පුද නාකොල ගගේ විහාරෙට පුද,

තංගිහේ වල්ලියේ උණ්ඩියේ රාළ "පවබැන්දන්" විසින් වන්නි කමට කැන්ද ගත්තාය."

(රාජසිංහ රජුගේ යුධ පිළිබඳ විත්ති පොත.)

# කුරුකුල සූරිය මුදලි

"මාතලේ දිස්ත්‍රික්කේ පඩිවිට සහ අඹන ගම්මානයන් සිංහ වික්‍රමත් පළමුවෙනි රාජසිංහ රජු (දෙවෙනි රාජසිංහ) විසින් මුලින්ම මීගමුවේ මහවීදියේ සහ වැල්ල වීදියේ (කුරුකුල සූරිය සහ වරුණ කුල සූරිය යන මුදලිවරු) A කරාවේ මුදලිවරුන් දෙදෙනෙකුට ඔවුන් විසින් කරන ලද යුධකටයුතු සම්බන්ධව සේවය සඳහා එයට විපාකයක් වශයෙන් දානය කරණ ලද බව විශ්වාස කරති.

## * Negombo Mudaliyars in Matale District

Extract from Ceylon Independent, June 11, 1919.

It is generally believed that the village of Padivita and Ambana in the Matale District were originally granted by the Lion hearted King Raja Singha I to two Karawe Mudali's of Maha Veediye and Welle Veediye in Negombo for their distinguished services. Be that as it may, the present Arachchila of Padivita is a good specimen of a descendant of a Karawe warrior Chief of the olden times. I failed in obtaining the authentic account of the two Mudali's in Tamil from the descendants of the Amban family.

† F. E. Gooneratne,
Mohotti Mudaliyar of the Galle Atapattu.

Ceylon Independent, Sept. 14, 1921.

It is worthy of remark that most of the prominent men who figured during the Portuguese and Dutch rule belong to the Karawa (or Kawrawa) class of the Low-country Sinhalees.

I am indebted to a late Kandyan Chief of consequence for the following historical account:—

The illustrious King Raja Singha with the object of capturing the fort of Negombo from the Dutch made an invasion with a large army, and finding that there was every possibility of a defeat, the King went a short distance and viewed the battle seated on a shield (paliha,) The two distinguished Karawa Modeliars of Maha Veediya and Welle Veediya of Negombo on perceiving this went over to the King, made obeisance and volunteered their services, but the King doubting the sincerity of the offer refused; when one of Modeliars drew out his sword from its scabbard, which was tied to his waist by a silk sash, and inflicted a cut on his left arm, and the King was convinced of the sincerity of the offer, and accepted their services. The two Modeliars and their four hundred followers went over to the King and gained a decisive victory over the Dutch.

† වෙළඳ කුලයට අයත් මෙම මුදලි වූකලී ඇඩ්මන්ඩ් ගුණරත්න වැඩ බලපු මහ මුදලි තුමාගේ සහෝදරයෙකි.



"ඒ කෙසේ වෙතත් දැනට පඩිවිට ගම ආරච්චි නිලය දරණතැනැත්තා ඉහතකාලේ කරාවේ නායක යුධ දක්ෂයෙකුගෙන් පැවත එන නියම වීර පුරුෂයෙකු මෙන් පෙනේ.

මේ මුදලිවරුන් දෙදෙනා පිළිබඳ කථාන්තරයේ සැබෑ පිටපත (දෙමළ) අඹනවලව් පේරුවෙන් පැවත එන්නන්ගෙන් ලබාගැනීමට නොහැකි විය."

The two Modeliars and their followers finding it not safe to remain in the Maritime Districts which belonged to the Dutch, begged of the King to accompany His Majesty to Matale. The request was granted, and on their going there each of the Modeliars were given 65 amunams of land in Padivita and Ambana, Matale; which their descendants possess up to this day.

It is believed that there is an old Tamil manuscript in possession of Ambana Mudiyanse's family at Ambana Walauwa, which gives a graphic account of the battle, the journey of the two Modeliars to Matale and other particulars.

F. E. Gooneratne,
Mohotti Mudaliyar of the Gelle Atapattu.
Thombuwe Valauwa, Galle, Sept. 9.

---

The family names still in use in Padivita and other 'sannas' villages colonised from there, are those of the Kurukulasuriya and Varunakulasuriya Mudaliars their ancestors, who must have gone there somewhere about 1650 in the time of Raja Singha II; and were certainly Christians, from the emblems they are found to have taken with them. (15-6-34)

"පෘතුගීසි සහ ලංදේශි කාලවලදී ප්‍රසිද්ධව සිටියාවූ ලාංකික ප්‍රභූවරයින් අතරෙන් ඉතා වැඩිදෙන පාතරට කෞරව නොහොත් කරාව වංශිකයින් වීම සැලකිය යුතු කරුණකි.

පහත දක්වනු ලබන්නේ උඩ රට ඉතාම වැදගත් ජන ප්‍රධාන නිලමෙ කෙනෙකුගෙන් අපට අසන්ට ලැබුනා වූ ඓතිහාසික විස්තරයකි.

කීර්තිමත් රාජසිංහ රජතුමා ලංදේශින්ගෙන් (පෘතුගීසින්ගෙන්) මීගමු කොටුව අල්ලාගන්නා අදහසින් විශාල යුද්ධ හමුදාවක් ගෙන ඒ ප්‍රදේශයට ගමන්කර පෘතුගීසින් හා සටන් කෙළේය. නුමුත් මේ සටනින් ජයක් ලැබීමට කොහෙත්ම අවකාශක් නොමැති බව දුටු රජතුමා මඳක් ඈතට ගමන්කර තම පලිහපිට වාඩිවී සටන සිදුවන ආකාරය බලා සිටියේය.

මේ බව දුටු මීගමු මහවීදියේ සහ වැල්ලේ වීදියේ සුප්‍රසිද්ධ කරාවේ මුදලිවරු දෙදෙනා රජුකරා ගොස් ආචාරකොට රජතුමා වනුවෙන් සටන් කිරීම පිණිස අවසර ඉල්වා සිටියෝය.

"නුමුත් ඔවුන්ගේ අවංකකම ගැන සැක සිතූ රජතුමා ඔවුන් පිළිගැනීමට සතුටු නොවීය. එවිට මුදලිවරු දෙන්නාගෙන් කෙනෙක් සේද පටියකින් තමාගේ ඉනේ එල්ලා තිබූ කඩුව කොපුවෙන් එළියට ඇද වම් බාහුවෙහි කැපුමක්කර ලේ වගුරුවා පෙන්වීය.

එයින් ඔවුන්ගේ අවංකභාවය පිළිගත් රජතුමා ඔවුන් තමාගේ පක්ෂයට පිළිගැනීමට සතුටුවිය. මුදලිවරු දෙදෙනා හාරසියයක් පමණ තමන් සේනාව හා රජුගේ පක්ෂයට ගොස් සටන් කොට ලන්දේශින් (පෘතුගීසින්) පරදවා ජය ග්‍රහණය කළහ."



ඉක්බින්තෙන් ලන්දේශීන්ට (පෘතුගීසීන්ට) අයිතිව තිබූ මුහුදුබඩ ප්‍රදේශයෙහි විසීම තමන්ගේ ආරක්ෂාව පිණිස නොවනබව සැලකූ මුදලිවරු දෙදෙනා හා ඔවුන්ගේ පිරිසද රජු සමග මාතලයට යාමට අවසර දෙනමෙන් ඉල්ලා සිටියාහ.

මෙසේ ඉල්ලනලද අවසරය ප්‍රදානය කරන ලදින් ඔවුන් එහි පැමිණිවිට මාතලේ අසල "පඩිවිට" "අඹන" යන ගම්වලින් අමුණු හැටපහක පමණ ඉඩකඩම් මුදලිවරුන්ගෙන් එක එකාට දෙන ලදින්, ඔවුන්ගෙන් පැවත එන අය මේ වනතුරු එහි අයිතිකාරයින්ව සිටිති.

ඉහතකී සටන හා මුදලිවරු දෙදෙනා මාතලයට පැමිණීමත් වෙනත් කරුණුත් තඹාකාරයෙන් විස්තර කරන පැරණි ද්‍රවිඩ අත් පොතක් අඹන වලව්වේ දැනට සිටින අයින් අත තිබේ."

මීට,
ඇෆ්. ඊ. ගුණරත්න,
මොහොට්ටි මුදලි.
තෝම්බුවේ වලව්ව, ගාල්ල.

(වර්ෂ 1919. 6. 11 සහ 1921. 9. 14 දිනයන්හි පලවූ "ඉන්ඩිපැන්ඩන්ට්" පත්‍රයේ සඳහන් ලිපිදෙකේ පරිවර්තනයෙන් පිටපත් කරගන්නා ලදී.)

## කලිඟු හාමි මුදලි

*කලිඟු හාමි මුදලි හෙවත් ලක්ෂපතිරාල, මොහු මොරටු-වේ ලක්ෂපතියේ පදිංචි විය. ද මෙල්ලෝ හෙවත් ද මැල් පරම්පරාව මෙතුමාගේ පරම්පරාව වෙති. කුරුකුල කඳ-වුරු වංශික යුධ සේනාපතියෙක් කීර්ති නිශ්ශංක මල්ල රජු දවස පොළොන්නරුවේ විසූ බවත්, ඉහත සඳහන් පරපුර ඔහුගෙන් පැවතෙන්නන් බවත් දැනගන්ට තිබේ.

* "කිත් පොලොන්නරු ලක් විජය සිංහ යනු ඉහත නාමය යයි කියති."

පරංගින් හා සටන් කිරීම පිණිස විජයපාල කුමරු හා එතුමන්ගේ මලනුවන් වන දෙවන රාජසිංහ රජු යන දෙපල විසින් රක්ගහ වත්තට රහසින් කැඳවනු ලැබූ පහත රට හතලිස් අට කෝරළයන් බඳ සිංහල ජනයා අතුරෙන් බොහෝ දෙනෙක් කුරුකුලයට අයත් යුධකාර වංශික යෝය.

මිරිස්සේ කොඩිප්පිලි සහ වැලිගම ගුරුනාන අප්පුහාමිල්ලා ද දෙවුන්දර විජේඅෛරු උන්නැහෙලා ද මෙයින් සමහරකි. මේ පරම්පරාවල් සම්බන්ධව පුරාණ පොත්වල සඳහන් කරුණු මෙහි බහාලීම යෙහෙකැයි සිතමු.

345 "යසින් දිගු කල එ ලි
තද යුදට සිත් නොපැකි ලී
කියා මිග බස් දි ලි
* අප්පුසාමි තමා කොඩිප්පි ලී

* හිමි රඹුක් වැල් ලේ
සාළු නාම් නමු දුල් ලේ
අප්පු සුම්පුල් ලේ
කියා හෙසා මිගරණ ලවුල් ලේ

දුනු විල සිරිම නා
ජ්ඣනායක මැති නා
හට නදන සිරි නා
අප්පුහාමි රුචින් රණ නා

(අළුදෙනියේ කිවිඳු)

ක්‍ෂත්‍රිය වංශයන් පැවතෙන රඹුක්වැල්ලේ රදළ පරපුරට අප්පුහාමිලා යනුවෙන් පෙරදී ආමන්ත්‍රණය කර තිබේ.

"ඉඳුරුව පියස ග රූ
අදිකාරි මැතිඳුට සු රූ
සහ ජාත සිරි දූ රූ
අප්පුහාමි කියා මිහසු රූ"

"පියස හිමි කොරනෙනා ට
අප්පුසාමි මහතු ට
යසනිඳු සිරින් සි ට
කියා වහසී මහත් විකුම ට"

"ගිරාහම අදිප ති
නායිදේ නාමින් යුත් මැ ති
පරංගින් සර සැ ති
සාපා සුනු විසුනු කර ජය ග ති

(අළුදෙනියේ කිවිඳුගේ රාජසිංහ වර්ණිනා ප්‍රශස්තොල පොත.
කෞතුකාගාර පොත්, නො. 69. 1. 7)

රදල වරුන්ට අප්පුහාමිලා කියාද, ඔවුන්ගේ සාන්තාවුන්ට හාමිනේලා කියාද, නායිදේලා කියාද, නාච්චිරේලා කියාද ගරු වශයෙන් සිංහල රජුන් දවස ව්‍යවහාරව තිබුනා බව මෙයින් පෙනේ.

"නාච්චිරේ = සාමාන්‍ය ක්‍ෂත්‍රියෙකුට වඩා උසස්ව යෙදෙන උප නාමයක්"

(රොබට් නොක්ස් 147 පිටුව)

"නායිදේ සහ නාච්චිරේ" යනු ගරු සහිත නාමයෝයි.

(මාරම්බේ රටේ මහතා)



346 වැද යුදයට තුමු ල්
ඇතලා රුපුන් මෙර තු ල්
සත් සවියෙහි උදු ල්
හිසා රන්ගෙන අතුනු බඩවැ ල්"

329 "වැලිගම් පුර පසි දු
ගුරුනාන නම් වති ගි දු
හට නදන සිරි ද දු
කියා වහසී එමැති තැන දු"

(අලුදෙනියේ කිවිඳුගේ රාජසිංහ වර්ණිනා මහා කාව්‍යය.)

තවද ඈ.ජේ. ජී. ගුණරත්න ගාල්ලේ මොහොට්ටි මුදලි තුමා විසින් ලියන ලද Dutch Times පොතේ 79 වෙනි පිටේ මෙසේ කියා තිබේ.

"මිරිස්සේ කොඩිප්පිලිවරු වනාහි සිංහල රජුන්ගේ යුධ හමුදාවල කොඩි කාරයෝ ය" යනුයි.

කෝරාලලාට පාවඩ එලා ඇඳිමට අවසර තිබේ. නුමුත් සාඩු හෝ (පා මේස්) පාද ජාලා පළඳින්ට වරම් නැත. .........කෝරාල වරුන් ළඟට ඇති උසස් අය නම්, අප්පුහාමිවරුයි.........මොව්හු නගරයට පැමිණි විට ඇඳිනගත හැක්කේ ඔවුන්ගේ පිටිපසින් තල් අත්තක් ඔසවාගත ගමන් කරනා සේවකයා ගෙන්ය."

(ජ්වෙයිට්සර්ගේ ලංකා කථාව - සිළුමිණ පත්‍රය 25. 10. 1931)

"සැතපෙනගේ අප්පුහාමිලා සහ වාසල අප්පුහාමිලාත් උඩ රට ඉතාම උසස් රලදවරුන් අතරෙන් පත් කර ගනු ලැබේ. වාසල අප්පුහාමිලා රජ වාසල මහා පිළිවෙලවත්, සැතපෙනගේ අප්පුහාමිලා රජතුමා නිදනකාල එතුමාගේ ප්‍රාණ ආරක්‍ෂා කිරීමටත් බැඳී සිටිති."

"දහඅට වෙනි ශතවරුෂයේ සිටි සිංහල රජුන්ගේ සැතපෙනගේ අප්පුහාමිලා වුකලී, උඩුවේ රඹුක්පොත රදල පේරුවට අයත් අප්පුහාමිලාය. එකල උඩුවේ රදල පවුල් කෙරෙහි සිංහල රජවරු බොහෝ විශ්වාස වන්තව සිටි බව දැනගන්ට තිබේ."

(Dutch Times පොත.)

"වලගම්බාහු ලෝක පුරන්දරයාණන් වහන්සේ දශ-රාජ ධර්මයෙන් රාජ්‍ය ශ්‍රී කාර වදාරණ කලට ශ්‍රී මහා බෝධීන් වහන්සේ සමග ගොඩ බැසපු අෂ්ට දක්ෂ මුදලි පරම්පරාවෙන් පැවත ආ තැනැත්තා පටන් එම අෂ්ට දක්ෂ මුදලියාගේ මුණුපුරු වූ "විජේශේරු" මුත්තවෙට්ටු පෙරුමාලුම් යන තනතුරු ලැබී."

(මාතලේ දිසාවේ මහ කඩයිම් පොත)

මෙම පරම්පරාවෙන් පැවත එන අය දෙවුන්දර ආදී පළාත්වල අද දක්වා සිටිති.

## වංනි ආංඩුකාරයෝ

"හලාවත දිස්ත්‍රික්කේ කඩුපිටි මාදම්පේ කුරුකුලත්

1 අරශත් සූරිය වන්නි උන්නැහේ,
2 මුත්තම්වන්නි උන්නැහේ,
3 ඇසියන් පුල්ලේ වන්නි උන්නැහේ,
4 පාලන් වන්නි උන්නැහේ,
5 කුමාරප්පෙරුමාල් වන්නි උන්නැහේ

යන වන්නිවරු පස්දෙනෙක් මුන්නේශ්වරම් දේවාලයෙන් පලමුවෙනි කම් පවත්වානන මීගමු තෝප්පුවේ පටන් කුදිරමලේ කන්ද දක්වා වන්නි කම් කලින් කලට කර තිබේ.

එම වන්නි පේරුවෙන් පැවත එන බොහෝ උදවියත් කඩුපිටි මාදම්පේ වන්නිවරු යන නාමයෙන් නුවර කලාවියේ, මහපොතාන කෝරලේ, රඹපොතාන, කෝන් වැව කොක් එබෙ, සහ තවත් ගම් කීපයක පදිංචිව සිටිති.

ඔවුන් මීගමු මහ වීදියේ කෞරව වංශිකයෝ ය. දැනට ඔවුන්ගේ නෑදෑයෙක් වන හලාවත තිඹිල්ලේ ආඩි අප්පන් සූරිය වන්නි උන්නැහේ ළඟ තිබෙන පුරාණ ලියවිලි වලින් මේ කාරණා දැනගතිමි.

(වඤ්ඤ කුල මාලාව, 4. 5. පිටු)



මේ කුරුකුලයට අයත් වන්නි පහ සම්බන්ධව දස්කොන් අදිකාරම්ගේ "පවත" නැමැති කාව්‍යයේ මෙසේ සඳහන් වී තිබේ.

"හවමිණි වොත් කිරුළු පලන් ආරිය කෝරල කුම රු
භුජ බල යු ත් පංනා පස්වෙනි සහ දහඅට වන්නිව රු
මතුරද ගෝ ත් රජසිහ නිරිඳුගෙ සිරිපා සියපත මිහ රු
කර කර ම ත් දෙස සිටිනේ ගෙන මාහැගි නන් වග පඬුරු"

("බෞ" පිටුව)

එම කවියේ ගැනෙන වන්නිවරු විසිතුන් වගීයාගෙන් "පස් වන්නිවරු" හා "දහ අට වන්නිවරු" කොටස් වයකින් හැඳින්වේ. මින් පස් වන්නිවරු විශේෂයෙන් ඔව්හු කෞරව වංශිකයෝ ය. දහඅට වන්නිවරු වනාහි වඤ්ඤ, සූරිය, සහ මුක්කර ගොතිර වලට අයත්හු වෙති.

"මොවුන් හට පරාක්‍රමබාහු රජ්ජුරුවන් ගෙන් වැදි කම් එපා කරමින් වන්නි මුදියන්සේලාය කියා තරුණාව, ලැබුණාය."

(රාජසිංහ රජුගේ යුධ විත්ති පොත, සිළුමිණ 20. 11. 1938)

වැදි වංශය රජ වංශයෙන් ප්‍රභේද වූ ගොත්‍රයක් බව නීති නිඝණ්ඩුවෙන් ප්‍රකාශ වේ.

## කුරුකුල ප්‍රභූ කුමාරයා

"දෙවෙනි රාජසිංහ රජු ලන්දේසීන්ට විරුද්ධව ඇරඹූ සටන් විලදී "කොකිල්" පළාතේ පට්ටන් කට්ටි තැනැද (පටබැන්ද නොහොත් කරාවේ ආණ්ඩු කාරයා) රජුවෙනුවෙන් ඉදිරියට ගොස් යුධ කටයුතු සංවිධාන කෞශල්‍ය. (මෙම කුලවත්තයෝ ඔවුන් පදිංචි ප්‍රදේශය ඔවුන්ම ආණ්ඩු කරගනු ලැබුවෝය.)

"ඔවුන්හට ඔවුන්ගේම ගොතිරේ අධිකාරම්වරු සහ මුදලිවරුනුත් ඇතිව සිටියෝය."

(පෝල් ඊ. පීරිස් මයා ගේ පෘතුගීසි ඉතිහාසය
කාණ්ඩ I, 500 කාණ්ඩ II, 454)

"අනුරාධ පුරයෙන් දවස් දෙකක ගමන් ගියවිට සිංහල රජුට හෝ ලංදේසින්ටත් යටත් නැති ස්වදේශික කුමාර යකු විසින් ආණ්ඩු කරණ......රාජධානියකි.........ඔවුන්ට කොසිලන් වන්නියා නැමැති ඔවුන්ගේම කුමාරයෙක් සිටී. හෙතෙම කන්දේ නුවර රජුටවත් ඕලන්දයන්ටවත් යටත් නැති මෙසවරි ආණ්ඩුකාරයෙකි.

ඕලන්දයෝ ඔහු යටත් කරගැනීමට යුධ කළහ. නුමුත් ඔවුන්ට එය කල නොහැකි විය. මහරජ සහ මෙම ප්‍රභූ කුමාරයා මිත්‍රය. දෙදෙනා ලියුම් ගනුදෙනු කරගනිති.

කලකදී මහරජු ඕලන්දයන්ට විරුධව යුධ හමුදාවක් යවද්දී ඒ හමුදාවට තම රට මැදින් යන්නට ප්‍රභූ කුමාරයා ඉඩ දුන්නේය. තෙමේද පුද්ගලිකව ගොස් යුධ කටයුතු සංවිධාන කෙළේය. ඔවුන් විසින් ඕලන්ද කොටු දෙකක් අල්ලා ගන්නා ලදී."

(රොබර්ට් නොක්ස්ගේ ලංකා ඉතිහාසය 222, 246)

මීගමුවේ ජයවීර බණ්ඩාර හෙවත් මන්නපෙරුම මුක වෙට්ටි විසිදහසක් හටසේනාව මීගමුවෙන් රැස්කරගෙන දෝනා කතරිනා කුමරියගේ පස ගෙනගිය බවත් විමල ධර්ම සූර්ය රජුගේ ව්‍යාජ ලිපියක් කාරණකොට නෙත සව්සා විසින් ඔහුව මරණ ප්‍රාප්ත කළ බවත් මේ නිසා මීගමු සෙබ ලුන් සියල්ලෝම පාහේ විමල ධර්ම සූරිය රජ පස ගෙන සව්සා ඇතුළු පරංගිමුල සිඳ දෝනා කතරිනා කුමරිය විමල ධර්ම සූරිය රජුට අල්වා දි උඩරට රජයෙහි උරුමය සම්පූර්ණ යෙන් තහවුරුකර දුන්නෝය.

මේ නිසා මීගමු සෙබල මූලට තමන්කඩ මන්නම්පිටි යෙන් අඹක්ද මන්නම් පෙරුම මූකවෙට් නමින් නින්දගම් කොට දෙවණ ලදී.



"වෙණ්ඩු කී ආදිත්‍ය, *වෙඩුමල් ඉට්ටන්, මන්නපෙරුම මූකවෙට්ටි නම් ජයවීර බාණ්ඩාර කෙරෙහි හතුරු දෙලොස් හමුදාව භාරව සිටි අනපත්තුවේ ආරච්චියා, ඉහත සඳහන් නින්දගම දුන්නාට ඊර්ෂ්‍යාවෙන් කියන ලද කවක්.

"හ න් තානේ කෙල්ල අත බැඳ දුන්නා ට
ම න් නම් පිටිය ගම්වර නොපි ලැබුවා ට
කොහොන් කානම් පයිය උමර බැඳ ගත්තා ට
ම න් නම් පෙරුම් අණ්ඩර වලියකි උට"

මන්නම් පිටියේ ගම්වැසියන් දෝනා කතරිනා බිසව විමල ධර්ම රජුට පාවාදුන්නේ ඔව්හු යයි අදත් වාගාඩම්බර බෙනති.

## ජාපනේ කෞරවයෝ

### නොහොත්

### ජාපනේ කුරුකුලය

උත්තර ඉන්දිය කුරු දෙසින් දක්ෂිණ ඉන්දියාව කරා පැමිණි කුරු රැටියෝ එහි නා නා ප්‍රදේශයන්හි පදිංචි වූවෝය. මෙසේ පදිංචිවූ කුරුකුල නොහොත් කෞරව ක්ෂත්‍රිය වර්ගයා ක්‍රමක්‍රමයෙන් ඔවුන්ගේ මාතෘ භාෂාව අත් හැර ද්‍රවිඩ භාෂාව භාවිතා කිරීමට පමණක් නොව ඔවුහු සිය නම් ගොත් පවා ද්‍රවිඩ ව්‍යවහාරයන් අනුව සකස් කර ගැන්මට පුරුදු වූහ.

එමෙන්ම ඉහතකී වර්ගයා ලක්දිවට පැමිණ සිංහල මිනි සුන් හා ආශ්‍රයට හා පදිංචියට පත්වීමෙන් පසු සිංහල භාෂාව කථාකරන්ටත් ස්වකීය නම්ගොත් සිංහලයන් අනුව ව්‍යවහාර කරන්ටත් වූහ.

---

* "රාජසිංහ රජ්ජුරුවෝ සොළි රටින් ආ "වෙඩුමල් ඉට්ටන්ට" සමුදුවක් භාරකොට "මන්න පෙරුමා මූකවෙට්ටි" යන නම් කුන් දී සඳපාත් දුන්නටත්, ගල්බඩ කෝරලේටත්, ඉමතුරේ කඳුරු ගහ රුප්පය යන තැන අනිකුත් පඩන්තලවරුන් කැටුව වාඩිලා ගෙන උන්හ."

(අලකේශවර යුධය, පු. කො. පොත - කෞ. පු. කො: AP/4)

වෙණ්ඩර්මා ඉට්ටන්, වෙඩුමල් ඉට්ටන්. යනු "අරගත් සූරිය" යයි ඇතැම් අය කියති.

එහෙත් මීගමුව, හලාවත, මාරවිල, මන්නාරම, ජාපනය යානාදී පළාත්වල වාසය කරන කෞරවයෝ දමිළ භාෂාවම භාවිතා කරන්නෝය. ඔවුන්ගෙන් ඇතැම්හු සිංහල ද්‍රවිඩ භාෂාවයම එකාකාරව කථාකිරීමට හා ලිවීමට සමත් තෝය.

මන්නාරම, ජාපනය යන ස්ථානවල පදිංචිවූ සියල් ලෝම ද්‍රවිඩ භාෂාව හා ද්‍රවිඩ නම්, නොත්, ඔවුහු පළපුරුදු කරගෙන ආ පරිද්දෙන් ම දක්වා භාවිතා කරති.

නාමත්කඩුව පළාත් බද ඇතැම් කෞරවයින් පිළිබදවද කිය හැක්කේ මෙයමය.

කෝට්ටේ හවෙනි පරාක්‍රමබාහු රජුන් දවස ජාපනය යටත්කර ගැනීම පිණිස "සපුමල් කුමාරයාගේ (සෙම්බුග පෙරුමාල්) මෙහෙයීම පිට යුධ හමුදුවන් රාශියක් ජාපනයට යවා එරට, සිංහල රජු විසින් යටත් කොටගෙන "සපුමල් කුමාරතෙම" එහි යුවරජ කෙළේය.

මේ කාලයේ කුරුකුල යුධ හමුදුවන් ජාපනේ රජුගේ පක්ෂයටද සපුමල් කුමරුගේ පක්ෂයටද එක්වී සටන් කළෝය. ඈත අතීත කාලයේ පටන් ජාපනේ රජවරු කුරු කුලෝත්තමවරු සහ වරුණ කුලෝත්තම් නැමැති ප්‍රධානීන් යටතේ ඔවුන්ගේ යුධ හමුදුවන් තැබ්බවූ බව ජාපනේ ඉතිහාස පොත් වලින් දක්නට ලැබේ.

හවෙනි පරාක්‍රම මහරජ ද කෞරව යුධකාර සේනාව ජාපනයට හෙවත් නාගපට්ටලමට ඇතුල්ව ජාපනය ජය ගත් බැව් මෙසේ විස්තර කර ඇත්තේය. මෙම සටන සිදු වූයේද හවෙනි පරාක්‍රමබාහු රජතුමාගේ ආඥාව අනුව බවසැලකිය යුතුයි.

"නැවත නාගපට්ටලමට (යාපන) යුධයට ගියාහ. ඉන් හතළිස් දවසක් සේවාකම් කරණ වේලාවට මානික්ක තලවෙන් කියන නීලමක්කාර උත්තැයේ සේවා කමින් වැටුනාය."



"එයින් දෙමස් පෝයක් සේවාකම් කරමින් නාග-පට්ටලම ඇල්ලුවාය. මෙයින් දෙදුස් අටසියයක් (කරාවේ යුධකාර) සේනාව වැටුනාය, නැවතත් මේ කොටු දෙකේ තිබුන රතු කොඩි දෙකත් මේ කොටු දෙකේ නීලමක් කාරයින් දෙදෙනාගේ තරම් දෙකත් දක්වාපු තැනේදී (හවෙනි පැකුම් රජු) බොහෝසේ සතුටු සන්තෝස වී,

වදුරමින් ගත්වර ලැබීමට උතුම් මහවාසලින් දෙවා වදල පනතයි."

(දෙස්තර් ඇන්ඩ්‍රියස් නැල් මහතා විසින් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙන් පිටපත් කළ ලිපිය සිළුමිණ 1. 11. 36)

* මාණික්‍ය තලෙයි වෙන්දර් (මැණික් ඔටුනු කුමාරයා) හෙවත් මානික්ක තල වෙන්ද නැමැති මෙම කුරුකුල හෙවත් කරාවේ කුමාරයාද ඔහුගේ යුධ හමුදුවද ජාපනේ රජු හා යුධයට ගොස් ජාපනය ජයගත් බැව් මෙයින් මනාසේ අවබෝධ වේ.

එසේ නමුත් ජාපනය දිනා උතුරු පළාතම හවෙනි පැරකුම්බා රජුව යටත් කරදීමේ ගෞරවය සිංහල ඉතිහාස කරුවන් විසින් තනිකරම සපුමල් කුමාරයාට පමණක් පිරි නමා ලියා තිබේ.

මෙම රණසූර කෞරව සේනාපතියන් සම්බන්ධව ගාල්ලේ ඇෆ්. ඒ. ගුණරත්න තෝම්බුවේ මුදලි තුමා විසින් "Ceylon Independent" පත්‍රයේ පළකළ ලිපියක කොටසක් මෙසේය.

---

* මාණික්ක කුමාරගේ, මාණිකගේ, මාණික්ක බදුගේ, මානික්කු සන්නද්දිගේ මාණික්කු සේවාගේ යන පෙළපත් නාමයන්ගෙන් පෙනී සිටින කුරුකුලයින් වනාහි "මාණික්ක තලවෙන්ද" ගෙන් පැවත එන පරම්පරාව වශයෙන් විශ්වාස කරනු ලැබේ.

"මාතික්ක තල වෙන්ද නැමැති සේනාධිප තැන යුධයෙන් ජයග්‍රහණය කරගත් නමුත් ඒ සටන කෙරෙන අතර එයින් මරුමුවට පත්විය."

මොහු ගැන කාශිචෙට්ටි ගැසටියර් පොතේ 157, 276 පිටුවලද එහි සඳහන් පියර්ස් නැමැති ග්‍රන්ථකරුවෙකුගේ පොතේ 466 පිටුවේද මෙසේ සඳහන් කර තිබේ.

"වැදි අරශන් සේනාපති තෙම සහ ඔහුගේ මුක්කර සේනාවත් මෙහි සේන්දුවී වැඩි කලක් යත්ට ප්‍රථම මෙම ප්‍රදේශයේ දක්ෂිණ භාගයේ විසූ ගම් ප්‍රධානියෙක් වන මාතික්ක තලෛවෙන් නැමැති කරාවේ ප්‍රධානියෙක් හා සටන් කිරීමට සිදුවිය."

"කෞරව නැමැති මිනිසුන් වර්ගයක් අපට විරුඩව සටනට පැමිණියේයැයි මුක්කරන් විසින් කියන ලද්දේය."

"මුක්කර යුධ හමුදාව පරාජය කොට පුත්තලම පරාක්‍රම බාහු රජහට අල්ලා දුන්නේය. නමුත් 1545 ෆේ අවුරුද්දට පමණ පසු සිංහල රජේකුගේ අවසරය ඇතිව මුක්කර වර්ගයා ඒ අසල ප්‍රදේශයෙහි පදිංචි විය."

(කාශි චෙට්ටි ගැසටියර් 281 වෙනි පිටුව)

"සංග්‍රාමයන් ගෙන් ජය ගෙනදුන් කෞරව ප්‍රධානීන්ට මීගමු විදි සියල්ලම නින්දගම් වශයෙන් පවරා දෙන ලද්දේය. රාවණා කොඩිය, ඉර හඳ කොඩිය, මකර කොඩිය යනාදි කොඩි තුනද ඔවුන්ට නම්බු පිණිස ප්‍රදානය කරණ ලදි."

(ඈ.ප්. ජ්. ගුණරත්න තෝම්බුවේ මුදලිතුමන් විසින් ඉන්ඩිපැන්ඩන්ට් නම් පත පලකර තිබුන ලිපියක කොටසකි )



"මුණි ර ද අප වදහල ලෙස කල තිපිටක තෙපල පා ට
කල බ ද තුඟු ගිජිඳුන් ලා බිඳි කන්නඩි පුරක පා ට
මනන ද මිණි බරණ ලකල පැරකුම් රජ හේම පා ට
ව ගු බි ද රණ දරණි මුකර වසිරි රාජ කුලවි පා ට"

(පැරකුම්බා සිරිත 79, කවිය)

හවෙනි පැරකුම් රජ සමයෙහි කන්නඩ සහ මුක්කරුන් සමග සටන්කර ජය අත් පත් කරගන තිබෙන බැව් මෙයින් පෙනේ.

මාන් තෝට්ටමේ ද ගොවිකර්මාන්තයෙන් ජීවත්වෙන කෞරවයින් කොටසක් සිටිති. ජාපනේ වැසි කෞරවයෝ 'කුරුකුලම්" නමින් ප්‍රසිඩව සිටිති.

"ඝෝර යුධයෙන් පරාජයට පත් වැදි අරශන්ට ස්වල්ප කලකට පසු කෞරවයින් හා මුහුදු සටනකට මුහුණ පාන්ට සිදුවිය."

"තුලුක්කුවර් නැමැති සමූහයක් ඔවුන්ගේ ප්‍රධානියා වන මීරා යටතේද මුක්කුවර් සමූහය ඔවුන්ගේ ප්‍රධානියාවූ වැදි අරශන් යටතේද සිටිමින් මුහුදු කොල්ල කාර ක්‍රියා කරන්ට වන්නෝය."

"මේ අතර මදුරෙ රට මනකර්ගේ දියනියන්ට මසන්නගේ පුත්‍රවූ කෝවලන්ට විවාහ කරදීමට නියමු විය. මේ මංගල්‍යයට නාගරත්නයන් උවමනා හෙයින් ඒ බැව් මදුරේ මනකර් විසින් සොළී රජුට දන්විය. සොළී රජ යුධ හමුදාවක් රැස්කොට කුරුකුල සේනාධිපතියෙකු භාරයේ නාගරත්නයන් ලංකාවෙන් ගෙන ඒම පිණිස පිටත්කර එවීය."

කුරුකුල සේනාධිපතියාට සහ ඔහු සේනාවටත් මුහුදු කොල්ලකාර මුක්කරුන් සහ තුලුක්කරුන්ද මුහුදේදී මුණගැසී මහත් සටනක් කරන්ට වීය. මේ සටණෙන් කුරුකුල සේනාපතියා ජයගෙන මුක්කරුන් මඩකලපුවේ ඉලංකෙතකාඩුවට ද තුලුක්කර් වරුන් විඩතල් දීවටද එලවා දැම්මේය.

(බ්‍රිටෝ ලිපි 32 පිටුව)

පූර්වදිග ඉන්දියාවේ පුරවැසි භාවයෙන් සිටි කුරුකුල යුධකාර සේනාවෝ තංජෝර් රාජධානියෙහි රජ තැන්පත් වූ නායික්වරුන්ට සහ ජාපනේ රජවරුන්ටත් යුධ කටයුතු අතින් විශාල සේවයක් කළ බව නිසැකව දැනගන්ට තිබේ.

ක්‍රි. ව. 1618 දී පමණ ජාපනේ සංකිලි රජ්ජුරුවන් විසින් දකුණු ඉන්දියාවේ නායික් රජුගෙන් පෘතුගීසීන් හා සටන්කිරීම පිණිස ආධාර ඉල්ලා සිටිකල යෝතකයින් සහ තවත් අයින් ද ඇතුලු යුධ හමුදුවක් නායික් රජ විසින් ජාපනයට එවන්ට යෙදුනේය.

මෙම යුධ හමුදාවේ මහා සේනාධිපතියාව සිටියේ වරුණ කුලාත නැමැත්තෙකි. මෙහි වරුණ කුලාත යනුවෙන් සඳහන්ව තිබෙන්නේ වරුණ කුල ආදිත්‍ය හෙවත් වරුණ කුලසූරිය නැමැති යුධ සේනාධිපතියෙකු බැව් සැලකිය යුතුයි.

නමුත් දෙවනුව මේ වරුණ කුලාත සහ ඔහුගේ සේනාවෝ යාපනේ සංකිලි රජු හා යුධකල බැව්, ලංකා සිවිල් නිලධාරියෙකුව සිටි, සී. රාසනායගම් මුදලිතුමා විසින් ලියනලද "ජාපනේ ඉතිහාස" නැමැති ද්‍රවිඩ ග්‍රන්ථයේ 124 සහ 125 වෙනි පිටුවල සඳහන් කර තිබේ.

එනම්:- "වරුණ කුලතාන් සහ ඔහුගේ පන්දහසක් යුධ භටයින් ක්‍රි. ව. 1620 දී පමණ ජාපනේ සංකිලි සහ ඔහුගේ මුදලිවරුන් ඇතුලු සේනාව, බරපතල පරාජයකට පත්කර ඒ රාජ්‍යයෙන් කොටසක් අත්පත් කරගත්තා ලද්දේය."



"මීට සවල්ප කලකට පසු ඔලිවේරා (පෘතුගීසි) විසින් වරුණ කුලතාන්ව පරදවන ලදී" යනුයි.

ඉහත සඳහන් දෙමල ඉතිහාස පොතේ 137 වෙනි පිටුවේ මෙසේ කියා තිබේ.

"පසු කලකදී ජාපනේ රජු විසින් "වරුණ කුලතාර්" වරුන්ට "ග්‍රාමතලවර් පට්ටන් කට්ටි," යන නම්බු නාමය දෙවා වදාරණ ලදී" යනුයි.

"ග්‍රාමතලවර් පට්ටන් කට්ටි" යන්නෙහි තේරුම ගම් ප්‍රධාන තලේ පළබැඳි නිලමේ නොහොත් ඔටුණු දැරුවෝ යනුයි.

දහසයවෙනි ශත වර්ෂවලදී කුරුකුල නොහොත් කරාවේ ගෝත්‍රයට අයත් වරුණ කුලාත, නොහොත් වරුණ කුලසූරිය නැමැති යුධකාර වංශිකයින් දකුණු ඉන්දියාවේ සහ ලංකාවේත් යුධ දක්ෂයින් බවට ප්‍රසිධව සිටි බවත් ලංකාවේ සහ දකුණු දඹදිව චන්ද්‍ර සූර්‍ය වංශික රජුන්ගෙන් ගම් බිම් තුටු පඬුරු වරප්‍රසාද ලබා තිබෙන බැව් මෙයින් මොනවට තේරේ.

තවද පූර්වෝක්ත ජාපනේ ඉතිහාස පොතේ 153 වෙනි පිටේ කරාවේ ගෝත්‍රයට අයත් ද්‍රවිඩ ප්‍රධානියෙකුට තොංකොං කෛලාශ පට්ටන් කට්ටි උන්නැහේට ජාපනේ රජු විසින් වන්නි ප්‍රදේශයෙන් නින්ද ගම්වර දෙන ලදැයිද" කියා තිබේ.

මොහු සම්බන්ධව ආචාර්‍ය පෝල් ඊ. පීරිස් මහතාගේ (පරංගි භාෂාවෙන්) ඉංග්‍රීසියට පරිවර්තනය කරණ ලද

The Kingdom of Jafnapatam 1645 "යාපාපටුනු රාජධානිය" නම් පොතේ 9 වෙනි පිටුවෙහි මෙසේ කියා තිබේ.

"මූලාදැනිත්ගේ නඩත්තුව සම්බන්ධව ආදායම් කර ගැනීම පිණිස වන්නි ප්‍රදේශයෙන් ඉඩම් දී තිබේ. මීට හිමි පෘතුගීසින් අතර දොන් පිලිප් කෛලාශ පට්ටන් කට්ටි නැනද කෙනෙකි."

එම පොතේ 13 වෙනි සහ 14 වෙනි පිටුවල මෙසේ කියා තිබේ.

"පෙම්පතී" ගම්වරය ජාපනේ රජුන් විසින් මන්නාර මේ පට්ටන් කට්ටිවරුන්ට (කරාවේ ප්‍රධානීන්ට) තිළිණගමක් වශයෙන් දෙන ලද්දේය.

පසුව මෙය පෘතුගීසින් විසින් එය භුක්ති විඳගත උන් අන්තිමයාගේ උරුමක්කාරයා වන පට්ටන් කට්ටින් මොර් තෝමේ ද මැල්ලෝ ට (තොම්මේ ද මැල්) සපිර වශයෙන් පවරා දෙන ලදී.

එයට ඇතුලත් කොන්දේසිය නම් "ඔහු විසින් අවුරුදු පතා අඩි හතරකට වඩා නොඅඩු අලියෙක් බැගින් පෘතුගීසි ආණ්ඩුවට (කප්පමක් වශයෙන්) සැපයිය යුතුය"යනුයි.

මෙම කරාවේ ගෝත්‍රයේ තොමේද මැල්ලෝගේ පුත්‍රයා වූ නාහි දෙන් ජෝන්ද මැල්ලෝ නම් සෙනෙවියාය. මොහු සම්බන්ධව මහවංශ තෘතීය භාගයෙහි පරිශිෂ්ට සංග්‍රහයේ 97 වෙනි පිටුවේ මෙසේ කියා තිබේ.

"එයින් බෙහෙවින් කිපියාවූ ශුද්ධ දක්ෂවූ ප්‍රතිකාල් ජනයෝ මන්නාරම් වැසි දොන් ජෝන්ද මැල්ලෝ නම් සෙනෙවියාගෙන් උපකාර අයැදියෝය" යනුයි.

"මදුරෙහි රජ්‍යයෙහි රජ්ජුරුවන් වහන්සේට අයත් භණ්ඩාර ගමකින් ලැබෙන ආදායමවූ පතාග 300 බැගින් අවුරුදුපතා මන්නාරමේ කරාවේ ප්‍රධානීන්ට ගෙවමින් තමන්ගේ රාජධානිවල මුතු මෙළඳම ආරම්භ කිරීම පිණිස ඔවුන්ට ආරාධනාකර තිබෙන බැව් පෙනේ."

(Jafnapatam 1645-18 Page.)



ජාපනේ ඇතැම් කුරුකුලයින්ට "පරම්බර්" නොහොත් "පරම්පර්" යන නාමය කියති. එහි අදහස "පරම්පරාකාරයෝ" යන්නයි. භරත රජුගේ පරම්පරාකාර යෝ යන අර්ථය එහි ඇති බැවින් කරාවේ මිනිසුන්ට දෙමළ භාෂාවෙන් එසේ ව්‍යවහාර කරති.

කායිචෙට්ටි ගැසට්යර් පොතේද කුරුකුල මිනිසුන්ට Paramber, (පරම්බර්) සහ Pattanever පට්ටනවර් යන නාමයන් අයිති බැව් 232 පිටුවෙහි කියා තිබේ.

ජාපනේ ඇතැම් කරාවේ මිනිසුන්ට "පට්ටනවර්" යන නාමය අයිති බැව් ආචාර්ය පෝල් ඊ. පීරිස් මහතා ප්‍රකාශ කරමින් එය "පට්ටනම් කරාව" නාගරික කරාව, නොහොත් ජාපනේ කරාව යනුවෙන් හැඟී යන පරිදි උන්නැහේගේ Jafnapatam නැමැති පොතේ 35 වෙනි පිටුවේ ලියා තිබේ.

"පට්ටනවර්" යනු ආණ්ඩුකාරයා වශයෙන් සිටි උතුමා නොහොත් නලල් පට බැඳ සිටි නැනැත්තා යනාදියයි.

එනම්:- පට්ටම් යන තමිල් වචනයෙහි අර්ථ නලලේ පළඳින රන් තහඩුව නොහොත් රන් නලල් පට, අධිපති තිලය, ප්‍රශාද නාමය යන මේ වේ.

පට්ටන් කට්ටි යන වචනයේ "කට්ටි" යනු බැඳීමේ අරුත්හි යෙදෙන "කට්ටු" ධාතුවෙන් සිඩයි. එබැවින් "පටබැඳි" යනුත් "පට්ටන් කට්ටි" යනුත් එකම අරුත්හි යෙදෙන වචන බැව් මෙයින් ප්‍රත්‍යක්ෂයි.

"පට්ට" යන සංස්කෘත වචනයේ තේරුම, රජ, බිසෝ කුමර, සෙන්පති යන අභිජාත ප්‍රභූන් විසින් පළඳින ලලාට පට්ටිය හෙවත් ශිරොවෙෂ්ටනය, කිරීටය යන මේ වේ. රජ යන අරුත්හිද පට්ට නොහොත් පට්ටම් (පට්ටනවර්) යනු ව්‍යවහාර කරති.

"පට්වාර්" හා පට්ට මහිෂි, පට්ටදේවි, පට්ටාභිෂේක යන සංස්කෘත වචනයෝද "පට්ටත් තාණෙ" (මඩගල හස්තියා) පට්ටත් තුණෙරෙ (සිංහාසනයට හෝ උසස් පදවියට උරුමක්කාරයා) "පට්ට වත්තනර්" (රදළවරු) යන තමිල් වචනයෝද ඊට නිදර්ශන වෙති. ප්‍රසාද පට්ට යනු නම්බු නාමයට ව්‍යවහාර වේ.

පට බැඳි නොහොත් පට්ටන් කට්ටි යනු සිංහල රජ කාලයේත් ඊළඟට ඇතිවුන ප්‍රතිකාල් ආණ්ඩු කාලයේත් එවකට සිටිය කුරුකුල රදළවරුන් විසින් උසුලනු ලැබූ උසස් පදවියක් බැව් පෙනේ."

"පට්ටනවර්" යන්නට ආචාර්ය පෝල් ඊ. පීරිස් මහතා විසින් පට්ටනම් කරුව නොහොත් නාගරික කරුව, ජාපනේ කරුව කියා අර්ථ දී තැබීම වැරදි විය යුතුයි.

| | |
|---|---|
| *பட்டணம்* | Town, City |
| පට්ටනම් | නගරය, නුවර |
| *பட்டணத்தான்* | Citizen, Townsman, |
| පට්ටනත්තාන් | නාගරිකයා නුවර වැසියා |

තවද එම පොතේ "පරම්බර්" වෙනුවට පරම්බස්" යයි පරම්බර්" වචනයේ අරුත් සුත්වන වචනයක් 26 පිටුවේ සඳහන් වී ඇත.

| | |
|---|---|
| Periyanati Tevan<br>පෙරියනාටි තේවන් | පෙරිය නාට්ටු කුමාරයා |
| Viramanica Tevan<br>වීර මාණික තේවන් | වීර මාණික්ක කුමාරයා |

මේ අයින් කාංකසන්තුරේ, කට්ටුවන්තුරේ ගම්වල ප්‍රධාන කරුවේ මිනිසුන් වශයෙන් ලියා තිබේ.

(Jafnapatam P; 26. 35)



දමිල බසින් තේවන්, දේවන්, තේවර්, දේවර්, යනු එකම අර්ථයෙහි යෙදෙන නාමයෝයි. මෙම නාමය කුමාරවරුන්ටද ආණ්ඩුකාරවරුන්ට සහ ප්‍රභූවරයින්ටද ව්‍යවහාර කරන නාමයෝයි.

තවද දෙවත්වය සලකා දේවර් යන්න ව්‍යවහාර කරති. මෙහි සිංහල අර්ථය දෙවියෝ යනුයි.

සිංහල රජවරුන්ටද දේවත්වය සලකා, දෙවි, දෙවියෝ, දේවස්වාමි දරුවාණෝ, දේවයන් වහන්ස, යනාදි ගෞරවාර්ථ ආමන්ත්‍රණයන් භාවිතා කළ බව පෙනේ.

කෞරවයෝද දීර්ඝ වර්ෂ කාලයක් මුළුල්ලේ උත්තර දක්ෂිණාදි ඉන්දියා ප්‍රදේශයන්හි ස්වෛරීව ආණ්ඩුකළ ක්ෂත්‍රිය පරම්පරා ඇත්තෝ බැවින් ඔවුන්ගෙන් පැවතෙන බොහෝ මනුෂ්‍ය සමූහයෝ තුමූ, රජ්ජුරුවෝ, කුමාරයෝ, ආණ්ඩුකාරයෝ, යන අරුත්හි සැලකෙන, තේවන්, දේවන්, තේවර්, දේවර්, යන නාමයන් භාවිතා කරත්.

මහා භාරතයේ පෙනෙන අයුරු හින්දුවරු විසින් කෞරව පරපුර දේවත්වයෙහි ලා සලකා තිබෙන බව මනාව ඔප්පුවේ.

සංකිලි රජු ජාපනය පරිපාලනය කිරීමට ප්‍රථම පටන් කරුවේ හෙවත් කුරුකුල දේවර්වරු විසින් මන්නාරම ප්‍රදේශය ආණ්ඩුකර තිබේ. සමහර කාලවල ජාපනේ රජුට පක්ෂව ඒ රජුගේ සතුරන් හා සටන් කිරීමටද එළඹ තිබේ. ඇතැම් විට සිංහල රජුට පක්ෂවද යුධකළ බව දැනගන්ට තිබේ.

පෘතුගීසි කලයේදී මෙහි දේවර්වරු ඇතුළුව ඔවුන්ගේ වැසියන් දහස් ගණනාවක් රෝමානු කතෝලික ආගම වැළඳ ගත්හ. ඉන්නිසා ඔව්හු බොහෝ දෙනෙක් මරණය දක්වා හිරිහැර විඳීමේ දුක්ඛදායක ප්‍රවෘත්තියක් මෙහි පසු භාගයේ පළවේ,

ලංදේසි කාලයේ මන්නාරමේ සෙවරී ආණ්ඩුකාරයාව සිටි (කරුමේ) දේවර් සම්බන්ධව කරුණු ස්වල්පයක් මෙසේය.

"අපට මන්නාරමට මී හරකුන් විශාල ගණනක් ගෙන්නා දුන් දේවර් සමග අපි ඉතා හොඳින් වසමු. ලොකු දළ සහිත ඇතෙකු දෙනොත් තව මී හරකුන් දහසක් (1000) ගෙන්නා දෙන්ට තෙනෙම කැමති විය.

නුමුත් පෘතුගීසීහු විසින් සවදේශීන් අපට වෛෂ කරන්ට පොළඹවති. පෘතුගීසීහු ඔවුන්ට කෘතඥතාවිතව සංග්‍රහ නොකරන්නාහ. ජෝන් ප්‍රේරා පසුගිය (1661) මාර්තු 15 දා එහි යන්නට "කැච්" නම් නැවෙන් පිටත් විය. ඔහුගේ නමත බොහෝ අදහස් පිට රඳා තිබේ.

එහි පදිංචිවීමටද ඔහු බලාපොරොත්තු වෙයි. ඒ ප්‍රදේශයෙන් පෘතුගීසි පූජකවරුන් අස්කරලන්ට පුළුවන් නම් එය ලොකු යහපතකි.........රාජසිංහ රජතුමේ මහළුව දුබලවී සිටී. ඔහුට සවකීය සේනාවන් ගැන දැන් නම් විශ්වාසයක් නැත.

එබැවින් අප සමග යුධයක් කරන්නට ඔහුගේ අදහසක් ඇතිවිය නොහේ. ඒ රජු විසින් වැන්ඩන්බර්ග්ට, රන් දම්වැලකුත් ඇතෙකුත් කොළඹ සිට දවසක් ගමන් ඇති දුර හරියේ ගමකුත් දෙන ලද යයි සමහරු කියති."

(බතාවියේ තිබෙන ඩැග් රිජිස්ටර් පරිවර්තනය. සිළුමිණ)

ලංකා මන්ත්‍රී මණ්ඩලයේ සමාජික අයි. ඇක්ස්. පෙරේරා මහතාට දකුණු ඉන්දියාණ්ඩුවෙන් "දේවන් බහදූර්"* යන ගරු නාමය ප්‍රදානය කර තිබේ. මේ මහතා භාරත වංශිකයෙකි.

* දඹදිව භාරත වංශිකයින්ට "දේවන් බහදූර්" කියාද අනිකුත් හිඳු වර්ගයාට "රායි බහදූර්" කියාද මුස්ලිම්වරුන්ට "ඛාන් බහදූර්" කියාද ගරු නාම ආණ්ඩුවෙන් ප්‍රදානය කරන බව කියති,



| | |
|---|---|
| தேவர் — கள் | Inferior Gods |
| දේවර්—ගල් (තේවර්—ගල්) | දෙවි, දේවතාවෝ |
| தேவன் | God, the Deity<br>Honorific affix to names |
| දේවන් — (තේවන්) | දෙවත්වය නොහොත් නම්වලට සම්බන්ධ කරගන්නා ගරු පදයකි. |

(ජාපනේ දෙමළ ඉංග්‍රීසි අකාරාදිය - පිට, 217)

"The Thevars, who are fine specimen,......Claim to be the Descendants of the Pandyan Kings who were also known by the title "Thevars,"

(E. L. Thambimuttu – Ceylon Daily News, 23-6-39)

මෙහි භාවය නම් :-

"තේවර් (දේවර්) වරු වනාහි පාණ්ඩ්‍ය රජවරුන්ගෙන් පැවත එන්නන් බවට සැලකිය යුතු උරුම කියහැකි කදිම සේනාවකි. (පඩි රජදරුවන් කවරාකාර මනුෂ්‍යයෝද යනු දේවර් වරුන්ගේ ස්වභාවයෙන් ආදර්ශයට ගතහැක) පාණ්ඩ්‍ය රජුන්ද තේවර් යන නම්බු නාමයෙන් පෙනී සිටියෝය."

"වැන්ගල්මස් ගේ පැමිණීමට ප්‍රථම කාලයේ සිට දේවර්" හා අප අතරේ එදිරි වාදිකම් පැවතෙමින් තිබුන නිසා කීලක්කරේ (ලංදේසි ආණ්ඩුවට) සමාගමට අයිතිව තිබුන බඩු ගබඩාව බිඳ හෙලන්ට සිදුවිය.

(කීලක්කරේ) දේවර් සමග මෙසේ අරගල සිදුවීමට හේතුව නම් ඝෝර පුවක් වෙළඳාම විය. මෙය ක්‍රි. ව. 1747 දී සිදුවූවකි."

(Ceylon and Hollanders, 1658/1796)

"ක්‍රි. ව. 1658 පෙබරවාරි මාසයේදී සොල්දාදුවන් හා නාවිකයන් 150 ක ගෙන් යුත් බල සම්පන්න ලන්දේසි පිරිසක් යුධ නැව් නවයකින් මන්නාරම් කොටුව බලා ගමන් ගත්තාය. මේ කාලයේ කොළඹ ආණ්ඩුකාර පදවිය උසුලන ලද්දේ "අඩ්‍රියන් වැන්ඩර් මේඩර්" විසිනි.

......මේ කාලය වනවිට මන්නාරම් දූපත පෘතුගීසි පාලනයට යටත්ව අවුරුදු 68 කි. මන්නාරමේ මුල් ඉතිහාසය සම්බන්ධයෙන් ලියකියවිලිවල සඳහන්ව ඇත්තේ ඉතා සවල්ප තොරතුරක් පමණකි. ප්‍රථම කාලයේදී මෙහි කරාව ගෝත්‍රයේ දෙමල මිනිසුන් වාසය කළ බවත් ජාපනේ රජුට ඔවුන් විසින් සුංගම් ගෙවූ බවත් කියනු ලැබේ.

ක්‍රි. ව. 1543 දී ශාන්ත ප්‍රන්සිස් සාවියෙර් මුනිඳුන් විසින් මේ දූපත් වැසියන් බොහෝ දෙනෙක් රෝමානු කතෝලික සභාවට හරවා ගන්නා ලදහ.

මෙයින් කෝපවූ යාපනේ රජු ක්‍රිස්තු සමය වැළඳ ගත් ස්ත්‍රී පුරුෂයන් හයසිය දෙනෙකුට පමණ දඬුවම් පමුණුවන ලදී.

ඉක්බිති යාපනේ රජුගෙන් මෙයට පළිගැනීම වස් සාවියෙර් තුමා විසින් පෘතුගීසීහු පොළඹවන ලද්දේය. තදනන්තරව 1590 දී ජාපනේ රජුට අයිතිව තුබූ මන්නාරම පෘතුගීසීහු විසින් අල්වා ගත්හ.

පෘතුගීසින් හා මහනුවර දොන් ජෝන් (විමල ධර්ම සූරිය) රජු අතර යුධය පවත්නා කාලයේ දෝනා කැතරිනා බිසව සිරකොට තබන ලද්දේ මන්නාරම් දූපතේය."

(බතාවියේ ඩැග්රෙජිස්ටර් පරිවර්තනය – සිළුමිණ, 1931 ජනවාරි 11)

"මන්නාරමේ පරවර සහ කරාවේ යන කුලවලට අයත් (600) හයසිය දෙනෙක් ක්‍රි. ව. 1544 වර්ෂයේ අගභාගයේදී සවකීය ආගම වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කළහ.



ප්‍රබන්ධ කථාවකටත් වඩා පුදුමවූ එම ජීවිත පරිත්‍යාගය මුළු ලෙව්හිම බල පෑවේය. ඉන්දියාවටත් ලංකාවටත් ක්‍රිස්තියානි ධර්ම දූතයන් එවීමට පෘතුගාලයේ රජතුමා මෙහෙයවන ලද්දේ එ හෙයිනි."

(තූතිකුඩියේ රාජගුරු ප්‍රසාදින් වහන්සේගේ කථාවකිනි. දිනමිණ 27 – 4 – 1945)

"ජාපනේ ඩෙල්ෆ්ට් (Delft) ගම් පෙදෙස විශූ සමාදාන විනිශ්චයකාර සහ නිල නොලත් පොලිස් මහෙස්ත්‍රාත් තැන් පත්වූද මණියාගර් සහ ගම්සභා විනිශ්චය කාරවූද (ගම් සභාපති) පිලිප්පු පුල්ලේ ජෝන් රාජා මුදලි තුමා,

පෙරිය තම්බියාර් නොහොත් දොන් නිකොලොස්, තිස්ස වීරසිංහ මුදලිතුමා. මෙතුමා ලංදේශී භාෂාව ව්‍යක්ත ලෙස කථා බස් කරන හෙයින් (Dutch Mudaliyar) ඩච් මුදලියාර් 'ලංදේශි මුදලි" යයි ප්‍රසිඩ වී සිටියේය.

*දොන් මනුවෙල් තම්බි බුවි රාජසිංහ මුදලි තුමා,

දොන් ජුවන් බුවි රාජසිංහ මුදලි තුමා,

දොන් දියෝ වරුණ කුල සූරිය අරශ නිල සිටිටු මුදලි තුමා "රෙස්පඤෙරූ" නිලමේ.

දොන් සන් ජුවන් පිල්ලේ දියෝවාස් නොහොත් දොන් දියෝවාස්, බුවිරාජ සිංහ මුදලි තුමා,

මේ ජාපනේ දෙමළ මුදලිවරු සියළු දෙනාම එක පවුලටම අයත් නෑ දරු මුණුපුරන් බැව් පෝලන්ත දේශයේ තානාපති තැන්පත් වැන්ඩිසන්ඩන් මහා විසින් ලියන ලද (Chieftains of Ceylon) ලක්දිව ප්‍රභූවරු යන පොතේ 53 වෙනි පිටුවෙහි සඳහන් වී තිබේ.

(කෞතුකාගාර පුස්තක අංක 22/C. 51)

* ඇතැම් අය කුරුම් 10 ක් පරංගි සහ ලන්දේසි ආණ්ඩුවලට ගෙවා "දොන්" නාමය ලබාගත් බැව් වුල්ෆ්ගේ සහ සර් ඇමර්සන් ටෙනන්ට්ගේ ඉතිහාසවල සඳහන් වී තිබේ.

ජාපනේ කෙල්ලි පල්ලෙයි ක්‍රි. ව. 1823 හෝදී විසූ වෙල්ලාල ගොතිරේ දොන් පිලිප් නැමැති දෙමල කිවිවරයා විසින් ලියන ලද "ඥානානන්ද පුරාණම්" නැමැති කාව්‍යයෙහි 10 වෙනි සහ 65 වෙනි කවිවල සිංහල පරිවර්තනය ලුහුඬින් මෙසේය.

"ර ත් ආබරණයකි දීසි කුරුරට මහ රු
දො න් දීගෝ මුදලිතුම කුරුකුල කුම රු"

ක්‍රි. ව. 1720 දී ලංදේශී ආණ්ඩුව විසින් ජාපනේ වරුණ කුල සූරිය අරශ තිලසිව්ට දොන් දීගෝ මුදලි තුමාව ආණ්ඩුව වෙනුවෙන් වැසියන් හා කච්චුතු කිරීමේ "රේස්පදෝරු" තිලයට පත් කරණ ලදී."

(Centenary of Jaffna Cathedral:
Translation Colombo 1906.)

Reswodore — A Parish officer, who Collects Revenue from lands and trees.)

රෙසවදෝරු - ආදායම් පාලක තැන යන අර්ථයි
(දේනවලමෙ (1790) 722 පිට)

## ජාපනේ - කුරුකුල - මුදලිවරු.

අරශ තිලසිව්ට මුදලි, කරෙයි - චූර්
අරශ තිලසිව්ව කතකරායත් මනියාගර්, පේදුරු තුඩු ව
වරුණ කුල සූරිය මුදලි, මන්නාරම.
විසුවන් වීරසූරිය අරශ සේලන් මුදලි,
වණ්කුලසූරිය වන්නියාර් මුදලි, දකුණු කෙලික මූලෙයි.
අරශ තිලසිව්ට කුරුකුල සූරිය වන්නියාර් මුදලි,
පුදුකුඩුඉරිප්පු දිස්ත්‍රික්කය

(ආණ්ඩුවේ කැලන්ඩර් පොත් ක්‍රි. ව. 1817 සහ 1819 කො. පු. නො. 20/ A 2



ශතවර්ෂයකට වැඩි කාලයකට මෙපිට සිටි ජාපනේ කුරුකුල මුදලිවරු මෙහි සටහන් නොකෙළෙමු.

## සන්නඩ පේරුව

කුරුකුලයින් අතර එක්තරා පේරුවකට අයත් අය වළුත්ගේ වරිග නාමයන් හා "හන්නැදි" යන්න සම්බන්ධ කර ව්‍යවහාර කරණු ලබත්.

එනම්:- බමුණු හන්නැදිගේ, වීර හන්නැදිගේ, වරුෂ හන්නැදිගේ, මරක්කල හන්නැදිගේ, පොන්න හන්නැදිගේ, පෙරුම හන්නැදිගේ යනාදි වශයෙනි. මෙහි පහත සඳහන් කරුණුවලින් හන්නැදි යන්නෙහි විස්තර වටහා ගත හැක.

"සන්නාහ සන්නඩව යුඩයට නික්මිත"
"ලතෙව සන්නඩ මනොඥ පල්ලවඃ"

"සන්නඩ ශබ්දයෙන් සන්නද යයි කිදී "සන්නද" (සැරසිමෙන්) යුක්ත තැනන්නා යනඅර්ථයෙහි "ඉ" ප්‍රත්‍යය (ව) සකාරයට හකාරාදේශ හා මාත්‍රාවෘඩි වීමෙන් හන්නැදි" යයි සිඩවී තිබේ."

(කවි කල්ප තරුව, වෂී 1908 දෙසැම්බ සහ 1909 ජනවාරි සහරා කලාප)

හන්නැදි යනු (අවිආයුධයෙන්) සැරසුනු යුධ භටයින් බැව් මෙයින් හැගේ.

# හත්වෙනි විජයබාහු රජ

භුවනෙකබාහු, මහරයිගම් බණ්ඩාර සහ මායාදුන්නේ යන සිංහල රජ කුමාරයින්ගේ ප්‍රාණ ගලවා ඔවුන් ආරක්ෂා කල ජාපනේ කරුවේ පටබැඳි නිලමෙ තුමා.

යසස් ඇත්තාවූ ඒ සත්වන විජයබාහු රජුගේ කාලයේ මෙසේ පළමු සොටම් (රෝමානු) කතෝලික සභාව මෙහි පිහිටියාය.

ඒ විජයබාහු රජුගේ ප්‍රියඞ්කරවූ පුණ්‍ය ලක්ෂණයෙන් ලක්ෂිතවූ රයිගම් බණ්ඩාරය පර රාජසිංහය, භුවනෙක බාහුය මායාදුන්නේය යන නම් ඇති පුත්‍ර කුමාරයෝ සතර දෙනෙක් වූහ.

ඔවුනතුරෙන් ඒ වැඩි මහළු කුමර තෙමේ කුඩා කාලයෙහිම මැරුණේය. අනික් කුමාරවරු තිදෙනා නිතර යස සිත් යුක්තව වැඩුනාහුය. ඒ කුමාරවරුන්ගේ මව් බිසව මළ කල්හි රජතෙමේ (විජය බාහු) අනික් බිසවක් පාවා ගත්තේය. ඕ තොමෝ රජ කුමරුවන් මැරවීම පිණිස කුමන්ත්‍රණය කළාය.

ඒ රජ කුමාරවරු එයදූත භික්ෂුන් සමගද මන්ත්‍රණය කොට සවකීය ජීවිතාරක්ෂාව සඳහා ඒ ඒ තන්හි සැඟවුනාහ.

(මහා වංශය)

සත්වෙනි විජයබාහු රජතෙම තම දෙවන බිසවගේ කුමන්ත්‍රණ වලට රැවටී කාලයාත්‍රා කළ බිසවගේ පුත්‍රයින් තිදෙන මැරවීමට වර පුරුෂයන් යෙදවීය. කෝට්ටේ වැඩ විසූ සිල්වත් භික්ෂූන් සමූහයක් මෙකුමරුන් තිදෙන බොහෝ කාලයක් ආරක්ෂා කලේවී නමුත් බලගතු ඔත්තුකාරයින් කාරණ කොට මෙන කුමාරයින්ගේ ජීවිත අවදානම් තත්ත්වයකට පත් විය.



දෙවෙනි බිසවට මෙසේ කුරිරු අදහසක් පහළ වූයේ තමන් විසින් වදා ගන්නාලද දේවරාජ නම් ලාබාල කුමාරයාට විජය බාහු රජුගෙන් පසු රජකම ලබාදීමේ බලාපොරොත්තුව පිටය. මෙවකට කෝට්ටේ රාජධානියේ බල සම්පන්න නිලමවරුන් වන කඳුරේ බණ්ඩාරන් ඒකනායක මුදියන්සේත් දෙවන බිසවට බොහෝ පක්ෂව සිටි හෙයින් කුමාරවරුන් තිදෙන කෝට්ටේ ප්‍රදේශයෙහි සිටීම බොහෝ භයානක බැව් හැඟී ගිය භික්ෂූන් සමූහය, ඔවුන්ට ජාපනයට පලාගොස් එරජුගේ ආරක්ෂාව ලබාගන්නා මෙන් අවවාද කෙලේය.

බොහෝ රහසින් ජාපනයට පැමිණුන මේ කුමාරයින් තිදෙනාට ජාපනේ රජතුමා හමුවෙනතුරු ලැගුම් සහ ආරක්ෂාව ලබාගැනීමට සිදුවූයේ ඔවුන් මීගමුවේ සිට යාත්‍රා කළ මහ සුළුප්පුවේ ප්‍රධාන බොරලැස්සේ මාලිම පට බැන්ද ගෙන්ය.

## අපොංසු නයිදේ

ශ්‍රී

සක වර්ෂ එක්වාදහස්......................... වර්ෂ.........වෙසක්........අව දොළොස්වක් නම් තිථියලත් ගුරුදින මෙදවස......... නාත්තන්ඩිගේ අපොංසු නයිදේ සිතාවක වැලි මලුවේදී ඇතුං පඩුරු ඔප්පු දෙමිං මූන පෑපු තැනේදී ශ්‍රී ලංකේශ්වර දෙව ස්වාමිදරුවානන් වහන්සේගේ කරුණා දිවස් එලියට........ ...............බොහෝ කරුනා සම්භාරවල් ලැබෙමිං බොරලැස්ස කියන ගමට නඩයිම නැගෙන ඉරෙන් දිය අගාරෙන් මෙපිටත් දකුණු දිගට මගුරුවලෙන් මෙපිටත් බස්නා ඉරට ගිංඹයෙන් මෙපිටත් උතුරු දිගට ආස් දියවලේ දිය බැවු මෙන් මෙපිටත් සතර සඩයින් ඇතුළුව *මුකදෙ රජකාරිය දෙමින් යන මෙකී ගම පවේනි සැලැස්මට බුක්ති විඳිනා හැටියට නාත්තන්ඩිගේ අපොංසු නයිදේට සේන්ද්‍ර කර ලැබෙමින් ත්‍රි සිංහලාදීශ්වර එකච්ඡත්‍ර ශ්‍රී ලංකේශ්වරවූ භුවනෙකබාහු දෙව්.............දරුවානන් වහන්සේගෙන් නාත්තන්ඩිගේ අපොංසු නයිදේට මේ සන්නස............ දෙවා වදාළ දෙව පතනයි.

* මුකදෙ = මුහුදෙ යයි ඇතැම් මතයයි.

කුමාරයින් තිදෙන මුණ ගැසුනු ජාපනේ රජ ඔවුන් තම මාලිගයේ මාස ගාණක් ප්‍රවේශම් සහිතව තබා ගත්තේය. එහෙත් කුමාරයින්ට අනතුරු කිරීම පිණිස කෝට්ටෙන් චරපුරුෂයින් සමූහයක් ජාපනය අසල සංචාරය කරන බැව් දැනගත් රජ එවකට බොහෝ බල පරාක්‍රමයෙන් විසූ ජාපනේ "මහපට බැඳි නිලමේ" තුමාට සිංහල කුමාරයින් තිදෙන භාරදී ඔවුන් බොහෝ ප්‍රවේසමින් ආරක්‍ෂා කරන ලෙස ආඥා කළේය.

ජාපනේ පට බැන්දගේ වලව්වේ කාලයක්ම ප්‍රාණ ආරක්‍ෂාවේ සිටි මේ කුමරුවෝ පසුව ඔහුගේ යාත්‍රාවකින් මීගමුවට පැමිණ කෝට්ටේ සිටි පියරජතුමා මරුදමා වැඩිමහල් කුමරු රජ තැන්පත් විය.

"විජය බාහු එකගෙයි කන අවදියට දෙදෙනාට ජාතකව උපන් කුමරු තුන්දෙනාට අහිමි කොට තමා ඇති කළ දේවරාජ කුමාරයාට රට දෙන්ට ඕනෑ නිසා කඳුරේ බණ්ඩාරත් ඒකනායක මුදලිත් දෙන්නා බස් ගිවිස්සා ඒ රාජකුමාරයින්ට සදියට උසාවිකර යෝජනා කෙළේය. මේ කුමාර තුන්දෙන කිතම්හුද යත් භුවනෙකබාහුය, මහ රයිගම් බණ්ඩාරය, මායාදුන්නේ රජය. මේ රාජ කුමරු තුන්දෙනා තමන්ට සදියට උසාවි කරණ බව දැනලා,

ගණ පන්තියට වැද සැඟවී සිටලා රාත්‍රියේ කරුණාදිපති වාසලින් පිටත්ව බොරලැස්ස පාරේ මීගමුවට ගොස් යාපාපටුන කරුණාධිපතියාගේ ගෙදරට ගොස් වැඩිමහලු රජ දෙදෙනා එහම "පට බැන්දට" භාරකරදී බාල රජ කන්ද උඩරටට ගියේය.

(රාජාවලිය පිටු 52, 53)



## කුරුවෙන්ද්‍ර වෙඩි අරශරන්

"මන්නාරම් දිස්ත්‍රික්කයේ මාන්තෝට්ටම් පත්තුවේ අච්චන් කුලමේ පදිංචිව සිටි ඉදිරි මුණසිංහ රත්න මුඩිකාතන කුරුකුල වච්ච නාච්චි දේවරීර් කෝරාලගේ පියාණන් වන නැසීගිය අච්චන් කුලමේ අදිකාරම් තුමාගේ පරම්පරාවේ මුත්තණුවන් කෙනෙක්වූ පුත්තලම් රට ආණ්ඩු කළ

කුරුවේන්ද්‍ර වෙඩි අරශ නවරතන්‍යාරණි සිංහ සූය්‍ය *වච්ච නාච්චි දේවරීර් තුමාට ශ්‍රී පරාක්‍රමබාහු මහ රජාණන් විසින් යුවරාජ තනතුරට දෙවා වදාළ ශ්‍රී සන්නස් පත්‍රයයි.

ස්වස්ති ශ්‍රීං ස්වස්ති ප්‍රශස්ත ප්‍රසිද්ධ ප්‍රබුද්ධ ප්‍රගාඪ ප්‍රකාශෝල්ලසිත ප්‍රවෘත්ත මූර්ති කීර්ති නිකරම්බර ප්‍රාංශු කදම්බ බිම්බෝත්තුඞ්ග තරඞ්ග රඞ්ග රඤ්ජිතප්‍රති මණ්ඩිත ප්‍රසන්න ජිම්ර හරකර මිහිරශ්‍රැති නිභ්‍රත්සභ්‍ර නිශ්‍ර නිශ්‍රාණාණීණ-වණීණා ස්ඛණ්ඩා ප්‍රබන්ධාණී කීණීණ පුණීණාණීණව ප්‍රතිභාගවූ විවිධ කවි වණීණ වර්ණිත ප්‍රවර හර රුචිරා මෘත කෘත සුකෘත ත්‍රී ගජදඬාර-ධාරිත භීම තර දඨ ඝෝර රණ ශූර කෘාරතර මාරාරිහඞ්කාර සංහාර කණ්ඨිරවාකාරවූ ගම්භීර සඬීර සිඬුර ධෘතිධාර ශ්‍රැතිධාර වෘතහාර හරිහාර යසසාර ගුණසාර සණසාරවූ බ්‍රහ්ද භ්‍රසර සුභ්‍රවර සුභ්‍රතර-විභ්‍රභුජගග්‍ර විබුධග්‍ර ග්‍රහචක්‍ර යසචක්‍ර ගුණචක්‍ර සච්චක්‍ර කකීභිම අකී ප්‍රතිමිත්‍ර සතපත්‍ර තරමිත්‍ර සකලත්‍ර මනොනහ කුම්භ නීමෙහාදනීන කෙශර සිංහ වික්‍රම ප්‍රතාපාලඞ්කෘතවූ තද කුරිරු ගිරි කඳුරු තුරු ගැඹුරු මහසයුරු හර මහරු රුද්‍රතර රිපු භඞ්ග මනරඞ්ග රුචිරඞ්ග තර තුඞ්ග සූර භෘඞ්ග වරබෘන්ද මනනන්ද අරවින්ද සඞ්කාශවූ සුරනාථ නරනාථ සවිනාථ කවිනාථ ප්‍රතිරුඩ රිපුයුඩ කරබඩ වරබුඩ සම්බුඩප් ප්‍රසිඩ බුඩි ශ්‍රී සුඩ බෞද්ධාගම ශිමස්තකප්‍රාප්ත පූජ්‍ය රාජනොත්‍රාති සුප්‍රසන්න සච්ඡද පණ්ඩිත ශ්‍රී පරාක්‍රමබාහු මහ රජාණන් වහන්සේ ස්වස්ති ශ්‍රී ප්‍රවර ගුණරත්නාලඞ්කෘතවූ ශ්‍රී ලඞ්කා දීපචක්‍රවෘතතියට රාජෛශ්වර්‍යයීයෙන් ශ්‍රීලෝක පාලව ප්‍රවර සුන්දරාති ගම්භීර ධීර සාර ගුණයෙන් යුක්ත ප්‍රති ඊශ්වර ද්‍රැමෙන්ද්‍ර රාජයා සරා සිටි

* වච්ච නාච්චි දේවගේ නමින් යුත් පරම්පරාවක් සීතාකෝරළේ කළගෙඩිහේනේ ද සිටිති.

ස්වර්ණාංකුරවත් නිභාසාද්‍රිස්‍යවූ සර්ව ලෝක ශාසනාධාර භූතවූ යුව රාජෝත්තම ශ්‍රී සෞභාග්‍ය අමර මන්දිර ප්‍රතිභාශ්වර භවන ශතසහස්‍රයෙන් සැදුම් ලත් විජයොත්-ප්‍රාසාදය වැනි ශ්‍රී දන්ත ධාතු මන්දිරයෙන් ශෝභමානවූ සකල නගරාඞ්ග ශ්‍රී සමෘද්ධි සම්පන්න ශ්‍රී වර්ධන පුරාසන්න ශෛගි කනක ගිරි ශිඛර නවරත්න ආලෝක විමානාලඞ්කෘතවූ නව මාල ප්‍රාසාද ශ්‍රී රජ මන්දිරයේ පූර්ව භාග නව රණ මිණි රණ තොරන් මධ්‍යමාලෝක ප්‍රතාපවූ සුදම් දෙව් සභාධිපති ශක්‍ර දෙවෙන්ද්‍ර ලීලායෙන් ශ්‍රී පරාක්‍රම නරේන්ද්‍රයාණන් වහන්සේ

ශ්‍රී සිංහාසනාරූඪව මධුමද මුදිත ලලිත රතිකර මනෝහර කුරවීක ශකුනාදයෙන් නිර්විශේෂණ රවානුසාර මධුරෝදාර ගම්භීරධීර ශ්‍රවණීයවූ සූත්‍රාභිධර්මවිනයානුකූලවූ සතර සඟරුවත දශවිධ රාජධර්ම රාජනීති සජ්ජනයාති.

සුප්‍රසන්නවූ ශ්‍රී සනකමල නිම්ලාකුල සකල සාසන තුමූල කෝමල කමලවන විකසිත මාතීණ්ඩ මණ්ඩලාකමානවූ උතුම් ප්‍රවරමෘත කිරණ නිකරාභි රඤ්ජිත සධාරානමානවූ අප උප රාජෝත්තමයාණන් ප්‍රධාන සියළු කාර්‍යයෙහි දක්ෂ විචක්ෂණ පක්ෂපාත සර්ව අමාත්‍ය මණ්ඩලයා අභිමුඛව.

අනේක ගුණ ගණාභරණ විභූෂිත සතත සමලඞ්කෘත ප්‍රඥාසාර සාධුජන මහසමොහ මධ්‍ය මහ සම්මත තත්වයානු පරිදි රාජාසනොත්තුඞ්ග ආත්මාභි ප්‍රතිලාභය සඳහා ශ්‍රී නරේන්ද්‍රානුකූලවූ විසිතුරු වාක්‍ය රාජ නීතිශ්‍රී සත්නසක් ඉදවා වදාරණ ලදින් සර්ව නගරාඞ්ග සකල සමෘද්ධීන් නවමහ නිදනින් යුත් කුරුක්ෂෙත්‍ර වනදී මධ්‍ය දීල්‍ය රම්‍ය පුණ්‍යඞ්ගාත්ම භූමි ප්‍රදේශ ශ්‍රේෂ්ඨ වංශෝත්තුඞ්ග කුරුවරාභිජාතවූ

කෞරවර කරවර පෞරවර පුරුවර කෞමනනායර කාරවර පාණ්ඩවර පරවර කුනතිවර කොරවර යන දශවිධ නාමෝප ලක්ෂිත වූ චන්ද්‍ර වංශ කරාගෝත්‍රයේ කුරුවෙන්ද්‍ර



වෙදි අරශ නවරත්න රණසිංහ සූරිය නාවවු * දෙවරීර් දෙවිසි වර්ෂයක් රාජ ශ්‍රී ෂඩ් සෙනෙවි නිලයාදි වූ බදිර දෙහලි වංශෝද්භූත උත්පල වර්ණ සුමණ කාර්ත්තික විභූෂණ සංඛ්‍යාත සතර දේවාල වල.

දේව සෙනෙවිය, ශ්‍රී බෞද්ධ්‍යාධාර සංඝමිත්තා පරම්පරා-යානුගතයාදි ශ්‍රී මහාබෝධි භාරවූ බෝධි සෙනෙවිය, බුද්ධ ශ්‍රී වර්ණ සූත්‍රාභි ධර්ම විනයාදි තත්ව විජානනීයානු සාරදත් ධර්ම සෙනෙවිය, ශ්‍රී අකාරාදි ඡන්දස්ව්‍යාකරණ ෂඩ්භාෂා ගුණාඪ්‍ය ප්‍රඥානුසාරයෙන් විසදත්තාවූ පණ්ඩිත සෙනෙවියා මහ සම්මත රාජාඞ්ග නීති දත් රාජ ශ්‍රේෂ්ඨාධිකරණ සභා-මන්දිරාදි විසූ රාජ සෙනෙවිය, සර්වරාජ පරද්‍රෝහි චතුරඞ්ග දක්ෂ සේනා භක්ෂණය කරන්නාවූ සේනා සෙනවිය,

යන ෂට් සෙනෙවි ස්ථානාන්තරයට පත් එතෙමයට ශ්‍රී පරාක්‍රම නරේන්ද්‍රයානන් වහන්සේ විසින් අග්‍ර යුවරා-ජාඞ්ගමයට කඩු බැඳ කිරුළු පලඳවා පත්කරණු ලැබූ ඔහුට ගෞරවනීය වූ රාජ භාණ්ඩාරයෙන් මිති පවතිනාතුරු නියම ලෙස තෑගි පිණිස දීමේ ප්‍රධාන වස්තූන් ගෙන් දුන්-නාවූ සුසැට රාජාභරණයක් ද ශාස්ත්‍රාගම දත් සතර ආමාත්‍යයන් ද, පාණ්ඩව ඇතෙක් ද, රිදී ගබඩාවක් ද, රත්රන් ගබඩාවක් ද, මැණික් පාතක් ද, වරාගන් දෙතිස්-සත් ද්‍රෝණයක් ද, රිදී දෝලාවක් ද, කපුර පලඟයක් ද, රජතාසනයක් ද, ශුරම්ව තලපතක් ද, ආලවට්ටම් දෙළුහක් ද, සමක්කට්ටු දෙළුහක් ද, ත්‍රිකාල් සෙව්සියක් ද, වාල් සත්‍රීන් සියයක් ද, වාල් පුරුෂ සියයක් ද, පෙරමුණු සේනා නවසියක් ද, පසමුණු සේනා නවසියක් ද, ශුද්‍රාදි ගොයිකරු රදකරු රන්කරු කපුකරු මල්කරු පෙහෙකරු කුඹුකරු වැදිකරු යන කුල අටක් ද,

* தேவரீர் Your lordship, your Reverence
දේවරීර් ස්වාමීන්ද්‍ර උතුමා, ගෞරවණීය උතුමා සහ .........
(ජාපනේ දෙමල ඉංග්‍රීසි අකාරාදිය. 217 පිටුව

සතර හයරියක්ද දී නැවත ගරු භාණ්ඩාර වසතුන් ගෙන් දුන්නාවූ මූන්නේස්සරම, මාරවිල, තඹරවිල, මට්ටක්කොටුව, පුලියන්දූව, මදික්තොරුව, කම්මල, ආනබිලන්දුව, හුනුපිටිය, කොලොන්පිටිය, පොතාමුල්ල, කුරණ, මීගමුව, පල්ලන්සේනිය, මෝරවුපිටිය, කෙවූපිටිය, කලපිටිය, වැලිපිටියාදී කෝරලේ ගම් නවයක් ද නින්දගම් දහඅටක් ද පවුණුගම් සත්තියක් ද පිදවිලිගම් දෙයාසූවක් ද, බත්ගම් එසියසූසැටක්ද දී රජස්ථාන භාණ්ඩයන් නියමකර නැවැත සූවිසි දෙනෙනක් මරණීය දඬුවමට පත් කරණු කැමැති තිසි රජාංඝ බලය ලත් රාජ ශ්‍රී තලල්පට රත් ශ්‍රී සත්තස විසිරෙබා දශාඬග රජ සත් මුඩුන්සන් තබා නියම ලෙස සිම්කර දුන්නේ.

ශ්‍රී බුඩ වර්ෂයෙන් එක්වාදහස් නවසිය නවපණස් වෙනිව පත් වෙසක පුර දෙපෝ ලත් කුජදින උදයාදී ශ්‍රී පරාක්‍රම ශ්‍රී කස්තයෙන් යුවරජ ධූරය ලැබූ කරාගොත්‍ර දෙවරීර්ද ශ්‍රී සන්තස මේ වැඩුවේ ජයවර්ධනපුර ශ්‍රී වර්ධන මහරජ වාසල දීය.

“දහඅටවෙනි යන වර්ෂයේ මදුරාසි පලාතේ වෙපොක් නැමැති ගම්මානයේ පදිංචිකාර කුරුකුල වංශිකයා තෝමෝත් වරුණ කුල මුදලි නැමැති වෙලෙන්දුට අයිති වෙළඳ නැව් හම්බන් කීපයක් ගැන මදුරාසි මහ උසාවියේ නඩුවක් ඇතිවී තිබේ. මෙම ධනවත් වෙලෙන්ද සිංදු ආගම අත්හැර ක්‍රි. ව. 1799 දී ක්‍රිස්තියානිය වැළඳගත් සෙයින් ආණ්ඩුවෙන් ලබාගත් ඉඩමක පල්ලියක් තනවන්ට අදහස් කරන ලදී.

ඊට ප්‍රධාන කොටම සම්මාදම් මුදල් ලබාගත්තේ නැව් හම්බන් යාත්‍රා අයිති කරුවන්ගෙන් පමණකි. ක්‍රි. ව. 1829 යේදී මෙම දේවස්ථානය සන්ත පීටර්ගේ පල්ලිය නමින් රෝයපුරම් නැමැති නගරයේ තනා හමාර කරන ලදී.



මදුරාසි මන්ත්‍රණ සභාවේ සමාජිකවූද රෝම සභාවේ “වැවලියර්” සිටු තනතුරු ලැබූවාවූද, ප්‍රගාස මුදලියර් චනාකි කුරුකුල වංශිකයෙකි.

තවද ජෙනකශ්‍රීත් විරාජමානවූ නිසාම් රජ තුමාට අයිති නිසාම් ජනපදයේ රේල් දෙපාර්තමේන්තුවේ මහ කලමනාකාර රායි බහදූර් ඇම්. ජේ. රත්න ස්වාමි, මහතාද කුරු වංශිකයෙකි.

“රජිඳුන් කඩු බැඳ කිරුළ පැලැන්දෙව් කුරුවෙන්ද වැදි අරශ නවරත්න රණසිංහ යුවරජුන්ගේ පුත්‍රයා වන රන් පට පැඳි කුරුකුල නාට්ටු බණ්ඩාර ස්වාමිටද ඔහුගේ පිය උරුම තනතුරුවලට පැමිණිය හැකිවිය එනම්:- කතරගම දේවාලය සම්බන්ධ දේව සේනාවිය, තොහොත් මහ බෙත්මේ තිලමේ කම, යනුයි.

මේ පරපුරේ උදවිය දනට තෙල්ගබඩා තිලමෙලාගේ කිනාද සමහරු කෙටි වශයෙන් තේල්ගේ කියාද, පෙලපත් භාවිතා කරති.

මෙකියන ලද මහ බෙත්මේ තිලමේගේ පසලොස් වෙනි මුනුබුරා වූකලී පළමුවෙන්ම ලංකාවේ මන්ත්‍රණ සභාවේ උප සභාපති වශයෙන්, ලංකාණ්ඩුකාර උතුමන් වහන්සේලා දරා සිටි, ආසනය පුදනු ලැබූ ශ්‍රීමත් සර් ජේම්ස් පීරිස් සිටු තුමාය.

පෘතුගාලයේ ලිස්බන් නුවර කෞතුකාගාරයේ තිබූ අලගියවන්න මුකවැටි තුමන් විසින් සකස් කල පෘතුගීසි තෝම්බුවේ පිටපතක් ගෞරවණීය ඇස්. ජී. පෙරේරා පිය තුමන් විසින් ගෙනැවිත් කොළඹ කෞතුකාගාරයේ අඟුළුලන ලද අල්මාරියක තැන්පත් කර තිබුණෙන් අපට මෙයින් බලාගත හැකිවූයේ කුරුකුල නාම දෙකක් පමණකි.

* කොළඹ කෞතුකාගාර පුස්තකාලයේ නො. 7/H 9 දරණ “සොලීවංශ” පේරුව පුස්කොළ පොතේ වෙඩි අරශන්ට සහ ඔහුගේ සේනාවටත් අළුත්කුරු කෝරලෙන් යත්ව නියමවී යයි සඳහන් වී තිබේ. මොහු වෙනින් කෙනෙකි.

එය මෙහි බහාලමු.

1. "දොන් සයිමන් පට්ටන් කට්ටි"
2. "සයිමන් කොරයා පට්ටන් කට්ටි" නොහොත් නයිදෙ අප්පු"

මෙම සයිමන් කොරයා පට්ටන් කට්ටි පිළිබඳව රොබට් නොක්ස්ගේ ඉතිහාසයේ 219 පිටුවෙහි මෙසේ සඳහන් කර තිබේ.

"පෘතුගීසින්ගේ ඊළඟ සෙනවියා සයිමන් කෝරිය (සයිමන් කොරයා) ඔහු සිංහලයෙකු වුවද ක්‍රිස්තියානි කාරයෙකි, ඔහු යුධ දක්ෂයෙකැයි කියනු ලැබේ. ඔහු සිංහල හමුදුවක් පරාජය කොට අල්ලාගත්විට බොහෝ කෲර ක්‍රියා කෙළේය."

## මීගමුව

"මීගමුව දෙදහසක් තරම් ජනකායක් ඇති ප්‍රදේශයකි. එයින් බොහෝ දෙනෙක් ප්‍රයෝජනවත්ය. ඒ බව සහතික කරණලද ලයිස්තුවකින් හමුත්තාන්සේලාට දත්තවා ඇත. ඒ සියල්ලෝම ක්‍රිස්තු භක්තිකයෝය."

"මීගමුවේ මිනිස්සු කිසිද ස්වදේශිකයෙකුවත් වඩා අපට විශ්වාසව සිටී. ආඩම්බරය ඇත්තෝය. ඒ ගැනද සැලකිල්ල ඇතිවිය යුතුයි. ඔවුන් අතර ඉතා හොඳට ඕලන්ද භාෂාව කථාකරන්නෝ බොහෝ සිටිති."

"මේ තාක් මීගමුව හැම බරවලින්ම නිදහස්ව පවතී. එක් එක් අය තම තමන්ට වවාගත හැකි තරම් භූමි බාර ගෙන සිටී. ඔවුන්ගෙන් අය බදු ආදියක් අය කරනු නොලැබේ. ඔවුන්ගෙන් දැකුම් බාර ගැනීම කුදු නැත.

.........මීගමු වැසියෝ අපේ අවසරය ඇතුව මදුරයට සහ චෝර මණ්ඩලයට යාත්‍රා කරන්නාහ."



........."ඔව්හු නිර්භීත මුහුදු යාත්‍රාකාරයෝ වෙති. වැඩි දුරටත් විස්තර දක්වන වැන්ගෝවින් ආණ්ඩුකාරයා, මහනුවර රජු සහ ඕලන්දයන් අතර පැවැති යුධයේදී ඕලන්දයන්ට හිතවත්ව ක්‍රියාකල ස්වදේශින් වගයක් ගැන කරුණු සඳහන් කෙරේ."

"බෙන්තොට අධිකාරම් තැනවූ දොන් කොන්ස්ටන්ටයින් නැමැත්තාට මීගමුවේ මුදලිට වඩා ගෞරව කළයුතු යයිද, ලුවිස් දි අන්දරාදි සහ මානුවෙල් දි අන්දරාදි යන සහෝදරයින් දෙදෙනාද හුස්වාර්ට් ඇඳින සිටියවුන්ගෙන් මුල් දෙදෙනායයිද කියන ලදී."

"මීගමුවේ ජාන් තිසේරු නැමැති අයෙක් වාසය කරයි. හෙතෙම උසස් පවුලක අයෙකි. කාරණා කාරණා තේරෙන බුද්ධිය ඇත්තෙකි. හෙතෙම මීගමුවේ මුදලි සමග වෛරය. මොහුට පණිවිඩ හැර ගෙන්වා ගැනීමට තමුන්නාන්සේට සමහරවිට වුවමනාවේ."

"එම ආණ්ඩුකාර තැන 1675 සැප්තැම්බර් මාසයේදී ජර්න්මාර්ට් සුකර් නැමැති ආණ්ඩුකාරයාට මෙසේ ලියුවේය.

"අන්‍යයන්ගෙන් දැනගත් දේ හැර උඩරට ගැන වෙන යමක් අප නොදනිමු. ඒ තොරතුරු දැන ගන්නා ලද්දේ අපේ ජනයාගෙන් සහ විශ්වාස කටයුතු උඩරට වැසියාගෙන්ය."

"විශේෂයෙන්ම මීගමුවේ මුදලි තැනවූ අඹන්විල දොන් ජාන්ද කොස්තා සහ ලුවිස් දි අන්දරාදි යන දෙදෙන සහ වෙනත් අයගෙන්ය. ඔහු වනාහි කොම්පඤ්ඤයේ ඉතා විශ්වාස කටයුතු අය සහ ස්වදේශින් අතර බොහෝ සැලකිලි ලබන්නෝය."

(ලූවිස්ද අල්‍රාඩ්) "මේ මුදලි තැන ලංකාවේ කොතරම් සැරිසරු පලපුරුදු ඇත්තෙක්දයත් ඔහු හා දුනක එකතෙක් සොයාගත් අතර නැති තරම්ය. ඔහුට ඊෂ්‍යා කරන අය පවා ඔහුගේ සත්‍යවාදී භාවය ප්‍රකාශ කරති."

"ඔහුට අලාභහානි සිදුවීමට කරුණක් නැතහොත් ඔහු නිතරම සත්‍යය කැමැති බව ඇත්තයි. එබැවින් ඔහු කියනදේ විශ්වාස කටයුතු වේ."

(බතාවියේ ඩැග් රිජිස්ටර්ය අනුව මීගමුව නැමැති ලිපිය සිළුමිණ 30. 11. 1930)

අඹන්විල නොහොත් අඹන්වැල්ලේ දොන් ජාන්ද කෝස්තා නැමැති මුදලි තැන මැතදී ඕලන්දයන් විසින් මීගමුවේ මුදලි කමට පත්කරනත් කුරුකුලයෙකි. ඔහු ඕලන්දයන් විසින් මහනුවරින් යම් යම් ඔත්තු ලබාගැනීම පිණිස රාජසිංහ රජු කරා රහසේ යවන ලද්දෙකි.

මොහු කොපමණ ප්‍රයෝග දක්ෂයෙක්ද කිවහොත් රාජසිංහ මාලිගාවේ වාසල අප්පුහාමි වරයෙකු වශයෙන් මෙහෙ කල ස්වල්ප කාලයකදී උඩරට සමහර රදල වරුන් ගේද සහය ඇතිව රජුට විරුඩව කැරැල්ලක් උපදවන ලදී.

රාජසිංහ රජු මැරීමට ඒදබුවාව, පැල්ලම්පිටිය, උඩුවද්ද, යන රදලවරු සහ ඔවුන්ගේ සහචරයොත් සමගිව නිල්ලම්බේ හදි පෙරළි කරන්ට සම්ප්‍රාප්තවූ කල්හි අළුවිහාර ගමේ වණිශේකර මහළු මුදලියා, ඇතුළු මාලිගාවේ යහන් ඇදේ අප්‍රකටව සයනගතව ඉන්ට සැලැස්සු විට එ දෙවි මහ රාජෝත්තමයාණන් වහන්සේමැයි සිතා සතුරන් විසින් ඒ මුදලියාට ඇණ මැරූ කල්හි-



රාජපක්ෂ වාදී කමින් ආස්‍ය නිසා තමාගේ ජීවිතාලය හැර එදෙවි රාජෝත්තමයාණන් වහන්සේ නිසා ජීවිතක්ෂයට පැමිණි ඒ මුදලියා ආදාහන කරවා, ඉක්බිති ඒ මහළු මුදලියාගේ පුත්හට අළුවිහාරේ වණිගසේකර මුදියන්සේ යයි නම් පට බැඳ මාතලේ රටේ මහත්කමද මුහන්දිරම් වසම් අටද කොඩියද දුන්නේය.

(පුරාණ සන්නසකින් හා මාතලේ මහ දිසාවේ කඩඉම් පොතෙන්)

මේ සම්බන්ධව රොබට් - නොක්ස්ගේ ඉතිහාසයෙහි 79 – 80 සහ 82 යන පිටුවල මෙසේ සඳහන්කර තිබේ.

"රාජසිංහ රජුට විරුඩව සිංහලයින් විසින් ක්‍රි. ව. 1664 දී කැරැල්ලක් ආරම්භ කළෝය."

"දෙසැම්බර් 21 වෙනි දින මාලිගාවට පහර දෙන්ට වන. කැරළි කාරයින්ගෙන් ප්‍රධානියෙක්වූ අඹන්වැල්ලේ රාළ (අඹන්විලරාල) නැමැත්තා මරාදමන ලෙස කොළඹ ලන්දේසින් වෙත යවන ලද්දේය. නමුත් ඕලන්දස්කාරයෝ ඔහුට කරුණාවෙන් සංග්‍රහ කොට (උඩරට) යම් යම් ඔත්තු දැන ගැනීම පිණිස කොළඹ රඳවා ගත්හ.

මේ කාලයේ භයානක ධූම කේතුවක් උදාව පැවැත්තේය." යනුයි

අඹන්වැල්ලේ රාළට මීගමුවේ මුදලි තානාන්තරය පවරණ ලද්දේ මෙයින් පසුව ලන්දේසින්ගේ ප්‍රයෝජනය උදෙසාය.

## සීමොන් තමෙල් මහ මුදලි

"1715 වැන්නෙන් පසු වණිකුල ආදිත්‍ය අරස නිල යිට්ට සීමොන් තමෙල් ලන්දේසි ආණ්ඩුව යටතේ මහ මුදලි තනතුරට පත් කරන ලද්දේය.

හෙතෙම යුධ සේනාධිපතිව මහනුවරට ගියේය. (මොහු හලාවත පලාතේ කම්මල නැමැති ග්‍රාමයේ වැසියෙක් සෙයින් කම්මල මහමුදියන්සේයයිද කියනු ලැබේ) මොහුට සාමාන්‍යයෙන් කම්මල මහ මුදියන්සේ යයිද කියා තිබේ. ඔහු විසින් ලන්දේසි ආණ්ඩුවට කරන ලද යුධ සම්බන්ධ රාජ කාත්‍යයන් හේතු කොට ගෙන මහ ඔය - මෝදර (තෝප්පුව) අසල කම්මල නැමැති විශාල ප්‍රදෙශය සතුටු පඩුරු වශයෙන් තෑගි කරන ලද්දේය.

එකී මහ මුදලි තුමාණන්ගේ මිණිබිරියකුගේ මුණුපුරෙක් වූ දකුණු පිටිගල් කෝරලේ කරවන ලද අම්බ්‍රෝසියුස් ද රෙවෙල් මුදලි තුමා එකී මහමුදලි තුමාගේ උරුමක්කාරයන් ගෙන් එක් තැනැත්තෙක් වේ.

එකී තමෙල් මහමුදලි තුමා දැදුරු ඔය පටන් කතරගම දක්වා මුහුදුබඩ ප්‍රදේශයට අධිපතිකම් කළ බැව් ප්‍රකාශ වේ."

## මාතලේ ඇලගොමුව සහ අඹන වලව් පිළිබඳ විස්තර.

අඹන වලව් පේරුවෙන් පැවතෙන තංගම්මා දූනට තමන්කඩුවේ එගොඩ පත්තුවේ පදිංචිව සිටිති. නොබෝ කලකට ප්‍රථම මාතලේ දකුණු ප්‍රදෙශයේ පිහිටි පඩිවිට ග්‍රාමයේ ජනප්‍රධානියා වන පාලප්පු ආරච්චිරාල කළුරිය කෙලෙත් එම පුරප්පාඩුව සඳහා ඉල්ලුම් කරුවන් හය දෙනෙක් ඉදිරිපත් විය.

මෙයින් පුරාණයේ සිට සුප්‍රසිද්ධ ඇලගොමුවේ පරම්පරාවට අයත් පෙරුමාල් කෝරලගේ පුත්‍රයා වන මුදියන්සේ නැමැත්තාද එක් ඉල්ලුම් කරුවෙක් වූයේය.



(1919) එකල මාතලේ සිටි ආණ්ඩුවේ උප ඒජන්ත තුමා මෙම මුදියන්සේව එකවරටම තම කැමැත්ත ප්‍රකාශ කරමින් පුරප්පාඩු ආරච්චි නිලයට පත්කරගනු ලැබුවේය.

"පැරණි සිටි මුදලිවරු දෙදෙනාගේ (අඹන සහ අල-ගොමුව, මුදලිවරු) යුධකාමී රණසූර භාවය තවම නැති වුනේ නැත. ඔවුන්ගේ මුණුපුරන් කෙරෙහිද ඒ රණ කාමි ගතිය පිහිටා තිබෙන බව මෙහිලා ප්‍රකාශ කිරීම යුතු කම් ඉෂ්ට කිරීමක් වන්නේය.

අද සිටින ඔවුන් අතරෙන් බොහෝ දෙනෙක් කාය බල සම්පන්න උස් මහත් පුරුෂයෝය. තවත් කියයුතු අමුත්තක් නම් ඔවුන්ගේ ගොත්‍රයෙන් පිට හිර ගනු දෙනු කිරීම සම්බන්ධව ඔව්හු කිසිවිටක කැමැති නොවන්නෝය.

(Dutch Times)

## මීගමුවේ කුරුකුල සූරිය තම්බි මුදියන්සේ

පැරණි කල පටන් පැවත එන මීගමුවේ කුරුකුල සූරිය පරපුරට අයත් කුරුකුල සූරිය තම්බි මුදියන්සේ 1815 දී හටගත් කැරලි කෝලාහල සමථයකට පැමිණවීම සඳහා බ්‍රවුන්රිග් උතුමාණන් වහන්සේ විසින් පත්කරන ලද්දෙකි.

මෙ කාලයේදීම වාගේ ශ්‍රී වික්‍රම රජසිහ රජ සහ මොල්ලිගොඩ, ඇහැලපොල, පිලිමතලව්වේ, අරුව්වාවල, යන නිලමවරුන් සමගද මෙතුමා ආශ්‍රයකර තිබේ.

තමාගේ සිය කැමැත්ත උඩ බොහෝ ධනවත් රූප ශ්‍රියෙන් හෙබි.........කුලයට අයත් කාන්තාවක් හා මෙතුමා විවාහ වෙන්ට යෙදුනෙන් ඒ කරණ කොට ගෙන එතුමන්ගේ නෑදෑ බන්ධුවරුදීන් ඔහුගෙන් වෙනස් වූහ.

ශ්‍රී වික්‍රම් රජු හිරභාරයේ කුරුණෑගල දිසත්‍රික්කයේ පිහිටි මාකඳුර මාර්ගයෙන් කොළඹට ගෙනෙන අතර මීගමුවේ ලංසි ඇල අසල තිබෙන කුරුකුල සූරිය තම්බි මුදියන්සේගේ වලව්වේ රජු සහ පිරිස නවාතැන් ගත්ත යෙදුනෝය.

මෙම වලව්ව තවමත් නිරුපද්‍රතව තිබේ. මේ කාලයේ මෙතුමා හැර වෙන තම්බි මුදියන්සේ කෙනෙක් සිටිය බව දැන ගන්ට නැත.

මේ නාමයන්ගෙන් පෙනී සිටින කුරුකුල මිනිසුන් මීගමුව, හලාවත, මොරටුව, පානදුරේ, කළුතර, යන පෙදෙස්හි මැතක් වනතුරු විසුවෝය. එනම් :- තම්බි, තම්බි අප්පු, තම්බි නයිදේ, අප්පු තම්බි, තම්බි සිඤ්ඤො, තම්බි කුට්ටි යනාදිහුය.

"මෙහි කතෘගේ පියාගේ වැඩිමහල් සහෝදරයාට ගෙදෙර දොරේ ව්‍යවහාර කර තිබෙන්නේද "අප්පුතම්බි" කියායි. ඔහු ක්‍රි.ව. 1830 දී පමණ ඉපිද 1919 දී මලේය.

තිදගය් දිනය අරභයා මීගමුවේ දී 1948 පෙබරවාරි 4 වැනිදා පැවැත්වූ උත්සවය සඳහා රැස්වූ මහජනයා ඉහතකී වලව්වටද පැමිණි බැව් පහත පළවේ.

"ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා සිරභාරයේ කොළඹට ගෙනෙත්දී නතර වූයේයයි කියන ස්ථානයට ඊට පසු මහ ජනයා රැස්වූහ. ඒ ස්ථානයේදී (මීගමුව) පළාත් ආණ්ඩු සභාවේ සභාපති සී. ඈම්. ප්‍රනාන්දු මහතා විසින් සිංහ කොඩිය ඔසවන ලදී." යනුයි

(6. 2. 1948 දිනමිණ)



## * පාලවකුමාර සිංහප්පා වන්නි මුදියන්සේ

"එයට ඉක්බිතිව පාලවකුමාර සිංහප්පා මුදියන්සේ පසෙකසිට සැලකරනසේක්, දේවයන් වහන්ස,

"මමද † මාතුල ජනපදය රක්නා ලෙස ඔබගෙන් ලබා සිටි නුමුත් එය තුළෙන් මා හැගි ලැගුම් ඉඩම්ද ඊට සුදුසු පරිවාර අතවැසියන්ද ලැබෙන ලෙසට සැලකළසේක."

"ඔබට රජ්ජුරුවෝ සතුටුව රන් වලන් පහක්ද පංච වර්ණ වසත්‍රයක්ද, රත්තරන් පටිසනායක්ද, දෙවාවදුරා පාලව කුමාරප්පේරු සිංහප්පා වන්නි මුදියන්සේයයි කියා රත්පට බැඳ ඔබට කැමැති පරිදි මා හැගි ලැගුම් ඉඩම් අසා වදුරා - මැද බැද්ද - අළකොළඹ - දඹව - සියඹලන්ගමුව අළුගම - තලතිරිය - ගල්බඩ - හත්වන - කෝන්ගොල්ල අකරාඩුව - නාලන්දෙගම - අඹගහ ඇල - පුවක් ගොල්ල අළුත්වැව - පැල්මඩුල්ල - ගල්මඩුව - කන්දලෑන - කුඹල් ඔළුව - පුබ්බිලිය - මඩවල වත්ත - මොරගොල්ල-නෙළුව - දම්මන් තැන්න - ඇල ගොමුව - තලාගොඩ - විලාන - හාඹුගම - කෝන්කඩවල - කොටගමුව - මඩියා වත්ත - තඹජේවෙල - දෙගල්ගම - ලීමන්ගම - ඉළුක් හේන්පොල කමන්නාව - කලයාය - නාරංදෙණිය."

"යන මෙකී ඉඩම් හිමිකොට දෙවාවදුරා මීට පසු රජ දරුවන් විසින් පඬුහුංගං පලිමරාල කඩප්පු තිරප්පු තුවක් කු අය ඇත් දත් - අලිදත් අය - රාජකාරිය නොගතිත්වා - නැතකියා තමෙන් ශ්‍රී සන්නස පිහුටුවා දෙවා වදුරා"

"ඔබ හා කැටිව ආ මෙහෙවරයින්ගෙන් හාරසිය පනසක් පමණ මෙහෙවරයින් දෙවා කැමැති පරිදි ගම් ඉදිකොට වාසය කරව"

---

* මොහු වනාසි භානිය තිස්ස රජුන් දවස ආයෝත්ති පට්ටන මෙන් පැමිනි යුඹ සේනාධිපති පැලවාගෙන් පැවත එන්නෙකි. පැලවා යනු පාලවන් කියාද පාලව කියාද ව්‍යවහාරව් තිබෙන බව සැලකිය යුතුයි.

† ත්‍රිකුණාමලය සහ කොට්ටියාරම් ප්‍රදේශ

# කරාවේ පුරාණ කොඩි විස්තරය

"කොළඹ කෞතුකාගාරය සිහිවීම සඳහා" කෞතුකාගාර අධ්‍යක්ෂක තැන්පත් D. SC. F. R. SE. F. LS. උපාධිලත් ජෝශප් පියර්සන් මහතාගේ කතෘත්වයෙන් ගරු ජ්. ඩබ්ලිව්. පෙරේරා මහතුන් විසින් සකස්කර ආණ්ඩුව මගින් 1916 ලේ වර්ෂයේදී මුද්‍රිත "සිංහල කොඩි පොතේ" Plate xxi, xxii සහ xxvi යේ පිංතූරු සටහන් අංක 55, 56, 57, 58 සහ 71 දරණ කොඩි පංචකය "කරාවේ කොඩි යනුවෙන් හඳුන්වාදී තිබේ.

මෙම කොඩි තමන්කඩුව පලාතේ ශත වර්ෂ තුන හතරකට අතරතුරෙහි විසූ කරාවේ මුදලිවරුන්ගෙන් පැවතෙන්නන් අතර තිබී මෑතදී සොයා ගන්නාලදුව දැනට හිංදු කෝවිලක ඒවා සුරක්ෂිත කොට තැන්පත් කර තිබේ.

මේ කොඩි පිළිබඳ විස්තර සඳහන් කල ග්‍රන්ථ කතුවරයෝ කුරුකුලයෝ නොවෙති. ඔව්හු වනාහි ගරු ජ්. ඩබ්ලිව්. පෙරේරා සහ තමන්කඩුව පලාතේ ආදායම් පාලක තැන්පත්ව සිටි හෝඩ්විත්ද ලිංචිරු යනාදී මහතුන් වෙති.

අංක 55, දරණ කොඩිය *මකර කොඩිය වන්නේය. මෙම වර්ගයේ පැරණි කොඩිවලින් සපයා ගත හැකිව තිබෙන්නේ එකක් පමණක් බැව් කියා තිබේ.

ඉතිහාසඥ වැලන්ටයින් සහ කාශිචෙට්ටි විතිශවාසකාර තැනද මීට බොහෝ කලකට ප්‍රථම ලියනලද ඉතිහාස ග්‍රන්ථයන්ගෙන් "කරාවේ මිනිසුන්ව මකරයා ඇඳි කොඩිය (මකරධවජය) හිමි බැව්" ප්‍රකාශයට පමුණුවා තිබේ.

*"ශවුල් දජයද පෙරටු කරමින් අසුර සෙන් බිඳි බල වැ ඩි
රවුල් දිසි හනුමන්තා කොඩියද පිහිටි ඉර සඳ ජය කො ඩි
තුමුල් සිංහයා මෝරු අලි මකරන්ද කිඳුරන් ඇඳි කො ඩි
එකල් ඉදිරින් පසුන් දෙපසන් දහස් සුවහස් රන කො ඩි"

(ඇම්බැක්කේ පෙරහැර අලංකාරය)



කරාවෙ මකර කොඩිය

(ජ්. ඩබ්ලිව්. පෙරේරා මහතාගේ කොඩි පොත)

අතීතයේ දඹදිව විසූ මහ රජවරු රෙපරහරින් රටතොට සංචාරය කරන අවස්ථාවලදී මේ මකරයා නම් මත්සය බැඳි කොඩිය ගෙනයනු ලැබුවේය.

මකර රූපයේ විස්තර මෙසේය.

"ගජේන්ද්‍ර හස්තං - කෲත පාද සිංහං;
හරාල දන්තං - හනුමන්ත නෙත්‍රං.
වරාහ කර්ණං - කඳ මත්ස්‍ය දේහං;
විචිත්‍ර පත්‍රං - මකරස්‍ය රූපං.

ඇත්හොඬ, සිංහ (කකුල්) පාද, කිඹුල් දත්, වානර ඇසි, වලස් හෝ හූරු කන්, මත්ස්‍ය සිරුර යන මේ අවයව යන් ගෙන් යුත් රූපය මකරා නම්වෙයි."

මේ මකරයා බැඳි කොඩිය මේ දක්වා කෞරවයන් විසින් භාවිතා කරනු ලබත්.

සිව දෙවියෝ තමන්ගේ කිසියම් අවතාරයකදී උත්තර ජම්බුවීප වැසි කුරුකුල සම්බන්ධාර් පර්දර් කෝමාන්, අදි අරශන් නැමැති මහාරාජ දුහිතෘ සරණ කර ගැනීම සඳහා ගිය ගමනේදී මේ මකරයා අඩයාලම පෙරටුව ගෙන ගොස් තිබේ.

මෙම සත්වයා සකල ලෝකයටම බලවත් බව හඟවන ලකුණක්යයි කියති. ඉන්දියානුන්ගේ අතහ * කොඩියේද මකර අඩයාලම සටහන්කර තිබෙනබව දැනගත්ට තිබේ.

මුතු කුඩය සහ මත්ස්‍ය කොඩිය

1. "முசற வண்டுமா லும் பசுந்தொங்கற்
பாசனு கொண்ட பகிரதிக்கு – வாசத்
தொடை யெடுப்பான் சோழன்று கிலெடுப்பான் சோன்
குடை யெடுப்பான் கொர்கையா கோன்"

(මදුරෙයි කාංචි දෙමළ කාව්‍යය.)

---

* "පස ග තුරු තද සයුර ගොසකර මකර දද බැඳ බැන මි ගේ
මත ග තම නැග රැගෙන උක්දුනු පසර විද විද වෙනු ර ගේ
මල ග රොස වි යුදට වැද හිදි නොදී තුන්යම නෙතු යු ගේ
ලක ග සෙතරන් මැතිතුමා සකි ඔත්න මට දූත් කල හි ගේ

(මදහස මාලේ කාව්‍යය )

සොළීන්ට පක්ෂව ලියා තිබෙන තවත් දෙමල කවියක් මෙසේයි:-

2\. "வீரர்க் குருகராக மீன வஞோவம்மா   கோ
வெற்றிப்புலிக் கொடிக்கு மீன மோவம்மா   கோ
ஊரிர்பு காதனக்கு கொற்கை யோவம்மா   கோ
ஒக்கு மோசோழனுக்கு பாண்டின் காணம்மா   கோ"

මෙම කාව්‍යයන්හි කෙටි විස්තර:-

1\. පුෂ්පයන් ගෙන් යුත් මුහුදෙහි ගුම් ගුම් නද දෙන බමරුන් හැසිරෙන්නේය.
සුවඳ මල් ගෙන එන්නා කව්ද හේ සොළියාය.
ඇඳුම් ගෙන එන්නා කව්ද? ඔහු චනාහි ක්ෂේරලයාය.
කුඹය රැගෙන එන්නා කවරෙක්ද? හෙතම වූකලී "කොර්කෙයි" නුවර රජ්ජුරුවෝය."

2\. වීරයාට මත්ස්‍යයා බැඳි කොඩිය සමවන්නේද?
මත්ස්‍යයා බැඳි කොඩිය ව්‍යාඝ්‍රයා බැඳි කොඩියට සමවන්නේද?
කොර්කෙයි නුවර පැසසුම් ලද උරෙයි උෆර් නුවරට නො සමවන්නේය.
පාණ්ඩ්‍යවරු සොළින් හා සංසන්දනය නොකළ යුතු වන්නේය.

මෙහි කුඹය යනුවෙන් ප්‍රකාශ වෙන්නේ "මුතු කුඹය" වය. මත්ස්‍යයා බැඳි කොඩිය සහ මුතු කුඹයත් කොර්කෙයි නුවර පඬි රජුන්ට අයිති බව මෙයින් මොනවට හැඟීයයි. "මදුරෙයි අයිනු ගුරු නුරු" නැමැති ද්‍රවිඩ පොතේද "කොර්කෙයි" නුවර මුහුදුබඩ පිහිටි වරායක් සහිත මුතු බෙල්ලන් ගැන ප්‍රසිද්ධ මහ නගරයක් වශයෙන් විස්තර කර තිබේ.



මෙම නගර වැසි සියල්ලෝම පාහේ බලසම්පන්න ජාතිකයන්වූ පරවරු, පරදර් හෙවත් භරත වංශිකයෝය. එක් කලෙක පඬි රජුන්ගේ අග නුවර බවට ප්‍රසිද්ධව තිබූ කොර්කෙයි නුවර සම්බන්ධව මීට ඉහතින්ද ලියා ඇත.

ක්‍රි. ව. 80 දී පමණ ග්‍රීක් (යවන) භාෂාවෙන් ලියන ලද "පෙරිප්ලස් මාරිස් ඉරිත්රේයි" නැමැති පුරාණ ග්‍රන්ථයෙහි සහ ක්‍රි. ව. 130 දී "පොටලොමි" විසින් ලියන ලද භූගෝල විස්තරයේද දකුණු ඉන්දියාවේ මුතු වගී සම්බන්ධව ප්‍රසිද්ධ නගරයක්වූ "කොල්කොහි' නුවර ගැන සඳහන්කර ඇත්තේය.

ඔක්ස්පෝර්ඩ් විශ්ව විද්‍යාලයේ සංස්කෘත භාෂාව කෙරෙහි මනා පටුන්ඩයක් ඇති මහාචාර්ය විල්සන් බෝඩන් පඬිවරයා සහ තවත් උගතුන්ගේද නිගමනය පරිදි ග්‍රීක් වරුන් විසින් "කොල්කොහි" යයි කියා තිබෙන නුවර අනිකක් නොව දෙමළ ඉතිහාස පොත්වල සඳහන් * "කොර්කෙයි" නගරය බවට විශ්වාස කර ලියන ලදී.

අතීතයේ සිටි ග්‍රීක් යාත්‍රා කරුවන් කුමාරි තුඩුව වටේ ගමන් කර මෙම කොර්කෙයි වරායට පැමිණි බව ඉහත සඳහන් පොත්වලින් ප්‍රකාශ වේ.

× × × ×

සකල බෞද්ධ සිද්ධස්ථානයන්ගේ ඇතුල් මාලිගාවේ පූජා වාරයන්හි මකර තොරණ පිහිටුවීම සිරිතක්ව පැවත එයිං. එමෙන්ම ආතැම් හිංදු දේවාලයන්හිද මෙය පිහිටුවා තිබේ.

ක්‍රි. ව. 1505 දී ජයවර්ධනපුර කෝට්ටේ රජු ප්‍රථම වරට පරංගි නානාපති තැන පිළිගන්නා අතර සිංහල රජු අසුන් ගෙන සිටියේ මකර තොරණ යටය.

* තවද, මෙ "කොර්කෙයි" නුවර රාමනාද් පලාතේ පිහිටි "කීලක්කරේ" විය යුතු යයිද බෝඩන් පඬිවරයා කියා තිබේ. මෙය කරාවේ මිනිසුන්ගේ නගරයකි. නරේන්ද්‍රසිංහ රජ බිසවද කීලක්කරේ කුමරියකි.

සිංහල රජ මාලිගාවලද මකර තොරණ පිහිටුවීම චාරිත්‍රයක් බැව් මෙයින් හැඟේ.

අංක 56 දරණ කොඩිය යටත් පිරිසෙයින් අවුරුදු 400 කට පමණ ඔබ්බෙහි පැවති ඉතා පැරණි කොඩියකි. මෙහි සඳහන් චන්ද්‍ර, සූර්‍ය, තාරකා, හක්ගෙඩි, මුතුකුඩ, තලපත්, චාමර, පන්දම්, චක්‍රායුධ, මහනෙල් පියුම්, හස්තියා, රජ ඔටුන්න, හෙණ්ඩුව, රන්කෙවිට, මත්ස්‍යයා, නාගයා, වී කරල්, යනාදි සියල්ලම රාජ මංගල ලාංඡනයෝ වෙති.

මෙම කොඩිය කෞරව ජනයා විසින් උතුරු ඉන්දියා වෙන් මුලින් ගෙනෙන ලද කොඩියට සමානව සාදාගන්නා ලද්දක් විය යුතුයයි කිය හැකිය.

මෙම කාරාවේ කොඩියේ සටහන්ව තිබෙන අඩයාලම් වැනි රාජ මංගල ලිංගයන් විසිඑක් වර්ගයක ලකුණු දරණ කොඩි රාශියක් භරත වංශිකයන් විසින් භාවිතා කරන බව දකුණු ඉන්දියානු ආණ්ඩුව මගින් එ.ව. 1917 දී මුද්‍රිත තින්නවැලි ගැසට්යර් පොතේ 122, 123, 124, පිටුවල සඳහන් කර තිබේ.

බැරඩාස් නැමැති පෘතුගීසි ඉතිහාසකරු විසින් ක්‍රි. ව. 1613 දී මොරටුවේදී දකින්ට ලැබු මංගල්‍ය ප්‍රස්ථා- වක් ගැන මෙසේ කියා තිබේ.

"ඔවුන් ගෙන යන ලාංඡනයෝ නම් ආලවට්ටන් දවල් පන්දම් හා හක්ගෙඩි විශේෂයකුත් වෙති.''

"මනාලියගේ ලඟම නෑදෑයින් ඇගේ අත්වලින් මාරු වෙන් මාරුවට අල්වාගන යති. විවාපත් අභිනව යුවල කිමට අතුරණ ලද සුදුරෙදි (පාවාඩ) උඩින් ගමන් ගනු ලැබේ. ඔවුන් මත සූර්‍ය තාපය නොවැටෙන පරිදි තම නෑයන් විසින් උඩුවියන්ද බඳවා ඔසවාගන යනු ලැබේ." යනුයි.



කාරාවෙ ගුරුළු කොඩිය
(ඊ. ඩබ්ලිව්. පෙරේරා මහතාගේ කොඩි පොත)



කෞරව ගෝත්‍රයේ ඇතැම්හු රෝමානු කතෝලිකාගම වැළඳ ගත් සමයේදී (ක්‍රි. ව. 1530 - 1550) අංක 56 දරණ කොඩියේ අඩයාලම්වලට කුරුසිය සත්‍ප්‍රසාද කරඬුව, ඔස්තප් කොරිය, යන මේවායේ ලකුණු සම්බන්ධකර අංක 57 දරණ කොඩිය සකස් කරගත තිබේ.

අංක 58 දරණ කොඩියෙහි කුරුසියක්ද තාරකාද මල් වැනි රූපද යොදා තිබේ. මේ කරාවේ ගෝත්‍රයට අයත් පැරණි රෝමානු කතෝලික කොඩිය වේ.

මෙම කොඩිය වනාහි තමන් කඩුවේ මත්තම් පිටිය වැව ඉදිරිපස පිණ්ටි කටමුණේ නොහොත් ගැටමුණේ නැමැති ග්‍රාමයේ පුරාණයේ පදිංචිව සිටි පෙරිය දොරේ මුදලියාර්, අප්පුහාමි මුදලියාර් නොහොත් මීගමුවේ වැල්ලේ වීදියේ මුදියන්සේට අයිතිවේ.

Plate XXVI යේ අංක 71 දරණ රූපයෙන් දක්වන්නේ *ගරුඩ කොඩියයි. එහි මුදුනේ අංශයක දෙමළ අක්ෂර යෙන් "கருடதாம உபயம்" "ගරුඩතාම් උපයම්" යන වචනය ලියා තිබේ. මේ වනාහි නාගයින්ට භීතිය ගෙන දෙන රාජාලි රූපයයි. ගරුඩා යනු රාජාලියාට කියන නාමයක් යයිද කියනු ලැබේ. මෙම කොඩිය මත්තම් පිටියේ පුරාණයේ විසූ මීගමුවේ වැල්ලේ වීදියේ මුදලියාර්ට නොහොත් "පුදු මුදලියාර්ට" අයිති පැරණි කොඩිය වේ.

මේ වර්ගයේ කොඩි වත්මන් සකල රාජපුතානාවේද භාවිතා කරනු ලබයි. ජෝද් - පූර්හිද රාජකීය අඩයාලම රාජාලියෙකි. සූර්ය වංශික රාජපුතානා මරාත්තාගේ මංගල ලිංගය ගරුඩෙකි. විෂ්ණු වාහනයද ගුරුළෙකි.

මෙම කොඩිවලින් සමහරක් මීගමුවේ වැල්ලේ වීදියේ සහ මහ වීදියේ මුදලිවරුන්ගෙන් පැවතෙන තලත්කඩුවේ එගොඩ පත්තුවේ පදිංචිව සිටින ඇස්. සූ. කුලසේකරම් පිල්ලේ උඩයාර්ට අයිතිව තිබේ.

* මෙම කොඩියට, තමන් කඩුවේ මයුර කොඩියයයි වැරදිමකින් "සිංහල කොඩි පොතේ" සඳහන් වී තිබේ. නුමුත් කොඩියේ අංශයක, දෙමළෙන් ගරුඩ කොඩිය වශයෙන් අඳුන්වා දී තිබේ. කොඩි පොතේ 22 පිටේ, 3 වෙනි පෙළේ සිට 6 පෙළ දක්වා කියවා බලනු.

ඔහු කරාව ගෝත්‍රයට අයිති බැව් කියති. කොළඹ බේරේ වැව ප්‍රමාණ විශාල ඇති ගංගලු විල්ලු නොහොත් මත්තම පිටිය විල්ලු නැමැති වැව අසබඩ පිහිටි මන්තම් පිටිය යන ගමේ පදිංචිව සිටින මෙම උඩයාර් දූහට හින්දු ආගම් කාරයෙකි. කෘෂි කර්මාන්තයෙන් රක්ෂාවකොට ගෙන වෙසෙති.

ඉතිහාසයේ ප්‍රකාර මීගමුවේ මුදලිවරු මත්තම් පිටියේ පදිංචිය ඇතිකර ගන්නා ලද්දේ ක්‍රි. ව. 1596 – 1656 ප්‍රතිකාල් ආණ්ඩු කාලයේදීය. තමන්කඩුවේ මහවැලි ගඟ අසබඩ පිහිටි මහගස්තොට දේවාලයේ පවත්වන උත්සව වලදී මෙම කරාවේ පුරාණ කොඩි ගෙන යනු ලැබේ.

(සිංහල කොඩි පොතේ 21, 22 පිටු බලනු.

## ඉංග්‍රීසි ආණ්ඩුව යටතේ සිටි කුරුකුල මුදලි මුහන්දිරම්වරු

| | |
|---|---|
| සූසේ ප්‍රනාන්දු වරුණකුල අරශකුලසූරිය | මුදලි |
| පිලිප් ද අන්දරාදි අරසකුල විජයරත්න | මුහන්දිරම් |
| ස්ටීවන් ප්‍රනාන්දු වීරවරුණ කුරුකුල සූරිය | මුදලි |
| ප්‍රන්සිස් ප්‍රනාන්දු අරස කුලරත්න කුරුකුලසූරිය | මුහන්දිරම් |
| ප්‍රන්සිස් රුද්‍රිගු | මුදලි |
| බස්තියන් ද අන්දරාදි අරසකුල විජයරත්න | මුදලි |
| ජුහානස් ද සිල්වා වික්‍රම ජයවර්ධන | මුහන්දිරම් |
| පේදුරු මැන්දිස් ගුණතිලක සමරසිංහ ජයවර්ධන සෙනෙවිරත්න | මුදලි |
| අන්තෝනි පෙරේරා පටබැඳි | මුහන්දිරම් |
| බර්නාර්ඩස් ද සිල්වා අරස කුලරත්න | මුදලි |
| මයිකල් රාවල් වරුණකුල විජේසූරිය | මුදලි |



| | |
|---|---|
| ජුහානස් පොන්සේකා වර්ණ සූරිය විජේතුංග සමරනායක | මුදලි |
| දිමින්ගු මැන්දිස් සෙනෙවිරත්න | මුහන්දිරම් |
| ජේනේසියස් පීරිස් සමර වික්‍රම සූරිය | මුදලි |
| වර්ණකුල සූරිය මාර්තෙස් ප්‍රනාන්දු පට්ටන්කට්ටි | මුහන්දිරම් |
| සෙලෙස්තීනු පොන්සේකා විජේතුංග අරස කුලරත්න | මුදලි |
| කුරුවෙ කංකානන්ගේ දොන් පිලිප් | මුහන්දිරම් |
| දොන් සයිමන් ද මැල් වනිග කෝන් රජවාසල හෙට්ටි | මුදලි |

(ක්‍රි. ව. 1817, 1819 ආණ්ඩුවේ කැලැන්ඩර් පොත් අංක 2/A20 20/A3 කෞතුකාගාර පොත්හල)

1819 න් පසු සිටි කුරුකුල මුදලි මුහන්දිරම් වරු මෙහි ඇතුළත් නොකෙළෙමු.

"මොරටුවේ කුරුකුලසූරිය අප්පන් තන්ත්‍රිගේ ඇලෙක්සැන්ඩර් අබේසිංහ ධර්මරත්න, මුදලිතුමා *(මේසමුදියන්සේ) ඉංග්‍රිසි රජදරුවන් අතින් ප්‍රථමයෙන්ම ගරු සම්මාන ලැබූ සිංහලයා වන්නේය.

මෙතුමා එංගලන්තයට ගොස් සිටින අතර වර්ෂ 1819 යේ මැයි මස 21 වෙනි දින ලන්ඩන් නුවර (Black. Hall)"බ්ලැක් හෝල්" ශාලාවෙහි සමස්ත ලෝක බයිබල් සමාගමේ සාංවත්සරික මඞ්ගල්‍යය පවත්වන්ට යෙදුනේය.

මේ මඞ්ගල්‍යයට පැමිණ සිටි එංගලන්තයේ iv වෙනි විලියම් රජුගේ සහෝදරයා වන ග්ලොස්ටර් මහ ආදිපාද ඉංග්‍රිසි අධිරාජ්‍යයේ අග්‍ර සෙනෙවිරදුත්ව, එහි පැමිණ සිටි ලාංකික මුදලි ආයින්තමින් සැරසීහුන් කදිම පෙණිමකින් යුත් මේ මුදලි තුමාව උසස් නිලධාරියෙකු විසින් හඳුන්වා දෙනු ලැබ,

* පුරාණයේ සිට, මේස පිට ආහාර තබාගෙන අනුභව කිරීමට වරම් ඇති අයට "මේස කාරයෝ" යයි කියනු ලැබේ. ඉන්නිසා මේ මුදලි තුමාද එසේ වරම් තිබූ පරපුරකට අයිතිව සිටි බැවින් "මේස මුදියන්සේ"යයි ප්‍රසිද්ධ විය.

ඉක්බිති ඉංග්‍රීසි සෙනෙවි රදුන් විසින් මුදලිඳුගේ වම් උරහිස මිත්‍ර ලීලාවෙන් පිරිමදිමින් සිය හස්තයෙන් අල්වාගත ගොස් රාජකීය පීඨයක (පුටුවක) හිඳුවා එතමේද සම අසුනක හිඳ පිළිසඳර කථාවෙහි යෙදුනේය.

මේ සිද්ධිය සිහිවීම්වස් බයිබල් සමාගමේ මහතුන් විසින් මුදලි තුමාට ගෙත්තම් කරන ලද අලංකාර හස්ත සටහනක් ගරු මාන්නයක් හැටියට සිය වම් උරහිස පලඳිනලෙස ත්‍යාග කරන ලදී.

ගලුස්ටර් ඈපැණන්ගේද අවසර ඇතිව මේ මුදලිඳු රාජකීය සම පීඨයන්ගේ (පුටුවල) හිඳීම සිහිවීම්වස් මෙතුමාගේ නමට පෙරටුව "රජ කුමරුන් එක පුටුදුන්" යන්නද එවක් පටන් භාවිතා කරන්ට යෙදුනේයි."

මෙයට දෙවන සිද්ධියක් සර් සලමන් ඩයස් බණ්ඩාරනායක K. C. M. G. මහ මුදලි තුමා විසින් ලියන ලද "Remembered Yesterday" යන පොතේ මෙලෙසින් ලියා තිබේ.

"සර් ජේම්ස් ලෝංඩන් ආණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ ඉල්ලීම පරිදි ඔටුන්න උරුමක්කාරයෙකුව සිටි ඇල්බට් කුමරු සස්නාතය සහිත පටියක් වාසල මුහන්දිරම් වශයෙන් පැළඳීමට මට (සලමන් ඩයස් බණ්ඩාර නායක තුමාට) දෙවා වදාරණ ලදී. තවද බණ්ඩාරනායක නාමයට පෙරටුව "රජ කුමරුන් කඩු සාරලුම්" යන ගරු නාමයද ආණ්ඩුවෙන් අවසර ලැබ භාවිතා කරන්ට වන්නේය, යනුයි.

මෙසේම තවත් සිද්ධියක් නම්, සියම් මහ රජු ලක්දිවට පැමිණි අවස්ථාවෙහි උහගසේකර මහත්මයාට, එතුමන්ගේ හස්තය දී ආචාර කෙළේය. මෙයින් පසු මේ මහතුන් තමන්ගේ නමට පෙරටුව "මහරජ අත දුන්" යන්නද ගරු විරුදාවලියක් වශයෙන් භාවිතා කරගත එන්නේයි.



## * මීගමුවේ දෙමළ ඔප්පුවක සිංහල පරිවර්තනය

වර්ෂ 1834 ක්‍රි. නොවැම්බර් මස 3 වෙනි දින එක පක්ෂයකට තිල්ලන්දූවේ පදිංචි "සත්සිය වගීයාට" අයිති මගල් රත්න මුහන්දිරම්ගේ මනුවෙල් ප්‍රනාන්දුද අනික් පක්ෂයට එම ස්ථානයේ මහ වීදියේ පදිංචි "කුරුකුල කරයූර්" වගීයට අයිති නැසිගිය බස්තියන් ප්‍රනාන්දුගේ දියණියන් වන ජුවානා ප්‍රනාන්දුන් අතරේ ලියවාගත් පොරොන්දු පත්‍රයේ (උකස්කරේ) වගතම්:–

ඉහතකී ජුවානා ප්‍රනාන්දු වන මම මේ දින මගේ උවමනාවක් පිණිස තම්මිට ඉහතකී තිල්ලන්දූවේ තිබෙන අඹගහවත්ත යන ඉඩම සහ කුඹුරෙනුත් මගේ මව්පියන් ගෙන් මට ලැබෙන්ට යුතු අවෙන් පංගුව ඉහතකී සත්සිය වගීයාට අයිති මිගල්රත්න මුහන්දිරම්ගේ මනුවෙල් ප්‍රනාන්දු වෙත උකස්කර,

පනාග දහයක් නයට ඉල්ලා භාරගත්තා ඇත. එපමණකුත් නොව එම මොවු මුදල භාරදෙන දිනකදී ගත්තේ නැත, දුන්නේ නැත, යන කිසිත් නොකියා පනාග සියයට එක ගණනේ පොලියත් සමග දෙන්ට පොරොන්දු උනාත් ඇත.

මීට එකඟවූ ජුවානා ප්‍රනාන්දුවන මම ඉහතකී මනුවෙල් ප්‍රනාන්දුහට මෙසේ අතසන් මුද්දර තබා මෙය ලියවා දුන්නිමි. ඕම්.

මෙය දන්නා සාක්ෂි.

පරදර් වගීයේ මනුවෙල් ඉනාසි ප්‍රනාන්දු.
කුරුකුල කර්යූර් වගීයේ ප්‍රන්සිස්කු ප්‍රනාන්දු.
× ජුවානා ප්‍රනාන්දු.

ලිව් බවට,
ඉස්තෝතු ප්‍රනාන්දු

(බුරාවේ ගොත්‍ර පිළිබඳ නීති රත්නාවලිය)

* දෙමළ භාෂාවෙන් ලියන ලද මෙම පැරණි ඔප්පුව දැනට රත්මලානේ සිටින බුරාවේ ගෝත්‍ර පුරාණ පෙළපතකට අයිතිව තිබේ.

# අකාරාදි විස්තර

| | | |
|---|---|---|
| கவுரவர் | = | Kurugula Caste |
| කවුරවර් | = | කුරුකුල වංශය |

(ජාපනේ දෙමල ඉංග්‍රීසි අකාරාදිය 94 වෙනි පිටුව)

| | | |
|---|---|---|
| කුරුකුලම් | = | පාරදර් කුලම් (භාරත වංශය) |
| පාරතර් | = | කුරුකුල වේන්දර් |
| පෞරවර් (පවුරවර්) | = | කුරුකුල වේන්දර් |
| කෞරවර් (කවුරවර්) | = | කුරුකුල වේන්දර් |

ජාපනේ ඇමරිකන් මිසමේ අකාරාදිය ක්‍රි. ව. 1842 මුද්‍රණය දකුණු ඉන්දියා දෙමල අකාරාදිය)

කුරුකුලම් = කුරුවංශය - කුරුරජුගේ පරම්පරාව

කුරුකුල වේන්දර් = කුරුවංශයේ රජවරු, හස්තිනා පුර පුරාණ රජ, ඔහුගේ නාමය "කුරු" නොහොත් කෞරවයින්ගෙන් පැවත එන්නන්ට කියනු ලැබේ. ප්‍රධාන වශයෙන් ධෘතරාෂ්ට්‍ර රජුගේ දරුමුණුපුරු ආදි කොට ඇති පරපුරට කියන නාමයයි.

කෞරවර් (කවුරවර්) = කුරුවංශයේ රජ නොහොත් කුරු වංශයෙන් පැවත එන්නෝ

කුරුදෙශම් = දිල්ලි රාජධානිය.

(පොන්ඩිචේරියේ යුරෝපීය මිසමේ අකාරාදිය 1856 මුද්‍රණය)



## A කොණ්ඩ පෙරුමාල් තඹ සන්නස

"ස්වස්ති ශ්‍රී වෛවස්සුත මනුසඞ්ඛ්‍යාත මහාසම්මත පරම්පරානුයාත සූර්‍ය්‍ය වංශෝද්භූත සුමිත්‍ර රජ, රාජපුත්‍ර පවිත්‍ර ගොත්‍රාභිජාත ශ්‍රී සිංහලාධීශ්වර නවරත්නාධිපති ශ්‍රීමත් ශ්‍රී සඟබෝ ශ්‍රී විජයබාහු චක්‍රවර්ති ස්වාමින්වහන්සේට අටවන්නේ මතු අවුරුදු පොසොන අව පසළොස්වකැ අළුත්කුරු කෝරළයේ මෙහි බඳ උඩුගම්පල සත්තකින් දෙඹවිල සාල් දෙපෑලේ නිලයට ඇතුලත්වූ වලල සීම පල්ලේ රෙරවිලලින් දෙර කුඹුර ආකට දීවෙල් කැකුලත් ඔවිට මෙහි බඳ ගම් මුදල් ගස කොළ වල් විල් කුඹුරු ඔවිටි පළමු කුරුණෑගල්දී ලත් දන පත්‍රය තියාවට දෙවෙනිවත් සූර්‍ය්‍යග්‍රහණ දිනයේ බමුණු B වෙණ්ඩරශු කොණ්ඩ පෙරුමාලාට යාරුප් පාවා උවදන ක්ෂේත්‍රකොට සිතාවදුරු චක්‍ර අර කාසපාය ස්වස්විරව ප්‍රවතිතා නියායෙන් උඩුගම්පල අළුත් මාලිගාවේ වැඩහිඳ කාරියට නියුක්ත ඇම දෙනා මැද වදාල මෙහෙවරින් මේ තාම්‍ර පත්‍රය ලියා දුන් බවට සත්හස් මකුට වෙරුන්වහප පෙරුමාලුම්හ.

සුදකෝ අනුත් හල පිං බන්ද නොම කනි. බල්ලෝ ඒ බත් කා නැගුවත් නැවත කති. උන්සේ තොපි මේ සුජනන් දුන් අයිති රැකදුන සුජනයෙති දෙලොවටම පිං ඇති."

(මෙම තඹ සන්නස මීනමුවේ කුරුදුවත්තක තිබී සම්භවී, ක්‍රි. ව. 1873 දී ලුඉස් ද සොයිසා මහ මුදලි තුමා විසින් ප්‍රසිඩ කරන ලදී.

A කොණ්ඩර් පෙරුමාල් නොහොත් කොණ්ඩන් පෙරුමාල් යනුයි.

B "වෙණ්ඩරශු" යනු "වේණ්ඩර් අරශු" යන්නයි. මෙය දෙමල භාෂාවෙන් ලියන විට

வேந்தர் - அரசு; යයි ලියනු ලැබේ. එහි තේරුම ;—

වේණ්ඩර් හෙවත් වේන්දර් 'රජ්ජුරුවෝ" යනුයි. අරශු යනු "ආණ්ඩුකිරීම" වෙයි. "වෙණ්ඩරශු" යන්නෙහි නියම අර්ථය "King's Governing" රජුගේ ආණ්ඩුකිරීම" වේ.

ගම්පල අගනුවර කරගෙන ක්‍රි. ව. 1398 සිට 1409 දක්වා රජකළ හවෙනි විජයබාහු රජු විසින් දෙන ලද්දක්සේ පෙනේයයි ආචාර්‍ය ඇඩ්වර්ඩ් තුමා විසින් කියන ලදී.)

(ඥානාදශීය, 1901 ජනවාරි කලාපය 96 පිටුව)

(වේණඩරඝු පෙරුමාල් නැමැති බ්‍රාහ්මණයාවූ දී තිබුන දන පත්‍රය ස්ථිර කරනු සඳහා මේ සන්නස ලියන ලදී.)

(ඥානාදශීය 1901 ජනවාරි කලාපය 44 පිටුව)

මෙහි සඳහන් කොණ්ඩ පෙරුමාල් ගෙන් පැවත එන්නන්, කළුතර, කොග්ගල, හරුමල්ගොඩ යනාදී ගම්වල සිටිති.

කොග්ගල වාසය කරන්නන් "කොණ්ඩ පෙරුමාල් ආරච්චිගේ" කියාද තවත් පලාත්වල වාසය කරන්නන් "කොණ්ඩ කුමාරගේ"* කියාද පෙලපත් නාමයන්ගෙන් පෙනී සිටිති.

ඉහත සිටි කුලීනයින් කවුරුන් පාහේ අවස්ථාවක් පැමිණි විට පූජක කටයුතුවල යෙදීම සිරිතක් සෙයින් ඔවුන්හට ඇතැම්විට බ්‍රාහ්මණ නාමයද ව්‍යවහාර කරණු ලැබේ. (ගුරුක්කල් කියාද කියති.)

තවද කොණ්ඩර්, කොණ්ඩන්, වීර කොණ්ඩන්, කුරු වීර කොණ්ඩන් කියාද, පෙරිය කොණ්ඩන්, සින්න කොණ්ඩන්, සෙලල කොණ්ඩන්, වීර කොණ්ඩන්, කුරුවීර කොණ්ඩන් කියාද, කොණ්ඩගේ, වීර කොණ්ඩගේ, මහ කොණ්ඩගේ, පුංචි කොණ්ඩගේ, සෙල්ල කොණ්ඩගේ, කියාද පෙලපත් නාමයන් ඇති කරුවේ පරම්පරාවල් බොහොමයක් තිබේ. ඔවුන්හට විනා අන්‍ය කුලීනයින්ට මෙම "කොණ්ඩ" නොහොත් "කොණ්ඩ" නාමය අයිති නැත.

---

* සෙම්බුගප් පෙරුමාල්ට සපුමල් කුමාරයා යයි කියති, පෙරුමාල් යනු කුමාරයා යන්න බැව් මෙයින් දනේ.



# ලක් විජයසිංහ කීර්ති සෙනෙවි තුමාගේ ශිලා ලිපිය

"ශ්‍රීමත් ඔකාඹස් රජ පරපුරෙන්" ආ අභා සලමෙවන් ලීලාවතී ස්වාමින්ගේ අග්‍රාමාත්‍යවූ "ලග් විජය සිඟු කිත් සෙනවියන්" තුන්වන්නේ අනුරාධපුරෙහි පටන් භූමියේ තමන් කැරවූ රුවන් පායෙහි වැඩහුන් සඟරුවන්ට සිවුපස යෙන් වත පාහු පිණිසැ තමන්ට බත්ගිණුව යැවින් යාලක් හා මෙහිමැ චෛත්‍යයට යාලක් හා පිළිම ගෙට යාලක් හා භූමිදන කොටැ හිරසඳ පමණවැ පිදූ පාසයෙන් පිරිනැමූ මේ ලාභය අන්තරාය කළවුන් විඳිනා නරකාදී දුක් දුත් හා මතු මතුවනා නුවනැතියන් ලෝභ මෙෂ මාන දුරු කොටැ ලාභ අන්තරාය නොකොටැ නුවනැත්තන් කළ ආයුෂබ්වනු මැනවී."

(මෙම ශිලා ලිපිය ක්‍රි. ව. 1212 දි පමණ කරණ ලද්දකි.)

(ඥානාදශීය – 1901 ජනවාරි කලාපය)

මෙම සෙනෙවියාගෙන් පැවත එන්නන් වශයෙන් සලකන කොටසක් නම්:–

ක්‍රි. ව. 1198 දී ශ්‍රී නිශ්ශංක මල්ල රජ දවස අග්‍ර සෙනෙවි නිලය දූරූ "කිත් පොලොන්නරු ලක් විජයසිංහ" යන පෙලපත් නාමය දරණ පරම්පරාව වෙති.

මෙම නාමය දරණ කෞරවයින් බොහෝ දෙනෙක් කොළඹ, පානදුරේ, මොරටුව, කළුතර, යනාදී ප්‍රදේශවල ධන කුවේර ලීලාවෙන් වෙසෙති. පෘතුගීසි ආණ්ඩු කාලයේ ක්‍රිස්තියානිය වැළඳගත "ද මැල්ලෝ" නොහොත් "ද මැල්" යන පෘතුගීසි අල්කුණ්ඩ නාමයෙන් ඔව්හු දනට ප්‍රසිඩව සිටිති.

ඇතැම් "ද මැල්" පරම්පරාවල් "ලක්ෂපතී" යන නම්න් ද පෙනී සිටිති. ඔවුන්හට අයිති නිලවලියෙන් ලක්ෂපතිය යන ග්‍රාම නාමය ඇතිවූ බව මොරටු වැස්සන් විසින් කියනු ලැබේ.

"එක්ව ලොබින් සිදුපාකල වලා පෙ ළ
දුක්ව නොයාගි සිටිනා මෙන් වෙර ළ
ලක්ෂ පතිනම් පොල් උයන සුලක ළ
දූක්ක හැකිය මද තැන එයිනි ගිය ක ළ"

(කොකිල සන්දේශය)

1803 දී මුත්තුසාමි කුමාරයාණන් ෆ්‍රෙඩ්රික් නෝර්ත් උතුමාණන් වහන්සේත් අතර ලියා ගන්නා ලද * ගිවිසුම් පත්‍රයයි.

The Treaty entered into between Prince Muttu Samy and Governor Frederick North in 1803

මහනුවර රජකළ ශ්‍රීවික්‍රම රාජසිංහ රජතුමාගේ සේනාවද ෆ්‍රෙඩ්රික් නෝර්ත් උතුමාණන් වහන්සේ යටතේ සිටි සේනාවද අතර ක්‍රි. ව. 1801, 1802 සහ 1803 දී යුධ කෝලාහල ඇතිවිය. සිංහල රජුගේ සේනාවෝ කෙතරම් දක්ෂ ලෙස යුධකොළෝද කිවහොත් එවකට ඉංග්‍රීසීන්ට අයිතිව තිබුනු මුහුදුකර පළාත්වලින් ගාල්ලත් කොළඹත් හැර අන් සියළු පළාත්ම අත්පත් කරගන්ට හැකිවිය.

දකුණු පළාතේ හම්බන්තොට, තංගල්ල, හක්මන, මාතර, වැලිගම, යන ස්ථානවල සිටි ජා, ඉංග්‍රීසි යුධ හමුදා වත් පන්නාහැර ඒ ප්‍රදේශ සිංහලයෝම අයිතිකර ගත්තාහ. ඉංග්‍රීසින්ට යටත්ව සිටි සේනාවත් සමත් කරනු පිණිස ගාල්ලේ සිටි යුධ හමුදාව කැරලි කාරයන් නිසා ගොඩින් ගෙනයා නොහැකි බැවින් මුහුදෙන් ගෙනයන විට ගාල්ලෙන් හැතැප්ම දහයක් පමණ ඈත පිහිටි

* බී. දහනායක මහත්මයා විසින් ලියා එවන ලදී.



* කොග්ගල කියන ගමේ ඔරු හත් අට සියයක් පමණ මුහුදු ගොස් නැව්වල ගමනද නවත්වන ලද්දේය.

හලාවත මීගමුව කළුතර යන පළාත්ද සිංහලයන් විසින් අත්පත් කරගන්නා ලද්දාහ. රජතුමා සහ ලෙවුකේ සේනාධිපති තුමාත් යුධ සේනාව කැටුව හංවැල්ලට පැමිණ එහි සිටි ඉංග්‍රීසි යුධ හමුදාවද පන්නා හැර එම කොටුවද අල්ලා ගන්ට තැත් කොළෝය. එහිදී සිදුවුන යම් කරුණක් නිසා රජු විසින් සේනාධිපති † ලෙව්කේ තුමාගේ හිස සිඳ දමන ලද්දේය. ඉන්පසු සිංහල යුධ සේනාවෝ අවෛධ්‍යවීව පසුබැස්සාහ. නැවතත් සියලුම මුදුතර ප්‍රදේශ ආපසු ඉංග්‍රීසීන්ට යටත්වූහ. ඉංග්‍රීසි හමුදාවෝ මහනුවරද අත්පත් කර ගත්තාහ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා කඳුකර ප්‍රදේශයකට පලා ගියේය.

* මෙසි ඔරු යනුවෙන් හැඳින්වෙන්නේ සාමාන්‍යයෙන් මුහුදේ මසුන් ඇල්ලීමට යොදනු ලබන ඔරු නොව මෑතක් වනතුරු "යාත්‍රා" ඔරු නමින් ලංකාව වටේ වෙළඳාමට යොදාගෙන පාවිච්චිකරන ලද විශාල බත්තල් විශේෂයකි. කුඩා රුවල් නැව් සමාන වර්ගයකි. එකී තුල මිනිසුන් දෙ තුන් සියයක් හෝ බඩු ටොන් සියයක පමණ හෝ බර පැටවීමට ඉඩකඩ ඇතුව සාද තිබේ. මෙම යාත්‍රා අයිති කාර කුරුකුල අධිපතීහු කතලුව, කොග්ගල, මලලගම, වැලිගම ආදි පළාත්වල දැනුදු සිටිත්. මෙය විශාල වෙළඳ ව්‍යාපාරයක් හැටියට එක එක්කෙනා මෙයින් 'යාත්‍රා' ඔරු හතර පහ බැගින් තබා ගෙන එණු ආහාර ද්‍රව්‍ය ගම්මිරිස් කරාබු පුවක් යනාදිය පටවා මඩකලපුව, පුත්තලම, ත්‍රිකුණාමලය, ගාල්ල, කොළඹ, යාපනය ආදි ප්‍රදේශවලට යාත්‍රා මගින් ගෙන ගොස් විශාල වෙළඳාමක් කර තිබේ. දැනට ලොරි ගමනාගමනය පහසු නිසා ක්‍රමක්‍රමයෙන් එයද හීනවිය.

මෙගම් වැසි පට්ටන්කච්චිය රජු (රාජසිංහ) වෙනුවෙන් ලංදේසීන්ට විරුධව සටන් කලා සේම ඉංග්‍රීසින්ටද විරුධව සටන් කර තිබේ. ඉංග්‍රීසින්ට විරුධව කල මුහුදු සටනේදී පාවිච්චිකර තිබෙන්නේ එම රුවල් නැව් වර්ගය බැව් සනිය නැකිය.

† "පුං සඳ සේම පායාලා රට මැද් දේ
රං කෙඳි සේම පිරලා පිට මැද් දේ
මාර සෙනග වට කරගන යම යුද් දේ
ලෙව්කේ මැහිඳු අද තනියම වෙල මැද් දේ"

මේ අතරතුර ක්‍රි. ව. 1781 පටන් 1798 දක්වා රාජ්‍යශ්‍රියට පැමිණි සිරි ශ්‍රී රාජාධි රාජසිංහ රජ තුමාගේ බිසෝවරු පස් දෙනාගෙන් අග බිසව් තනතුරු ලත් අලමේලු අම්මාගේ සහෝදරයා වන මුද්දුසාමි හෙවත් මුද්දුසාමි කුමාරයා ඉංග්‍රීසින්ට පක්ෂ විය. මුද්දුසාමි කුමාරයා සිංහල රාජධානියේ රජකමට නියම හිමියා හැටියට ඉංග්‍රීසින් විසින් ඒත්තු ගන්නා ලද්දේය. මුද්දුසාමි කුමාරයාත් ෆ්‍රෙඩ්රික් නෝර්ත් උතුමාණන් වහන්සේත් අතර ගිවිසුම් පත්‍රයක්ද ලියා ගන්නා ලද්දේය. කඳුකර පලාතක සැඟවී සිටි ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා නැවතත් මහනුවරට පැමිණ ඉංග්‍රීසින් පලවා හැර ඔවුන්ට පක්ෂව සිටි මුද්දුසාමිද මරවන ලද හෙයින් යථෝක්ත ගිවිසුම් පත්‍රයෙන් යම් ප්‍රයෝජනයක් ඇති උනේ යයි නොසිතමි.

(ඥානදර්ශය viii කාණ්ඩය 1903. 118 පිටුව)

## කොක්ගල

වත්මන්කල කොග්ගල නමින් ප්‍රසිඬව ලක්දිව දකුණෙහි පිහිටි ග්‍රාමය, වනාහි බොහෝ කොටම කුරුකුල සින්ගේ වාස භූමියකි.

කොක්ගල ඔයේ පිහිටි ගල්වල හරක් පාද කැටයම් කර තිබේ. කොක්ගලේ කොක්කු යන පක්ෂීන්ගේ රූප කොටා තිබෙන බැවින් මේ ගමට කොක්ගල යන නාමය ඇතිවූ බව සිතිය හැක.

එහි "පට්ටන්කට්ටියා වත්ත" "මාඹගානැන්න" "බංගලාව" "උයන" යන නාමයන්ගෙන් හැඳින් වෙන ප්‍රියකරු භූමිභාග කීපයක් තිබේ.

මෙහි සුලු රජෙක් විසූ බවද සිතන්ට ඉඩ තිබේ. සුලු ප්‍රදේශ ආණ්ඩුකාර කරාවේ ප්‍රධානින්ට "පට්ටන්කට්ටියාර්" නොහොත් "පටබැන්ද" යනුවෙන් ව්‍යවහාරකර තිබෙන බව නොයෙකුත් පැරණි ඉතිහාස ග්‍රන්ථාදියෙහි දක්නට ලැබේ.



මෙයට සාක්ෂි වශයෙන් රාජාවලියෙන් සහ ආචාර්ය පෝල් පීරිස් මහතාගේ පෘතුගීසි ඉතිහාසයෙන්ද කරුණු ස්වල්පයක් මෙහි බහාලීම යෙහෙකැයි සිතමු.

දෙවෙනි රාජසිංහ රජු ලන්දේසීන්ට විරුඬව යුඬය මෙහෙයවන අතර :—

"කොක්කිල්ල ( රට හෝ ගම ) පට්වන්කට්ටියාර්ද රජ්ජුරුවන් වෙනුවෙන් ඉදිරියට (සමනට) ආවේය."

The Pattangatin of * Coquille was also approached on behalf of the King"

(Portuguese Era. 2. 454)

"ඔවුන්හට ඔවුන්ගේම (කුලයෙන්) අදිකාරම්වරු සහ මුදලිවරුද ඇතුව සිටියෝය."

(පෘතුගීසි ඉතිහාසය. 1. 500)

"They had Adigars and Mudaliyars of their own"

(Portuguese Era. 1. 500)

"භුවනෙකබාහුය, මහ රයිගම් බණ්ඩාරය, මායාදුන්නේ රජය ............යාපාපටුනේ කරුණාධිපතියාගේ ගෙදරට ගොස් වැඩිමාලු රජ දෙදෙනා එ ගම "පටබැන්දට" භාර කරදී බාල රජ කන්ද උඩ රටට ගියේය."

(රාජාවලිය. 53 පිටුව)

ජාපනේ කරුණාධිපතියා හෙවත් ජාපනේ රජුට එඩා එ ගම "පටබැන්ද" (කරාවේ ප්‍රධානියා) බලවතෙක් බව මෙයින් හැගේ.

තවද පටබැන්දන් නොහොත් පට්ටන්කට්ටියාර් වරු ස්වෛරී බලයෙන් යම් යම් ප්‍රදේශ ආණ්ඩුකර තිබෙන බවත් මේ "දේශවලමය," ක්‍රි. ව. 1840 දක්වා ඔවුන් විසින් ක්‍රියාවේ යොදවාගත් ආ බවත් දැනගන්ට තිබේ.

* ඇතැම් අය මෙය "කොග්ලි" කියාද ශබ්ද කරති.

කොක්ගලද "පට්ටන්කට්ටි" ආණ්ඩුකාරයෙක් සිටි බවත්, ඔහුගේ පදිංචි ඉඩමට "පට්ටන්කට්ටියා වත්ත" කියා කියන බවත් ඔහු පදිංචිව සිටි වාසස්ථානයට "බංගලාව" යයි කියන බවත් විශ්වාස කළ හැක.

# සිරිලක කුරුකුල ප්‍රභූන්

## යුවරජවරු, කුමාරවරු, බිසෝවරු හා කුමරියන්

| නාම | ස්ථාන | රජකාලය |
|---|---|---|
| කුරුරට කුමාරයා | අළුත්කුරු කෝරලය | රාම රජ කාලය |
| කුරුරට බිසව | එම | එම |
| කාරවන්ත යුවරජ | එම | විජය රජ |
| කාරවත්ත බිසෝ | එම | එම |
| මල්රජ වේඩර් අරශන් | එම | පඬුවස්දෙව් |
| කුලකෝසිඹවන් රජ | ත්‍රිකුණාමලය | එම |
| අණීව ශ්‍රේෂ්ඨ සුශ්‍රීගුප්ත (කුරුකුල සූරිය) | අනුරාධපුරය | දෙවනපෑතිස් |
| කණ්දරු<br>කාරවන්ත | එම<br>එම } තමන්කඩ | දුටුගැමුණු |
| පටබැඳි බිසෝවරු | එම | එම |
| වේද ව්‍යාසර් පෙරුමාලුන් | දෙවුන්දර | දපුළුසෙන් |
| රන්පට බැඳි කිරිඑතනා කුමාරි | එම | එම |
| ඵකුර | දඹදෙණිය | දෙවන පැරකුම්බා |
| මහින්දය | එම | පළමුවෙනි භුවනෙකබා |
| සුබතෝය | එම | එම |
| වසනත කුරුය | එම | එම |
| නන්ද කුරුය | එම | එම |
| ගජ කුරුය | එම | එම |
| පුස්සද කුරුය | එම | එම |
| උසබ්භ කුරුය | එම | එම |



| නාම | ස්ථාන | රජකාලය |
|---|---|---|
| කිත් පොළොන්නරු<br>ලක් විජයසිංහ කිත්<br>අග්‍ර සෙනෙවි | පොළොන්නරුව | කීර්ති නිශ්ශංක මල්ල |
| කෞරව ආදිත්‍ය අරශ<br>නිලයිට්ටි ඉලනාග | ජයවර්ධනපුර | පස්වැනි විජයබාහු |
| කුමාර තළමල් | එම | පණ්ඩිත පරාක්‍රමබාහු |
| කුරවසිංහ වන්නි බණ්ඩාර, | පුත්තලම | බුවනෙකබාහු |
| කෞරව ආදිත්‍ය අරශ<br>නිල ඉට්ට මහනාග | එම | හයවෙනි පරාක්‍රමබාහු |
| වච්චනාටු තේවරීර් | අළුත්කුරු කෝරළේ | , එම |
| කුරුකුල නාට්ටු දේවරීර් | එම | එම |
| සිංහ සූරිය දේවරීර් | එම | එම |
| අන්තෝනියෝ බැරුත්තෝ | ඌව පළාත | පළමුවෙනි විමල ධර්ම සූරිය සෙනරත් රජ |
| මන්නාරමේ දේවර් | මන්නාරම | එම |
| කොකිල් වන්නියා | වන්නිය | දෙවන රාජසිංහ රජ |
| සූරිය වන්නි උන්නැහේ | කුරුණෑගල දිග්දෙනිය | |

## අමාත්‍යවරු

| | | |
|---|---|---|
| කුරුවන්නියා | කුරු දූවේ | විජය රජ කාලය |
| කරුනි | කරදන පිටිය | එම |
| කුරුනි | කුරු පිටිය | එම |
| කරුනි | කරා පිටිය | එම |
| බංගාල අමාත්‍යවරු | තම්මැන්නාව | එම |
| රන්පට බැඳි කුරුකුල නාට්ටු බණ්ඩාර සාමි | | බුවනෙකබාහු රජ කාලය |

## සේනාපතිවරු, මහ අදිකාරම්වරු, අදිකාරම්වරු, මහ මුදලිවරු, මුදලිවරු

### පළමුවැනි විමලධම් සූරිය රජකාලය

| | |
|---|---|
| වරුණ කුල ආදිත්‍ය, අරශ නිල ඉච්ච දෙන් මැනුවෙල් දියෙස් මහ අදිකාරම් | සෙංකඩගල නුවර |

### දෙන් ජුවන්ධර්මපාල රජ කාලය

| | |
|---|---|
| තකුර අර්ථ දේව ආදිත්‍ය, ගාර්ඩිය වශම් ලිඳමූලගේ පේදුරු ද සිල්වා මහසෙනෙවි | කෝට්ටේ |
| දෙන් ප්‍රතාපසූ සමර කෝන් මහ සෙනෙවි | කොළඹ |

### බුවනෙකබාහු රජ කාලය

| | |
|---|---|
| එකුර අඹී දේවාදිත්‍ය, ගාර්දිය වසම් ලිඳමූලගේ මුනුමෙල් ද සිල්වා මහ සෙනෙවි | කොළඹ |
| විජය වික්‍රම ජය බාලසූරිය මහ සෙනෙවි | |

### ක්‍රි. ව. 1519 පෘතුගීසි කාලය

| | |
|---|---|
| මිහිඳු කුලසූරිය වාස් පෙරමුණු කොඩි වඩීන සේනාපති | මීගමුව |
| කුරුකුල සූරිය විජයබාල දෙන් පිලිප් කාර්ලන් සෙනෙවි සහ අග්‍ර විනිශ්චය කාර | අළුත් කෝරළය සහ කොළඹ |
| කුරුකුල සූරිය ප්‍රතාපසූ අග්‍ර විනිශ්චය කාර | මීගමුව සහ කොළඹ |



### දෙවන රාජසිංහ රජ කාලය

| | |
|---|---|
| වර්ණ කුරුකුල සූරිය අදි අරශ මෙතනි සිංහ අරශ නිල ඉච්ච කුරු කුලත්තිල් මහ මුදියන්සේ තොමෙහාත් දෙන් ලියෝ නාඩි මහ අදිකාරම | සෙංකඩගල නුවර |
| වෙත්තසිංහ අදි අරශ පරද කුල සූරිය මහ ගොමෙරන්දේ මුදලි මහ දිසාව සහ මහ අදිකාරම | සෙංකඩගල නුවර |
| වර්ණ කුල සූරිය වැල්ලක්කේ මුදලි මාතලේ මහ දිසාපති | මාතලේ මඩබැද්ද |
| විජයරත්න කුරුකුල සූරිය මුදලි සෙනෙවි | මීගමු මහ වීදිය |
| සෙම්බරි තුරෙ කුරණ අඩප්ප උන්නැහේ සෙනෙවි | එම |

### පෘතුගීසි ආණ්ඩු කාලය

| | |
|---|---|
| වර්ණ කුල සූරිය දෙන් සෙල්වදෙරේ මුදලි | මීගමුවේ පෙරිය මුල්ල |

### ලන්දේසි ආණ්ඩු කාලය

| | |
|---|---|
| වීරවර්ණ කුරුකුල සූරිය *බූසා බදුගේ රේනිස් ප්‍රනාන්දු විනිශ්චය කාර | |
| වීරවර්ණ කුරුකුල සූරිය බූසා බදුගේ ඇන්ඩෘ ප්‍රනාන්දු විනිශ්චය කාර | |
| වීරවර්ණ කුරුකුල සූරිය බූසා බදුගේ ජුවන් ප්‍රනාන්දු විනිශ්චය කාර | |
| වීරවර්ණ කුරුකුල සූරිය බූසා බදුගේ පිලිප් ප්‍රනාන්දු විනිශ්චය කාර | |

---

* බූසා බදුගේ යනු “බෝස් බදුගර්” යන්නයි. සුභාස් චන්ද්‍ර ‘‘බෝස්’’ යන්න ගැන විභාග කළ යුතුයි.

### දෙවන රාජසිංහ රජ කාලය

වර්ණ කුල සූරිය ඉල නයිදේ මහ මුහන්දිරම් } පඬිවිට හුලංනමුව මාතලේ

### පෘතුගීසි ආණ්ඩු කාලය

අමඅේරු මුදියන්සේ — මෝදර

"රත්නාදිත්‍ය නීතියේ ශතනව දූනි පූජෝ පරාශර වාක්‍ය විරචිතෝ පුරුකුරුක්ෂේත්‍ර කෞරව කරාව ගෝත්‍ර සෞර්‍ය වංශ බෝධිගුප්ත පරම්පරාත්‍ර ගත යාදිවූ ජ්‍යෝති ශ්‍රී සිංහ වෛද්‍යරත්න ධර්මසේඛර වීරසේන පණ්ඩිත තොටගම වීදාගම ෂඩ්භාෂා පරමේශ්වර විජයබා පිරිවෙනේ සූර්‍ය කුමාර වන්නිසිංහ නුවර වෑවේ මුදියන්සේ රාලහාමින්නාන්සේ"

(පණ්ඩිත ඩී. ඇම්. ඇස්. ඇස්. කවිරාජ තුමාගේ කවිකල්ප තරුව සඟරා 236, පිටුව)

........"කරාවේ ගෝත්‍රයට අයත් බොහෝ දෙනෙක්, සිංහල පරංගි, ඕලන්ද, බ්‍රිතාන්‍ය යන ආණ්ඩුවලින් උසස් පදනාතියේ නිලතලද ලැබූහ. එනම්:- යුධ හමුදාවල කපිතන් ධුර කෝරල මුදලි ධුර, නාගරික මුදලි ධුර, විනිශ්චයකාර ධුර ව්‍යවස්ථාදායක මන්ත්‍රී සභාවේ මන්ත්‍රී ධුර, හා බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ උසස් නාම සම්මුතියක්වූ "නෛට්" පදවිය යන මේ ආදිය වේත්."

"ලංකාවේ මහා ධනවතෙක්වූ චාල්ස් ද සොයිසා මුදලි තුමා මේ කරාව ගෝත්‍රයෙහි උපන්, ඉංග්‍රීසි ආණ්ඩුවෙන් බොහෝ ගරු නාමතුරුලත්, ක්‍රිස්තියානි පල්ලි, පාඨශාලා ආරෝග්‍යශාලා ආදිය සාදවා රටට බොහෝ වැඩ සිදුකළ කෙනෙකි."

(ශ්‍රී ලංකාවිප වර්ණනා පිටු 96, 97)



## ක්‍රි. ව. 1815 දී සිටි කරාවේ මුදලි මුහන්දිරම්වරු

## Mudaliyars and Muhandirams in 1815 a. c.

1 සුසේ ප්‍රනාන්දු වර්ණ කුරුකුල අරශකුල සූරිය, කොළඹ සහ මෝදර මුදලි

2 ෆිලිප් දි අන්ද්‍රාදි අරශ කුල විජයරත්න, කොළඹ සහ මෝදර පළමුවෙනි පටබැඳි මුහන්දිරම්

3 ඉස්තේවල් ෆර්නැන්ඩෝ වීරවර්ණ කුරුකුල සූරිය කොළඹ සහ මෝදර මුහන්දිරම්

4 ෆ්‍රැන්සිස්කෝ ප්‍රනාන්ඩෝ අරශ කුල රත්න කුරුකුල සූරිය කොළඹ සහ මෝදර මුහන්දිරම්

5 ෆ්‍රැන්සිස්කෝ රුද්‍රිගෝ කොළඹ ගාර්දියේ මුහන්දිරම්

6 බස්තියන් දි අන්ද්‍රාදෙ අර්සකුල විජය රත්න මෝදර කිතුලාරු පටබැඳි මුහන්දිරම්

7 ජොහැන් නැස්ද සිල්වා විජය වික්‍රම ජයවර්ධන කොළඹ කිතුලාරු පටබැඳි මුහන්දිරම්

8 පේදුරු මැන්ඩිස් ගුණතිලක සමරසිංහ ජයවර්ධන සෙනෙවි රත්න, මොරටුවේ සහ ගල්කිස්සේ මහවිදාන මුදලි

9 අන්තෝනි ප්‍රේරු මොරටුවේ කිතුලාරු පටබැඳි මුහන්දිරම්

10 බර්ණස්ද සිල්වා අරශකුල රත්න ගුණතිලක මහවිදාන මුදලි, මීගමුව

11 මයිකෙල් රෝවල් වර්ණකුල වීරසූරිය ජයතිලක කරාවේ ජාතියේ ලස්කිරිඤ්ඤ කණ්ඩායම් දෙකේ සහ අළුත් කුරුකෝරලේ පොරොවකාර, අතුල්කාර ආදීන්ගේ මහවිදාන මුහන්දිරම්, දඬුගම

12 ගාල්ලේ හර්මානිස්ද සිල්වා වීරසූරිය ගුණවර්ධන මහ විදාන මුදලි

13 „ දොන් අදිරියන් ද සිල්වා අමඅේරු ජයවර්ණ පටබැඳි මුහන්දිරම්

14 හද්දේගේ සයිමන් වීරසූරිය, වැලලබඩ පත්තුවේ
පටබැඳි මුහන්දිරම්

15 සයිමන් ද සිල්වා වික්‍රම සූරිය රාජපක්ෂ,
තල්පෙ පත්තුවේ මහ විදානේ

16 ජොහැන්නැස් ද සිල්වා අභය ගුණවර්ධන,
අම්බලන්ගොඩ මහ විදානේ

17 මාතර, කහකත්තෙග පටබැඳිගෙ ජොහැන්නැස්
අභය වික්‍රම වීරරත්න පළමුවෙනි මහ විදානේ

18 විජයනායක ආරච්චි පටබැඳිගෙ දොන් ලූවිස්
විජයනායක දෙවෙනි මහවිදානේ

19 අබෙන්සෝ විජයවීර ගුණරත්න, වැල්ලබඩ පත්තුවේ
හා ගිරුවා පත්තුවේ මහවිදාන මුහන්දිරම්

20 දොන් තෝමිස් ද සිල්වා අභයසිංහ කොඩිප්පිලි,
ගිරුවා පත්තුවේ මහවිදාන මුහන්දිරම්

21 විජයවීර මහවිදානගේ ඔදාත් දානියෙල් ද සිල්වා,
වැලිගම් තොටමුනේ හා මිරිස්සේ මහ විදානේ

22 නම්බුකාර ඒබ්‍රහම් ද සිල්වා වීරකෝන් තිතුලාරූ
මුහන්දිරම්

23 සෙලෙස්තිනු පොන්සේකා විජයතුංග අරශ කුලරත්න,
කළුතර දිස්ත්‍රික්කයේ මහවිදාන මුදලි

24 කුරුවේ කත්කානිගේ දොන් පිලිප්පු,
මග්ගොන විදාන මුහන්දිරම්

25 අන්ද්‍රිස් පේ්‍රරා අභය ශ්‍රී වර්ධන, හම්බන්තොට මහ විදානේ

26 හලාවත සහ පුත්තලම් කල්පිටියේ
ෆ්‍රැන්සිස්කො ලෝව් කම්මලේ කෝරාල

27 ජුවන් ප්‍රනාන්දු කම්මලේ මුහන්දිරම්

(ඥානාදර්ශය 1909 – 1911 කලාප පිටු 200)

සැලකිය යුතුයි:-

ඉහත සඳහන් රදළ වරුන්ගේ පුතුයින්ට "අප්පුහාමි" නාමයක් භාවිතා කරගත්තා ආවේ නමුත්, පසු කලක දී ඔවුන් විසින්ම ඒ නාමය අත්හැර දමන ලදී.



# ඉංග්‍රීසි ආණ්ඩු කාලය

වෂී විපුල සන්නඩගේ ජොරෝනිස් ද සොයිසා ධම්ම ගුණවර්ධන විපුල ජයසූරිය කරුණාරත්න දිසානායක රජවාසල මුදලි. මෙතුමා වැඩි වශයෙන් පදිංචිව සිටියේ හඟුරන්කෙත සහ මහනුවරයි. එකල මෙතුමා ලංකාවේ ධන කුවේරයා වශයෙන් පසිදුයි.

උඩ රට මයිල පිටියේ පටන් හඟුරන්කෙත දක්වා සැතපුම් දෙක හමාරක් පමණ දුරවූ වන මාග, ඇපිාදින් ගෙන් ගහනවූ මහවන මැදින් ඉතා යහපත් රජ මාවතක් තනවාදිමෙන් මහජනයාට උපකාර කෙළේය.

හාරගම කොලොම්හන තොටුපල සිට මාඹයේ තොටුපල දක්වා සැතැක්ම 10 ක් පමණ දුරවූ කදිම රජ මාවතක් තනවා දීමෙන් එගම වාසීන්ට මහත් උපකාරයක් කර තිබේ.

උඩරට ගොනගම වැව, මිල් ඔලුවාවේ වැව යන විශාල වැව් දෙක බඳවා දී කර තිබෙන මහත් උපකාරය නිසා අද දක්වා ඒ වැව්වල ආධාරයෙන් ගොවිතැන් කොට ජීවත් වෙන පවුල් දහස් ගණනකි.

හාරගම තිබුබටුවාවේ මහත් මුදලක් වියදම්කොට විශාල අම්බලමක් තැනවීමෙන්ද ඒ පෙදෙසේ මාර්ග සහ ඒ දඹුත් තැනවීමෙන්ද මහ ජනයාට විපුල ප්‍රයෝජනයක් සිදු කර තිබේ.

ගෝනවත්ත, තලාතු ඔය, නාරංවිට ආදි ගම් වාසීන්ට කුඹුරු අස්වද්දා ගැනීම සඳහා වැව් අමුනු කීපයක් කරවා දීමෙන් දහස් ගණන් මනුෂ්‍යයෝ ඒවායින් ගොවිතැන් කොටගෙන සැපසේ ජීවත් වෙති,

හඟුරන්කෙත අති ප්‍රසිද්ධ පොත්ගුල් විහාරස්ථානයේ පිහිටි විශාල භූමිය පූජා එම විහාරය ගොඩ නැගීමට මහත් මුදලක් පිණට දුන්නේය.

වාරගොල්ල නම් විශාල කෙත් යායෙන් ලැබෙන මහත් වී රාශිය අද දක්වා පිණට දීගෙන එන්නේය.

හඟුරන්කෙත පළාතේ බාල දරුවන්ට සාමාන්‍යාද් ග්‍රහණය කරවනු පිණිස පාඨශාලාවක් තනවා දී මහත් සෙත් සැලසුවෙයි.

මෙතුමා විසින් කරණ ලද අප්‍රකට පුණ්‍ය කෘත්‍යයන් තවත් බොහෝයි.

මෙතුමා සියධනයෙන් රු. 500,000 ක් (පන් ලක්ෂයක්) පමණ මහජන ප්‍රයෝජනය උදෙසා වැය කොට පරිත්‍යාගශීලීව කටයුතු කෙළේය.

## සූසෙව් ද සොයිසා වාසල මුදලි තුමා

මේ මහතා අනුන්ගේ දුකට ලය උණුවෙන්නාවූ මහා කාරුණිකයෙකි. මෙතුමා විශාල වාණිජ ව්‍යාපාරිකයෙකි. අක්කර දහස් ගණන් විශාල පොල් කෝපි තේ වතු කුඹුරු මනහර මන්දිර ඇත් ඇස් ගව මහිෂාදි උපභෝග පරිභෝග සම්පත්තියෙන් අඪ්‍යව සිටියේය.

වර්‍ෂ 1844 දී මුළු කොළඹ නගරයෙහි කොළරා වසංගත රෝගය පැතිරී ගොස් දිනකට මරණ හතළිහ පණහ බැගින් සිදුවෙන අතර රෝග බියෙන් බොහෝ ප්‍රභූ ජනයා නගරය අත්හැර පිටිසර පළාත්වලට පලා ගියෝය.

නමුත් මේ මුදලි තුමා නිර්භීතව සවකීය සහෝදරයා වන ජ්‍රෝනිස් ද සොයිසා මුදලිඳුගේ ප්‍රත්‍යක්ෂ කොලරා ගුලි සහ බිත් තෙල් සකස් කොට ගෙන වැටුප් පිට තවත්



වෙදුන් සමග රෝග බෝවූ ගෙයක් පාසා වෙදුන් පිටත් කොට ඖෂධ කොට දහස් ගණන් රෝගීන්ගේ ජීවිත දානය දුන්නේය. බොහෝ දෙනෙකුට රෝගීන්ගේ නඩත්තුව පිණිස විශාල මුදලක්ද පරිත්‍යාග කෙළේය.

මේ වසංගතය නැති කිරීමට මේ කාලයෙහි මෙන් එකල ආණ්ඩුවේ ආධාර නොතිබුනු බැවින් යථෝක්ත මුදලිඳුගේ මහත් ධන ශක්තියෙන් නගර වාසීන්ට සෙත සලසවා දුන්නේය.

වර්‍ෂ 1848 දී මාතලේ පළාතෙන් ආරම්භවූ කැරැල්ලේදී ඒ පළාත් වාසීන් කවුරුත් පානේ පලායාමට සිටින අතර මේ නිර්භීත මුදලිඳු ඉතා ජව සම්පන්න සුදු අසෙකු පිට නැගී වහාම ඒ ප්‍රදේශය කරා පැමිණ තම කටයුතුවල යෙදී සිටි මහත් පිරිවර සේනාව හා අන්‍යයන්ද අස්වසා කැරැල්ලේ මූලිකයන්වූ උඩරට රජ වංශයෙන් ඔටුනු පැළඳ සිටි මොරටු කුරුකුල පුත්‍රයෙක්වූ පුරන් අප්පු ප්‍රධානව අතිකුත් කැරැලිකාරයින් කරා ගොස් මෙබඳු කැරැල්ලකින් ඉංග්‍රීසි ආණ්ඩුව ලංකාවෙන් නෙරපා දමන්ට අපට නොහැකි බවත් මෙයින් අත්වෙන ආදීනවය නිකරුණේ සිංහල අපිම විනාශ වන බවත් යනාදී කාරණා කාරණා කියාදී ඔවුන් නික්මවාගෙන නැවත ඉංග්‍රීසි යුධ හමුදාවේ උසස් නිලධාරීන් වෙත ගොස් බොහෝ දුරට කථා බස් කර මෝඩ කැරැලිකාරයින් කෙරෙහි ක්ෂමාවෙන මෙන් ඉල්ලා සිංහල සින් දහස් ගානකගේ ජීවිත දානයගෙන දුන්නේය.

මේ මුදලිඳු එකල සිටි සියලුම ඉංග්‍රීසීන් හා මිත්‍රව සිටි හෙයින් මේ විපතින් සිංහල ජාතිකයින් රාශියකගේ ජීවිත ආරක්ෂා කරගැනීමට පුළුවන්විය. එහෙත් මෙතුමාගේ පැමිණීමට පෙර ඉංග්‍රීසි යුධ හමුදාව විසින් සිංහලයින් 40 ස් දෙනෙකු පමණ වෙඩි තබා මරා දමන ලද්දේය.

මෙතැන් සිට මෙතුමා උඩ පාත සිංහලයින් අතරෙන් නිර්භීත ජනනායකයෙකු වශයෙන්ද ආණ්ඩුවට පක්ෂ පාත උතුම් සිංහල සේනාපතියෙකු මෙන්ද නිර්ලෝභි ධනවතෙකු මෙන්ද ඉංග්‍රීසි ආණ්ඩුව විසින් පිළිගනු ලැබීය.

වර්ෂ 1870 දී ඉර නොබසින අධිරාජ්‍යයේ වික්ටෝරියා මහා රැජිණගේ විතීය පුත්‍ර "ඇඩින්බොරෝ" මහාදිපාදයාණෝ සිරිලකට ප්‍රවිෂ්ටවූ කල තම ඥාති පුත්‍ර හැන්රිද සොයිසා මහතා හා සමග සිංහල ජාතියේ ගෞරවය ආරක්ෂා කරනු පිණිස ඒ ක්ෂත්‍රියයන් ප්‍රධාන කොට උසස් නිලධාරින් හා සිටුවරුද කොල්ලුපිටියේ "ඇල්ෆ්‍රඩ් හවුස්" නම් වලව්වට කැඳවා රාජ භෝජනයෙන් සංග්‍රහ කොට තම අස්හලේ උපන් සව්ඩ්ඩ අශ්ව පොව්වෙක් හා මිණි, මුතු, රන් ඈ නොයෙක් දෙයින් පරිත්‍යාග කරන ලදුව මේ සඳහා රුපියල් (100,000) ලක්ෂයක් පමණ වැය කෙළේය.

මේ රජ වාසල මුදලි තුමාට අයත්වූ මහනුවර පෙදෙසේ පිහිටි වාහොල්ලේ වෙල්යායෙන් ලැබෙන මහත් අස්වැන්න පලාත්වාසි දිළින්දන්ගේ ප්‍රයෝජනය පිණිස එතුමා විසින් පරිත්‍යාග කරන ලදුව මේ දක්වා ඒවා පලාත්වාසි අසරණයින්ගේ ප්‍රයෝජනය පිණිස යෙදේ.

ක්‍රි. ව. 1854 රේ සිට සෑම වසකම අළුත් අවුරුදු උලෙලට දසදහස් ගණන් දුගී මගී යාචකාදීන් රැස් කරවා සහල්, මිල, මුදල්, වස්ත්‍ර ආදියෙන් සතප්පවා ලීම මේ මුදලිඳුගේ අභාවය තෙක් පැවැත්තේය.

මොරටුවේ එංගලන්ත සභාවේ පාඨශාලාව හා දෙවස්ථානයෙහි නඩත්තුව සඳහා ගල්කිස්සේ මහ හෝටලය ඉදිරි පස පිහිටි රු. 10000 ක් (දස දහක්) වටිනා පොල් ඉඩම් දෙක පිනට දුන්නේය.



වර්ෂ 1872 දී සිදුවූ මහ ගං වතුරෙන් පීඩාවට පත් දහස් ගණන් ජනයින්ට මුදලිඳුට අයත් ගෙවල් දොරවල් කෝපි ගබඩාවල් වාසයට සලස්වා ආහාර පාන වස්ත්‍ර මිල මුදල් ආදියෙන් උපකාර කරන්ට යෙදුනා පමණක් නොව ජල ගැල්මෙන් දුකටපත් ප්‍රදේශවලට ඔරු පාරුවල හාල් මීරි දහස් ගණන් හා අතිකුත් දුරු මිරිස් ආදි ද්‍රව්‍ය පටවා හැරියේසි. ජල ගැල්මෙන් පසු ගේදොර විනාශවූ සියගණන් පවුල්වලට ගෙවල් තනා ගැනීම පිණිස, විශාල මුදලක්ද පිනට දුන්නේසි.

ඇඩින්බරෝ මහ ආදිපාදයන්ගේ නාමය සිහිවීම් වස් ලක් වැසි ජනතාවගේ ප්‍රයෝජනය පිණිස "ආදාශ ගොවි පල" ක් නමින් විශාල භූමි භාගයක් ආරම්භ කිරීමට රු. 50000 ක් පරිත්‍යාග කරන්ට යෙදුනා ඇත.

පානදුරා නගර වාසීන් ගේ ප්‍රයෝජනය උදෙසා රු. 20000 ක් වියදම් කර දෙවස්ථානයක් ගොඩ නගන ලදී. එමෙන්ම එය අසල රු. 50000 ක් පමණ වියදම් කර දැනට පවතින ආරෝග්‍ය ශාලාව ගොඩ නගා පොදු ජනයාගේ ප්‍රයෝජනය සැලැස්සුවේය.

මේ ආරෝග්‍ය ශාලාව නිසා සල්පිටි සහ රයිගම් කෝරලය බඳ ලක්ෂ සංඛ්‍යාත ජනතාවගට ලැබී තිබෙන ශුභසිද්ධිය වර්ණනා විෂයාතික්‍රාන්ත වෙයි.

"සු ර ර ද වැනි දෙරණ බට ඉසුරෙන් නොම ද
කු රු ර ද මහ ගොතින් පැවතෙන ලොව පබ ද
සු සෙ වි ද සොයිසා වාසල මහ මුදලි ස ද
කල සොද රජකිය ඔසුහල බල සබ ද

(කුමර සංදේශය 1909)

පානදුරා නගරයේ ආණ්ඩුවේ පාසැල දුර්වලවී යන කල මුදලි තුමා විසින් එය ලබාගත "ශුද්ධවූ ජෝන්" නාමයෙන් ශාස්ත්‍ර ශාලාව ප්‍රකාශිමත් කොට බාල දරුවන් ගේ ශාස්ත්‍රෝද් ග්‍රහණයට සැලැස්සු බැවින් අද දවසේ රයිගම් කෝරල වැසි දසදහස් ගණන් ඉංග්‍රිසි ඉගෙන රැකී රක්ෂාවල නියුක්තව සිටිති.

මේ මුදලිඳුට අයත් වටිනා ඉඩ කඩම් පිහිටි මාරවිල පෙදෙසේ විශාල ධන සම්භාරයක් වැය කොට දෙවස්ථානයක්ද එසේම පලාත් වාසීන්ගේ ප්‍රයෝජනය උදෙසා ආරෝග්‍ය ශාලාවක්ද තනවා ලීය. මේ සඳහා රු. 50000 ක් පමණ වියදම් වී ඇත්තේය.

පානදුර ප්‍රසාංත භූමිය සකස්ව, සාදදීම, හගුරන්කෙත දෙවස්ථානයක් කරවීම හා වර්ෂ 1877 දී ඇතිවූ මහා දුර්භික්ෂයේදී මොරටුමුණට අයත් ගම් හා මොරටුවේ ගම් (18) දහ අටක වැසියන් දස දහසකටත් වැඩි තරම් ජනගහණයකට ආහාර පානාදියත් හා මිල මුදලින් සංග්‍රහ කරවීමද කෙළේයි.

කොළඹ, ආණ්ඩුවේ වෛද්‍ය කෞතුකාගාරය ගොඩ නැඟීම පිණිස මෙතුමා මහත් ධන සම්භාරයක් වියදම් කෙළේයි.

එමෙන්ම මෙහි සඳහන් දේ හැර අප්‍රකටව තමා කරා පුද්ගලික ආධාර උපකාර සඳහා පැමිණි දුගී මගී යාචකාදීන් සඳහාද වෙනත් පුණ්‍ය කටයුතු සඳහාද මෙතුමා විසින් කරන ලද පරිත්‍යාග රුපියල් ලක්ෂ ගණනාවකි.

## * චාර්ලස් හැන්රි ද සොයිසා මහතා

මෙතුමා සිය පියා, සහ සුළු පියා මෙන්ම පුණ්‍යවන්තයෙකි. බාල පරපුරේ අභිවෘද්ධිය සඳහා වේල්ස්හි රජ කුමාර ශාස්ත්‍ර ශාලාව නමින් පිරිමි ළමයින්ට හා වේල්ස්හි රජ කුමාරි නමින් ගැහැණු ළමයින්ටද ප්‍රධාන පඩකතියේ ශාස්ත්‍රශාලා වයක් සිය ධනයෙන් සාදවන ලද්දේය.

---

Late C. H. de Soysa Esq.
නිධනප්‍රාප්ත ධනේශ්වර
ශ්‍රීමත්. චාල්ස් හැන්රි ද සොයිසා සිංහල සිටුතුමා

මෙතුමා ගැන එංගලන්තයේ "ග්ලෝබ්" නම් ලෝක ප්‍රසිද්ධ ඉංග්‍රීසි පත්‍රයේ මෙසේ කියා තිබේ.

"බ්‍රිතාන්‍ය කොඩියට අයත් පෙරදිග රටවල සොවිසා සිටුතුමා මෙන් රට වාසීන්ගේ දියුණුව සඳහා විශාල මුදල් ගණනක් වියදම් කළ එකම මිනිහෙක්වත් නැත්තේමය."

(කවි කල්ප තරුව පෙරා 1909 පෙබරවාරි කලාපය.)



කොළඹ සහ අවට ගම් නියම් ගම් ආදියෙහි අසරණ ගැබිණියන් උදෙසා තිබිරි ගෙයක් නොවූයෙන් ඒ පාඩුව ආණ්ඩුවට හෝ පබු පසව නොපෙනී තිබුන මුත්, එය මෙතුමාට පෙනී සකල අංගයන් සහිත ප්‍රසූතිකාරෝග්‍ය ශාලාව තනවා රජයට පැවරුවේය.

වර්ෂ 1866 දී මහත් ධනයක් වැය කොට කටු බැද්දේ පාරද, එනාවේ පාරද, පිළියන්දල පාරේ කොටසක්ද තනවා ආණ්ඩුවට පවරණ ලද්දේය.

"දෙශ සංචාරණයේ යෙදුනාවූ වික්ටෝරියා මහා රැජිණියගේ දෙවන පුත්‍රතෙමේ මේ කාලයෙහි මෙහි පැමිණියේය.

චාර්ලස් හැන්රි ද සොයිසා නම් සිංහල ප්‍රභූ තෙමේ ඒ රජ කුමරු සිය නිවෙසට පමුණුවා, බොහෝ ධනය වියදම් කොට ශ්‍රෙෂ්ඨ සංග්‍රහයක් කෙළේය. එදා ඒ සංග්‍රහය තෙමේ සවජාතික ගෞරවයට හේතුවිය."

(මහවංශ තෘතිය භාගය)

මේ මහත්මයාගේ පුත්‍රයෝ සත් දෙනෙකි. ඔව්හුද සිය පිය මුතුන් මෙන් පුණ්‍ය කටයුතුවල යෙදුනෝය. මේ පරපුරට හිමි එක් පොල් උයනක් ගැන වනන "සිංහල ජාතිය" පත් කතු පියදාස සිරිසේන කිවියාණෝ මෙසේ කියා තිබේ.

(1909)

"සි රි ස ර   පාන සක් සුරිඳුගෙ නඳුන්   ව න
හැ ම න ද   මාන වතු හිමියන් දවල   ව න
කි රි මැ ටි   යාන මහ පොල් උයන දකී   මි න
දි රි ස හ   මාන ඇතිවිය සිතට අප   ම න

අ ක් ක ර   අටසියක් වන විපුල මෙ උ   ය න
ඉ ස් ති ර   සිහල සිටු තුමෙකුට අයිති   ව න
වි ස් ත ර   මෙහි කියන කවි නැත ඉක්ම   ය න
ඇ ස් ඇ ර   බලව් උඩඟුව සිහලුනි බෑ   ති න

ද හ ස ක් සියක් කුරු පෙල කප් තුරන්
අ හ ස ක් වසා සිරිවලු බර මෙමින් — බ දේ
ස හ ස ක් සියොන් දෙන සද තදන එහි — සො දේ
ය ස ස ක් කියන වැනි සොයිසා මැතිදු — ඉ දේ
ස දේ

තොසප ත් හිති කරණ සිය සිහල දන
ද ත ව ත් රිවෙඩි සොයිසා මැතිදු සඳ — ලැ දි
සැ ප ව ත් ලෙස විසුම් ගැනුමට එහි පු — සු දී
මි හි ප ත් සුර විමානෙහි මැදුර සිරි — සැ දි
සැ දි

ලෝතෙ ක් පෙර පතල සිහළුන් තෙද
නැ දු ක් මට මිසක් ජරපත් තෙද — මා ත
මා රු ක් උයන දුටු කල කිරි මැටි — මා ත
බෝ වි ක් මය වඩසි හද තුල සිහ — යා ත
ලා ත"

(සිංහල ජාතිය පත්‍රය)

## ඩබ්ලිව්. පීටර් ද සොයිසා මහතා

මේ මහතා වනාහි නිරහංකාර ධනවත් සිරිලක කුරු කුමාරයෙකි. පුණ්‍ය කටයුතු සඳහා මෙතුමා විසින් රුපියල් ලක්ෂ ගණනක් වැය කොට තිබේ.

යම් කිසි උපකාරයක් බලාපොරොත්තුව මෙතුමා කරා පැමිණි කිසිවෙක් හිස් අතින් නොගිය බව රට පුරා පතලය.

මෙතුමාගේ පුත්‍රයින්ද මහජන සේවයෙහි යෙදී සිටින ප්‍රභූවරුය.

## ගාල්ලේ අමරසූරිය මුදලි තුමා

ගාල්ලේ කුරුකුල ක්ෂත්‍රිය අමරසූරිය මහා මුදලිතුමා දකුණු පළාතේ ශ්‍රෙෂ්ඨ පඩ්ක්තියේ ධන කුවේර යෙකි. සියම් රජුගෙන් ගරු නම් ලද මෙතුමාට ලක්දිව නා නා පළාත්හි තේ, රබර්, පොල් යනාදි අක්කර දස දහස් ගණනාවකගේ හිමිකම් ඇත.



දකුණු ලක අධ්‍යාපන දියුණුව තකා කටයුතු කිරීමේ මූලිකයෙකු වශයෙන් මෙතුමා සේවය කෙළේයි. මේ සඳහාද මංමාවත් පාලම් ඒදඬු අම්බලම් යනාදි මහජන ප්‍රයෝජන සඳහාද ස්වකීය ධනයෙන් රුපියල් කෝටිය කටත් වඩා වියදම් කෙළේයි.

යථෝක්ත මුදලිවරයාගේ පුතුන් වූ එච්. ඩබ්ලිව්. අමරසූරිය මහතා සහ තෝමස් අමරසූරිය මහතාද පියා මෙන් පුණ්‍ය කාර්‍යයන්හි යෙදෙන්නෝය. *

මේ දෙපලම රාජ්‍ය මන්ත්‍රිවරුය,

## ගාල්ලේ බේලි කන්දේ වලව්ව

ගාල්ලේ මහමුදේ දූවක පිහිටි බේලිකන්දේ වලව්වේ ගෘහපති තෙම වනාහි කෞරව ක්ෂත්‍රියකුගෙන් පැවතෙන ධනවත් සයිමන් ප්‍රේරා මහතා වන්නේය.

මෙතුමාගේ වැඩි මහල් පුත්‍ර බැනිස්ටර් පෙරේරා මහතා මොරටුවේ ශ්‍රී චන්ද්‍රසේකර මුදලි තුමාගේ දියණියක් හා විවාහ වීය.

දෙවන පුත් ප්‍රන්සිස් පෙරේරා මහතා මොරටුවේ සී. එච්. ද. සොයිසා මහතාගේ සහ ශ්‍රීමති ලේඩි ද සොයිසා මහා ආර්යාවගේත් දියණියක් හා විවාහ විය.

දියණියවූ රෙජිනා හාමු ආතර් ද සොයිසා මහතා හා විවාහ විය. මේ දෙපලගේ එක් දියණියක් විජේශෙඛර මුදලිඳුගේ පුත්‍රයෙකු සමගද අනික් දියණිය හුළුගල්ලේ අධිකාරම් තුමාගේ පුත්‍ර හුළුගල්ලේ බණ්ඩාර මහතා සමගද විවාහ විය.

---

* ගාල්ලේ මහින්ද මහා විද්‍යාලය මෙම මහතුන්ගේ ප්‍රධානත්වයෙන් පවතී.

## දියෙස් අන්දරාදි පරපුර

උඩරට ප්‍රථමයෙන්ම මහ අදිකාරම් තිලය දරූ වරුණ කුල ආදිත්‍ය අරශ නිලසිව්ව දෙන් මැනුවෙල් දියෙස් අන්දරාදි මහ මුදලි තුමාගෙන් පැවත එන පරපුරෙන් බොහෝ දෙනෙක් කළුතර මිහ වලව්ව ප්‍රධාන ස්ථානය කරගෙන වාසය කරති.

සිංහල පරංගි ඕලන්ද සහ ඉංග්‍රීසි ආණ්ඩු කාලවලදී මහ අදිකාරම්, මහ මුදලි, සෙනෙවිරත් විනිශ්චයකාර යනාදි උසස් ඨානාන්තර දරූ දියෙස් ද අන්දරාදි සහ දියෙස් ද පොන්සේකා වරු වනාහි කුරු කුලත්තාර් වරු වත්තෝය.

දෙවන රාජසිංහ රජුට සහ එතුමාගේ මිත්‍ර පාක්ෂික ඕලන්ද ආණ්ඩුවටද පක්ෂව පරංගින්ට විරුඩව මීගමුව කොළඹ කළුතර ගාල්ල ජපනය යනාදි ස්ථානවල ඇරඹූ සටන් වලදී ප්‍රමුඛව ක්‍රියා කළවුන් අතරෙන් ලූවිස් දියෙස් අන්දරාදි සහ මනිවෙල් දියෙස් අන්දරාදි යන සහෝදර මුදලි වරු දෙදෙනා නියම වීරයන් බවත් සිංහලයින් අතරෙන් විශ්වාස කටයුතු මුදලි වරුන් බවත් බතාවියෙ ඩැග් රෙජිස්ට්‍රයේ ඕලන්දයන් විසින් සටහන් කර තිබේ.

සිංහල රජුගේද අනුමැතිය ඇතිව ඕලන්ද ආණ්ඩුව විසින් කොළඹ නාගලම් තොට පිහිටි අමුණු 65 ක් පමණ විශාලත්වය ඇති මහ වත්ත නැමැති ගම්වරය ලූවිස් දියෙස් අන්දරාදි මුදලි තුමාට නින්දගමක් වශයෙන් දෙවා වදාරණ ලදින් අද දක්වාත් මේ පරපුරට මෙය අයිතිව භුක්ති විඳිමින් එහි පදිංචිව සිටිති.



දුටුගැමුණු රජකාලයේ ගන්ධාර දේශයෙන් කෞරව යුධ කාරයින් රාශියක් ලංකාවට පැමිණ තිබේ. මෙයින් බොහෝ දෙනෙක් පරසතුරු උවදුරු මැඩලීම සඳහා මුහුදුතෙර රැක වල්හි යොදවන ලදී.*

ගාන්ධාර යන අරුත්හි යෙදෙන "ගන්දර"ද මුහුදුතෙර රැකවල්හි ගන්ධාර කුරුකුලයින් රැඳවූහ යි කියති.

වත්මන ගන්දර වලව් පේරුවේ මුදලිවරුන් ගෙන් පැවත එන්නෝ මෙහි මූලික ගෘහපතීන් මෙන් පෙනී සිටිති.

## ශ්‍රී චන්ද්‍රසේකර මුදලිතුමා

මොරටුවේ හොරේ තුඩුවේ වලව්වේ විසූ මුතු තංත්‍රිගේ සිමියොන් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රසේකර මුදලි (කෞරව ආදිත්‍ය මුදලිතුමා) වනාහි එකල සිරිලක සිටි මහා කෙලෙඹි පුත්‍රයෙකි.

සියම් මහ රජුගෙන් ප්‍රසාද ලැබූ ප්‍රභුවරයෙකි. මෙතුමා විසින් රුපියල් ලක්ෂ ගණනක් වියදම් කර තම වලව්ව අසල සකලාංගයන් ගෙන් යුත් විහාරස්ථානයක් කෙළේය.

මහ ජනයාගේ ශුභ සිද්ධිය සඳහා රුපියල් දස ලක්ෂය කටත් වඩා වියදම් කෙලේය. මෙතුමාගේ එකම පුත්‍ර රත්නය වූ ශ්‍රී චන්ද්‍රසේකර මහතාද සවකීය පියා මෙන් පුණ්‍ය කටයුතුවල නිරත වූයේය.

---

* ඇතැම් ඉන්දියානු රජවරුන් තුල ලංකාව කෙරේ පැවති සතුරු අදහස් එහි නැවති සිටි කාලය තුළ දී මුගලන් කුමරුට දැනගන්ට ලැබුනු බව සිතිය හැක. එතුමා ලංකා විපය පරසතුරු විඝවුල් වලින් වලකනු සඳහා මුහුදු බඩ රැකවලුත් තැබ්බ විය. එබැවින් පුරාණ ලංකා නාවුක හමුදාවේ ආරම්භය ගැන මුගලන් රජුගේ ක්‍රි.ව, 497-515 රජකාලය අතිශයින්ම වැදගත් කාල පරිච්ඡේදයකි.

(Indian Shipping Cha vii-viii J. R. A. S. 1896)

"සයුරින් අරක් බැඳ, ලක්දිව නිර්භය කෙළේය." (මහ වංශය)
"ක්‍රි. ව. 607 දී ලංකාවේ රජ ඔහුගේ නැව් 32 ක් ඉදිරියට එවා චීන නානාපතියන් පිළිගත් බැව්, "සුසිඝු" නම් චීන ඉතිහාස කරු කියා තිබේ.

තරුණ වියෙහි සවගීසථ වූ මේ මහතා පුණ්‍ය කටයුතු සඳහා විශාල ධනසකන්ධයක් "ශ්‍රී චන්ද්‍රසේකර අරමුදල" නමින් අණ්ඩුව භාරයේ තැබුවේය.

මේ පිං මුදලෙන් රුපියල් දහස් බැගින් උඩරට පාතරට පල්ලි පන්සල් පාඨශාලා යනාදියට ආධාර වශයෙන් අවුරුදු පතා ලබා ගනිති.

සි රි සුනත් දම් සඟ — තුණුරුවන් ගුණ මහිමෙන
සි රි චන්ද්‍රසේකර — මුදලි මැති සඳ දිනේවා

දූ න දි න මුණි දහම සුසිරිත මහ බැ න් දූ
ම න මෙන ලද යසස දස දිගතෙහි රැ න් දූ
දූ න යෙන දනද තිලියෙන සුරතුරු බ න් දූ
දි න දි න සිරි චන්ද්‍රසේකර මුදු ලි න් දූ

ර කි සු රු දුටුගැමුණු මහ නරනිඳු ප ව ර
පු ර තු රු අනුර කරවූ දූක මහ වෙහෙර
එ ම ගු රු කොට තව වෙහෙරත් කල මෙ ව ර
මැති සු රු ගුණ කෙලෙසින් කරමුද වි ත ර

සු රි දු සිරිත් වැජඹෙන සුරවරන් මැ ද
නි රි දු සියම් මහ රජ මෙහි පැමිණි ස ද
පු බු දු වමින් එතුමන් සිත සතොස ල ද
මැති දු කොතෙක් වෙත මෙ මැතිඳු හැර ක වු ද

අ රු ම මහ රුවන් කරඬුව රැගෙන පෙ ර
බු රු ම දෙසින් මහ පිරිසක් පැමිණි ව ර
දූ රු ම නොහැකි තැවි මිල ගෙවමින් එ ව ර
පි රු ම කෙලේ යස දස දෙස මෙ මැති පු ර

පි න් සි ත් කදන් ගුණ නැණින් ඉසුරෙන් පසින් නා
තු න් සි ත් පහන් කොට නිතින් සැදහෙන් තිවස් නා
සේ කි ත් රැසින් සසඳර විලසින් සුදිස් නා
මේ ච න්ද්‍ර සේකර මැතිඳුන් දිනෝ දිනෝ වා

(සත්‍ය සමුච්චය සඟරාව 26. 1. 1908/2450)



# බෞඬයින් පල්ලි ගිය කාලය

මහත්මයාණෙනි,

මේ සැප්තැම්බර් මස 14 වෙනි දින "දිනමිණ" පත් මගින් දෙවෙනි වරට මේ මාතෘකාවෙන්ම ප්‍රකාශයට පමුණු වාලූ ඩී. සී. දිසානායක මහතුන්ගේ ඇත්ත පිළිගැනීමේ අභිලාෂ ඇති බව දුටු මා අතිශය ප්‍රීතියට පැමිණියෙමි.

බටුවන් තුඩාවේ පඬි තුමන් පිළිබඳවූ චරිතයෙහි සව-හන්ව පවත්නා බැවින් මේ මහත්මයා එසේ බටුවන්තුඩාවේ පඬිතුමන් විසින් "සිවිල් රෙජිස්ට්‍රේෂන්" නීතිය (සාමාන්‍ය විවාහ ලේකම් ශාලාව) ඇති කරවූයේ යයි ලියූ බව සිතයි.

ඇතැම් නවීන ග්‍රන්ථ චරිත කරන්නන් දක්වූ පමණින් අදත් ජීවතුන් අතර වැජඹෙන වයෝවෘඬ බොහෝ ගිහි පැවිද්දන් විසින් දන්නා ලද අප කියන සත්‍ය ප්‍රවෘත්තිය මැකී නොයයි.

චරිත පොත් පිළිබඳ මහජනයාගේ ඇදහීමද ඉතා දුර්වල තත්වයක පවතී. පානදුරේ රංකොත් විහාරාධිපති ගුණරත්න තිස්ස මාහිමි තුමන්ගේ අනුශාසනය පරිදි වර්ෂ 1859 යේ සිට වියදම් දරා ගම් සැත්තෑ පහක ඇවිද වන්ද (33000) තිස්තුන් දහසක් රැගෙන ආඬතර වියෂී කොටත් ලංකාණ්ඩුවෙන් පිහිටක් නොලැබ පසුව එකල රාජ්‍යය කල වික්ටෝරියා මහ රැජිණිය වෙත ලියා යවා.

දූන් පවතිනා "සිවිල් රෙජිස්ට්‍රෙෂන්" නීතිය ශ්‍රී චන්ද්‍ර සේකර මුදලි තුමන්ගේ සොහොයුරු මුතුකංත්‍රිගේ ලුවිස් ප්‍රනාන්දු නම් මහතා විසින් ලංකා බෞඬයන්ට ලබා දුන් බව වර්ෂ 1907 පානදුරේ ඩී. ඇම්. ඇස්. කවිරාජ පඬි තුමාගේ කතෘත්වයෙන් පතලකල "කවි කල්ප තරුව" නම්වූ මාහැගි ධර්ම ශාස්ත්‍රීය සංග්‍රහයක පලවී ඇත.

මෙයටත් පැරණි ප්‍රවෘත්ති අයද ලිපිය දික්වෙන බැවින් දැනට මෙතනින් නිමා කරමි.

දිනමිණ කතෘ ම.ගත්මා මෙසේම අවකාශ දෙතොත් එම් පිළිබඳ ඉතා වැදගත් සත්‍යවූ විශේෂ විස්තර ප්‍රවෘත්තියක් ලියා එවන්ට අදහස් කරමු.

මීට, හොරේතුඩුවේ ආර්යවංශ භික්ෂු.

(දිනමිණ 20. 9. 193.)

## ශ්‍රාවස්තියේ තපස්විතුමා

මෙතුමන් සිරිලක ප්‍රකටව සිටි මොණ්ඩුවංශී කුරුකුල ඩබ්ලිව්. ආතර් ද සිල්වා රාජ්‍ය සහ අමාත්‍ය තුමාගේ පරම්පරික වස්තුව හා තුරුණු වියෙහි සරි කරන ලද වස්තුවද ආධාර කොට ගෙන බෞද්ධාගමේ සහ ජාතික දියුණුව පිළිබඳ නොයෙක් විට ක්‍රියා කළේය.

ශ්‍රී චන්ද්‍රසේකර මුදලි තුමන්ගේ දියණිය හා විවාහ වීමෙන් ලැබුන විශාල දායාදයද කරණ කොට ගෙන එය දියුණු කිරීමෙන් නොබෝ කලකින් ලක්දිව ප්‍රධාන පඩකාතියේ ධනවතෙක් විය. කොළඹ "ශ්‍රාවස්ති" නැමැති සුප්‍රසිද්ධ මහා මන්දිරයෙහි වෙසෙමින් "ශ්‍රාවස්තියේ තපස්වරයා"යයි ප්‍රසිද්ධව ජාතික සහ ආගමික කටයුතු කෙරෙහි මහධන සම්භාරයක් පිදුවේය.

පරමවිඥානාර්ථ බෞද්ධ සමාගමට අයත් පාඨශාලාවන් රැසක් බොහෝ කොට නඩත්තුවූයේ මේ මහතාගේ මුදලින්ය. ස්වකීය මුදලයෙන් කොටසකටත් වැඩියෙන් එම සමාගමට වියදම් නොකොලේ නම් එකී සමාගම එකල වස්තු භංගත්වයට වැටෙන්ට ඉඩ තිබුණේය.



මෙතුමා මහනුවර ව්‍යවස්ථා දායක මන්ත්‍රී වශයෙන්ද මොරටුවේ රාජ්‍ය මන්ත්‍රී වශයෙන්ද පත්වී සිටියේය.

මෙතුමාට දරු එල නොලැබින. පස් පව් දස අකුසලයෙන් වෙන්ව සිටි මේ තපස්වී තුමා හා සිය මැතිනියන්ද සිය මුදලය සම්පූර්ණයෙන්ම වාගේ පුණ්‍ය කටයුතු වලට යොදවා ස්වර්ගස්ථ විය.

## පොන්සේකා සේනාධිපති

ඉතිහාස පොත්වල පෙනෙනෙන කුමාරයා "වරුණ කුලාත්‍ය රජ" වූ කලී "වරුණ කුල ආදිත්‍ය රජ" සේනාධිපතියා වන්නේය. තන්ජූරයේ කරාව ගොත්‍රය ගැන විස්තර කරන රෙගුලෝ විසින් "Prince of Karias" කරාවේ කුමාරයා යයිද ක්වූරෝස් ඉතිහාසකරු විසින් "Kinglet of the Careaz" "කරාවේ යුවරජ" කියාද ව්‍යවහාර කර තිබෙනවා පමණක් නොව මේ කරාවේ මිනිසුන් තද පරුෂ යුධ කාමි වර්ගයක් යයිද කියා තිබේ.

එපමණක්ද නොව *"වෙම්නායක්" නැමැති කාරාවේ රජු, "වරුණ කුලාත්‍ය" නැමැති ඔහුගේ සේනාපතියා හා චඩුගර් වරුන්ගෙන් යුත් හට හමුදාවක් සමග ජාපනේ සංකිලි රජුට ආධාර පිණිස එලඹ තිබෙන බවත් පසුව වෙම්නායක් නැමැති කරාවේ රජුට ජාපනේ ඇපෑමෙන් පත් වීමට "තන්ජූරුවේ නායක්" විසින් ආඥාකළ බවත් පෙරිරෙ පවුසා විසින් 1621 දී ලියන ලද්දෙන් සහ ආචාර්ය පෝල් ඊ. පිරිස් මහතාගේ පෘතුගීසි ඉතිහාසයේ (2) II කාණ්ඩයේ 137 වෙනි පිටේ සඳහන් කරුණු අනුවත් දැන ගන්ට තිබේ.

මෙම කුමරුගෙන් පැවත එන පරම්පරාව වනාහි ක්‍රි.ව. 1660 දී ලංදේසි ආණ්ඩුව යටතේ කළුතර අධිකාරම් ධුරය දැරූ වරුණ සූරිය දෙත් මෙකේලියස් ද පොන්සේකා මහතා පළමු කොට එවක් පටන් මේ දක්වා නොබිඳ එන පොන්සේකා මුදලි පරම්පරාව වන්නේය.

---

* වෙම් - නායක්, නායක්, නායිදු, නයිදු, නයිදෙ, නායකර්, නායකෙන්ද්‍ර, යනාදිය එකම අර්ථ ඇති නාමයෝ වෙති.

ඉහත සඳහන් අධිකාරම්ගේ පුත්‍රයා වරුණගේ
කැප්ටන් පොන්සේකා බතාවි ජා හමුදාවකට මුලිකව යුධයට
ගිය හෙයින් එවක් පටන් ඔහුට "වරුණගේ බතාවියේ ජ
හේවාසිත්ගේ කපිතන් පොන්සේකායයි ව්‍යවහාර විය.

කැප්මන් පොන්සේකාගේ පස්වෙනි මුණුපුරා සුප්‍රසිද්ධ
ආයුර්වේද වෛද්‍යවරයෙකු වූ වරුණගේ මාතික්කු ද පොන්
සේකා ජනරංජිත තැමැත්තාය.

කළුතර වරුණ කුල සූරිය නමින් සිටි උදවිය වනාහි
මේ පරපුරට අයිති වේ. මොවුන්ගේ මුල් වලව්ව
තවමත් රජ ගෙදරයයි කියති.

## රෙජිනෝල් ඒ. ද මැල් මැතිතුමා

කොළඹ මහ නගරාධිපති තනතුරු ලබා සිටි කුරුකුල
කුමාර රෙජිනෝල්ඩ් ඒ. ද මැල් පාර්ලිමේන්තුවේ මන්ත්‍රී
තුමා මොරටු පුත්‍රයෙකි.

මෙතුමා අප්‍රකටව පිංදහම් කරන මහගු ප්‍රභුවරයෙකි.
ආධාර උම්මනා තැනට පිහිට වන මහ පිංවතෙකි. විශාල
ආදායමක් ලැබෙන ආර්. ඒ. ද මැල් මහතා වූකලී නියම
කුමාරයෙකැයි ප්‍රකාශ කරමින් කොළඹ අග්‍ර විනිශ්චය
කාරයෙකු විසින් නොබෝද තඩු තීන්දුවක ලියා තිබුවේය.

## ආර්. ඇfජ්. ඇස්. ද මැල් මහතා

මේ මහතා වනාහි කාලයාත්‍රා කළ ශ්‍රීමත් සර් හෙන්රි ද
මැල් මහතාගේ පුත්‍රයාය. කොළඹ නගරාධිපති ධුරය
කීප වරක්ම ලැබුවේය, වර්තමානයේ එම ධුරයද උසුලන්
නේය. දැනට යෝජනාවක පැනෙන "නගරාධිපති සාමි"
නාමය මෙතුමාට හිමි වේයයි පත් මග නතු වලින් හෙළි
කරයි,



## මාතර නීතිඥ E. M. W. ජයසූරිය මහතා

මෙතුමා වනාහි මහජන හිත කාමියෙකු මෙන්ම
නොයෙක් පුණ්‍ය කටයුතුවල නිරත වන්නෙකි. දෙවුන්දර
දේවාලයේ බස්නායක නිලමේ ධුරයද ලබා සිටියේය.

## ජ්. පී. විජේතුංග නීතිඥතුමා

සමාදාන විනිශ්චයකාර අසථාවර මහෙසත්‍රාත් ධුරන්ධර
මෙතුමා දැනට දෙවුන්දර දේවාලයේ බස්නායක ධුරය
ලබා තිබේ.

මේ බස්නායක නිලමවරු දෙපල වූකලී කුරුවංශික
යෝයි.

## සමරවීර වාසල මුදලිතුමා

වැලිගම සිරිමැදුර වලව්වේ ඩේවිඩ් සමරවීර වාසල
මුදලිතුමා වනාහි පුණ්‍ය කටයුතු සඳහා තම සතු ධන
සම්භාරයක් වියදම් කළ මහා පිංවතෙකි. බාල පරම්පරාවේ
දියුණුව පිණිස මෙතුමන්ගේ තනි වියදමෙන් පාඨශාලා
කීපයක්ම තනවා ඉදත්ව යෙදුණේය.

මේ කුරුකුල ප්‍රභුවරයාගේ මුනුපුරු මොන්ටේගු ජය
වික්‍රම පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාද සිය මුත්තණුවන් මෙන්
පුණ්‍ය කටයුතු සඟ පලාතේ දියුණුව අරභයා නිර්ලෝභීව
ධන වියදම්කර රටට මහඟු සේවයක් කරන්නේයි.

## එච්. ඇම්. ප්‍රනාන්දු මැතිතුමා

ශ්‍රීමත්, සර් එච්. ඇම්. ප්‍රනාන්දු M. D. B. S. C., L. S. A. යන
ශාස්ත්‍රීය උපාධි ධාරී ගෞරව ආදිත්‍ය තුමාණෝ එංගලන්ත
යේ මහ රජතුමා අතින් සිටු තනතුරු ලත් ජන නායක
යෙකි. මෙතුමාගේ සහෝදර සී. ඇම්. ප්‍රනාන්දු මැති
තුමාද ලංකාවේ සුප්‍රසිද්ධ නීති වේදියෙකුව සිටියේය.

මෙම දෙපලගේ මැණියෝ සතර කෝරළය පාලනය
කළ දිශාධිපති නමට පත්ව සිටි ක්ෂත්‍රියයෙකු ගෙන්
පැවතෙන උත්තමාවකි.

## මොරටුවේ කුරුවීර පුරන් අප්පු

ඩබ්ලිව්. ප්‍රන්සිස්කු ප්‍රනාන්දු නොහොත් පුරන් අප්පු නැමති ජාතික වීරයා 13 වෙනි අවුරුදු වයසේදී ලක්ෂපතියේ ලාංඡනියාට ගල් මුල් වලින් ගසා ගෙදරින් පැන ගියේය. ඔහුගේ මයිලනුවන් කෙනෙක් වන රත්නපුරේ නීතිඥ ඩබ්ලිව්. මර්සලීනස් ප්‍රන්සිස්කු ප්‍රනාන්දු මහතාගේ ගෙදර අවුරුදු දෙකක් පමණ නැවතී සිට ඉන්පසු හල්දුම්මුල්ල අසල කළුපහන පාලම් රේන්ද පොල * භාරකාරයාව කටයුතු කෙළේය.

ඉන්බිති එයින් අස්ව බදුල්ලට ගොස් සවකීය නිර්භීත භාවය නිසා ජනප්‍රසාදය දිනාගත් මොහු පොලිස් මහෙත්‍රාත් ඩෝසන් මහතාගේ බංගලාව කොල්ල කෑවේය. එහිදී අල්ලා සිරකරනු ලැබූ නමුත් ඔහු තවත් සිරකරුවන් සමග සිරගෙය කඩාගෙන පැන ගියේය.

තිස්පස් වෙනි වයසේදී පුරන් අප්පු හාරිස් පත්තුවේ බණ්ඩාර මැණිකා නැමැති කාන්තාවක් සමග විවාහ විය.

ක්‍රි. ව. 1848 ජූලි 29 වෙනි දින කැරලි කෝලාහල කර මාතලේ නගරය අල්ලා ගත් පුරන් අප්පු තමා උඩ රට රජු බව ප්‍රකාශ කෙළේය. ගොංගාලේගොඩ බණ්ඩා, තොනොන් පැලියානාඩ ඩේවිඩ් ද, දිනෙකස් සහ ඩිංගිරාලද උප රජවරු වූහ.

නබනම්වල රජ ඇඳුමකින් සැරසුන පුරන් අප්පුව සුදු ඇතකින් රිදී ඔටුන්නක් සහිත කඩුවක්ද පළඳවන ලද්දේ කුඩාපොල භික්ෂූන් වහන්සේය.

මාතලේ කැරැල්ල සුළු එකක් නොව එය මැඩලීමට යුධ හාසින් 100,000 පමණ යොදන්ට සිදුවිය. පුරන් අප්පු විසින් මෙම කැරැල්ල ආරම්භ කිරීමට හේතුවූයේ උඩරට ඉංග්‍රීසින්ගෙන් නිදහස් කර ගැනීම පිණිස වන්නේය.

* මෙහිදී එරුණ බර කරත්තයක් තනියම කොඩ ගත්ට විරිය කිරීමේදී කරත්ත රෝදය පුරන් අප්පුගේ අතක් උඩින් යෑම හේතු කොට නාත අතක මාණික් කටුව බිඳුන බව කියත්.



වර්ෂ 1848 අගෝස්තු 2 වෙනි දින පුරන් අප්පු ඉංග්‍රීසින් අතට අසුවිය. ඔහුව සිරගෙය කරා ගෙන යන අතර සවකීය මස්සිනා මූන ගැසුනෙන්, "සොහොයුර මගේ මව්ට මා වැනි තවත් පුතෙකු සිටියේ නම් ලංකා රාජධානිය කිසි කලෙකත් සුදු මිනිසුන්ට නොදෙන්නෙමි" යයි කීවේය.

අන්තිමේදී මේ වීරයා බ්‍රිතාන්‍යයන් විසින් බෝගම්බර වැව අද්දරදී වෙඩි තබා මරා දමන ලද්දේය.

මොහුට තබන ලද වෙඩිල්ලට නොමැරුණ හෙයින් එහි සිටි "බෘක්" නැමැති නිලධාරියාගේ පිස්තෝලයෙන් පුරන් අප්පුගේ කනට වෙඩි තබා මරා දැම්මේය. මෙය නීතියට විරුද්ධ ක්‍රියාවක් හෙයින් මෙම නිලධාරියාව නිලයෙන් පහකර එංගලන්තයට යවන ලද්දේය.

පුරන් අප්පු රජ්ජුරුවන්ව ඉංග්‍රීසින් විසින් අල්වා ගන්නා ලද්දේ මාතලේ වාරියපොල දීය. මොහුව සිහිවීම් වස් එහි ගල් ටැඹක් පිහිටුවන ලද්දේය. කලකට ඉහතදී මෙම ගල් ටැඹ යමෙකු විසින් සොරාගෙන යන ලදුව, එවකට මහනුවර මන්ත්‍රී තැන්පත් ආතර් ද සිල්වා මහතා විසින් මේ ගැන පොලිසිය උනන්දු කරවා යථෝක්ත ගල්ටැඹ සොයාගෙන නැවතත් එහි පිහිටුවන්ට යෙදුනා ඇත.

### ශ්‍රීමත් සර් විල්ෆ්‍රඩ් ද සොයිසා සහ ජේ. ඇස්. වෝල්ටර් ද සොයිසා මැතිවරු

ශ්‍රීමත් සර් විල්ෆ්‍රඩ් ද සොයිසා මැති තුමා සහ මොරටුවේ අගුලානේ "කුරුක්ෂේත්‍ර" නැමැති වලව්වේ වැසි ජේ. ඇස්. වෝල්ටර් ද සොයිසා මැති තුමාත්, ශ්‍රීමතී ලේඩි කැතරින් ද සොයිසා මහ ආර්යාවගේ පුත්‍රයෝ වෙති. මෙතුමන්ලාද සවකීය පියාණන් වූ සුප්‍රසිද්ධ සි. එච්. ද සොයිසා සිටුතුමන් මෙන් ත්‍යාගවන්ත ප්‍රභූවරු වෙති. එමෙන්ම දුප්පතා වෙනුවෙන් නිර්ලෝභීව ධනය වියදම් කළ පිංවත්හු වන්නෝය.

* "සිත සර සරද ව න සා ලක ලි වි සි සද
සි සි සර සරද ස ර සා හිම ලි ය ස සද
සි රි සර සරද සොයිසා මුද ලි මැති සද
සිය සර සරද සැ ප සා සුදි ලි වි දි සද"

(අද්භූත කාව්‍යය)

මෙයින් කවි පසළොසක් කිය හැකිය.

# අවුරුදු සියයකට ඉහත ඇතිවූ මාතලේ කැරැල්ල

## පුරන් අප්පු සහ ගොංගාලේගොඩ බණ්ඩා

(ජේ. ඈf්. ද සිල්වා මහතා විසිනි)

මීට ශත වර්ෂයකට ඉහතදී මෙරට ඉංග්‍රීසි පාලනයෙන් මුදා ගැනීමට දරණ ලද ප්‍රබල ව්‍යායාමයක්වූ 1848 මාතලේ කැරැල්ල පිළිබඳ එක්තරා උද්යෝගයක් ඇති මේ අවදියෙහි ඒ පිළිබඳ ඓතිහාසික ප්‍රවෘත්ති එළිදරව් කිරීම කාලෝචිතය. අයුතු පාලන ක්‍රමවලින් මෙරට වැසියා විවිධ ක්‍රමයෙන් පෙළන ලද බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව එදා උද්ගතවූ මහජන බල වේගය දූකලී ඇතැම් අය සිතන පරිදි හුදු ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණයක් නොව බ්‍රිතාන්‍ය පාලනය මෙරටින් මුලෝත්පාටනය කර ජාතික නිදහස අත්පත්කර ගැනීමේ පරමාර්ථයෙන් කරන ලද මහා සටනක් බව ඓතිහාසික සාක්ෂ්‍ය වලින් එළිදරව් වෙයි.

කොලින් කැම්බල්, වෛකවුන්ට් ටොරින්ටන් ආදී ආණ්ඩුකාරයින් ගේ අයුතු බදු පැනවීම හා තාඩන පීඩන නිසා උඩරටියන් ස්වාධීන තත්ත්වය දිනා ගැනීමට මහත් ව්‍යාපාරයක් කළ බව පැහැදිලිව පෙනේ. තුවක්කු බදු, බලු බදු, ආදී රට වැසියන්ට නුහුරු බදු පැනවීම නිසාද භික්ෂූන් වහන්සේලාට පවා ඇඟ බදු ගෙවන්ට නියම කිරීම වැනි අදූරදර්ශී පාලන ක්‍රමයන් නිසාද උඩ රටියන්ගේ ජාතික සටන දිනෙන් දින මුවහත් විය. ජාත්‍යනුරාගයෙන් ඔද වැඩී ගිය සිංහල ප්‍රධානීන් රටේ නිදහස ගැන කල්පනා කිරීම නිසාද ඊටත් වඩා මේ අතර රණකාමී වීර සිංහලයකුගේ පහළවීම නිසාද මේ සටන නොවැළැක්විය හැකි දෙයක් බවට පත්විය. ඒ වීරයා වනාහි අනිකෙක් නොව අප අතර ප්‍රකට පුරන් අප්පුය. බාල කාලයේ සිටම එඩිතර



භාවය දක්වූ මේ පුරුෂයා කලක් බදුල්ලේ වාසය කළ බවද ඒ අතර ඉංග්‍රීසීන්ට දක්වූ විරුද්ධකම් වලින් ඉතා ජනප්‍රියවූ බවද පෙනේ. භික්ෂූන් වහන්සේලාගේ සම්බන්ධය ලබාගත් මේ නිර්භීත පුරුෂයා, එක් භික්ෂූන් වහන්සේ නමක් සමඟ මහනුවරට පැමිණි බවද එහිදී උඩ රට කාන්තාවක් සරණ පාවාගත් බවද ප්‍රකටය. මොරටුවේ උපන් මොහු "වීර සත්තද්ධ වීර බල ජයසූරිය කුරු උතුම්පාල අසුළුදේව ගුණරත්න පටබැඳිගේ ප්‍රන්සිස්කු ප්‍රනාන්දු" හෙවත් පුරන් අප්පු නමින් දන්නා ලදී. ඉංග්‍රීසින් ගේ අපරාධ දුටු පුරන් අප්පු මහනුවරදී උඩ රට ප්‍රභූන්ගේද සහාය ලබාගෙන රට වැසියන් නිදහස් සටනට සංවිධානය කොළේය.

දුල්ලෑවේ මහ නිලමේ, ගොලහැල්ලේ නිලමේ හා රත්-වත්තේ බණ්ඩා ආදී ජන ප්‍රධානීන්ද, කුඩාපොල, ඇඹුල් අඹේ, ගිරාගම ආදී දඹුළු විහාරවාසී භික්ෂූන්ද මේ සටනට පුරෝගාමීව ක්‍රියා කළහ.

පුරන් අප්පු මහනුවර අල්ලා ගැනීමට අරමුණු කොට කොතරම් ක්‍රමානුකූලව සේනාව සංවිධානය කළාද යන බව පෙනී යන්නේ සතර දිශාවකින්ම එක් දිනයක නගරය වටලෑමට සූදානම් කළ සැටි පරීක්ෂා කිරීමෙනි.

දඹුලු විහාරයේදී උඩ රටියන් විසින් පුරන් අප්පු රජ බවට තෝරා පත්කර ගෙන පැරණි යුද්ධ චාරිත්‍ර අනුව ගොන්ගාලේගොඩ බණ්ඩා, ඩිංගිරාල හා දිනෙස් යන අනෙක් තිදෙනාද "රුකඩ රජ" බවට පත්කොට ඔවුන් ලවා සේනා සංවිධානය මෙහෙයවන ලදී. මේ තිදෙනා කැලණියට නුදුරු වනවාසල ග්‍රාමයෙහි වහුම්පුර ගෝත්‍රයට අයත් මිනිසුන් බව කියති. පැලියගොඩ දාවින් හෙවත් ගොන්ගාලේගොඩ බණ්ඩා උඩුනුවර අළුදෙනියෙහි ගොන්ගාලේගොඩ මැණික්රාළගේ දියණියක් විවාහ කර ගත්තේය.

ඩිංගිරාළගේ සේනාවෙහි අදිකාරම් වශයෙන් උකුවෙල හිටපු රටේ මහත්මයාද, ගොන්ගාලේගොඩ බණ්ඩාගේ සේනාවේ කෝන්ගොඩ සාමි නමැති අයෙක්ද, පුරන් අප්පුගේ සේනාවට රත්වත්තේ බණ්ඩාද අදිකාරම්වරු මෙන් ක්‍රියා කළහ.

1848 ජූලි 26 වෙනි දින පුරන් අප්පුගේ නායකත්වය යටතේ දඹුල්ලෙන් පිටත් වූ සිංහල මහා සේනාවත් ටොරින්ටන් ආණ්ඩුකාරයාගේ ලිය කියවිලි අනුව එක් ලක්ෂයක් පමණවූ බව පෙනේ. පුරන් අප්පුගේ සේනාව ලෙනදෙර, කාවුඩුපැලැල්ල, නාලන්ද, පලාපත්වෙල, අලුවිහාරය ආදි ස්ථාන පසුකොට දෙදිනකින් මාතලයට පැමිණ දූතට "සැක්ස්වන් පාක්" නමින් ප්‍රකට මැක්ඩෝවල් කොටුව බිඳ දමා නගරය දිනාගත් කල්හි උඩ රට ප්‍රභූන් විසින් නැවතත් පැරණි සිරිත් අනුව පුරන් අප්පු මහනුවර රජ බවට ප්‍රකාශකොට රට වැසියන්ට රජුගේ අණපනත් පිළිපදින්ට නියම කරන ලදී. යුධ සේනාපති පී. ඒ. ඩුවුට් මහතාගේ වාර්තාවන් අනුව ගොන්ගාලේගොඩ බණ්ඩාගේ නායකත්වය යටතේ එදිනම දඹුල්ලේ සිට වෙනත් මගකින් පැමිණි සේනාව කෙල්ලමිංගල්ල, ගොන්ගාවෙල සහ පලාපත්වෙල ඔස්සේ ජූලි 28 වෙනි දින වාරියපොලට පැමිණි බව පෙනේ. මහනුවර සිට පසු දින ආ ඉංග්‍රීසි සේනාවන්ට මුණ ගැසුණු වාරියපොල සිටි ඒ සිංහල හමුදාව හා අතර ඇතිවූ සටනින් ඉංග්‍රීසින්ට ජය අත්විය. සතුරාට අසුනොව පලා ගිය ගොන්ගාලේගොඩ බණ්ඩා, ඇල්කඩුවේ ගල් ගුහාවක සැඟවී සිට පසු දින ඩිංගිරාළ සේනාපතියාගේ සේනාවට ආධාර කිරීම සඳහා කුරුණෑගල බලා පිටත් විය, එහෙයින් ඔහුට මාතලේ සටනට සහභාගි වන්ට අවකාශ නොලැබින. මෙය පිළිබඳ විස්තරයක් ටොරිංටන් සාමිගේ 1848 අගෝස්තු 14 වෙනි දින වාර්තාවෙන් පෙනේ. ඩිංගිරාළ සේනාපතියා යටතේ කුරුණෑගල බලා 26 වෙනි දිනම පැමිණි සේනාවද නගරයට ඇතුල්ව



සිර ගෙවල් කඩා උසාවිය ගිනි තබා මහත් විනාශ කළ බව පෙනේ. එහෙත් මහනුවරින් ගිය ඉංග්‍රීසි හමුදාව ජය අත්පත් කර ගත්තේය. වාරියපොල සිට ගිය ගොන්ගාලේගොඩ බණ්ඩා ද 30 වෙනි දින කුරුණෑගල සටනට එක්වූ නමුත් පරාජය වී පැන ගිය බව පෙනේ.

මෙසේ දඹුල්ල, කුරුණෑගල, මාතලේ අතර ප්‍රදේශය සිංහල හමුදාවන්ගේ සටන්වලට ගොදුරුවන්ට වූ කල ඉංග්‍රීසීහු බිය පත් වූහ. ජූලි 29 වෙනි දින මේ ප්‍රදේශයෙහි යුධ නීතිය පනවා අතිරේක යුධ හමුදාවන්ද කැඳවන ලදී.

මාතලේ විනාශ කොට පුරන් අප්පුගේ සේනාවෝ 29 වෙනි දින මහනුවර ඇල්ලීමට ගමන් ගත්තෝය. මේ අතර වාරියපොලදී ජය ග්‍රාහකවූ ඉංග්‍රීසි භටයෝ මාතලේට පැමිණ ඒ නගරය අත්පත් කර ගත්හ. 4,000 පමණවූ පුරන් අප්පුගේ සේනාව අගෝස්තු 1 වෙනි දින මහනුවර අල්ලා ගැනීමට ළංවන අතරමගදී ඉංග්‍රීසින්ට පුරන් අප්පු අසුවිය.

සිංහලයන් සෙනග බලයෙන් අධිකවූ නමුත් ගණකින් අඩුවූ ඉංග්‍රීසි සේනාවන් පරාජය කළ නොහැකි වූයේ බල-වත් අවි ආයුධ හා යුද්ධ ශිල්පීයෙහි දක්ෂ භටයන් සිංහලයන් අතර නැතිවූ බැවිනි. මෙසේ සිංහල සේනාවන් මෙහෙයූ එතික් නායකයන් වන ගොන්ගාලේගොඩ බණ්ඩා හා ඩිංගිරාළද ඉංග්‍රීසින් අතට ක්‍රමයෙන් අසුවූහ.

ලක්දිව පර සතුරු උවදුරින් මුදාලීමට පුරන් අප්පු ගත් උත්සාහයද සාර්ථක නොවීය. ඉංග්‍රීසින්ගේ අත් අඩංගුවට අසුවූ පසු යුද්ධ නීති ප්‍රකාර පවරණ ලද නඩුවේ විභාගයේදී සාක්ෂි දුන් ගොන්ගාලේගොඩ බණ්ඩා උඩරට නායකයන් විසින් රජ බවට තෝරාගත් නියම රජු ඔහු නොවන බව ප්‍රකාශ කෙළේය.

(ආණ්ඩුවේ වාර්තාව දෙසැම්බර් 5. 1848)

තඩු විභාගයෙන් පසු මරණීය දණ්ඩනයට නියමවූ ගොන්ගාලේගොඩ බණ්ඩා මරණයෙන් නිදහස් කොට කස පහර සියයක් තලා රටින් පිටුවහල් කරන ලදී. කිංගිරුල වෙඩි තබා මරණ ලදුව කුරුණෑගල නුග ගසක ඔහුගේ මළ කඳ දින සතරක්ම එල්ලා තබන ලදී. පුරන් අප්පුද ඉංග්‍රීසින් විසින් අගෝස්තු 8 වෙනි දින බෝගම්බර වැව අසලදී වෙඩි තබා මරණ ලදී. මරණයට පැමිණවීමට කලින් මේ වීර පුරුෂයා "මගේ මවට මා වැනි තවත් පුතෙකු සිටියේ නම් කිසිකලක ලංකා රාජ්‍යය සුදු මිනිසුන්ට අත්කර ගන්නට හැකි නොවන්නේය"යි ප්‍රකාශ කළ බව කියති.

මේ ස්ථානයේදීම අගෝස්තු 26 වෙනි දින කුඹා පොල ස්වාමීන් වහන්සේද සිවුරු පිටින්ම වෙඩි තබා මරණ ලදී. මුත්වහන්සේ මාතලේ රුක්අත්තන ගසක එල්වා මරණ ලද බවට ඇතැමෙකුගේ මතයක් ඇතද එය පිළිගැනීමට තරම් සාක්ෂි හිඟය. ඉතිහාස නයින් පෙනෙන මේබඳු එකම සිද්ධිය නම් 1823 දී සිදුවූ මාතලේ උඩගොඩ කෝරලේ ඇතිවූ කැරැල්ලය.

කැරැල්ල සම්බන්ධවූ මොරිත්වන් සාමිගේ ලියවිලිවලින්ද 1850 ගේ පාර්ලිමේන්තු පරීක්ෂණ වාර්තා වලින්ද දක්වෙන පරිදි ඓතිහාසික සාක්ෂි වලින් මෙහිදි එළිදරව් කරන එක් වැදගත් කාරණයක් නම් පුරාණයේදී අරාජක කැරලි වලදී නියම රජෙකු තෝරා ගැනීම් හා ඔහු විසින් යුද්ධ කට යුතු කිරීමට රූකඩ රජවරුන් පත්කරන ආකාරයයි. රට වැසියන් විසින් තෝරා ගන්නා රජුගේ නාමය ජයග්‍රහණය කින් පසු විනා කලින් එළිදරව් නොකිරීමද චාරිත්‍රයක්වූ බව හෙන්ඩර්සන් සහ වොට්සන් ගේ වාර්තාවලින් පෙනේ. ඇතැම් විට තෝරාගත් රජුද රූකඩ රජුන්ගේ කඩු ගත් අය ලෙසින් රහසිගතව සටන් භූමියට අවතීර්ණවන බව පෝර්බ්ස් ගේ මතයකි.

මේ ලිපිය සම්පාදනය කරන ලද්දේ ජේ. ඇස්. ඒ. ප්‍රනාන්දු සහ ගස්ටේවස් ජයවර්ධන යන මහතුන් විසින් සපයා දෙනලද ඓතිහාසික සටහන් ආධාර කොට ගෙනය.

(පෙරමුණ පත්‍රය 1948 – සැප්තැම්බර් 10)



# කුරුකුල ගෝත්‍ර නාම

"රංඥගේ" යන නාමය දෙවුන්දර පුරාණ වැදගත් කරාවේ පරපුරකට අයත්ය. මෙවුන්ගේ පැරැණි මී මුතුන් වූ කලී දෙවුන්දර දෙවොල අධිගෘහිත විෂ්ණු දෙවියන්ගේ රං කලත් භාරව සිටි නිලමෙ කෙනෙකැයි කියනු ලැබේ.

"ජය සූරිය," කතළුවේ "වරුණ කුල පට බැඳිගේ" "ගාල්ලේ වීරසූරිය" අම්බලන්ගොඩ "වීර වරුණ පට බැඳිගේ" "යුද්ධකාර හේවාගේ" "ගලප්පත්තිගේ" *"බදුගේ" "කුරුවගේ" යනාදිය කරාවේ ගෝත්‍රයෝ වෙත්.

"මෙම යුද්ධකාර කරාවේ ගොතිරට අයත් මෑත භාගයේ සිටි පරම්පරාවල් අතරෙන් සමහර දෙනෙක් මුහුදු බඩ ප්‍රදේශයේ පිහිටි "බණ්ඩාර වත්ත" නැමැති "රාජකීය පොල් උයන්" පාලකයින් නොහොත් තාන්ත්‍රිවරු වශයෙන් පත් කරණු ලැබූවෝය."

---

* (බදුගේ) ක්‍රි. ව. 1544 (28 ඔක්තෝම්බර් 1542) දී තුත්තුකුඩිය සම්බන්ධව බොහෝ වැදගත් කරුණු ඇතුලත් වී තිබෙන සාන්ත ප්‍රැන්සිස් සාවියර් මුණිඳුගේ ලිපියකින් මෙසේ ප්‍රකාශකර තිබේ:-

"An attack made on the village by the "BADUGES" (Vadugans) that is, the emissaries of the Vijayanagar Rulers and their Nayakkan Subordinates of Madura."

භාවය:-

"ග්‍රාමය කෙරේ පහර දීමක් "බදුගෙ" වරු (වඩුග) විසින් කරන ලදී. ඔවුන් වනාහි විජයනගර රජුන් යටතේ මදුරෙහි සිටින නායක්කාන් උප පාලකයින් සහ කාරිය කරවන නිලමේවරු වෙති."

"කුරුකුල පවිත්‍ර ගෝත්‍ර අභිජාත කුරුකෑටි නෑයෝ"ය නැමැති උඩ රට පරම්පරාවක් කුරුණෑගල පළාතේ සිටිති. ඒ පවුලේ මූලිකයෙක් "සූර්‍යකුමාරසිංහ නිලමේ" කියා සිටි බවත්, ඔවුන් මහ බෝධිය සමග ලංකාවට පැමිණි ක්ෂත්‍රියයකුගෙන් පැවතෙන බවට උරුම කියන බවත් දැනගන්නට තිබේ.

මොරටුවේ භාදික්කා වලව්වේ විසූ නයිදෙහාමි මුදියන්සේද පැරණි ප්‍රභුවරයෙකි. මේ කුරුකුල රදලවරයාගෙන් පැවතෙන අප්පුහාමිලා සහ හාමිනේවරු කීප දෙනෙක් තවමත් ජීවත්ව සිටිති.

"ගිණිගේ" පෙළපත් නාමයද වැදගත් කුරුකුල පරපුරකට අයත් වේ.

"ගාල්ලේ තල්පේ පත්තුව බද කතළුවේ වැසි කරාවේ ගෝත්‍රයක් සම්බන්ධව මූඛ පරම්පරා කථාවක් මෙසේය."

(පෘතුගීසි) ඕලන්ද ආණ්ඩුවේ ආඥව පිට අලගියවත්ත මොහොට්ටාල හාපුරා කියා මුහුදු බඩ ප්‍රදේශවල විවාහ උප්පැන්න හා මරණ සම්බන්ධව තෝම්බුව (රෙජිස්ට්‍රාර් නොහොත් ලේකම් පොත) ලියාගත යන අතර ක්‍රමයෙන් කතළුවට පැමිණියේය.

මෙහි වැසියන් එක්තෙනාගේ විස්තර ලියාගත යන අතර එහි බණ්ඩාර වත්ත පාලකයාගේ නොහොත් "තංත්‍රිගේ" පෙලපත් නාමය මොහොට්ටාල විසින් ප්‍රශ්ණ කරන්ට යෙදුනෙත් ඒ වේලාවට ඔහුට තම පෙලපත කීමට ප්‍රමාද විය. එවිට ඒ මහ ලේකම් තැන බණ්ඩාරවත්ත පාලකයාගේ, තන්ත්‍රිගේ, නොහොත් තන්තුලගේ පෙලපත් වලිය "ගේ බලන තන්ත්‍රිගේ" යයි තම තෝම්බුවේ ලියාගත්තේය.

මේ අලගියවත්ත මොහොට්ටාල විසින් පට බඳින ලද "ගේ බලන තංත්‍රිගේ" යන පෙලපත් නාමාවලිය ඇති කරාවේ පරම්පරාවක් මේ දක්වා කතළුවේ සිටිති.

බොහෝ විෂම සහිත පෙලපත් නාමාවලියන් කරාවේ මිනිසුන්ට ඇත්තේය. මේ නාමයන් අන්‍ය කුලවල මිනිසුන්ට ඇති බව පෙනෙන්ට නැත.

"ක්‍රි. ව. 1867 සිට අවුරුදු 30 ක් පමණ කාලය තුළ ගාලු පලාතේ තෝම්බුව බාරව සිටි මට පුරාණ නම් ගම් බලා ගැනීමට හොඳ නිදහසක් තිබුණේය."

(ඇෆ්. ජී. ගුණරත්න ගාල්ලේ තෝම්බුවේ මුදලි තුමාගේ Dutch Times පොත)



කුරුකුල හේවා, ලමා හේවා, කුරුප්පු හේවා, බාල හේවා, සල්පඅරූ හේවා, හෙට්ටි හේවා, ගාර්දියේ හේවා, ගල්බොක්කේ හේවා, කනක්ක හේවා, පුංචි හේවා, මහ හේවා, කුඩා හේවා, සෙල්ල හේවා, තල්ල හේවා, ගං හේවා, තොට හේවා, ජයලත් හේවා, කොඩිකාර හේවා, සරංගු හේවා, හේවාකොඩිකාර යනාදි හේවා නාමාවලිය ඇති කරාවේ මිනිසුන් සියල්ලෝම කුරුකුල යුධ භටයෝ සහ යුධ කොඩිකාරයෝය.

මෙම කුරුකුල හේවා කිවියෙකුගේ කීමක් මෙසේය.

"රු හු ණු දෙසෙහි දිනු සෙව් සරණ තෙරු ව ණ
පු හු ණු යුද සරඹ පරපුරක හිමි ව ණ
තු රු ණු කිවිදු හේවා කොඩි කරු වි සි හ
ඇ මූ ණු කුසුම් කලඹකි මුණි පිදුම ගැන"

මහ පට බැඳිගේ, කොළඹ පට බැඳිගේ, කළුතර පට බැඳිගේ, අරුණ වරුණ පට බැඳිගේ, මහ මරක්කල පට බැඳිගේ, සකල සූරිය පට බැඳිගේ, වරුණ සූරිය පට බැඳිගේ, සෙම්බු කුට්ටි පට බැඳිගේ, සෙල්ල පෙරුම පට බැඳිගේ, යනාදි "පට බැඳි" විරුදුවලිය ඇත්තන් කුරුකුල නිලම්වරු වන්නෝය.

පටබැඳි යනු පට්ටන්කට්ටි යනුයි. මේ පිළිබඳ විස්තර ඉහතින් දක්වා ඇත. පට්ටන්කට්ටි යන නාමය පුරාණ ශිලා ලිපියකද මෙසේ සටහන් කර තිබේ.

"නැවත දේවාලයෙහිද එහි ගම්වලද ප්‍රධානත්වයට ගම් මුලාදෑණි සමද පට්ටන්කට්ටි කෝරාළද, උඩසාරිද අධිකාරම් කෝරාළද යනාදි ව්‍යවස්ථා කර වදාලා" යනුයි.

ලංකාවේ මුතුපර සම්බන්ධව, යුධ නෞකා යොදවා සාගරය මුරකිරීම සහ මුතු පිහිටි මුහුදු ප්‍රදේශයන්හි සර්වාධිකාරි භාවයද කුරුකුල යුධ කාරයින්ට පෙර සිට අයිතිව තිබුනු සෙයින් මුතුමාලගේ, මුතුවාදිගේ, මුතුවාඩිගේ, මුතු තංත්‍රිගේ, මුතුමංත්‍රිගේ, මුතුමේස්ත්‍රීගේ, මුතුකුමරගේ, මුතු අරශගේ යනාදි පෙලපත් නාමයන්ගෙන් මේ දක්වා ඔව්හු පෙනී සිටිති.

## කවුර වඩුග නායකර් වංශය සහ ලංකාව

මහනුවර රජකළ සිංහල රජවරුන් අතරෙන් අන්තිම යාවූ වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ බිසෝ පදවියට තම රජ වංශයට සුදුසු සිංහල කුමරියක් නොසිටීයෙන් එතුමා අවිවාහකව සිටියේය,

ඉක්බිති සිංහල මන්ත්‍රීවරු මදුරා පුර විජයරංග චොක්කනාථ පඬි රජයන් කරා දූතයන් යවා ඔහු දූ කුමරියක් එවන ලෙස ඉල්ලා සිටියෝය. මෙයට එරජු විරුද්ධ විය.

එහෙත් සිංහල දූතයෝ පඬිරට මදුරා පුර මසුන් මැරීම සම්බන්ධ ප්‍රසිද්ධ කිලක්කරේ නැමැති ග්‍රාමයේ කුමරියක් කැඳවා විත් රජුට සරණ කර දුන්නෝය.

නරේන්ද්‍රසිංහ රජු දරුවන් නොලැබ මිය ගිය බව දැනගත් ලන්දේසි ආණ්ඩුකාර විල්හැල්ම් පැලොක් විසින් මෙසේ ප්‍රසිද්ධ කරන ලදී.

"නරේන්ද්‍රසිංහ රජ කළුරිය කළ බව දැනගන්ට තිබේ. කුංඩසාලේගේ බිසවගේ සහෝදරියගේ පුත්‍රයාවන කිලක්කරේ කුමාරයෙකුට සිංහලේ සිංහාසනය උරුම කිරීමට මහනුවර රජ මාලිගාවේ දැනට බලවත් රහසක් පවතී."

"මෙම කුමරුගේ මෑණියන් පවා අපවත්වූ රජු පාවාගත සිටි බවද දැනගන්ට තිබේ." යනුයි. (Ceylon & Hollanders P. 121.) නරේන්ද්‍රසිංහ රජුගේ ඇවෑමෙන් කිලක්කරේ මහිසියගේ සහෝදරයා ශ්‍රී විජය රාජසිංහ නමින් සිංහලේ රජ විය.

මෙකල පඬි රට මදුරා පුර විජයරංග චොක්කනාථ රජ නැසී ගොස් ඔහු බිසව වූ *මීනාච්චි අම්මාල් ත්‍රිචිනාපොලියේ සිටිමින් පඬි රට ආණ්ඩු කළේය. බංගරු තිරුමලේ නායකර් නැමැත්තා මදුරා පුරය සහ තින්නවැලි පලාත් ආණ්ඩු කළේය. මොහුගේ ඥාති කුමරියක් ශ්‍රී විජය රාජසිංහ රජු විවාහ කර ගත්තේය.

* මත්ස්‍ය අක්ෂි = මීනාක්ෂි = මීනාච්චි



මෙරජු ගැන ඇස්. ජී. පෙරේරා පියතුමා මෙසේ ලියා තිබේ.

........."මොහුට මහනුවර රාජ වංශය හා සමග ලේ නෑ කමක් නැත. ඔහුගේ ජන්ම භූමිය මදුරා පුරයෙහි මසුන් මැරීම ගැන ප්‍රසිද්ධ කොටසක විය. එහෙන් මෙතෙම සිංහලයන් සූර්ය වංශයයි කියන වංශයට අයත් වෙයි.

........."මේ අද්භූත අයිතිවාසිකම ගැන කිය හැකි අනික් කිසිවකු නොමැති බැවින් තමන්ගේ කෙනෙකුට වඩා මේ විදේශිකයාගේ උසස් ජන්මය සලකා ඔහුට රජකම දීමට සිංහලයෝ මැලි නොවෙති." යනුයි.

* ශ්‍රී විජය රාජසිංහගේ මරණින් පසු ඔහු බිසවගේ සොහොයුරු කීර්ති ශ්‍රී රාජසිංහ රජු සිංහාසනාරූඪ විය.

මෙතෙම වෙන්කත පෙරුමාල් නායක්කර්ගේ බාල සහෝදරිය සරණපාවා ගත්තේය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු දරුවන් නොලැබ මිය ගියෙන් ඔහුගේ බාල සහෝදරයා රාජාධි රාජසිංහ නමින් රජ විය. මෙතෙම තංජෝර් රට, රාජ විජය රාඝ නායක්කර් නමින් විසූ රජුගේ මුණුපුරෙකු වූ විජයමාන නායක්කර්ගේ දූවරු දෙදෙනෙකු භාර්‍යා කොට ගත්තේය.

ඒ හැර මේ රජු තවත් කුමරියන් දෙදෙනෙකු සරණපාවා ගත. නුමුත් මේ බිසවුන් සිව් දෙනාම දරුවන් නොලද්දෝය. ඔහුගේ මරණින් පසු කන්නසාමි කුමරු ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් රජ විය.

මේ සියල්ලෝම පඬි රට කිලක්කරේ කවුර වඩුගර් පරම්පරාවට අයත් වූවෝ වෙති.

(මදුරා පුර ඉතිහාස ලේඛණයන් අනුව ලියන ලදී.)

* මෙ රජුට ප්‍රථම කාලයේ, ක්ෂත්‍රිය කන්‍යාවන්ට පමණක් "කුමාරිහාමි" යන නාමය ව්‍යවහාර කර තිබෙන බවත් ඉන් පසුව මහ අදිකාරම්, දිසාපති යනාදි බමුණු ගෝත්‍රික නිලම වරුන්ගේ කාන්තාවන් හටද මේ ගරු නාමය ව්‍යවහාර කිරීමට අවසර ලැබුනු බවත් ඉන් පිට කිසිවෙකුට මේ නාමය කියවා ගැනීමට තහනම්ව තිබුනු බවත් දැනගන්ට තිබේ.

## වච්චනාට්ටු දේවරීර්

ප්‍රංශ රාජ්‍යයට යටත් දඹදිව "පොංඩිචේරි" ජනපදයෙහි, ක්‍රි. ව. 1856 දී මුද්‍රිත "යුරෝපීය මිසමේ" අකාරාදියේ විස්තර දක්වන පරිදි:—

"වච්ච පට්ටනම් යනු උත්තර දඹදිව, පැරණි නගරයකි. හස්තිනා පුර "නෙම්චක්කිරන්" රජුගේ අග නුවර කෞශම්බියයි. මෙම රජු කෞශම්බිය නොහොත් වච්චපට්ටනම අග නුවර කොට ගත්තේය." යනුයි.

* "චන්ද්‍ර වංශික රජුන්ගේ පරම්පරාවල් සම්බන්ධව රාජාවලිය අනුව පරම්පරා 75 ක් පමණ සිටි බව සඳහන්ව තිබේ. සූරිය වංශයේ පරම්පරාවද මෙපමණ වේ යයි සිතිය හැක."

(වේලර් 1. 2. 31)

---

* "The best royal stock of Singhalese" "සිංහලයින්ගේ ඉතා උසස් රාජකීය පෙළපත" යනුවෙන් ඉංග්‍රීසි ආණ්ඩුව විසින් අමතනු ලබන්නේ දත්ත සහ හේමමාලාවන් ගෙන් පැවතෙන නිර්මල චන්ද්‍ර වංශික සෑගලු පලාතේ බෙලිගල් කෝරලේ කීරවැල්ලේ පරපුරටය. මේ රාජකීයයන්ට "රාළහාමි" යන ගරු පදයෙන් ආමන්ත්‍රණය කර තිබෙන බව පෙනේ.

කෞතුකාගාර නොම්මර A R 18/127 දරණ වත්නි රාජවලිය පුස් කොළ පොතේ මෙසේ ලියා තිබේ.

"ශ්‍රී රාජසිංහ රජ්ජුරුවන්.............. ඉද තමාගේ සුහුරුවූ කීරවැල්ලේ රාළහාමිංඩ යුද්ධයට යන්ට............තමාගේ දෝනිකෙනෙකුත් එවං සාදරණ වූවාහ. ඒ කුමාරිකාව කීරවැල්ලේ රාළහාමිංඩ සරණවැද වැඩූ අයින් කවරහුද යත්, ගුංගොමුවේ රාළහාමිය, ඔබ්බෙබ්රියේ රාළහාමිය, මොලගොඩ රාළහාමිය, ඇන්තොරුවේ රාළහාමිය, කීරවැල්ලේ රාළහාමිය, ජයවීර බණ්ඩාරගාව උන්ඩිසෝ............"

චන්ද්‍ර වංශික ජයවීර බණ්ඩාර, මහනුවර රජවරුද, ඔවුන්ගේ කරව් බණ්ඩාර, කරව් ලියද්ද, නොහොත් කාරලියද්දේ කුමාරයින් වද "රාළහාමිලා" යයි ව්‍යවහාර කර තිබේ. "රාළහාමි" යන්නෙහි තේරුම "රදළ සවාමි" යනුයි.

වත්මන්කාල මේ ගරු පදය නගර ශෝධක කංකානම් වරු පවා කියමා ගැනීම බෙද ජනකයි.



"චන්ද්‍ර වංශයෙහි මූලිකයා වනාහි චන්ද්‍රයාගේ පුත්‍රයා වන "පුත" යයි කියනු ලැබේ. ඇතැම් විට සූර්යයාගේ පුත්‍ර "සුර පුතන්" යයිද ඔහුට කියති."

(පො. මි. අකාරාදිය.)

පුතගේ හයවෙනි මුනුපුරා වනාහි *"පුරු" නම් විය. මොහු කරණ කොට ගෙන "පෞරව" හෙවත් "පරවර" පරපුර ඇති විය.

"ක්‍රි. ව. යට 325 දී ග්‍රීසියේ මහා ඇලෙක්සැන්ඩර් රජුට විරුද්ධව සිටි "පෝරස්" නැමැති රජ වූකලී සුප්‍රසිද්ධ "පුරු" පරම්පරාවේ පෞරව රජෙකු බවට බාධා රහිතව සිතාගත හැක. තවද ඔහු හස්තිනාපුර ක්ෂත්‍රියයෙකු බවට එකහෙලාම සිතාගැනීමට කරුණු පෙනෙන සෙයින් පුරාණ පුරු පවුලට මොහු ඇතුලත් වූවෙකු බැව් නිසැක වශයෙන් කිය හැකියි.

(වේලර් 1. 244)

පුරුගේ 15 වෙනි මුනුපුරා වනාහි සකුන්තලාව භාර්යාව කොට ගත් දුෂ්මාන්තා රජුය. මොහුට "පුරුගේ පුත්‍රයයි" කාලිදාස විසින්ද කියන ලදී. ඔහුගේ පුත්‍රයා මහා භාරත කියා නම් විය. මේ රජුගේ "කුමාරි" නැමැති දියනියට භාරතයෙහි දක්ෂිණ ප්‍රදේශ හිමිවිය. මෙයි කොට සකට කුමාරි තුඩුවයයි එයින් පසු නම් විය.

(වින්ස්ලෝ)

---

* "පො ර ණ පටන් පුරුගෙන්.........එ න
ප සි - ද්ධ කොළොම් පුරවරයට නුදුරු වි න
හ මි න උතුම් කල එළි ග්‍රාමේ උප න
මෙ ප ද ගෙතුම් ප්‍රන්සිස් නෝනිස් විසි න"

(ශාන්ත ප්‍රන්සිස් සාවියෙර් තුමාගේ ජීවිත කථා කාව්‍යය)

මීගමුවේ සිට කෙලින්ම යාත්‍රාකල විට කුමාරි තුඩුවට පැමිණේ. පුරාණ කාලයේ සිට මීගමු මිනිපුත් කුමාරි තුඩුවට යමින් එමින් ද හිර ගනුදෙනු කර ගනිමින් ද එරට වැසියන් හා නෑ සබඳ කම් ඇතුව ජීවිවෝය.

"කුරු රජුගේ පුත්‍රයෙක්වූ "සුධර්ම" නම් රජු විසින් බිහාරයේ පිහිටි "මගධ රජධානිය" පිහිටු වන ලද්දේය."

(වේලර් 1 240)

කුරු රජුගේ 15 වෙනි මුණුපුරෙක් වූද වඟ නොහොත් සුරසුතන් නම්වූ පුතගේ 45 වෙනි (පමණ) මුනුපුරන් වූ පාණ්ඩු ධ්‍රතරෂට යන කුරුකුල සහෝදරයින්ගේ 8 වෙනි මුනුපුරා වූ "නෙම් චක්‍රවර්ති රජුගේ" ප්‍රධාන නගරයට වච්ච පුරය යයිද දෙමළ භාෂාවෙන් වච්ච නාච්චු යයිද ව්‍යවහාර වීය. මෙනි කුරුකුල කුමාරයින් හට "වච්ච නාච්චු දේව රීර්" යන නාමය අයිති වන්නේය.

හියුංසාන් නැමැති චීන වන්දනාකරු ක්‍රි. ව. 645 දී මෙම වච්ච පුරයට නොහොත් කෞශම්බි පුරයට පැමිණ සිබේ.

"වච්ච නාච්චු දේවගේ" නමින් පෙනී සිටින කුරුකුල පරම්පරාවල් දනට ලක්දිව සිනා කෝරලය බඳ "කලගෙඩිහේන" නැමැති ගම්මානයේ සහ ජපනේ පලාතේ අවචන් කුලමේද මේ දක්වා සිටිති.



## මොරටුවේ උයනේ පිහිටි ශුද්ධවූ ජුසේ මුනිඳුන්ගේ දෙව්මැදුර

"මොරටුවේ පළමුවෙනි වරට ක්‍රිස්තු ධර්මය වදාළේ වර්ෂ 1534 දීය. සර්ව සිතින් ක්‍රිස්තු ධර්මය වැළඳ ගත්තන් අතුරෙන්, හින්දු දේවාලයක්වූ "ගොනා කෝවිලේ" කපුරාළගේ පුත්‍ර තෝමස් දියෙස් විශේෂයෙන් සඳහන් කළයුතු මුල් ක්‍රිස්තියානි කාරයෙකි.

වඩු කර්මාන්තයෙහි අරග්ගත් ශුද්ධ වන්තයාවූ ජුසේ මුනිඳුන්ට කැප කරන ලද පළමුවෙනි දෙව් මැදුර තැනූයේ මොවුන්ගෙන් කෙනෙකි. ඔහු වනාහි රාජකීය කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වඩු නිලමේවූ* "කුරුකුල නාච්චු දේවරීර් මනුකුල සූරිය පාලප්පන්" වන්නේය.

නයිනාන්තුර්වල කඩෙයි මුහුදු වෙරළ බඳ පිහිටි භූමි තීරුවක මේ දෙව් මැදුර වර්ෂ 1575 දී ගොඩ නගන ලදී."

(ලංකාදීප පත්‍රය 19. 4. 48.)

## සී. ඇම්. ප්‍රනාන්දු අධිනීතිඥ තුමා

සලාවත් නුවර කෞරව වංශාධිපති පවුලකට අයත් මෙතුමා එවකට ලෝකයෙහි සිටි ඉගණිමෙහි දක්ෂයෙක් විය. කේම්බ්‍රිජ් යුනිවර්සිටි ලෝකල් විභාගයෙන් ප්‍රථමයාව ෂේක්ස්පියර් නම් ත්‍යාගයටද යුනිවර් සිටි ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රථම ඉඩමටද හිමිවූ මෙතුමා එංගලන්තයට ගොස් ඇම්. ඒ. ඇල්. ඇල්. බී. යන පටබැඳි නාම ලැබ ලඩකාවට විත් ආණ්ඩුවේ සේවයෙහි සෙදිසිව රාජ නීතිඥ (ආණ්ඩුවේ නීතිඥ) ධුරයටද පත්වීය.

සමර්ථ ගාන්ධිවාදියෙක් ලෙසද ප්‍රකටව සිටි මෙතුමා කොතලාවල ආටිගල මිනිමැරුම් නඩුවේදී ආණ්ඩුවේ පක්ෂයට පෙනීසිට ඉන්දියාවේ සිංහයා යයි ප්‍රකට නීතිඥයෙකු වූ නෝටන් තුමාගේ කථාවට පිළිතුරු වශයෙන් කල කථාව කරණ කොට ගෙන මහත් කීර්තියක් ලද්දේය.

* "පාලප්පන් වඩුග මනුකුල ආදිත්‍ය කුරුකුල නාච්චු දේවරීර්"

ආරෝග්‍ය භාවය සඳහා ප්‍රංශයට ගොස් සිටියදී අකාල මරණයට භාජනව ඔබෙහෙත් ගල්වා ලංකාවට ගෙනෙන ලදුව එතුමන්ගේ මෘත ශරීරය ගරු බුහුමන් සහිතව භූමදාන කරන ලදී. මෙතුමා වනාහි ගරු සී. එච්. ඉසැඩ්. ප්‍රනාන්දු තුමාගේ පියාණෝය.

කෞරව වංශෝද්භූතවූ මෙතුමා වනාහි (මච්පසිත්) ජයවර්ධනපුර (කෝට්ටේ) විසූ භුවනෛකබාහු රජතුමා හා තත් සහෝදර මායාදුන්නේ රජතුමාත් අතර පැවති යුද්ධයේදී භුවනෛකබාහු රජතුමාගේ පක්ෂයට එකතුව යුද්ධකල පෘතුගීසි හමුදාවේ (කොමැන්ඩර්) සේනාධිපතිවූ යුද්ධදක්ෂ *පේද්‍රුරු සිල්වා මුදලි තුමාගේ මුනුපුරෙකි. හලාවත පැරණි වැදගත් ප්‍රසිද්ධ පෙලපතකින් පැවතවුත් කොළඹ කොටුවේ ප්‍රසිද්ධ ප්‍රභූ වෙළඳ මහතෙක්ව විසූ ඇන්ඩෘ ප්‍රනාන්දු රාජ කාරුණා රත්න මුදලිතුමා වනාහි මෙතුමාගේ මහ පියාය. (මුත්තාය) යථොක්ත මුදලි තුමාගේ පුත්‍ර කොළඹ මෝදර විසූ ඇන්ඩෘ ප්‍රනාන්දු මහත්මා මෙතුමාගේ පියාය. එසේම කළුතර සිට අවුත් දෙහිවල විසූ බෝදියා බදුගේ බස්තියන් පෙරේරා විජයරත්න ජයවර්ධන විද්‍යා ආරච්චි මැතිතුමාගේ පියාදර ජ්‍යෙෂ්ඨ දුහිතෘවූ,

අපලෝනියා පෙරේරා විජයරත්න ජයවර්ධන මහත්මිය මෙතුමාගේ මව් වන්නීය. මෙලෙසින් බලනකල මෙතුමාගේ උභය පරපුරම සකකිරි මෙන් පිරිසිදු බැව් කිය යුතුයි.

"පාණ්දුරේ පණ්ඩිත ඩී. ඇම්. ඇස්. ඇස්. කවිරාජ තුමාගේ කවිකල්ප තරුව.

(පිටු 365. 1909 ජූනි)

---

* ගම්පොල රාජධානි කාලයේ, උඩරට ප්‍රධාන යුද්ධ දක්ෂයාව සිටියේ, "කුරුගම අධිවාසි කුරුවර අභිජාත අමර දිවාකර වික්‍රම සිංහ රාජපක්ෂ හාම්බුකාර මහ අදිකාරම" බව අම්බලන්ගොඩ තෝම්බුවේ දක්වේ.

පේරාදෙණිය අසල පිහිටි දැනට වැවිලි කරන ලද ප්‍රදේශයක් වූ "කුරුගම" ගැන මේ සම්බන්ධයෙන් සැලකිය යුතුයි.



# අමරපුර නිකාය

ශාසන වංශාලංකාර කවිධ්වජ විනයාචාර්ය වැලිගම සිරි සුමංගල මහා නායක මාහිමියාණන් වහන්සේද, වැලිගම ලොකු බදු ජයසූරිය පෙලපතේ කුරු වංශික උත්තමයෙකි.

ලංකාවේ පමණක් නොව විදෙශවල පවා පැතිරී ගිය කීර්ති ඝෝෂාවකින් සමුපලක්ෂිත යථොක්ත නායක මාහිමියන් වහන්සේ සංස්කෘත භාෂාව විෂයෙහි සකල බුද්ධිමතෙක් වූහ.

සුප්‍රසිද්ධ ඩබ්ලිව්. ඇ.ජ්. ජයසූරිය දෙස්තර මැතිතුමා හා වී. සී. ජයසූරිය පලාත් පාලන කොමසාරිස් තුමාද මේ නායක මාහිමියන් වහන්සේගේ මුණුබුරන්ගෙන් කීප දෙනෙකි.

ලංකාවේ ප්‍රථම වරට උප සංඝරාජ ධුරය ලැබූ අම්බලන්ගොඩ, ශ්‍රී දේවානන්ද නායක මාහිමියන් මහන්සේ, මුන්වහන්සේගේ ධර්මානෙනවාසී ශිෂ්‍ය රත්නයකි.

අමරපුර නිකාය නමින් හැඳින්වෙන භික්ෂු වංශයේ ආදි කර්තෘවරයාණෝ ද මේ වැලිගම ශ්‍රී සුමංගල මහා නායක මාහිමියාණන් වහන්සේය. දැනට එම නිකායේ මහා නායක ධුරය උසුලන්නේද යථොක්ත මහා නායක මාහිමියන් වහන්සේගේ ප්‍රව්‍රජ්‍යානෙනවාසි ශිෂ්‍ය වේරුවල, ශ්‍රී සුමංගල සිරිනිවාස මහා සථවිරපාදයෝය.

## කල්‍යාණි වංශ මහා නිකාය

"ස්‍යාමෝපාලි මහා නිකායෙහි කලක් පැවිදිව සිටියා වූ කතලුවේ (කුරුකුල) ගුණරතන නම් යති තෙමේ උපසම්පත්තිය ලැබීම පිණිස විදේශයකට යාමෙහි කරන ලද ආසා ඇත්තේ හිතවතුන්ට ඒ අදහස දන්වා

විහිවූ පරිදි ඔවුන්ගෙන් බොහෝ උපකාර ලැබ ශික්ෂාකාමිවූ සාමණේර සත් නමක් සමග

දෙදහස් තුන්සිය එක් පණස් වන බුද්ධ වර්‍ෂයෙහි නැව් නැග මුහුදු තරණය කොට නුවණින් යුතුව

රාමඤ්ඤ රට හංසවතී නම් පුරවරයට පැමිණ රාජ සම්මාන ලැබ තුටු පහටු වූයේ

එකල්හි සවකියයන් සමග සාකච්ඡා කොට රිසිසේ කල්‍යාණි සීමාවෙහි මනාව උපසම්පත්තිය ලැබ

පෙරලා ලක්දිවට පැමිණ සගමොක් ලැබීමේ ආසා ඇත්තවුන්ට පැවිද්ද හා උපසම්පත්තියත් දෙමින් හා දෙවමින්ද

සාධු සම්මතවූ යම් භික්ෂු නිකායක් පිහිටුවීද ඒ මේ කල්‍යාණි වංශ නම් නිකාය අදත් විරාජමාන වේ."

(මහාවංසය 102 වෙනි පරිච්ඡේදය තුන්වන කොටස)

## අවසානය .

මෙසේම ලංකාවේ පුරාණ විසුවාවූ ද දැනටත් ඉන් පැවත එන්නාවූ ද කුරුකුලයට අයත් සමූහයා ගැන බොහෝ තොරතුරු කියන්ට ඇති නුමුත් මෙම පුස්තකය විශාල වන සෙයින් මෙයින් නවත්වන්ට සිදු විය.

— නිමි —

---

දෙවෙනි කොටස ගැන බලාපොරොත්තු වෙනු.